# ඊයේ දිනයේත් මෙරටින් තවත් ආසාදිතයෝ 887ක් මරණ 9ක්




**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

මෙරටින් කොවිඩ් 19 වයිරසය ආසාදිතයන් 887 දෙනකු ඊයේ (09) උදෑසන වන විට අලුතෙන් හඳුනාගෙන ඇති බව කොවිඩ් 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පවසයි.

එම ආසාදිතයන් අතරින් පුද්ගලයන් 09 දෙනකු විදේශගතව සිට පැමිණි අය වන අතර අනෙක් පුද්ගලයන් 878 දෙනා දේශීයව හඳුනාගත් පුද්ගලයන් ලෙස වාර්තා වේ.

හඳුනාගත් ආසාදිතයන් අතරින් වැඩිම ආසාදිතයන් පිරිස වන 214 දෙනකු කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. ඊට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 208ක්, බදුල්ල දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 181ක් සහ අනෙකුත් ආසාදිතයන් 275 දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලින් වාර්තා වේ.

ඊයේ (09) උදෑසන වන විට මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් පොකුරට සහ කොළඹ මත්ස්‍ය වෙළෙඳපොළට සම්බන්ධ පොකුරෙන් වාර්තා වූ කොවිඩ් 19 වයිරසය ආසාදිත සම්පූර්ණ පුද්ගලයන් සංඛ්‍යාව 66,730කි. මේ වන විට එයින් පුද්ගලයන් 62,727 දෙනකු පූර්ණ සුවය ලබා රෝහල් වලින් බැහැරව ගොස් ඇත.

ඊයේ (09) උදෑසන වන විට මෙරටින් හඳුනාගත් මුළු කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 70,234ක් වන අතර එයින් පුද්ගලයන් 64,140ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් ඇත. ඊයේ (09) උදෑසන වන විට රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල ආසාදිතයන් 5729 දෙනකු තවදුරටත් ප්‍රතිකාර ලබයි.

ඊයේ (09) උදෑසන 6.00න් අවසන් පැය 24 තුළ රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පුද්ගලයන් 740ක් පූර්ණ සුවය ලබා පිටව ගොස් ඇත.

ඊයේ (09) උදෑසන 6.00න් අවසන් පැය 24 තුළ මෙරටින් කොවිඩ් ආසාදිතව පුද්ගලයන් 09 දෙනකු මිය ගොස් ඇති අතර ඔවුන් ගුරුදෙණිය, කොළඹ 15, කොළඹ 12, මීගමුව, කයිට්ස්, කුරුණෑගල, හොරණ, අනුරාධපුරය සහ මාවනැල්ල ප්‍රදේශවල පදිංචි පුද්ගලයන් බව වාර්තා වේ. ඒ අනුව ඊයේ (09) උදෑසන වන විට මෙරටින් කොවිඩ් ආසාදනය වීමෙන් සිදු වූ සම්පූර්ණ මරණ සංඛ්‍යාව 365ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඊයේ (09) දිනයේදී ත්‍රිවිධ හමුදාවෙන් පාලනය කරන නිරෝධායන මධ්‍යස්ථාන 94ක පුද්ගලයන් 9025 දෙනකු නිරෝධායනය වෙමින් සිටී. පෙරේදා (08) දිනයේ පමණක් පීසීආර් පරීක්ෂණ 12,145ක් සිදු කර ඇති බව කොවිඩ් 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය වැඩිදුරටත් සඳහන් කරයි.

## විදේශයන්හි රැඳී සිටි තවත් ශ්‍රී ලාංකිකයෝ 458ක් දිවයිනට

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙරටට පැමිණීමට නොහැකිව විදේශයන්හි රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 458 දෙනකු යළි ශ්‍රී ලංකාවට ගෙන්වාගෙන තිබේ.

ඊයේ (09) පෙරවරු 8.30න් අවසන් වූ පැය 24 තුළ ගුවන් ගමන් 7කින් මේ පිරිස පැමිණි බව ගුවන්තොටුපොළ ආරංචි මාර්ග පවසයි.

එම පිරිස අතරට ජෝර්දානයේ සිට පැමිණි ශ්‍රී ලාංකිකයන් 290ක් සහ කටාර් රාජ්‍යයේ සිට පැමිණි 66 දෙනකු ද ඇතුළත් වෙති.

ඊට අමතරව ගුවන් ගමන් දෙකකින් තවත් ශ්‍රී ලාංකිකයන් 112 දෙනකු රැකියා සඳහා විදේශ රටවල් බලා පිටත්ව ගොස් තිබේ.

## බිබිලෙන් කොවිඩ් ආසාදිතයෝ 6ක්

**ඌව වෙල්ලස්ස විශේෂ ඩී. එස්. ගුණතිලක**

බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයට අයත් මල්ලෑව ප්‍රදේශයෙන් කොවිඩ් ආසාදිතයන් හය දෙනකු පෙරේදා (08) හමුවී ඇතැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ආරංචි මාර්ග සඳහන් කරයි. මේ රෝගීන් වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට මහ රෝහලට යවා ඇත.

# ලොව පුරා කොවිඩ් ආසාදිත ගණන ලක්ෂ 1,070 ඉක්මවයි

**මහින්ද අලුත්ගෙදර**

ලොව පුරා කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වයිරසය ආසාදනය වූවන් සංඛ්‍යාව ලක්ෂ 1,070 ඉක්මවා ගොස් තිබේ.

ලෝකයේ රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 218කින් වාර්තා වන කොවිඩ් වසංගතය හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 2,336,650ක් වන අතර මුළු ආසාදිතයන් සංඛ්‍යාව 107,019,170කි. ඒ අතරින් 78,887,385 දෙනකු පූර්ණ සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව දෙකෝටි හැත්තෑ ලක්ෂය ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව අමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව 27,700,629ක් වන අතර එරට මරණ සංඛ්‍යාව 470,000 ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව එරට මිය ගිය සංඛ්‍යාව 476,405ක් වෙයි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 10,847,790ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 9,550,301ක් ලෙස වාර්තා වන අතර රුසියාව, ප්‍රංසය, එක්සත් රාජධානිය, ඉතාලිය, කොලොම්බියාව, මෙක්සිකෝව, ස්පාඤ්ඤය, ආර්ජන්ටිනාව, ජර්මනිය, ඉරානය, පෝලන්තය, දකුණු අප්‍රිකාව, යුක්රේනය, පේරු, නෙදර්ලන්තය රටවල ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 10 ඉක්මවා ගොස් ඇත.

මේ වන විට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් ලොව පුරා මිය ගිය සංඛ්‍යාව දෙලක්ෂයකට වැඩි පිරිසක් අමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර ඉන්දියාවෙන් සහ බ්‍රසීලයෙන් ලක්ෂයකට වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා වෙයි. ඒ අනුව බ්‍රසීලයේ මරණ සංඛ්‍යාව 232,248 වන අතර ඉන්දියාවේ මරණ සංඛ්‍යාව 155,195කි.

අමෙරිකා එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ සංඛ්‍යා ලේඛන අනුව කොවිඩ් හේතුවෙන් ස්පාඤ්ඤයේ 62,295ක්, ඉතාලියේ 91,580ක්, ප්‍රංශයේ 79,423ක්, බ්‍රිතාන්‍යයේ 112,798ක්, බ්‍රසීලයේ 232,248ක්, රුසියාවේ 77,068ක්, බෙල්ජියමේ 21,423ක්, ඉරානයේ 58,536ක්, නෙදර්ලන්තයේ 14,428ක්, මෙක්සිකෝවේ 166,731ක්, කැනඩාවේ 20,835ක් සහ ජර්මනියේ 62,597ක් ලෙස මරණ වාර්තාවී තිබේ.

මේ වන විට ලොව වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන රටවල් ලැයිස්තුවේ තවදුරටත් පෙරමුණේ පසුවන්නේ අමෙරිකාව වන අතර ඉන්දියාව දෙවැනි ස්ථානයේත්, බ්‍රසීලය තෙවැනි ස්ථානයේත්, රුසියාව සිවු වැනි ස්ථානයේ හා එක්සත් රාජධානිය පස් වැනි ස්ථානයේත් පසු වෙයි.

මේ අතර එක්සත් රාජධානියෙන් හමු වූ කොරෝනා වයිරස ප්‍රභේදය මේ වන විට එක්සත් ජනපදයේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බව නව පර්යේෂණයකින් හඳුනාගෙන තිබෙන අතර එම ප්‍රභේදය හේතුවෙන් අමෙරිකාවෙන් හමු වන නව කොරෝනා ආසාදිතයන් දින නවයක් වැනි කාලයකදී දෙගුණයක් වන බව එයින් හෙළිවී ඇති බව පර්යේෂකයෝ පවසති.

එම නව ප්‍රභේදය B 1.1.7 ලෙස නම් කර ඇති අතර ඒ හේතුවෙන් ලොව පුරා එන්නත්කරණ වැඩසටහනට දැඩි බලපෑමක් ඇතිව තිබෙන බවට වාර්තා වන අතර ලබන මාර්තු වන විට ප්‍රමුඛතම ප්‍රභේදය එය වීමට ඉඩ ඇති බව ද සඳහන් වේ.

## කාත්තන්කුඩියේ ග්‍රාම සේවා වසම් 10 හුදෙකලා බවින් නිදහස්

**මහින්ද අලුත්ගෙදර**

කෝවිඩ් 19 වසංගතය පාලනය කිරීමට කාත්තන්කුඩිය ප්‍රදේශයේ හුදෙකලා කර තිබූ ග්‍රාම සේවා වසම් 10ක් ද හුදෙකලා බවින් නිදහස් කිරීමට රජය තීරණය කරයි.

ඒ අනුව කෝවිඩ් මර්දනය කිරීමේ ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපතිවරයාගෙන් නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය සිදු කළ විශේෂ ඉල්ලීමකින් අනතුරුව ඊයේ (09) සිට ක්‍රියාත්මක වන පරිදි මේ තීරණය ගෙන තිබේ.

හුදෙකලා බවින් ඉවත් කළද මේ ප්‍රදේශවල ජීවත්වන ජනතාව දැඩි සෞඛ්‍යාරක්ෂිතව සිය එදිනෙදා ජීවන කටයුතු සිදු කර ගෙන යන මෙන් ආණ්ඩුකාරවරිය ඉල්ලීමක් කරයි.

යම් ලෙසකින් සෞඛ්‍ය නීතිරීතිවලට අනුගත නොවී කටයුතු කළහොත් යළිත් එම ප්‍රදේශවලට දැඩි නීති පැනවීමට සිදු වන බවද ආණ්ඩුකාරවරිය පැවැසුවාය.

## සැරයන්වරයකුට කොරෝනා කළුතර රෝහල් පොලිසිය වසයි

**කළුතර මධ්‍යම සමූහ**

දකුණු කළුතර පොලිසියට අනුයුක්තව කළුතර, නාගොඩ රෝහල් පොලිසියේ සේවය කළ පොලිස් සැරයන්වරයකු කොරෝනා ආසාදිතයකු බවට හඳුනා ගැනීමත් සමඟ රෝහල් පොලිසිය තාවකාලිකව වසා දැමීමට පියවර ගෙන ඇත.

එම රෝහල් පොලිසියේ සේවය කළ සෙසු පොලිස් නිලධාරීන් නිරෝධායනයට යොමු කර තිබේ. මෙසේ වසා දැමුණු රෝහල් පොලිසිය සම්පූර්ණයෙන්ම විසබීජහරණය කිරීමෙන් පසු වෙනත් නිලධාරීන් යොදවා නැවත විවෘත කරන බව කළුතර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනෙත් ශාන්ත මහතා ඊයේ (09) කීය.

## මොනරාගල එකම පවුලේ හතරකට කොවිඩ්

**ඌව වෙල්ලස්ස විශේෂ - ඩී. එස්. ගුණතිලක**

මොනරාගල, විහාරමුල්ල පදිංචි එකම පවුලේ හතර දෙනකුට කොවිඩ් ආසාදනයවී ඇති බව පෙරේදා (08) සිදු කළ පීසීආර් පරීක්ෂණයේදී අනාවරණයවී ඇත.

මේ නිවෙසේ ගෘහ මූලිකයා මොනරාගල නගරයේ වෙළෙඳසලක් පවත්වාගෙන යන 48 හැවිරිදි අයෙකි. ඔහුගේ බිරියටත්, දියණියටත්, නිවසේ සිටින 81 හැවිරිදි කාන්තාවකටත් මෙලෙස කොවිඩ් ආසාදනයවී ඇත.

ඔවුන් සිවු දෙනාම හම්බන්තොට මහ රෝහලට ප්‍රතිකාර සඳහා යොමු කර ඇත.

## යාපනයෙනුත් කොවිඩ් මරණයක්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනය දිස්ත්‍රික්කයේ පළමු කොරෝනා මරණය පෙරේදා (08) වාර්තා වූ බව උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඒ. කේතීස්වරන් මහතා පැවැසීය. ඒ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය. 'යාපනයේ වේලනෙයි ප්‍රදේශය වයස අවුරුදු 73ක පුද්ගලයකු යාපනය ශික්ෂණ රෝහලේදී ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගියා. මේ පුද්ගලයා වෙනත් අසනීපයකට කොළඹ පෞද්ගලික රෝහලකින් ප්‍රතිකාර ගෙන තිබෙනවා. පසුව ඔහු අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ලබමින් සිටියදී යාපනය ශික්ෂණ රෝහලට මාරු කර තිබෙනවා. එහිදී ප්‍රතිකාර ලබමින් සිටියදී ඔහු මිය ගියා.

## පොළොන්නරුව මහ රෝහලේ කොරෝනා එන්නත් දීම ඇරඹේ

**පොළොන්නරුව දිස්ත්‍රික් සමූහ - ඇම්. පී. සරත්**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොරෝනා මර්දන එන්නත් දීමේ කටයුතු පසුගිය 30 වැනිදා පොළොන්නරුව මහ රෝහලේදී ආරම්භ කරන ලදි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයට කොරෝනා මර්දන එන්නත් 4070ක් දී ඇති බවත්, එන්නත් කිරීමට 3960 දෙනකු සිටින බවත්, වෛද්‍යවරුන්ට, හෙද හෙදියන්ට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ සියලුම රෝහල් කාර්ය මණ්ඩලයට එන්නත් දීම රෝහලේ ස්ථාන දෙකකදී සිදු වන බවත්, රෝහලේ හෙදියන් විසින් එන්නත් දීම සිදු කළ බවත් පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඩබ්ලිව්. එම්. එම්. කුමාරවංශ මහතා කීය.

## නිරෝධායන රීති කඩ කළ ආයතන 38ක් පෙරේදා දිනයේ හඳුනා ගැනේ

**රක්ෂණ ශ්‍රියන්ත**

රාජ්‍ය හා පෞද්ගලික ආයතන නිරෝධායන රීතීන්ට අනුගතව කටයුතු කරන්නේ දැයි සෞඛ්‍ය අංශ සහ පොලිසිය එක්ව සිදු කරන මෙහෙයුමේදී පෙරේදා (08) ආයතන 447ක් පරීක්ෂාවට ලක් කර ඇති අතර එයින් ආයතන 38ක් නිරෝධායන රීතීන්ට පටහැනිව කටයුතු කරන බවට හඳුනාගෙන තිබේ.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා මෙසේ පැවැසීය.

'නිරෝධායන රීතීන්ට පටහැනිව කටයුතු කරන ආයතනවල කළමණාකාරීත්වයට හෝ හිමිකරුවන්ට එරෙහිව පොලිසිය නඩු පැවරීමට කටයුතු කරනවා. ජනවාරි මස 10 වැනි දින සිට මේ දක්වා කාලයේ නිරෝධායන රීතීන්ට අනුගතව රාජ්‍ය හා පෞද්ගලික ආයතන කටයුතු කරන්නේද යන්න පිළිබඳව ආයතන 12,012ක් පරීක්ෂාවට ලක් කර තිබෙනවා. එයින් ආයතන 1389ක් නිරෝධායන රීතීන්ට පටහැනිව කටයුතු කර ඇති බවට හඳුනාගෙන තිබෙනවා.

නිරෝධායන රීතීන්ට පටහැනිව කටයුතු කළ රාජ්‍ය හා පෞද්ගලික ආයතන 1300කට නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ නඩු පවරා තිබෙනවා.'

## සෞඛ්‍ය රීති කැඩූ 3056ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

මුහුණු ආවරණ නොපලඳීම සහ දුරස්ථ භාවය තබා නොගැනීම සම්බන්ධයෙන් පුද්ගලයන් 15 දෙනකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මුහුණු ආවරණ නොපැලඳීම සහ දුරස්ථ භාවය තබා නොගැනීම සම්බන්ධයෙන් මේ වන විට පුද්ගලයන් 3056ක් අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

සෑම විටකම නිවෙසින් බැහැරව පොදු ස්ථානවලට ගමන් කරන්නේ නම් මුහුණු ආවරණ පැලඳීම සහ දුරස්ථ භාවය තබා ගත යුතු බවත්, නිරෝධායන රීතීන්ට අනුගතව කටයුතු කරන ලෙසත්, එසේ කටයුතු නොකරන පුද්ගලයන් පිළිබඳ පොලිසිය දැඩි විමසිල්ලෙන් පසුවන බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් පැවැසීය.

## සැඟව සිටි කොරෝනා ආසාදිත යුවළ පොතුඅටවනදී අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

කොරෝනා ආසාදිත බවට තහවුරු වීමෙන් පසුව පළා ගොස් සැඟව සිටි යුවළක් කොස්වත්ත, පොතුඅටවන ප්‍රදේශයේදී පෙරේදා (08) කොස්වත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන රෝහල්ගත කර තිබේ.

කොස්වත්ත පොලිසිය වෙත සෞඛ්‍ය බලධාරීන් විසින් දෙන ලද තොරතුරක් මත කොස්වත්ත පොලිසිය සිදු කළ විශේෂ මෙහෙයුමකින් අනතුරුව ඔවුන් අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

ඒ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මෙසේ ද කීය.

'එලෙස අත්අඩංගුවට පත්ව තිබෙන්නේ හැඳල, වත්තල ප්‍රදේශයේ පදිංචි 25 හැවිරිදි තරුණයෙක්. එම පුද්ගලයා ජා - ඇල ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක සේවයේ නියුතු අයෙක්. එහිදී සිදු කළ පීසීආර් පරීක්ෂණයකින් අනතුරුව ඔහු කොරෝනා ආසාදිත බවට තහවුරුවී තිබෙනවා. ආසාදිත බවට තහවුරු වීමෙන් අනතුරුව එම පුද්ගලයා සිය බිරිය සමඟ කොස්වත්ත ප්‍රදේශයේ නිවෙසක සැඟව සිටියදී මෙලෙස පොලිස් භාරයට ගෙන තිබෙනවා. අනතුරුව අදාළ පුද්ගලයා දංකොටුව රෝහල වෙතත්, කාන්තාව මාරවිල රෝහල වෙතත් ඇතුළත් කළා.

# කොවිඩ් එන්නත්කරණයේදී පෞද්ගලික අංශයේ සුව සේවකයන්ට ද ප්‍රමුඛත්වය දෙන්න

### පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමයේ සභාපති ආචාර්ය ලකිත් පීරිස්

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් 19 ජාතික එන්නත්කරණ වැඩසටහනේදී පෞද්ගලික අංශයේ සුව සේවකයන්ට ද ප්‍රමුඛත්වය දෙන ලෙස පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමය (APHNH) රජයෙන් ඉල්ලීමක් කරයි.

ඒ පිළිබඳව පෞද්ගලික රෝහල් හා සාත්තු නිවාස සංගමයේ සභාපති ආචාර්ය ලකිත් පීරිස් මහතා වැඩිදුරටත් මෙසේ අදහස් දැක්වීය.

'මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින කොවිඩ් ජාතික එන්නත්කරණ වැඩසටහනේදී රජයේ සුව සේවකයන්ට හා සමානව පෞද්ගලික අංශයේ සුව සේවකයන්ටත් ප්‍රමුඛත්වය දෙන්න. පෞද්ගලික සුව සේවකයන් තවමත් රජයේ මේ එන්නත්කරණ වැඩපිළිවෙළ යටතේ ලැයිස්තු ගත කර නෑ. මෙරට කොවිඩ් වසංගත ප්‍රතිචාරයේදී පෞද්ගලික අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කර තිබෙනවා.

කොවිඩ් වයිරසය පැතිරීම සහ අවදානම අවම කිරීමට රජයේ සුව සේවා ආයතන කැපවී ක්‍රියා කරමින් සිටින අතරතුර රෝගීන්ට නිසි වේලාවට අඛණ්ඩව ප්‍රතිකාර දීමට පෞද්ගලික අංශය සමත් වුණා.

කොවිඩ් වසංගතයට එරෙහි සටනේදී පෞද්ගලික සුව සේවකයන් ද පෙරමුණෙන් සිටිනවා. රාජ්‍ය අංශයේ සුවවිරුවන් මෙන්ම වයිරසයට නිරාවරණය වීමේ අවදානමක් ඔවුන්ට ද තිබෙනවා. අපගේ සුව සේවකයන් කොවිඩ් වසංගත ප්‍රතිචාරයේ ඉතා වැදගත් අංශයක්. එනිසා වත්මන් එන්නත්කරණ වැඩසටහනට රජය ඔවුන්ට ද ප්‍රමුඛත්වය දිය යුතුයි. පෞද්ගලික සුව සේවකයන්ට එන්නත් දීමට අවශ්‍ය දත්ත හා තොරතුරු APHNH සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව (PHSRC) සතුව පවතිනවා. එනිසා ඔවුන් ද මේ වැඩසටහනට ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

පසුගිය මාස කිහිපය පුරාවට මෙරට කොවිඩ් මර්දනය කිරීමේ සහ එයින් ආරක්ෂා වීමේ ප්‍රයත්නයන් සඳහා අපගේ සාමාජික රෝහල් හා ඉදිරියෙන් සිටින සුව සේවකයන් කැපී පෙනෙන දායකත්වයක්දී තිබෙනවා.



කොවිඩ් හේතුවෙන් රජය මත පැටවී තිබෙන බර අවම කිරීමට අප විසින් අතරමැදි සෞඛ්‍ය සේවා පහසුකම් සැලසුවා. සිදු කරන පීසීආර් පරීක්ෂණ සංඛ්‍යාව ද වැඩි කළා. එනිසා මේ එන්නත්කරණ වැඩසටහනේදී රජයේ සේවකයන් සමඟින් අපගේ සේවක මණ්ඩලයටත් ප්‍රමුඛත්වය දිය යුතුයි.

දිවයින පුරා කොවිඩ් එන්නත්කරණ වැඩපිළිවෙළේ පරිපාලන කටයුතු සඳහා රජයට සහාය වීමට පෞද්ගලික අංශය සූදානමින් සිටිනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයට අනුව 2021 පෙබරවාරි පළමු වැනිදා වන විට පුද්ගලයන් 100,000කට වැඩි සංඛ්‍යාවකට රජයේ කොවිඩ් ජාතික එන්නත්කරණ වැඩසටහන යටතේ එන්නත දී ඇති බව වාර්තා වෙනවා.

පසුගිය දින කිහිපය පුරාවට රජය හා සෞඛ්‍ය අංශය විසින් මේ එන්නත්කරණ ක්‍රියාවලිය පරිපාලනය කළ ආකාරය ඉතා ප්‍රශංසනීයයි. පෞද්ගලික අංශය ද මේ ක්‍රියාවලියට මැදිහත් වූ පසු දිවයින පුරා වැඩි මාත්‍රා ගණනක් දීමට හැකි වෙනවා වගේම ශ්‍රී ලංකාවේ මේ එන්නත්කරණ වැඩසටහන කාර්යක්ෂම ඉදිරියට පවත්වා ගෙන යෑමටත් හැකි වෙනවා. ඉදිරි සති කිහිපයේ මෙරටට එන්නත් මාත්‍රා මිලියනයක් ලැබීමට නියමිතයි. ඒ සඳහා එන්නත්කරණ සේවා වැඩි කිරීම ද අවශ්‍යයි.'

## නිවෙස්වල මිය ගිය කළුතර 2කටත් කොවිඩ්

**කළුතර මධ්‍යම සමූහ**

නිවෙස්වල මිය ගොස් සිටි කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනකු කොරෝනා ආසාදිතයන් බව පෙරේදා (08) හඳුනාගෙන තිබේ.

එයින් එක් අයකු දකුණු කළුතර පොලිස් වසමේ කලීල් ප්‍රදේශයේ පදිංචිව සිටි 68 හැවිරිදි අයකු වන අතර අනෙක් තැනැත්තා උතුරු කළුතර පොලිස් වසමේ සිරිනිවාස පාරේ පදිංචිව සිටි 81 හැවිරිදි පුද්ගලයෙකි.

## කරාපිටිය ශික්ෂණ රෝහලේදී මිය ගිය අයකුට කොවිඩ්

**කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට**

කරාපිටිය ශික්ෂණ රෝහලේ 19 වැනි වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගිය පුද්ගලයකුට කොරෝනා ආසාදිත බවට තහවුරුවී ඇතැයි එම රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී සමාධි දන්දෙණියආරච්චි මහත්මිය පවසයි.

මෙලෙස මිය ගොස් ඇත්තේ දංගෙදර කෝන්ගහ පාරේ පදිංචි 81 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. ඔහු දින 05ක කාලයක් 19 වාට්ටුවේ ප්‍රතිකාර ලබමින් සිටියදී පසුගියදා (07) මිය ගොස් තිබේ. මිය ගිය පසු ගත් පීසීආර් පරීක්ෂණයේ ප්‍රතිඵල පෙරේදා (08) ලැබී තිබූ අතර එහිදී තහවුරුවී ඇත්තේ ඔහු කොරෝනා ආසාදනය වූ පුද්ගලයකු බවයි.

දීර්ඝ කාලයක් පුරා පැවති හෘද රෝග තත්ත්වය සහ කොරෝනා ආසාදනය වීමෙන් ඇති වූ සංකූලතා හේතුවෙන් මරණය සිදුව ඇති බව අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සිදු කළ වෛද්‍ය දන්දෙණියආරච්චි මහත්මිය පවසයි.

දේහය පිළිබඳ ආදාහන කටයුතු පෙරේදා (08) සවස දඩල්ල ආදාහනාගාරයේදී සිදු කිරීමට නියමිතව තිබිණි.

## ඉඹුල්ගොඩින් තවත් කොවිඩ් ආසාදිතයෝ දෙදෙනෙක්

**සොරණාතොට සමූහ - සී .ගමගේ**

බදුල්ල, බදුලුපිටිය සහ ඉඹුල්ගොඩ ප්‍රදේශයේදී කෝවිඩ් ආසාදිත පාසල් සිසුවෙක් සහ තරුණියක් පසුගිය 07 වැනිදා සොයා ගත් බව බදුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක පියල් පද්ම මහතා පවසයි.

ඉකුත්දා බදුල්ල බදුලුපිටිය ප්‍රදේශයෙන් හමු වූ කෝවිඩ් ආසාදිතයකුගේ පළමු පෙළ ආශ්‍රිතයන් ලෙස හඳුනා ගත් මොවුන් දෙදෙනා පීසීආර් පරීක්ෂණයට භාජනය කර නිරෝධායනයට ලක් කර සිටියදී කෝවිඩ් ආසාදිත බවට අනාවරණයවී ඇත.

මේ කෝවිඩ් ආසාදිත සිසුවා සහ තරුණිය ප්‍රතිකාර සඳහා බිඳුණුවැව සහ කහවත්ත කෝවිඩ් ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කළ බව ඒ මහතා වැඩිදුරටත් පැවැසීය.

## දොම්පෙන් ආසාදිතයෝ 881ක්

**කිරිදිවැල සමූහ - ජී. එස්. තැලිගම**

දොම්පෙ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 133කින් කොරෝනා රෝගීන් 881දෙනකු හඳුනාගෙන ඇත. මේ හේතුවෙන් පවුල් 2580ක 9980 දෙනකු ස්වයං නිරෝධායනයට ලක් කර ඇත. ඒ අතරින් පුගොඩ කුමාරිමුල්ල ග්‍රාමසේවා වසමෙන් රෝගීන් 171ක් මේ වන විට වාර්තාවී ඇත.

ඊට අමතරව කොරෝනා රෝගීන් වැඩිම සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ මැණික්ලන්ද, නාම්පොල, කළුකොඳයාව, යකඹේ, පට්ටියගම, මීගහවත්ත, පැල්පිට, පැපිලයවල, දියවාල, වේරහැර, රංවල, කුට්ටිවිල, වතුරුගම ග්‍රාම සේවා වසම්වලින් බව ප්‍රාදේශීය ලේකම් නිශ්ශංකආරච්චි මහතා පැවැසීය.

# බදුල්ල මහ රෝහලට තවත් පීසීආර් යන්ත්‍රයක් අත්‍යවශ්‍යයි

### බදුල්ල වසංගත රෝග විශේෂඥ වෛද්‍ය ශාන්ත ගමගෙදර

**ඌව පළාත් සමූහ - ප්‍රසන්න පත්මසිරි**

ඌව පළාතේ කොරෝනා ආසාදිත යැයි සැක පුද්ගලයන්ගෙන් ලබා ගන්නා ජෛව සාම්පල් නියැදි පරීක්ෂා කිරීමට දින තුනක් පමණ ප්‍රමාද වන නිසා බදුල්ල මහ රෝහලට තවත් පීසීආර් යන්ත්‍රයක් අත්‍යවශ්‍ය බව බදුල්ල වසංගත රෝග විශේෂඥ වෛද්‍ය ශාන්ත ගමගෙදර මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ ඌව ආණ්ඩුකාර කාර්යාලයේ ඊයේ (09) ආණ්ඩුකාර ඒ. ජේ. එම්. මුසම්මිල් මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම පැවති කොවිඩ් මර්දන කමිටු රැස්වීමේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීවේය.

'මේ වන විට බදුල්ල මහ රෝහලේ පීසීආර් පරීක්ෂණාගාරයේ ජෛව සාම්පල් 800ක් පමණ ගොඩ ගැසී තිබෙනවා. පරීක්ෂණ කරන්න තියෙන්නේ එක යන්ත්‍රයයි. පරීක්ෂණ ප්‍රතිඵල එන්න කල් යද්දී ජනතාව එක තැන ඉන්නේ නෑ. හැම තැනම ඇවිදිනවා. මේක ඉතාම භයානකයි. රිදීමාලියද්ද ගාමන්ට් එකේ සේවකයන් විශාල පිරිසකගේ පීසීආර් පරීක්ෂණ ප්‍රතිඵල තාම දී නෑ.

බදුල්ල මහ රෝහලේ තිබෙන පීසීආර් යන්ත්‍රයෙන් දිනකට කරන්නේ පරීක්ෂණ 300ක් පමණයි. නමුත් දිනකට ඌව පළාතෙන් කොරෝනා ආසාදිතයන්ගේ සහ සමීපතයන්ගේ ජෛව සාම්පල් 400ක් විතර පරීක්ෂණ කටයුතු සඳහා රෝහලට එනවා. මේක විශාල ප්‍රශ්නයක්.'

# අද සිට අඩු ආදායම්ලාභී පවුල්වලට නොමිලේ විදුලිය



ඇමැති ඩලස් අලහප්පෙරුම

**චන්දිමා කරුණාරත්න**

අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලේ විදුලි සබඳතා දීම අද (10) සිට ආරම්භ කිරීමට විදුලිබල අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා මෙසේ පැවැසීය.

මෙහි පළමු අදියර ලෙස මාතර දිස්ත්‍රික්කයෙන් විදුලි සබඳතා දීමට කටයුතු කරනවා. අප්‍රේල් මාසයේදී සම්පූර්ණයෙන් විදුලි සබඳතා දී අවසන් කිරීමට පියවර ගෙන තිබෙනවා.

මාතර දිස්ත්‍රික්කයට අයත් තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ජනතාවගේ විදුලිය, ජලය සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යය කඩිනම් කළ යුතුයි.

මේ වසර අවසන් වීමට ප්‍රථම රට විදුලියෙන් ඒකාලෝක කිරීමේ වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක වන අපේ අමාත්‍යාංශය මේ වන විට එහි අවසන් අදියරට පැමිණ සිටිනවා. දිළිඳුබවේ තීරුවට අයත් වන ජනතාවට සහනයක් වෙමින් ඔවුන්ට නොමිලේ විදුලි සබඳතා දීමේ ප්‍රතිපත්තිමය තීන්දුවකට එළැඹ තිබෙනවා. ඒ අනුව මේ වන විට දිවයිනේ විදුලිය නොමැති පවුල් 118,000ක් අතරින් තිහගොඩ මෙතෙක් විදුලිය පහසුකම් නොලැබූ පවුල් 33කට නොමිලේ විදුලිය දීම අද සිට ආරම්භ කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ අංශ වෙත උපදෙස් දුන්නා. අදාළ පිරිස අතරින් දිළිඳුබවේ උපරිමයේ සිටින පවුල්වල නිවාස වයරින් කිරීම පවා සහනදායි ක්‍රමයක් යටතේ සිදු කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.'

## ශ්‍රීකාන්තගේ ශ්‍රීදූපත



• පීඩිත ජනතාව වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී ඉන්නව කියල සජිත් කියන්නෙ බං !

• ඒ වුණාට සර්, පීඩිත ජනතාව සජිත් වෙනුවෙන් පෙනී හිටියෙ නෑනෙ ?

## වාලම්පුරියක් සමඟ අයෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

විකිණීමට වාලම්පුරියක් සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයකු කොළඹ කොටුව පොලිස් වසමේ ගාලු මුවදොර ඉදිරිපිටදී පෙරේදා (08) පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පිරිසක් සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

පොලිස් භාරයට ගෙන ඇති වාලම්පුරිය කිලෝ 01 ග්‍රෑම් 066ක් බර වාමාවෘත වාලම්පුරියකි.

සැකකරු සහ වාලම්පුරිය වැඩිදුර විමර්ශන කටයුතු සඳහා කොළඹ කොටුව පොලිස් ස්ථානය වෙත භාරදී තිබේ.

## ගීතිකාව

ලියවිලි ලියා තෙත හිඳෙනා තුරු පෑනේ  
හඬ දී කෑ ගසා රැඳෙමින් එක රෑනේ  
පෙනි පෙනි බොඳ වෙමින් තිබිලා ඇස් මානේ  
අවසන සැබෑ විය ඒ දහසේ හීනේ

ගුණදාස ගෝනා

## අද නාට්ටුව

බඩු විසි හතක මිල අඩු කර දෙන වගට  
බන්දුල ඇමැති පවසයි නොදැනී ඇඟට  
නැතිනම් ඒ මිලට ගිය විට කඩ ළඟට  
වේවිද? එයත් ඉනි කැපුවා මෙන් ගඟට

මිල වැඩි වුණා නම් බඩු හැම තැනම තිබේ  
එළියට ඇදෙයි හංගා ගත් තොගය ඉබේ  
මත වාදයෙන් ඇතිමුත් පිල් අතර හබේ  
ඇති හැකි අයට ඔය හැම සම්පතම ලැබේ!

රටේමුල්ලේ මුදන්නායක






දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 පෙබරවාරි 10 බදාදා

# වතු කම්කරුවන්ගේ ජයග්‍රහණය

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප පිළිබඳ ආරවුල ස්ථාවර විසඳුමක් කරා පැමිණ තිබේ. ඒ අනුව වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් දහසකි යන්න නීතිගත වී ඇත. එය මඟ හැරීමේ හැකියාවක් හාම්පුතුන්ට නැත. නීතිය ක්‍රියාත්මක නොකරන හාම්පුතුන්ගේ වතු රජයට පවරා ගැනීමට ක්‍රියා කරන බවට ද සඳහනක් ඇත. වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් දහසකි යන්න සාධාරණ තීන්දුවකි. ඒ මගින් වතු හිමියන්ට බරපතළ අලාභයක් සිදුවන්නේ නැත. හාම්පුතුන්ගේ සාකච්ඡාවලින් හෙළිදරව් වන්නේ වැඩිදෙනකු දහසක වැටුප මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන්නේ නැති බවය. තත්ත්වය කුමක් වුව වතු කම්කරුවන් දීර්ඝ කාලයකට පසු තම ඉල්ලීම් දිනාගෙන ඇත.

කම්කරුවන්ගේ ගැටලු ඡන්ද කාලයට ඉස්මතු වන අතර පසුව ක්‍රමයෙන් යට යන්නේ ය. ගිය ආණ්ඩුව වතු කම්කරුවන්ගේ ගැටලු ගැන සාකච්ඡා කොට පසුව එය අතහැර දැම්මේය. රුපියල් දහසේ දෛනික වැටුප වත්මන් ආණ්ඩුවේ ජනතා පොරොන්දුවකි. එය අය වැය යෝජනාවලට ද ඇතුළත් කර තිබිණි. ඒ අනුව ක්‍රියා කළ කම්කරු අමාත්‍යාංශය හාම්පුතුන් සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්වීය. කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කොට අනුමැතිය ගත්තේය. අවසන් ලෙස පඩි පාලක සභාව ඔස්සේ අදාළ වැටුප නීතිගත කිරීමට පියවර ගත්තේය. රුපියල් දහසේ දෛනික වැටුප අරගලයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකිය. මේ ජයග්‍රහණයේ ගෞරවයෙන් සැලැකිය යුතු ප්‍රමාණයක් කම්කරු අමාත්‍යවරයාට හිමි විය යුතුය.

වත්මන් රාජ්‍ය තන්ත්‍රය ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් ලෙස හැඳින්වීම නිවැරැදිය. කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට බදු දීම නැවතුණේ එම ඇහුම්කන් දීම නිසාය. අන්තර්ජාතික වශයෙන් සිදුවන අහිතකර බලපෑමට මුහුණ දෙමින් නැගෙනහිර පර්යන්තය වරාය අධිකාරිය යටතේ පවත්වා ගැනීමට රජය තීරණය කළේය. රටේ කම්කරු ප්‍රජාව හා ගොවි ජනතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ක්‍රියාත්මක වීම රජයේ තවත් ප්‍රතිපත්තියකි. වතු කම්කරුවන්ගේ දෛනික වැටුප ඉහළ දැමීමට අමතරව තවත් සුභසාධක කටයුතු ගණනාවක් ඉටුකර දීමට රජය ක්‍රියා කරගෙන යයි. නිවාස, පාසල්, වෘත්තීය අධ්‍යාපනය මේ අතර පවතී. වතු කම්කරුවාට හොඳ ආදායමක් සමඟ සමාජ පිළිගැනීමක් දීම රජයේ ඉලක්කය වී ඇත.

ශ්‍රී ලංකාවේ දේශීය ගොවියාට ඉහළ ජීවන තත්ත්වයක් හිමි වූයේ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමය තුළදීය. එහෙත් සමස්ත ආර්ථික ක්‍රියාවලිය හා ගෝලීය ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ඉදිරියට යෑමට තරම් එදා ක්‍රමවේද ශක්තිමත් වූයේ නැත. 1977න් පසු සියල්ල කනපිට හැරුණු අතර, දේශීය ගොවියා නැත්තටම නැති විය. ශ්‍රී ලංකාව කාර්මික හා සේවා ආර්ථිකයක් සහිත රාජ්‍යයක් බවට පත් කිරීම ලිබරල් ආර්ථික නායකයන්ගේ අරමුණ විය. එය අපගේ කෘෂිකර්මය ද, දේශීය කර්මාන්තය ද දුර්වල කළේය. වත්මන් ආණ්ඩුව ගොවියා ශක්තිමත් කිරීමට යන්නේ මේ සියල්ල හොඳින් වටහාගෙන ශක්තිමත් වැඩපිළිවෙළක් යටතේය. එහි අලුත්ම පියවර වන්නේ දේශීය කිරි ගොවියාට රුපියල් ලක්ෂ දහයක ණයක් ගැනීමට පහසුකම් සැලැසීමය.

ලෝකයේ හොඳම ස්වාභාවික තේ හෝ හොඳම ස්වාභාවික රබර් සැපයුම්කරුවා හැටියට ශ්‍රී ලංකාව නමක් දිනාගෙන සිටියේය. අපේ වතු වගා ගැන ද ඒවායෙහි නිෂ්පාදන තාක්ෂණය ගැන ද ලෝක නායකයෝ පවා පුදුම වූහ. සිංගප්පූරුවේ හිටපු නායක ලීක්වාන් යූ පවා ඒ ගැන සඳහන් කර තිබේ. එහෙත් කලින් කලට එකිනෙක ආණ්ඩු විසින් ගනු ලැබූ වැරැදි තීන්දු තීරණ නිසා අපේ තේ මෙන්ම රබර් ද ලෝක වෙළෙඳපොළ තුළ පසුපසට ගියේය. ලෝක වෙළෙඳපොළෙහි තේ සැපයුම ඉන්දියාව හා කෙන්යාව පැහැරගත්හ. ස්වාභාවික රබර් වෙනුවට කෘත්‍රිම රබර් නිෂ්පාදනයට සමහර රටවල් උත්සුක වූහ. චීනය වැනි රටවල් රබර් වවන්නට පටන් ගත්හ. ඊට තරගයක් දීමට ශ්‍රී ලංකාව ඉදිරිපත් වූයේ නැත. මේ අනුව තේ හා රබර් නිෂ්පාදනයේ වටිනාකම පල්ලම් බැස්සේය.

නිෂ්පාදන කර්මාන්ත සාර්ථකව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන සාධක කිහිපයක් කෙරෙහි අවධානය යොමුකළ යුතුය. ලෝක වෙළෙඳපොළෙහි ප්‍රවණතා, කළමනාකරණ නිපුණතා, නව තාක්ෂණය හා කම්කරු ප්‍රජාවගේ තෘප්තිමත්භාවයත් ඊට ඇතුළත්ය. අපේ ආණ්ඩු ලෝක ප්‍රවණතා ගැන බලන්නේ නැත. කම්කරුවන් ගැන බලන්නේ ද නැත. බොහෝ තීන්දු තීරණ ගෙන ඇත්තේ හිමිකරුවන් තෘප්තිමත් වන ආකාරයෙන්ය. ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් සලකනු ලබන්නේ අසංවිධානාත්මක කම්කරු ප්‍රජාවක් හැටියටය. එය වෙනස් කිරීමට උත්සුකවූ සංවිධානය ලෙස සැලකිය හැක්කේ ලංකා කම්කරු කොංග්‍රසයයි. දහසක දෛනික වැටුප ලංකා කම්කරු කොංග්‍රසයේ ඉල්ලීමකි. ඒ අනුව කම්කරු කොංග්‍රසය ද ජයග්‍රහණයක් ලබා තිබේ.

විවිධ දේශපාලන විවේචන, මඩ ප්‍රහාර හා චෝදනා ඉදිරිපත් වන්නේ වුව ජනතාවගේ පැත්තෙන් බලන කල මේ ආණ්ඩුව පැවැති ආණ්ඩුවලට වඩා රටට වැඩ කරයි. ජනතාවට ලබාදුන් පොරොන්දු එකින් එක ඉටු කරයි. කොවිඩ් ලෝක වසංගත තත්ත්වය යටතේ වුව මෙබඳු වැඩ කොටසක් ඉටු කිරීම විශේෂිතය. කොවිඩ් - 19 හේතුවක් කරගෙන ආර්ථිකය වසා දැමීමට ආණ්ඩුව ක්‍රියා කළේ නැත. ජනතාව වෙනුවෙන් දෙන සහන කපා හරින්නට ක්‍රියා කළේ ද නැත. සෑම සමාජ කණ්ඩායමක් කෙරෙහිම අවධානය යොමු කිරීමත් රාජ්‍ය පාලනයෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. වතු කම්කරුවන්, ගොවියන් ගැන පමණක් නොව, පෞද්ගලික බස් හිමියන් ගැන ද ආණ්ඩුවේ අවධානය යොමු වී ඇත.

රටේ පැවැති සෑම කම්කරු සටනක්ම සුබදායක ලෙස අවසන් වී නැත. 1980 ජූලි වර්ජනය අවසන් වූයේ දහස් ගණනකට රැකියා අහිමි කරමින්ය. වතු කම්කරුවන්ගේ සටනට තරමක ඉතිහාසයක් තිබුණ ද එය තීව්‍ර සටනක් බවට පත් වූයේ නැත. එසේ වීමට පෙර ආණ්ඩුව ඊට ස්ථාවර විසඳුමක් දුන්නේ ය. එය යහපත් දේශපාලන ප්‍රවණතාවකි.




වත්තේ පඩිය ලෙස දහසක් ලැබෙන එක
තහවුරු වීය, සටනක අග නසා දුක
රොටියක් කමින් බොන අතරේ කහට ටික
දැන් ජය සමරන්න පුළුවන් නැතුව සැක

# කට පරිස්සම් කර ගනිමු

ක්ෂණික ආහාර යනු ඉක්මනින් ආහාරයට ගත හැකි, කෙටි කාලයකින් පිළියෙල කර ගත හැකි පෝෂණ ගුණය මත පමණක් නොපිහිටා කෑමට ගත හැකි ආහාර වේ. ඉක්මනින් පිළියෙල කර ගැනීම ගැන පමණක් සිතන නිසා මෙම ආහාරවල ගුණය සහ පෝෂණ ගුණය පිළිබඳ එතරම් තැකීමක් නොකරයි. ක්ෂණික ආහාර නිපදවීමේදී බැරලෝහ විෂ වීම, රසකාරක, කල් තබා ගැනීමේ රසායනික ද්‍රව්‍ය අඩංගු යනාදී සාධක හේතුවෙන් පමණ ඉක්මවා මේ ආහාර ගැනීම ශරීර සෞඛ්‍යයට හිතකර නැත. සැබවින්ම මෙම ආහාර පරිභෝජනය අවශ්‍යම නැත. සාමාන්‍යයෙන් ක්ෂණික ආහාරවල පෝෂණ ගුණය එතරම් සැලකිල්ලට භාජනය නොවේ. ඇතැම් රසායනික ද්‍රව්‍ය පිළියෙළ කිරීමේදී විනාශ වී යයි. උදාහරණ වශයෙන් විටමින් A,C,D යනාදිය ද, ඛනිජ ලවණ ද විනාශ වී යයි.



ඉතා පහසුවෙන් ලබා ගත හැකි වීම, ආහාර පිසීමට වැය වන කාලය අවම වීම, රසවත් වීම, නවීන බව, නිවෙසටම ගෙන්වා ගැනීමට ඇති හැකියාව, පහසුවෙන් රැගෙන යා හැකි වීම යන හේතූන් මත ක්ෂණික ආහාර සඳහා සුවිශේෂී ඉල්ලුමක් පවතී. නාගරීකරණය වූ සමාජය තුළ කාර්යබහුලත්වය හේතුවෙන් ආහාර වේල සම්පූර්ණ කරගැනීමට ඔවුන්ට ඇති කදිම විසඳුම වන්නේ පෙර සකසන ලද ආහාරය. මීට අමතරව තම සමාජ තත්ත්වය පෙන්වීම උදෙසාත් ජනප්‍රිය වෙළෙඳ නාම ඇති මෙවැනි ආහාර අවන්හල් කරා ඇදෙන පිරිස වැඩිව තිබේ. වර්තමානයේදී ක්ෂණික ආහාර සඳහා තරුණයන් සහ ළමයින් තුළ විශාල පෙලඹුමක් දැකිය හැකිය.

## අහිතකර රසායනික

ක්ෂණික ආහාරවලට එක් කරන රසායනික ද්‍රව්‍ය හුදෙක්ම, රසය වැඩි කර ගැනීමට, පෙනුම වැඩි කිරීමට, පාට ලබා ගැනීමට, ප්‍රියතාවක් ඇති කිරීමට එක් කරන ද්‍රව්‍යයි.මේවා අතර ස්වාභාවික මෙන් ම කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය ද ඇත. මේවායින් සමහරක් ශරීරයට ඉතා හානිකර වේ. එම නිසා ලෝක ආහාර කමිටුව හා සෞඛ්‍ය සංවිධානය මඟින් සමහරක් රසායනික ද්‍රව්‍ය ආහාරවලට එක් කිරීම තහනම් කර ඇත. තවත් සමහර රසායනික ද්‍රව්‍යවලට නීති සහ සීමාවන් පනවා ඇත. එවැනි රසායනික ද්‍රව්‍ය හඳුනා ගෙන සිටීම වඩාත් වැදගත් වේ. එම රසායනික ද්‍රව්‍ය අඩංගු ආහාර පරිභෝජනයෙන් වැළකී සිටීමෙන් ශරීරයට සිදු වන හානිය අවම කර ගත හැකි ය.

සිට්‍රස් රතු 2 කෘත්‍රිම වර්ණකය දෙහි කුලයේ පලතුරුවල පාට වැඩි කිරීමට පාවිච්චි කරයි. මෙය ශරීරයට හානිකරය. බ්‍රිලියන්ට් නිල් කෘත්‍රිම වර්ණකය පිළිකා කාරකයකි. මෙය සමට හා ඇස්වලට හානිකරය. කොළ පාට කෘත්‍රිම වර්ණකය මීයන්ගේ ශරීරයේ අසාමාන්‍ය ගෙඩි සාදන බවට ඔප්පු කර ඇත. සන්සෙට් කහ (සුඩාන් 01) , ටාට්‍රසින් කහ වර්ණක යන කෘත්‍රිම වර්ණක මඟින් ඇදුම මෙන්ම කුඩා ළමයින් දැඩි ලෙස අධික ක්‍රියාකාරීන් බවට පත්වෙයි.

BHA(බියුටයිලේටඩ් හයිඩ්‍රොක්සි ඇනිසෝල්) නමැති ආහාර කල් තබා ගැනීම සඳහා යොදන රසකාරකය, අර්තාපල් චිප්ස් හා ධාන්‍යමය ආහාර කල් තබා ගැනීමට එක් කරයි. මෙය පිළිකා ජනකය. BHT (බියුටයිලේටඩ් හයිඩ්‍රොක්සි ටොලියීන්) යන රසකාරකය තෙල් සහිත ආහාරවල මුඩු වීම වැළැක්වීම සඳහා ආහාරවලට එක් කරයි. මෙය පිළිකාකාරකයකි. EDTA (එතිල් ඩයිඇමයින් ටෙට්‍රා ඇසිටික් ඇසිඩ්) ආහාර මුඩු වීම වළක්වයි. යකඩ එක් කිරීමේදී ස්ථිර කාරකයක් ලෙස මෙන්ම බැර ලෝහ විෂ වූ විට ද භාවිත කරයි. මෙම රසායනිකය මඟින් සෛල විනාශ වීම සහ ප්‍රජනක පද්ධතියට විවිධ බලපෑම් ඇති කරයි. කැල්සියම් ප්‍රොපියොනේට් ආහාර කල් තබා ගැනීමට භාවිතා කරන රසායනිකය විශේෂයෙන් බේකරි නිෂ්පාදනවලට යොදා ගනී. ක්ලෝෆෙනිසින් සහ ෆ්‍රීනොක්සිඑතනෝල් ආහාර කල් තබා ගැනීමට ගන්නා රසායනිකය, බැක්ටීරියා නාශකයකි. මෙය මානසික විෂාදිය හා මධ්‍යම ස්නායු පද්ධතියට හානි කරයි. සෝඩියම් බෙන්සොවේට්/බෙන්සොයික් ඇසිඩ් කල් තබා ගැනීම සඳහා බීම වර්ගවලට සහ කාබනේටඩ් බීමවලට එක් කරයි. තවද මෙය ලියුකේමියා සහ අනෙකුත් පිළිකා තත්ත්වයන් ඇති කරවනු ලබන රසායනික ද්‍රව්‍යයකි. ආහාර කල් තබා ගැනීමට ගන්නා සලෆයිට්ස් රසායනික ද්‍රව්‍ය මඟින් නොයෙකුත් අසාත්මිකතා සහ රෝග ඇති කරයි. තව ද මෙමගින් B විටමිනය ද විනාශ කරයි. TBHQ(ටර් බියුටයිල් හයිඩ්‍රො ක්විනොන්) රසායනිකය, අසංතෘප්ත මේදය, මුඩු වීම නැති කිරීමටත්, කල් තබා ගැනීමටත් යොදා ගනී. මෙය DNA වලට හානිකර මෙන් ම පිළිකා ඇති කරනු ලබයි.

ඇසිටෝන් පොරොක්සයිඩ්, ඇරිස්ටොලොනික් ඇසිඩ්, කෘත්‍රිම සුවඳකාරක, ක්ලොරෝ ප්‍රොපනොල්ඩ්, ඩයසිටයිල් ඩයි සෝඩියම්ගුවනේට්, හයිඩ්‍රොලයිඩ්, ප්‍රෝටීන් (එළවළු) මොනෝ සෝඩියම් ග්ලූටමේට් (අජිනමොටෝ) නොනිල් ඇල්කොහොල් පොලිසෝබේට් 80, පොටෑසියම් බ්‍රෝමේට්, පොටෑසියම් නයිට්රේට්, සෝඩියම් නයිට්රේට් යනාදිය ද තහනම් රසකාරක වේ.

## රෝගාබාධවල අවදානම

කෘත්‍රිම රසකාරක, කල් තබා ගැනීමේ රසකාරක ද්‍රව්‍ය, නිසා මේවා නියමිත මාත්‍රාවට වඩා වැඩි වූ විට පිළිකා ජනක බවට පත් වේ. තව ද ක්ෂණික ආහාර පිළියෙළ කිරීමේදී එළවළු තෙල්, මාගරින් යොදා ගන්නා බැවින් මේවා නිසා මුක්ත ඛණ්ඩක සෑදී පිළිකාකාරක විය හැකි වන අතර, හෘදයාබාධවලට ද මුල පුරයි.



විශේෂඥ, ආහාර හා පෝෂණවේදී වෛද්‍ය සෙලී ප්‍රනාන්දු

ක්ෂණික ආහාර පිළියෙල කර ගැනීමේ ඉක්මන්කම නිසාම නාගරික ගෘහණිය රැකියාවට යාමට පෙර මෙවැනි ක්ෂණික ආහාරවලට පුරුදු වී සිටියි. ක්ෂණික ආහාර සමබර නොවන ආහාර නිසා විශේෂ රෝගී අවස්ථාවන් වුවද ඇති විය හැකි ය. එනම් විටමින් A ඌනතාවය, B ඌනතාවය සහ C ඌනතාවය යනාදියයි. එම නිසා වැඩෙන දරුවාට, ගර්භණී මවට, ක්ෂණික ආහාර සුදුසු නැත. තව ද ක්ෂණික ආහාර නිසා බැරලෝහ විෂවීම පවා ඇති විය හැක. තව ද රසකාරක කල්තබා ගැනීමට යොදා ගන්නා රසායනික සංයෝග යනාදිය නිසා හෘදයාබාධ හට ගන්නා බව විද්‍යාත්මකව පෙන්වා දී ඇත. තව ද පිළිකා සෑදීමට ඉතා අවදානමක් ඇත. ක්ෂණික ආහාරවලට Baking Magarine දමා සාදන නිසා Transfat නිපද වේ. මේ හේතුවෙන් පිළිකා තත්ත්වයන් ඇති විය හැකි ය. සමහර විට මෙම ක්ෂණික ආහාරවල කටට රසය, සැර මිස පෝෂ්‍ය පදාර්ථ ගැන අවධානයක් නැත. එම නිසා මෙම ක්ෂණික ආහාර නිතරම ගැනීමේ අවදානමක් ලෙස මන්දපෝෂණය, රක්තහීනතාවය ද පෙන්වා දිය හැකි ය.

## නිර්මාණශීලී ක්ෂණික ආහාර

ක්ෂණික කාබනික ආහාර මඟින් නිසි පෝෂණය නිසි ආකාරයෙන් ලැබේ. ක්ෂණිකව පිළියෙල කරන කාබනික ආහාරවල පෝෂ්‍ය පදාර්ථ විනාශ නොවේ. වස විෂ ද අඩංගු නොවේ. එම නිසා හෘදයාබාධ, සහ වෙනත් අතුරු ආබාධ ඇති වන්නේ නැත. ක්ෂණිකව පිළියෙල කරන කාබනික ආහාර පිළියෙල කිරීමේදී අසංතෘප්ත මේදය පිළියෙළල කිරීමට නොගනී. එම නිසා පිළිකාකාරක Transfat සෑදෙන්නේ නැත. මෙම ආහාරවලට රසකාරක අඩංගු නොකරන නිසා ලොල් වීම (Addiction) සිදු වන්නේ ද නැත.

මුදල් වැය කරමින් ක්ෂණික රසයක් වෙනුවෙන් පසුකාලීනව ලෙඩ ගොඩක් ඉතිරි කරගන්නවාට වඩා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලකට හුරුපුරුදු වීම කෙතරම් හොඳ ද යන්නට සෑම දෙනෙක්ම අවබෝධ කර ගත යුතු ය. පලතුරු, එළවළු සහ පලාවර්ග වැඩි වශයෙන් ආහාරයට ගනිමින් ඉතා කලාතුරකින් මෙවැනි ක්ෂණික ආහාර සඳහා ඔබ යොමු වුවාට කමක් නැත.

අප පරිභෝජනයට ගන්නා එළවළු, මාංසමය ආහාර හොඳින් පිරිසිදු කර ඉතා අඩු උෂ්ණත්වයට රත් කර, පිරිසිදු පොල්තෙල් ස්වල්පයක් දමා තෙම්පරාදු කර තෙලෙන් පෙරළා බැදීම (දවටා) මඟින් විටමින්, ඛනිජ ලවණ, විනාශ නොවේ. මෙහිදී රසායනික ද්‍රව්‍ය එකතු කිරීමක් ද සිදු නොවේ. කල් තබා ගැනීමට, අඩු උෂ්ණත්වයේ ශීතකරණයේ දැමීම සිදු කර ගත හැකි ය. මෙම ක්‍රමයට ව්‍යංජනය සෑදීමට ගත වන්නේ විනාඩි 5- 10 කි.

වම්බටු , දඹල, කංකුං, මැල්ලුම්, තක්කාලි, යනාදිය ක්ෂණික ලෙස සෞඛ්‍ය සම්පන්නව පිළියෙල කර ගත හැකිය. මෙවැනි එළවළු තෙලේ දවටා ගැනීම මඟින් ක්ෂණික වන අතරම කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය කිසිවක් ඇතුළත් නොකරන නිසා බියක් නැතිව ආහාරයට ගැනීමට පුළුවන. තව දුරටත් ක්ෂණික කිරීමට නම් එළවළු, කපා වියළා පැකට් කර කල් තබා ගත හැකි ය. පසුව මෙම එළවළු ක්ෂණිකව පිළියෙල කර ගත හැකිය. මෙම එළවළු කාබනික එළවළු නම් තවත් වටිනාකම වැඩි වේ. වැටකොළු, වට්ටක්කා, අල, කෙසෙල් යනාදී එළවළු ක්ෂණික කර ගත හැකි වන්නේ ඉතා අඩු ජලය ප්‍රමාණයක් දමා තම්බා කෙටි කලකින් තෙලෙන් තෙම්පරාදු කර ගැනීමෙනි. මැල්ලුම, කපා සෝදා පැකට් කර වෙළෙඳපළේ විකිණීමට ඇත. මේවාට පොල් රැලි ( ගාගත් ) ස්වල්පයක් දමා රත් කර ගත හැකිය.

කරපිංචා, ගොටුකොළ, හාතවාරිය, මුරුංගා, පැෂන් ෆෘට් යනාදී කොළ වර්ග අව්වේ හෝ උදුනක වියළා කුඩු කර පිටි කර කල් තබා ගැනීමට පුළුවන. හාල් ෆ්ලේක්ස්, හබල පෙති උතුරන ජලයට දමා, පිටි කර ගත් කොළ (කලින් සඳහන් කළ ශාක පත්‍ර) පිටි මේස හැන්දක් උණු ජලයට දමා විනාඩි 10 ක් පමණ තබා එයට, ලුණු කුඩු, සීනි, පොල් කිරි, එකතුකර විනාඩි 15 කින් පමණ කාලයක් වැය කර ක්ෂණික කැඳ සාදා ගත හැකිය.

තව ද විවිධ පලතුරු වර්ග මධ්‍යම ප්‍රමාණයේ කැබලිවලට කපා ලුණු, දෙහි , අවශ්‍ය නම් වැනිලා ඉස ඕනෑම තැනකට පහසුවෙන් ගෙන යෑමට හැකි පරිදි භාජනයට (කුඩා කප් එකකට දමා) ක්ෂණික පලතුරු ආහාර වේලක් සකස් කර ගත හැකි ය. හදිසි බඩගින්නක් ඇති වූ විට එම පලතුරු භාජනයට, යෝගට් ස්වල්පයක් දමා මිශ්‍රකර පෝෂණ ගුණය වැඩි කර ආහාරයට ගත හැකි ය. මෙම පලතුරු සකස් කර ගැනීමේදී වස විසෙන් තොර කාබනික පලතුරු ගන්නවා නම් වඩාත් හිතකර වේ.

තිරිඟු පිටිවලින් සකස් කරගත් ක්ෂණික ආහාර ගන්නවාට වඩා හාල් පිටි සහ විවිධ බීජ පිටි වර්ගවලින් සකස් කර ගත් ආහාර ගැනීම වඩාත් යහපත් වේ. උදාහරණ වශයෙන් කඩල පිටි, මුං පිටි, කව්පි පිටි, උදු පිටි යනාදී පිටි වර්ග පෙන්වා දීමට පුළුවන. පිෂ්ඨය වැඩි ආහාරවලට වඩා කජු, ආමන්ඩ්, රට කජු වැනි පෝෂණ ගුණයෙන් පරිපූර්ණ කජු වර්ග සහ මී පැණි එකතු කර නිර්මාණාත්මක සීරියල් වර්ගයේ ආහාර නිර්මාණය කර ගත හැකිය. ශරීරයට අහිතකර ක්ෂණික ආහාරවලට වඩා එවැනි නිර්මාණාත්මක, ගුණාත්මකභාවයෙන් වැඩි ආහාර ශරීර සෞඛ්‍යට වඩාත් හිතකරය.

> ක්ෂණික කාබනික ආහාර මඟින් නිසි පෝෂණය නිසි ආකාරයෙන් ලැබේ. ක්ෂණිකව පිළියෙල කරන කාබනික ආහාරවල පෝෂ්‍ය පදාර්ථ විනාශ නොවේ. වස විෂ ද අඩංගු නොවේ. එම නිසා හෘදයාබාධ, සහ වෙනත් අතුරු ආබාධ ඇති වන්නේ නැත. ක්ෂණිකව පිළියෙල කරන කාබනික ආහාර පිළියෙල කිරීමේදී අසන්තෘප්ත මේදය පිළියෙල කිරීමට නොගනී. එම නිසා පිළිකාකාරක Transfat සෑදෙන්නේ නැත. මේ ආහාරවලට රසකාරක අඩංගු නොකරන නිසා ලොල් වීම (Addiction) සිදු වන්නේ ද නැත.




මදාරා මුදලිගේ

# රට විරුවන් ගෙන්වා ගැනීමට නිසි සැලැස්මක් නැතැයි කීම බොරු

## ඉකුත් 7දා වන විට විදෙස්ගත ශ්‍රමිකයන් 85,183ක් ගෙන්වා ගත්තා

### ● ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

රට විරුවන් මෙරටට ගෙන්වා ගැනීමේ නිසි වැඩපිළිවෙළක් හෝ සැලැස්මක් රජය සතුව නැතැයි ඇතැම් පාර්ශ්ව එල්ල කරන චෝදනා රජය තරයේ ප්‍රතික්ෂේප කරන බව ජනමාධ්‍ය අමැති හා සම කැබිනට් ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

මේ මස 7 වැනිදා වනවිට රජය විදේශගත ශ්‍රමිකයන් හෙවත් රට විරුවන් 85,183ක් මෙරටට ගෙන්වා ඇති බවත් ඇමැතිවරයා සඳහන් කරයි.

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ය.

එහිදී අදහස් දැක්වූ ඇමැතිවරයා-පසුගියදා ආන්දෝලනාත්මක මතයක් ඇතැම් සංවිධාන ඇති කර තිබුණා, රට විරුවන් ගෙන්වන ප්‍රමාණය කිසිම සැලැස්මක් නැතිව, වැඩපිළිවෙළක් නැතිව සිදු කෙරෙනවා කියා. ඒ අයගේ අභියාචනාවන්ට, මැසිවිලිවලට අප ඇහුම්කන් දෙන්නේ නැහැ කියන මතයක් ඉදිරිපත් කරන්න පසුගිය දින දෙක තුන තුළ කාන්තා සමිති ඇතුළු සමිති කීපයක් කටයුතු කළා. මේ චෝදනා කිසිම හරයක් නොමැතිව, විශ්ලේෂණයක් නොමැතිව දේශපාලන වශයෙන් හෝ වෙනත් අවශ්‍යතා වෙනුවෙන්ම ඉදිරිපත් කරන කරුණු හැටියටයි අපි දකින්නේ.

අපේ රටේ දැනට ක්‍රියාත්මක කොවිඩ් රෝහල් සංඛ්‍යාව 42ක් වනවා. අප පටන් ගත්තේ එක රෝහලකින්. අයි.ඩී.එච්. රෝහල විතරයි ඒ වෙලාවේ තිබුණේ. ඒ නිසා ලොකු මතයක් හැදුනා අපට මේක පාලනය කරගන්න බැරිවෙයි කියා. නමුත් ඉතාමත්ම කෙටි කාලයකදී විශේෂයෙන්ම, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, ආරක්ෂක අමාත්‍යාංශයත් ඇතුළු සියලු අංශ එකතුවී කොවිඩ් ආසාදිතයන් වෙනුවෙන් මේවනවිට රෝහල් 42ක් වෙන් කරන්න හැකිවී තිබෙනවා. පෙබරවාරි 7 වෙනිදා වන විට මේවායේ ප්‍රතිකාර ලබන සංඛ්‍යාව 2583ක් වී තිබෙනවා. මීට අමතරව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන 27ක් ද ගොඩනගා තිබෙනවා.

සමහර අය බලාපොරොත්තු වුණා වෙනත් දියුණු රටවල වගේ ඇඳන් නැතිව රෝහල් කොරිඩෝවල අප රෝගීන් රඳවා තබයි කියලා. වාසනාවට එවැනි තත්ත්වයක් මතුවී නෑ. මේ වනවිට අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල 3118ක් ප්‍රතිකාර ලබනවා. ඒ අනුව දළ වශයෙන් පන්දහසක පමණ ප්‍රමාණයක් ප්‍රතිකාර ලබමින් සිටිනවා. අනෙක් අය සුවපත්වී පිටව ගිහින්. රෝගීන් ප්‍රමාණය වැඩිවීමට සමාන්තරව සුවපත්වී යන ප්‍රමාණයත් අනෙකුත් රටවලට සාපේක්ෂව අපේ රටේ ඉතා ඉහළ මට්ටමක තිබෙනවා. ඒ නිසා අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මේ විදිහට පහත් මට්ටමින් කතා කිරීම අසාධාරණයි. සීමිත සම්පත් ප්‍රමාණයක් තබාගෙන, ඒ සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගෙන සෞඛ්‍ය අංශය කරගෙන යන වැඩපිළිවෙළට සහයෝගය ලබා දීම වෙනුවට කරන මේ කඩාකප්පල්කාරී වැඩ ගැන අප කනගාටු වනවා.



## කිසිම කොරෝනා රෝගියකු කොරිඩෝවක, පැදුරක මෙට්ටයක දාලා නෑ; සියලු රෝගීන්ට පහසුකම් දී තිබෙනවා

මීට අමතරව මුදල් ගෙවන ප්‍රතිකාර මධ්‍යස්ථාන 3ක් තිබෙන අතර, ඒවායේ 370ක් ප්‍රතිකාර ලබනවා. කොවිඩ් රෝගීන් සඳහා ගිලන් ඇඳන් 11,443ක් වෙන්කර තිබෙනවා. අපි මේ කටයුතු ආරම්භ කරනවිට තිබුණේ අයි.ඩී.එච්. රෝහලේ ඇඳන් 120 විතරයි. මේ නිසා රටේ පුරවැසියන් විදිහට අප පැමිණි ගමන ගැන, රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන ආඩම්බර විය යුතුයි. ඒ වගේම, ආරක්ෂක අංශ එයට සහයෝගය ලබාදී යටිතල පහසුකම් ආදිය සැලසීමට ගත් ප්‍රයත්නය ගැනත් අප සතුටු විය යුතුයි.

මේ වනවිට අපේ රටේ දිනකට වාර්තා වන කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 600ත් 800ත් අතර වනවා. අපේ මේ කිසිම රෝගියෙක් කොරිඩෝවක, පැදුරක, මෙට්ටයක දාලා නෑ. සියලු රෝගීන්ට ඇඳන් ලබා දී තිබෙනවා. මේක ආදර්ශයක් විදිහටයි ලෝකයේ අනෙක් රටවල් සලකන්නේ. ඒ නිසා තමයි රටවල් 194කින් 10 වෙනි තැනට විතර අපි සිටින බව ප්‍රකාශ වී තිබෙන්නේ.

පෙබරවාරි 7 වැනිදා වනවිට විදේශයන්හි සිට ලංකාවට ගෙන්වා ඇති ප්‍රමාණය 85,183යි. මේක තමයි රටවිරුවන් ගැන අඬන අයට දෙන්න තිබෙන පණිවුඩය. අප ඉතා පුංචි රටක්. සම්පත් අඩුයි. ඒ වගේම, ගුවන්තොටුපළ වසා තිබෙන අවස්ථාවක සියලු ක්‍රියාකාරකම් සිදුකර තිබෙන්නේ. අපේ අඩුපාඩු ඇති. අපේ විතරක් නෙවෙයි මුළු ලෝකයේම මේ අංශයේ සියලුම ක්ෂේත්‍රවල අඩුපාඩු තිබෙනවා. ඒ දෙස සාපේක්ෂිතවයි බැලිය යුත්තේ. අපව තනිකර ප්‍රහාරයන් එල්ල කිරීම ඉතාමත්ම පහත් දේශපාලන ව්‍යාපාරයක් හැටියටයි මා සලකන්නේ.

විදේශවල සිට පැමිණි අයගෙන් රජයේ වියදමින් නිරෝධායන මධ්‍යස්ථානවල නිරෝධායනය වූ සංඛ්‍යාව 44,602යි. ඒ හැර මුදල් ගෙවා නිරෝධායනය වූ අය 40,000ක් පමණ වෙනවා. පෙබරවාරි 7 වැනි දින ගුවන් යානා 15කින් 1113ක් ලංකාවට ගෙනාවා. සවුදි අරාබියෙන් 71ක්, මාලදිවයිනෙන් 97ක්, කටාර් රාජ්‍යයෙන් 212ක්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් 516ක්, ඉතාලියෙන් 19ක් සහ සිංගප්පූරුවෙන් 105ක් යනාදී වශයෙන් එසේ පැමිණ තිබෙනවා. පෙබරවාරි 8 වැනිදා 468ක් ගෙන්වා තිබෙනවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් 36ක්, සවුදි අරාබියෙන් 76ක්, ඉන්දියාවෙන් 40ක්, කටාර් රාජ්‍යයෙන් 127ක් හා කුවේට්වලින් 150ක් ආදී වශයෙන් එසේ පැමිණ තිබෙනවා.

සෑම ගුවන්යානයකම අවම වශයෙන් ආසන 50ක් වෙන්කරනවා රටවිරුවන් ගෙන්වීමට. ජෝර්දානයේ කර්මාන්තශාලාවක ඇතිවූ තත්ත්වයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතුවුණා. ඒ පිළිබඳ තානාපති කාර්යාලයට දැනුම්දුන්නා. ඒ අනුව ඊයේ (9) විශේෂ ගුවන්යානයක් යවා 284 දෙනෙක් ගෙන්වා ගත්තා.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නාලක කලුවැව මහතා ද මේ අවස්ථාවට සහභාගී විය.

# ජිනීවා මානව හිමිකම් වාර්තාව ගැන රාජ්‍ය තාන්ත්‍රිකව සාකච්ඡා කරනවා

### ● ඇමැති කෙහෙලිය

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

ශ්‍රී ලංකාවට එරෙහි ජිනීවා මානව හිමිකම් වාර්තාව සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික නායකයන් සමඟ රජය නිරන්තරයෙන් සාකච්ඡා කරමින් පවතින බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

එසේ වුවත් මේ මොහොතේ අප රටට පක්ෂව කටයුතු කරන, එසේත් නැතිනම් මධ්‍යස්ථව සිටින රටවල් සම්බන්ධයෙන් අපගේ යම් යම් අදහස් ඇතත් මේ අවස්ථාවේ ඒ පිළිබඳ ප්‍රකාශ කළ නොහැකි බවත් ඇමැතිවරයා කීවේය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියකු නඟන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

'මේ අවස්ථාවේ රාජ්‍ය තාන්ත්‍රික නායකයන් සමඟ අපි නිරන්තරයෙන් සාකච්ඡා කරමින් පවතිනවා. විවිධ ප්‍රශ්නවල ප්‍රමුඛත්වයක් ගන්නා කරුණක් තමයි මානව හිමිකම් සම්බන්ධ ප්‍රශ්නය. එය රහසක් නෙවෙයි. අපි ආර්ථික, ද්වීපාර්ශ්වික කරුණු පිළිබඳ සාකච්ඡා කරන අතරතුර, මානව හිමිකම් කොමිෂන් වාර්තාව සම්බන්ධව අනිවාර්යයෙන්ම අප සාකච්ඡා පවත්වනවා' යැයිද ඇමැතිවරයා එහිදී පැවසීය.



## කැබිනට් තීරණ

### ■ 'අපේගම' ඵලදායීව පවත්වා ගෙන යාම

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස 'අපේගම' ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය ආරම්භයේ සිට මේ දක්වා පරිපාලනය වී ඇති අතර මේ වන විට එහි පරිපාලන කටයුතු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. අක්කර 13 රූඩ් 03 පර්චස් 25.1ක ඉඩම් ප්‍රමාණයකින් සමන්විත මෙම මධ්‍යස්ථානය සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක්, පරිපාලන හා නඩත්තු කටයුතු සඳහා වෙන් වූ වැය ශීර්ෂයක් නොමැති බැවින්, එහි කටයුතු අකර්මණ්‍ය වෙමින් පවතින බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, 'අපේගම' ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් පත් කර විධිමත් අයුරින් එම ආයතනය පවත්වාගෙන යාමට හැකි වන පරිදි අවශ්‍ය පියවර ගැනීම පිණිස බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය වශයෙන් අගමැතිවරයා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

### ■ කජු බීජ උද්‍යානය සඳහා දීර්ඝකාලීන බදු

එළුවන්කුලම කෘෂිකර්ම පර්යේෂණ ඒකකය පවත්වාගෙන ගොස් ඇති වනාතවිල්ලුව, රාල්මඩුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හෙක්ටයාර 86.093ක ඉඩම් කොටසක් (අක්කර 212 රූඩ් 02 පර්චස් 23.95) සංවර්ධනය කර භාවිත කිරීම සඳහා 1998 ජූලි මාසයේදී ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත භාර දී ඇත. ඒ අනුව, මේ වන විට කජු සංස්ථාව විසින් එකී ඉඩම කජු වගාව සඳහා භාවිත කරමින් සිටී. ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සමඟ එක්ව එම ඉඩමේ ශාක අභිජනන මධ්‍යස්ථානය මඟින් ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින කජු ප්‍රභේදයන් ඒකරාශි කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ආර්ථික හා සාමාජීය වශයෙන් ඉහළ වැදගත්කමක් ඇති එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී ඉඩම අවුරුදු 50ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත ලබා දීම පිණිස ඉඩම් ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් අනුමැතිය ලැබිණි.

### ■ මෙගාවොට් 150 සූර්ය බල ධාරිතාවක් ප්‍රසම්පාදනය කිරීම

දිවයිනේ විවිධ ස්ථානයන්හි මෙගාවොට් 150ක ධාරිතාවයෙන් යුත් සූර්ය විදුලිබලාගාර ස්ථාපනය කිරීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, පැකේජ 05ක් යටතේ ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශයන්ට එරෙහිව අභියාචන ඉදිරිපත්ව නොතිබූ ප්‍රසම්පාදනයන් පිරිනැමීම සඳහා 2020 දෙසැම්බර් මස 14 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඉතිරි ප්‍රසම්පාදනයන්ට අදාළව ඉදිරිපත්ව තිබූ අභියාචනයන් ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව, අවුරුදු 20ක කාලයක් සඳහා අනුරාධපුරය, හබරණ, මාතර, ගාල්ල, දෙනියාය, කොස්ගම, මතුගම, පන්නල, මහව හා කුරුණෑගල ග්‍රිඩ් උපපොළවල් සඳහා තෝරාගත් ලංසුකරුවන් වෙත අදාළ ප්‍රසම්පාදනයන් පිරිනැමීම පිණිස විදුලිබල අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### ■ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලා පරිශ්‍රයේ ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම

කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලා පරිශ්‍රයෙහි සිමෙන්ති නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය විසින් මූලික සැලසුම් සකස් කර ඇත. ඒ සඳහා එම පරිශ්‍රයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්ත ශාලා පරිශ්‍රය පිරිසිදු කිරීමට අදාළව ස්ථානීය පරීක්ෂණයක් සිදු කර නිර්දේශ ඇතුළත් තත්ත්ව වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා පංචපුද්ගල කමිටුවක් පත්කර තිබේ. එකී කමිටුවේ නිර්දේශ පරිදි, කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රය තුළ තිබෙන ප්‍රයෝජනයට ගත නොහැකි ගොඩනැගිලි, ව්‍යුහයන්, යන්ත්‍රෝපකරණ සහ අබලි යකඩ හා වානේ යන දෑ පිළිබඳව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම්ව, රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින්, එකී අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම පිණිස කර්මාන්ත ඇමැති ඉදිරිපත් කළ යෝජනාව අනුමත විය.

### ■ වසර පහට ක්‍රියාත්මක පශු සම්පත් ව්‍යාපෘති

දේශීය කිරි නිෂ්පාදනය සහ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් කර්මාන්තවල නිෂ්පාදන හැකියාව ඉහළ නැංවීම සඳහා දැනට ක්‍රියාත්මක පහත සඳහන් ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් යාවත්කාලීන කර ඉදිරි වසර 05ක කාලය තුළ ක්‍රියාත්මක කිරීම පිණිස කෘෂිකර්ම ඇමැතිගේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කළේය.

### ■ දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

අභිජනන ගොවිපළ පිහිටුවීමේ ව්‍යාපෘතිය, සූකර සංවර්ධන ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගව ගොවිපළ ප්‍රවර්ධනය තුළින් ඵලදායිතාවය වර්ධනය කිරීම, මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මේ අනුව ක්‍රියාත්මක වේ.

### ■ රසායනික පොහොර ප්‍රසම්පාදනය කිරීම

2021 යල කන්නයේ අප්‍රේල් මුල සැපයීම සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම (ලක් පොහොර) සහ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම යන ආයතන වෙත රසායනික පොහොර ප්‍රසම්පාදනය කිරීම සඳහා අන්තර්ජාතික තරගකාරී ලංසු කැඳවා ඇත. එම මිල ගණන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ අනුව පහත සඳහන් පරිදි පොහොර සැපයීමේ ප්‍රසම්පාදනයන් පිරිනැමීමට අදාළව කෘෂිකර්ම ඇමැති ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

යූරියා (ග්‍රනියුලර්) මෙට්‍රික් ටොන් 40,500+5%ක් දින 270ක ණය කාල සීමාවක් යටතේ මෙට්‍රික් ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 343.10කට ස්විස් සිංගප්පූරු ඕවර්සීස් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීම,

යූරියා (ප්‍රිල්ඩ්) මෙට්‍රික් ටොන් 8,500+5% දින 180ක ණය කාල සීමාවක් යටතේ මෙට්‍රික් ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 364.74කට වැලන්සි ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීම,

මියුරියේට් ඔෆ් පොටෑෂ් මෙට්‍රික් ටොන් 13,900+5%ක් දින 180ක ණය කාල සීමාවක් යටතේ මෙට්‍රික් ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 258.74කට ඇග්‍රිකල්චරල් රිසෝසස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ප්‍රදානය කිරීම මෙමගින් සිදු කෙරේ.

**බුද්ධිකා- සිතාරා**

# සොරා ගත් ත්‍රිරෝද රථයකින් පැමිණ අත් බෑග් පැහැර ගත් කම්බා හොරෙක් අල්ලයි

**නුගේගොඩ සමූහ - සමීර අබේසිංහ**

සොරා ගත් ත්‍රිරෝද රථයකින් පැමිණ මාර්ගයේ ගමන් ගත් හෙදියක් ඇතුළු කාන්තාවන් දහතුන් දෙනකුගේ අත් බෑග් පැහැර ගත් පුද්ගලයකු පෙරේදා (08) බොරලැස්ගමුව පොලිස් වසමේ රත්තනපිටිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව බොරලැස්ගමුව පොලිසිය පැවැසීය.

ජනවාරි 29 වැනිදා උදෑසන බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවතේ පදිංචිකාරිනියක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහලට අනුයුක්තව සේවය කරන හෙදියක් සේවයට යමින් සිටියදී ත්‍රිරෝද රථයකින් පැමිණෙන පුද්ගලයෙක් ඇයගේ අත් බෑගය උදුරා ගැනීමට යෑමේදී අත්බෑගය තම උරහිසේ පැටලී ත්‍රිරෝද රථය දෙසට වැටීමත් සමඟත් එහි රෝදය ඇයගේ හිස මතින් ගොස් තුවාල සිදු වීමේ සිද්ධියක් බොරලැස්ගමුව පොලිසියට වාර්තාවී ඇත. එම මාර්ගය ආසන්නයේ නිවෙසක සවි කර තිබූ සීසීටීවී කැමරාවක මේ සිදුවීම සටහන්වී තිබූ බවත්, ඒ අනුව විමර්ශන ආරම්භ කළ පොලිස් නිලධාරීන් ත්‍රිරෝද රථයේ අංකය අනුව පරීක්ෂණ සිදු කර සැකකරු අත්අඩංගුවට ගත් බවත් පොලිසිය පැවැසීය.

23 වැනි වියේ පසු වන සැකකරු රත්මලාන, කටුකුරුන්ද පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බවත්, සොරා ගෙන ආ ත්‍රිරෝද රථයේ ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික තිබූ නිසා ගල්කිස්ස හා රත්මලාන ප්‍රදේශයේ කුලී ගමන් සඳහා යොදවා එයින් ලැබෙන මුදලින් මත් කුඩු පානය කර ඇති බවත්, දිනකට රුපියල් 7000ක පමණ මත් කුඩු පානය කර ඇති බවත් පොලිසිය විසින් අනාවරණය කර ගත් බව පොලිසිය පැවැසීය.

සැකකරු මහරගම ප්‍රදේශයේ මං පැහැරගැනීම් 04ක්, කොහුවල පොලිස් වසමේ මං පැහැරගැනීම් 3ක්, පිළියන්දල පොලිස් වසමේ 02ක් සහ බොරලැස්ගමුව පොලිස් වසමේ මං පැහැරගැනීම් 3ක් සිදු කර ඇති බවට මූලික විමර්ශනයේදී අනාවරණය වූ බවත්, සොරකම් කරන ලද ත්‍රිරෝද රථයේ වටිනාකම රුපියල් ලක්ෂ නවයකට ආසන්න බවත් පොලිසිය පැවැසීය.

සැකකරු ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

# කෝවිඩ්වලින් හානි වූ අංශවලට මූල්‍ය පහසුකම් දෙන්න අනුමැතිය

**බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි**

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩි වශයෙන් බලපෑමට ලක් වී ඇති ක්ෂේත්‍ර සඳහා මූල්‍ය පහසුකම් සලසා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ගිවිසුම්වලට එළඹීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා මුදල් අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

කොවිඩ් 19 වසංගතය මඟින් වැඩි වශයෙන් බලපෑමට ලක් වී ඇති සංචාරක, ඇඟළුම්, ඉදි කිරීම්, වෙළෙඳ, නිෂ්පාදන, කෘෂිකාර්මික අපනයන සහ සෞඛ්‍ය සේවා වැනි අංශ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ලබා දීමට එකඟ වී ඇති ශ්‍රී ලංකා කොවිඩ්19 හදිසි හා අර්බුද ප්‍රතිචාර දැක්වීමේ පහසුකම යටතේ ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ සහභාගිත්වයෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

යෝජිත ව්‍යාපෘතිය මඟින් එකී අංශවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය ද්‍රවශීලතා පහසුකම් ඉහළ නැංවීම සඳහා සහාය වනු ඇති අතර, එම ව්‍යාපෘතිය යටතේ ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 90 බැගින් වූ ණය මුදල් දෙකක් ලබා දීමට නියමිත ය. එම බැංකු දෙක විසින් සිය සේවාදායකයන්ට උප ණය පහසුකම් ලබා දීමට නියමිත අතර, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ගිවිසුම්වලට එළඹීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා මුදල් අමාත්‍යවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අදාළ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බව ජනමාධ්‍ය ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කීවේය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (9) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ය.

මෙරට ජනතාවට අවශ්‍ය කොවිඩ් එන්නත් ප්‍රමාණය ගෙන්වීම සම්බන්ධයෙන් මෙහිදී අදහස් දැක්වූ ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා පැවසුවේ, මාර්තු මාසය වනවිට රටට අවශ්‍ය එන්නත් ප්‍රමාණයම ලබා ගෙන අප්‍රේල් මාසයට පෙර ඉලක්ක ගත සංඛ්‍යාවටම භාවිතා කිරීමට හැකිවනු ඇතැයි විශ්වාස කරන බවයි. අපට තිබෙන දත්ත අනුව මෙම රෝග තත්ත්වය සම්පූර්ණයෙන්ම නතර කිරීමට නම් විසඳුමක් ලෙස සැලකෙන්නේ එන්නත බැවින් ඒ කෙරෙහි දැඩි අවධානයක් යොමුකර තිබෙන බවද ඇමැතිවරයා කීය. මේ සඳහා අපිට මුදල් නෑ, ගේන්නේ නෑ, යටිතල පහසුකම් ලබාගන්න ක්‍රමවේදයක් නෑ ආදී වශයෙන් කවුරුන්හෝ හිතනන්නේ එය සම්පූර්ණ බොරුවක් බවද ඇමැතිවරයා අවධාරණය කළේය. ඉතා ක්‍රමානුකූලව හා විධිමත්ව මේ ප්‍රශ්නයට මුහුණ දීමට මේ වනවිට සියලු විධිවිධාන යොදා තිබෙනවා පමණක් නෙව, 'එය අපට කළ හැකිය' යන පූර්ණ විශ්වාසය ද පවතින බවත් ඇමැතිවරයා මෙහිදී අවධාරණය කළේය.

# කේරළ ගංජා කිලෝ 3ක් සමඟ සැක දෙදෙනෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

විකිණීමට කේරළ ගංජා කිලෝ 03 ග්‍රෑම් 120ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනකු පලෙයි පොලිස් වසමේ අයියකච්චි මංසන්දියේදී පෙරේදා (08) පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පිරිසක් සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් එක් සැකකරුවකු සතුව කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 400ක් තිබී ඇති අතර අනෙක් සැකකරු සතුව කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 720ක් තිබී ඇත. ඔවුන් සතුව තිබූ ජංගම දුරකථන දෙකක්ද පොලිස් භාරයට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා සහ නඩු භාණ්ඩ වැඩිදුර විමර්ශන කටයුතු සඳහා පලෙයි පොලිස් ස්ථානය වෙත භාරදී තිබේ.

පොලිස් විශේෂ කාර්ය බළකාය කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් පිරිසක් විසින් මේ වැටලීම සිදු කර තිබේ.

# ඇතැම් ද්‍රවිඩ දේශපාලනඥයන් පුරාවිද්‍යාත්මක ස්ථාන ගැන යාපනයේ ජනතාවට වැරදි මත දීලා

### ● සිවිල් සංවිධාන කේන්ද්‍රයේ කැඳවුම්කරු අරුන් සිද්ධාර්ත්

**උපාලි කරුණාරත්න**

පුරා විද්‍යාව සහ පුරා විද්‍යාත්මක ස්ථාන පිළිබඳ යාපනයේ ජීවත්වන ජනතාව තුළ වැරදි මතයක් ගෙන යාමට ඇතැම් ද්‍රවිඩ දේශපාලනඥයන් කටයුතු කරන බව යාපනය සිවිල් සංවිධාන කේන්ද්‍රයේ කැඳවුම්කරු අරුන් සිද්ධාර්ත් මහතා ප්‍රකාශ කරයි. ඔහු එසේ ප්‍රකාශ කළේ, ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා සමඟ පෙරේදා (8) අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවකදීය.

පුරාවිද්‍යාවට මුවා වී හමුදාව දෙමළ ජනතාවගේ ඉඩම් බලහත්කාරයෙන් අත්පත්කර ගැනීමට කටයුතු කරන බවට අසත්‍ය මත ප්‍රචාරය කිරීමකද ඇතැම් පිරිස් ක්‍රියාකරන බවද යාපනය සිවිල් සංවිධාන කේන්ද්‍රයේ කැඳවුම්කරු මෙහිදී පැවැසීය.

යාපනයට පැමිණි වැරදි මත ගෙන යන පාර්ශවයන් හමුවී ඔවුන් සමග සාකච්ඡා කර සත්‍ය තත්ත්වය පෙන්වා දෙන මෙන් මෙහිදී විදුර වික්‍රමනායක රාජ්‍ය ඇමැතිවරයාගෙන් අරුන් සිද්ධාර්ත් මහතා මෙහිදී ඉල්ලා සිටියේය.



# වී මිලට ගන්න දෙන ණය කඩිනම් කරන්න

## අගමැතිගෙන් නිලධාරීන්ට උපදෙස්

**මහින්ද අලුත්ගෙදර**

වී මිල දී ගැනීම සඳහා අවශ්‍ය ණය ලබාදීමේ කටයුතු කඩිනම් කරන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

ඒ අනුව බීර නිෂ්පාදනය වැනි අතුරු නිෂ්පාදන සඳහා මහා පරිමාණ වශයෙන් වී මිලදී ගැනීම සීමා කළ හැකි බවද ඒ මහතා පෙන්වා දෙයි.

කිරි ගොවින් සඳහා අය-වැයෙන් යෝජනා කළ රුපියල් ලක්ෂ 5ක ණය මුදල රුපියල් ලක්ෂ 10ක් දක්වා වැඩි කරන්නැයි ද මුදල් ඇමැතිවරයා වශයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දී තිබෙන අතර, අය-වැය යෝජනා අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති හා ජනතා සහන පිළිබඳ අවධානය යොමු කරමින් මුදල් අමාත්‍යාංශයේ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ඒ මහතා මේ බව පැවසීය.

ඒ අනුව ඉදිරි සතියේ සිට කිරි ගොවීන් සඳහා ඔවුන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය කරගැනීමට සියයට 4 පොලියට රුපියල් ලක්ෂ දහයක් දක්වා ණය ලබා ගැනීමට අවස්ථාව උදාවනු ඇත. අය-වැය යෝජනා අනුව දැනට ක්‍රියාත්මක ණය සහන සම්බන්ධයෙන් මෙම හමුවේ දී මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල මහතා කරුණු දැක්වීය.

ඒ අනුව රජයේ සේවකයන්ට දෙන හා ලබා ගත් ණය මුදල සියයට 7 පොලී අනුපාතය යටතේ ක්‍රියාත්මක වේ. මෙම සහනය මත රජයේ සේවකයකුගේ මාසික වැටුප් වැඩිවීම රුපියල් 2500-3000ක් අතර වන බව එස්.ආර්. ආටිගල මහතා පෙන්වා දුන්නේය. රජයේ සහ රජයේ නොවන සේවකයන් වෙනුවෙන් විදුලි සූර්ය පැනල සිය වහලයට සවිකිරීම සඳහා දැනට සියයට 4 පොලී අනුපාතයට රුපියල් ලක්ෂ 8ක් දක්වා ණය මුදල් ලබාදීම සිදු වේ.

මෙම කන්නයේ වී මිල දී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ණය පහසුකම් ලබාදිය යුතු බව රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා මෙහිදී පෙන්වා දුන්නේය. ඒ අනුව වී මිලදී

## රජයේ සේවකයන්ට 7% පොලියට නිවාස ණය





## විදේශ ණය වෙනුවට විදෙස් ආයෝජන කෙරෙහි රජයේ වැඩි අවධානය

## බීර වැනි අතුරු නිෂ්පාදනවලට මහා පරිමාණයෙන් වී ගැනීම සීමා කරන්න

ගැනීම සඳහා අවශ්‍ය ණය ලබා දීමේ කටයුතු කඩිනම් කරන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙහි දී උපදෙස් දුන්නේය. එමගින් බීර නිෂ්පාදනය වැනි අතුරු නිෂ්පාදන සඳහා මහා පරිමාණ වශයෙන් වී මිලදී ගැනීම සීමා කළ හැකි බවද හෙතෙම පෙන්වා දුන්නේය.

නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ක්‍රියාත්මක මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රම සඳහා සියයට 6.25 පොලියට ණය පහසුකම් ලබාදීම ආරම්භ වී තිබෙන අතර, විදුලිය ලබා ගැනීම ඇතුළු සමෘද්ධි සමාජිකයන් වෙනුවෙන් පිරිනමන සහන ණය මුදල් කඩිනමින් ලබා දීම පිළිබඳ ද මෙහිදී අගමැතිවරයාගේ අවධානය යොමු විය.

විදේශ ණය සඳහා යොමුවීම වෙනුවට විදේශ ආයෝජන සම්බන්ධයෙන් රජය මේ වනවිට වැඩි අවධානයක් යොමු කර ඇතැයි මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර්. ආටිගල මහතා මෙහිදී පෙන්වා දුන් අතර එය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළේය. ශ්‍රී ලංකා රේගුවේ ආනයන අංශය ඔන්ලයින් තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන බව පෙන්වා දුන් රේගු අධ්‍යක්ෂ ජනරාල් ජී.වී රවිප්‍රිය මහතා එමගින් ගැටලු අවම කර ගැනීමට උපකාර වූ බව පෙන්වා දුන්නේය.

එමෙන්ම දිනකට රේගුවට පැමිණෙන වාප්පු ලිපිකරුවන් සංඛ්‍යාව සියයට 60කින් පමණ අඩුකර ගැනීමට එය උපකාරි වූ බව කියා සිටියේය. මේ අතර දේශීය අදායම් දෙපාර්තමේන්තුවට ඔන්ලයින් ක්‍රමයට බදු ගෙවීම ක්‍රියාත්මක අතර ඊට බැංකු 5ක එකගත්වය හිමි වූ බවද එම නිලධාරීහු අගමැති මහින්ද රාජපක්ෂ මහතාට දැනුම් දුන්හ.

බැංකුවලට ණය මුදල් හා ලීසිං මුදල් කලින් පියවීමේ දී සියයට 3ක ගාස්තුවක් ගෙවීමට සිදුවීම පිළිබඳ අවධානය යොමු කළ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා එම ගෙවීම සම්පූර්ණයෙන්ම නතර කළ යුතු යැයි මෙහිදී යෝජනා කළේය. මෙම අවස්ථාවට රාජ්‍ය ඇමැතිවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල්, ශෙහාන් සේමසිංහ, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර් අටිගල මහත්වරුන් ඇතුළු නිලධාරීහු රැසක් එක්ව සිටියහ.

## කිරි ගොවියාට අය-වැයෙන් දුන් ලක්ෂ 5ක ණය මුදල 10ක් දක්වා වැඩි වෙයි

## රට පුරා ඇති සෑම වැවක්ම මැනීමට සැලසුම්

## වැව් 5000ක් ප්‍රතිසංස්කරණ වැඩසටහන කොන්ත්‍රාත් පදනමින් බැහැරව

### ඇමැති චමල් කියයි



**චන්දිමා කරුණාරත්න**

මිනුම්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව රටේ සෑම වැවකම මැනුම් කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා පැවැසී ය.

ඉදිරි අවුරුදු 5 ඇතුළතදී වැව් 5000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය හැකි තරම් කොන්ත්‍රාත් පදනමින් බැහැරව සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ගමට ලබා දෙන සම්පතක් ලෙස වැව් ආරක්ෂා කර ගැනීම අපගේ වගකීමක් බවත් අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

හම්බන්තොට දිස්ත්‍රික් 'වාරි සෞභාග්‍යයා' වාරි පුනරුත්ථාපන වැඩසටහනට යටතේ පසුගියදා (7) වීරකැටිය නුගගහවැව ප්‍රතිසංස්කරණය කිරීමේ ආරම්භක අවස්ථාවට සහභාගී වෙමින් ඇමැතිවරයා මෙසේ පැවසීය.

නුගගහවැව වසර ගණනාවකින් නඩත්තු කටයුතු නොකිරීම නිසා වල් බිහිව ජල රැඳවුම් ධාරිතාව අඩු වී තිබූ වැවකි. එම වැව රුපියල් ලක්ෂ 148ක් වැය කොට මාස 4ක් ඇතුළත ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වේ. එමගින් ගොවි ජනතාවට දෙකන්නයම ආරක්ෂිතව වගා කටයුතු සිදු කිරීමට ජලය සැපයෙනු ඇත.

ඒ අනුව නුගගහ වැවේ, වැව් බැම්ම පෝෂණය කිරීම, ඇවිදින මංතීරු සැකසීම, සෞඛ්‍යාරක්ෂිත ආහාරාපාන, අත්කම් වෙළෙඳකුටි ඉදිකිරීම, දේශීය විදේශීය සංචාරකයන් ආකර්ෂණීය වන පාරිසරික ඉදි කිරීම් ද ඇතුළුව ග්‍රාමීය ආර්ථිකයට වැදගත් කාර්යාභාරයක් සිදු වනු ඇත.

එම අවස්ථාවට සහභාගී වෙමින් වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා මෙසේ අදහස් පළ කළේය.

දකුණු ආසියාවේම දිගම උමගින් කිලෝ මීටර් 28ක් දුර හුරුළුවැවට ජලය ගෙන යනවා. මොරගහකන්ද ජලාශයේ සිට ඒ ජලය හුරුළුවැව දක්වා ගෙන යන මේ ව්‍යාපෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අප ආරම්භ කළා.

ඒ අනුරාධපුර, වව්නියාව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක සම්බන්ධ කරගනිමින් සිදුකරන දැවැන්ත වැඩසටහනක් ලෙසයි .ඒ ව්‍යාපෘතිය අවුරුදු 4ක් වැනි කාලයකදී සිදු කරන්න බලාපොරොත්තු වනවා.

ඊට අමතරව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තිබෙන තෝරා ගත් වැව් සහ ජනතාව ඉදිරිපත් කරන වැව්, ප්‍රතිසංස්කරණය ආරම්භ කරනවා. මෙම ගම්වල ඇති වැව්වල අයිතිය භාරකාරත්වය ගමේ පන්සලේ විහාරාධිපතිට භාර කරනවා. ඊළඟට ගමේ පාසලේ විදුහල්පතිතුමා හා සිසුන්ගෙන් කමිටුවක් හදනවා. ගමේ ඉන්න සියලුම ජනතාවට හැම පවුලකටම මෙහි අයිතියක් තියෙනවා. ඒ අයටත් කාර්යභාරයක් තියෙනවා. ගමේ තරුණ පිරිසට, ගොවිතැන් කරන අයට ඒ වගකීම තිබෙනවා.

උතුරුමැද බඩඉරිගුස් වවන්න ව්‍යාපෘතිය අප පටන් ගත්තා. අවශ්‍යතාවෙන් 82% ක් පමණ වවන්න අපට පුළුවන් වෙයි. ඒ සඳහා අපට අධිෂ්ඨානයක් තියෙන්න ඕනෑ. ඉලක්කයක් තියෙන්න ඕනෑ. ගොවීන්ට වවන්න අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීම අපේ යුතුකමයි. ඔබ වවන දේ සාධාරණ මිලට ගන්න රජය කටයුතු කරනවා. ඒ නිසා වවන්න බය වන්න එපා.

අප ප්‍රාදේශීය ලේකම්ට කියා මිනුම්දෝරු දෙපාර්තමේන්තුවට හරහා හැම වැවක්ම මැනුම් කටයුතු කරනවා. මේ සිතියම්වල තිබෙන මැනුම අනුව වපසරිය දැනගන්න පුළුවන්.

මහාපරාක්‍රමබාහු රජතුමා කිව්වා වගේ පොළොවට වැටෙන හැම වැහි බිඳුවක්ම පාවිච්චි නොකර මුහුදට ගලා යන්න දෙන්නෙ නැහැ. ඒක තමයි අපේ අරමුණ සහ ඉලක්කය. ඒ අනුව තමයි මේ පද්ධතිය හදන්නේ. අප මේ අවුරුදු දෙකේ තෝරා ගත්ත සියලුම වැව් ටික හදනවා. අපි ඉදිරි අවුරුදු 5 ඇතුළත වැව් 5000ක් හදනවා. අමුණු හදනවා, පොඩි ඇළවල් හදනවා. අප මේවා හදන්නේ පුළුවන් තරම් කොන්ත්‍රාත් පදනමින් බැහැරවයි. කොන්ත්‍රාත් දුන්නම බාගෙට භාරනවා සල්ලි ටික අරගෙන යනවා. අයිතිකාරයෙක් නැහැ. මේවා ආරක්ෂා කර ගැනීම අපගේ වගකීමක්. වැව ගමේ අයට දෙන සම්පතක්.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වළවේ ගගෙන් එහා පැත්තේ චන්ද්‍රිකා වැව හැදුවා. ඒ 1957 බණ්ඩාරනායක මහත්මයාගේ ආණ්ඩුව කාලේ. මගේ පියා තමයි ඉඩම් හා ඉඩම් සංවර්ධන උප ඇමැති. හුලංදාව හරස් කර අපේ බලාපොරොත්තුව උඩවළවෙන් චන්ද්‍රිකා වැවට දෙන වතුර ටික අනිත් පැත්තට ගෙන යන්නයි. එහෙමනම් නිල්වලා ගගේ වැඩ කටයුතු ඉක්මන් කර අවසන් කරන්න ඕනෑ. නිල්වලා ගගේ වතුර චන්ද්‍රිකා වැව දක්වා ගෙනිච්චොත් මේ ප්‍රදේශයේ පානීය හා ගොවිතැනට අවශ්‍ය ජලය සපුරා ගන්න පුළුවන්.

මොනරාගල දිස්ත්‍රික්කයත් ඉතාම දුෂ්කර දිස්ත්‍රික්කයක්. ඒ හරහා ගංගාගැලුවට වතුර පාවිච්චි කරන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අය. ඒ ප්‍රදේශයේ අයට කුඹුකන් ඔය ජලාශය ඉදිකර ඔක්කම්පිටිය, ඇතිමලේ, හුලංදාව ජනපදය පැත්තටත් වතුර ගෙනියන්න පුළුවන්. මේ ඔක්කොම දැවැන්ත ව්‍යාපෘති.

එම අවස්ථාවට මාතර වැල්ලබඩපත්තුව ඇතුළු හම්බන්තොට දිසාවේ උප ප්‍රධාන සංඝානායක මාතර කඩවීදියේ පුණ්ණජි නායක ස්වාමින් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩමවා වදාළ අතර, පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රී සහ දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති වෛද්‍ය උපුල් ගලප්පත්ති, වීරකැටිය ඇතුළු තදාසන්න ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් ඇතුළු මහජන නියෝජිතයන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු රාජ්‍ය නිලධාරීන්, සමඟ ප්‍රදේශයේ ගොවි ජනතාව සහභාගී වී සිටියහ.

## වතු කම්කරු වැටුප් වැඩි කිරීම ගැන

## ලංකා කම්කරු කොංග්‍රසයෙන් අගමැතිට ප්‍රසාදය



**මහින්ද අලුත්ගෙදර, අසේල කුරුළුවංශ**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රටේ ආර්ථිකය පසුබෑමකට ලක්ව තිබුණ ද වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1000 දක්වා ඉහළ නැංවීමට තීන්දු කිරීම සම්බන්ධයෙන් ලංකා කම්කරු කොංග්‍රසය, අගමැති මහින්ද රාජපක්ෂ මහතාට සිය ප්‍රණාමය පිරිනමයි.

වතු කම්කරුවන්ගේ රුපියල් දහසක දෛනික වැටුප පෙරේදා (8) පැවති පඩි පාලක මණ්ඩලයේ දී අනුමත වීම සම්බන්ධයෙන් ලංකා කම්කරු කොංග්‍රසයේ මැති ඇමතිවරු පැමිණ අගමැති මහින්ද රාජපක්ෂ මහතාට ප්‍රණාමය පළ කළහ.

ලංකා කම්කරු කොංග්‍රසයේ සභාපති රාජ්‍ය ඇමැති ජීවන් තොණ්ඩමන්, උප සභාපති සෙන්තිල් තොණ්ඩමන්, භාණ්ඩාගාරික පාර්ලිමේන්තු මන්ත්‍රී මන්ත්‍රී මරුතාපන්දි රාමේශ්වරන් මහත්වරු විජේරාම පිහිටි නිල නිවසට පැමිණ මෙසේ අගමැතිවරයා හමු වී ප්‍රණාමය පිරිනැමූහ.

කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති වැටුප් මණ්ඩලයේ දී වතු කම්කරුවන් වෙනුවෙන් රුපියල් 900ක දෛනික වැටුප සහ රුපියල් සියයක දීමනාව අනුමත වී තිබේ.

ඒ වෙනුවෙන් පැවති ඡන්ද විමසීමේ දී ආණ්ඩුවේ වැවිලි සමාගම් වතු වෘත්තීය සමිති සමඟ එක්ව අනුමත වූ වැටුපට ඡන්දය ප්‍රකාශ කිරීම විශේෂත්වයකි.

# ගුරු වැටුප් ගැටලුව විසඳීමට උපරිමයෙන් කැප වනවා



## ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස්

**ගැටලුව විසඳීම අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් කරන්න බැහැ: ඒ නිසා සති දෙකකින්-මාසයකින් විසඳුම් ඉල්ලීම සාධාරණ නෑ**

ගුරු වැටුප් ගැටලුව විසඳීමට උපරිම උත්සාහය දරන බවත්, එහෙත් එය අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් තනිව කළ නොහැකි නිසා සති දෙකකින්, මාසයකින් විසඳුම් දෙන ලෙස ඉල්ලා සිටීම කිසිසේත් සාධාරණ නොවන බවත් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා පැවසීය.

මේ මස 20 වැනි දින ගුරු වැටුප් සමඟ අතුරු දීමනාව ගෙවීමට ආණ්ඩුව කටයුතු නොකළහොත් මාර්තු මාසයේ දැවැන්ත වැඩ වර්ජනයකට යාමට සියලු ගුරු හා විදුහල්පති සංගම් තීරණය කර ඇති බව ලංකා ගුරු සංගමය කර ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් දරන මතය කුමක්දැයි පෙරේදා (8) අනුරාධපුරයේදී මාධ්‍යවේදියකු මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මේ බව පැවසීය.

මෙය අද ඊයේ ඇති වූ ප්‍රශ්නයක් නෙවෙයි. යහපාලන පාලන යුගයේ සම්පූර්ණ කාලය තුළ ඔය ප්‍රශ්නය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවතුණා. ඒක විසඳීමට අප දැඩි උත්සාහයක් දරනවා. දැනටම මේ සම්බන්ධයෙන් යම් යම් පියවර අරන් තිබෙනවා.

අවසානයේදී අප වැඩපිළිවෙළක් සකස් කර ඒක ඉදිරිපත් කරනවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට. ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයට තනිවම ගන්න පුළුවන් තීරණ නෙවෙයි. බොහෝ ව්‍යාකූල සංකීර්ණ ප්‍රශ්න. ඒවා අපට දායාද වූ ප්‍රශ්නයි. අප ඇති කළ ප්‍රශ්න නෙවෙයි. ඒ නිසා මේ මාසයේ විසඳුවේ නැති නම් වැඩවර්ජනයකට යනවා කියන එක කිසිසේත් සාධාරණ ක්‍රියාමාර්ගයක් නොවෙයි. අප අවංක උත්සාහයක් දරනවා.

මමත් ගුරුවරුයෙක්. අවුරුදු 26ක් විශ්වවිද්‍යාලයේ අපේ තරුණ පරම්පරා දෙකකට අධ්‍යාපනය දුන් ගුරුවරයෙක්. ඒ මා දේශපාලනයට එන්න පෙරයි. ඉතින් ගුරුවරුන් පිළිබඳ අවංක කැක්කුමක් මට තිබෙනවා. මේ ප්‍රශ්නය විසඳීමට අප උපරිම උත්සාහයක් දරනවා. හැබැයි සති දෙකකින්, මාසයකින් මේක අංග සම්පූර්ණ විදිහට ඉවර කර විසඳුමක් දෙන්න කියන එක කිසිසේත් යථාර්ථවාදී, සාධාරණ දෙයක් කියා මා අනුමත කරන්නේ නෑ.

# වැවත්-කර්මාන්ත පුරයත් එකට බිහි වීම තරුණ පිරිසගේ ආර්ථිකයට ජවයක්

## රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ

**ඇම්. පී. සරත් පොලොන්නරුව දිස්ත්‍රික් සමූහ**



වැවත්, කර්මාන්ත පුරයත් එකට බිහිවීමෙන් ගොවියාගේත්, තරුණ තරුණියන්ගේත් ජීවන ආර්ථික තත්ත්වය ඉහළ නැංවිය හැකි බව ඉඩම් කළමනාකරණ කටයුතු, ව්‍යාපාර ඉඩම් හා දේපොළ සංවර්ධන රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා පැවසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ජනවාරි 7 වැනිදා හිඟුරක්ගොඩ පාළුවැව වැව ඉස්මත්තේ පැවැති ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ වාරි සෞභාග්‍යා වැව් 5000ක් දැයට තිළිණ කරන වැඩසටහනේදීය.

රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා මෙසේ ද කීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍ය දැක්ම තුළින් ගොවියාත්, ජනතාවත්, තරුණ තරුණියන් මේ සැම දෙනාගේම ජීවන ආර්ථික තත්ත්වය නැංවීමට කටයුතු කරගෙන යනවා. පාළුවැව ප්‍රදේශය දුෂ්කර ගම්මානයක්. මේ ප්‍රදේශයේ කර්මාන්ත පුරවරයක් ඇති කරනවා. ගම සමග පිළිසඳරක්, සෞභාග්‍ය දැක්ම වැනි වැඩසටහන් තුළින් මේ රටේ ජනතාවගේ ප්‍රශ්න ගැටලුවලට විසඳුම් ලබා දී ජනතාවට හොඳ අනාගතයක් ඇතිකරන්න කටයුතු කරනවා. මහින්ද රාජපක්ෂ මහතාගේ රජය කාලයේ යුද්ධය තිබුණා. ඒක ඉවර කළා. ඒ සමගම සුනාමි විනාශය ආවා. කොරෝනා ආවා. මේ සියල්ලටම මුහුණදී අපි රට සංවර්ධනය කළා. අනික අපිට ලැබුණේ භාණ්ඩාගාරය හිස්වූ ආණ්ඩුවක්. කුමන සංවර්ධනය කළත් පැලැස්තර සංවර්ධනය වැඩක් නැහැ. ස්ථිර විසඳුම් අවශ්‍යයි.

පොලොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංවර්ධන කමිටු සභාපති අමරකීර්ති අතුකෝරල මහතා- පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා වසම් 294ම සංවර්ධනය කර ජනතා අවශ්‍යතා ඉටුකර දෙනවා. යහපාලන රජය මේ රට විනාශ කර හිස්වූ භාණ්ඩාගාරයක් තමයි අපිට ඉතිරි වුණේ යැයි කීය.

පොලොන්නරුව මහදිසාපති ඩබ්ලිව්. ඒ ධර්මසිරි, මින්නේරිය වාරිමාර්ග ඉංජිනේරු අංජන අබේරත්න, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ඩබ්ලිව්. ඇම්. කේ. එල්. චන්ද්‍රසිරි මහතා මෙය සංවිධාන කර තිබිණි.

# මහබැංකු ගනුදෙනුවට වඩා වැඩි මුදලක් සීනි ගනුදෙනුවෙන් රටට අහිමි වෙනවා

## මන්ත්‍රී ජේ.සී. අලවතුවල

**මල්ලවපිටිය සමූහ අනුර දිසානායක**



ටයිල් ආනයනය තහනම ගැසට් එකකින් ඉවත් කර පැය කීපයකින් එය මුදල් අමාත්‍යාංශය අවලංගු කරනවා. පොල් ගෙඩියටත් ගැසට් ගහපු මේ රජයට මේක ප්‍රශ්නයක් නොවේ යැයි සමගි ජන බලවේගයේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ.සී.අලවතුවල මහතා පැවසීය.

ඒ මහතා මෙසේ පැවසුවේ පසුගිය දා කුරුණෑගල දී පැවති මාධ්‍ය හමුවක දීය.

සීනිවලට ගැසට් ගසා බදු වාසිය ගජ මිතුරන්ට දුන්නා වගේම, මේ ටයිල් සිද්ධිය හරහාත් ගජ මිතුරෙකුට ගෙනාපු ටයිල් ටික ඉවත් කරගන්න අවස්ථාව දුන්නාද කියා අපට සැකයි. මේ රජය එහෙම රජයක්. ගොඩනැගිලි හදන අය, නිවාස ඉදි කර ගන්න උත්සාහ කරන අය දැන් මේ නිසා ලත වනවා. ටයිල් මිල ඉහළ ගියා. ඒ වගේම ඒ ටයිල් වෙළෙඳපොළේ මිලදී ගන්නත් නැහැ. දේශීය ව්‍යාපාරිකයා නගාසිටුවන්න හදන රජය කරන්නේ මේ වගේ දේවල්. ගජ මිතුරන්ට අනපේක්ෂිතව ලාභ ලබන්න අවස්ථාව උදා කර දෙනවා.

සීනි බදු ඉවත් කිරීම පිළිබඳ අප කතා කළා. සීනි බදු ඉවත් කිරීම නිසා මිලියන 10කට වැඩිය රජයට අහිමි වුණා. ඒ වාසිය ජනතාවට ගියෙ නෑ. ගජමිතුරු ව්‍යාපාරිකයන්ට බදු වාසිය ලබා දෙමින් කළගුණ සලකන විදිය නිසා මහජනතාව පීඩනයට පත් වනවා. මහබැංකු ගනුදෙනුවට වඩා විශාල මුදලක් සීනි ගනුදෙනුවෙන් රටට අහිමි වී තියෙනවා.

මේ රටේ ජනතාව ඉතා අමාරුවෙන් ජීවත් වෙන අවස්ථාවක්. ඒ නිසා රජයට අප කියන්නේ, ජනතාවට සහන දෙන මුවාවෙන්, ගැසට් ගසා ජනතාව මුලා කරන්න එපා කියායි.

දැන් වරාය නැගෙනහිර ජැටිය රජය බේරො දුන්න කියා සමාජය තුළ මතයක් හදල තියෙනවා. ඇත්ත කතාව බටහිර ජැටිය 85% ඉන්දියාවට දී, 15%ක් වරාය අධිකාරියට අයිති වෙන විදියටයි ක්‍රියාත්මක වෙන්නේ. මේ ගැන රජයේ මැති ඇමතිවරුන්ගේ අදහස්වලින් තේරෙනවා. මේක තිබුණට වඩා අවාසනාවන්ත තත්ත්වයක්.

ඉන්දියාව ලංකාවට දුන්න ඩොලර් මිලියන 400 ආපහු ඉල්ලුවා. චීනයෙන් ඩොලර් මිලියන 1500ක් ණයක් දෙනවා. මේක ලොකු සැකයක්. මේ ණය මොනවටද ගන්නෙ. පොලිය කීයද. මේ වෙනුවෙන් ගෙවන්න වෙන වන්දිය මොකක්ද. මේ වෙනකොට අතිවිශාල ණයක් චීනයට ගෙවන්න තියෙනවා.

අනාගත පරම්පරාව භයානක තැනකට දාන මාවතකටයි රජය යොමු වී තියෙන්නේ. රජය පත් වෙනකොට රට ජාතිය ආගම ගැන කතා කළා. රාජ්‍ය දේපොළ විකුණන්නේ නැහැ කිව්වා. කොළඹ ඉතාම වටිනා ස්ථානවලින් අක්කර 300ක් පමණ විදේශීය සමාගම්වලට විකුණන්න හඳුනාගෙන තියෙනවා. ලේක්හවුස් එක ඉදිරිපිට ඉඩම මේ වන විටත් විකුණන්න සියලු කටයුතු සූදානම් කරලා. මේ රජය ජනතාව සම්පූර්ණයෙන්ම මුළා කර තියෙනවා. ජනතාවට දුන් පොරොන්දු සියල්ල කඩ කර විදේශවලට ණය වෙමින් රට භයානක තැනකට ගෙන යනවා.

මේ රජය බොහෝ කාරණා වගේම අධ්‍යාපනය කියන කාරණයෙනුත් අසමත් වෙලා. රජය අසමත් වුණාට කමක් නැහැ. මේ ගන්න තීන්දු තීරණ නිසා මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දරුවන් ඉතාම අසහනකාරී තත්ත්වයට පත් වනවා.

පහේ ශිෂ්‍යත්වය සමත් වන දරුවන්ට හොඳ පාසලකට යන එකත් ශිෂ්‍යාධාර ගන්න එකත් වැදගත්. මෙවර ශිෂ්‍යත්ව දරුවන් ඉහළ ලකුණු අරන් තියෙනවා. ඒ අයටත් අද ජනප්‍රිය පාසලකට යන්න බැරි වෙලා. මේ වෙනකොට ජනප්‍රිය පාසල් 109කට ළමයි 6337 අරගෙන තියෙනවා. ඉතින් කොහොමද ශිෂ්‍යත්වය සමත් ළමයි පන්තිවලට ඇතුල් කරන්නේ. ශිෂ්‍යත්වය සමත් දරුවන්ට සිදුවන්නේ විශාල අසාධාරණයක්.

# වැරදි කරන ඕනෑම කෙනෙකුට විනය ක්‍රියාමාර්ග ගන්නවා

## ශ්‍රීලපොපෙ මහ ලේකම් මන්ත්‍රී නීතිඥ සාගර කාරියවසම්

**සුභාෂිණී සේනානායක**



ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඉතාමත් දැඩි විනයක් සහිත කටයුතු කරන පක්ෂයක් බවත්, වැරදි කළ කිසියම් පුද්ගලයෙක්, දේශපාලනඥයෙක් හෝ වෙනත් ඕනෑම තරාතිරමක පුද්ගලයකුට විනය මාර්ග ගන්නා බවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රි නීතිඥ සාගර කාරියවසම් මහතා පැවැසීය.

ඒ මහතා මේ බව කියා සිටියේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මාධ්‍ය හමුවට එක් වෙමිනි.

එහිදී ඒ මහතා මෙසේද කියා සිටියේය.

පසුගිය දිනවල ඇති වූ විවිධ ප්‍රකාශ සහ වාර්තා සහ අප සමඟ කටයුතු කරන පුද්ගලයන් සිදු කරන ප්‍රකාශ සම්බන්ධයෙන් ජනතාවට කිසියම් හෝ කරුණු පැහැදිලි කිරීමක් කිරීමට අවශ්‍ය යැයි හැඟී ගියා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන්නේ ඉතාමත් දැඩි විනයක් සහිතව කටයුතු කරන පක්ෂයක්. පක්ෂයේ විනය පක්ෂයේ මහ ලේකම්වරයා වන මටත් අදාළයි. එය සැමට අදාළයි. ඒ වගේම රටේ ජනතාව බලාපොරොත්තු වුණු, විනය ගරුක, රටට ආදරය කරන පක්ෂය බිහිකිරීම තමයි, පක්ෂයට නායකත්වය දුන් මහින්ද රාජපක්ෂ මහතාගේත්, පක්ෂයේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මහතාගේත් මූලික අභිප්‍රාය වුණේ. ඒ වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂය බිහිවන්නේ ඉතා සුවිශේෂී තත්ත්වයක් මතයි. මේ රටේ යුද්ධය දිනපු, රට සංවර්ධනය කළ, ජනතාව ආදරය කළ නායකයාට බොරු චෝදනා කර, වැරදි විදිහට පරාජය කර ජනතාව නොමඟ යවා ගෙදර යැව්වා. ඊට පස්සේ එතුමා වටා එකතු වන ජනතා බලවේග සමඟ විවිධ කණ්ඩායම් විවිධ කාරණා කීවා. ඒත් අපි හැමෝම දන්නවා, ඒ බලවේගය ගොඩනැගුණේ කවුරුත් වටා නෙවේ මහින්ද රාජපක්ෂ වට කියන එක. ඒ නායකත්වය වටා ගොඩනැගුණු මහා ජනබලවේගයේ කූටප්‍රාප්තිය තමයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට නිර්මාණය වන්නේ. අප පක්ෂය නිර්මාණය කරන විට මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවේ අසුන් ගන්වන තත්ත්වයක් යටතේ එතුමන්ව පරමාදර්ශී නායකයා හැටියට පිළිගනිමින් තමයි මේ පක්ෂය ගොඩනැගුවේ.

අප බොහෝම කළගුණ දන්නා පක්ෂයක්. මේ පක්ෂයට නායකත්වය දුන්නේ මේ පක්ෂයේ ශක්තිය වුණේ හදවත වුණේ මහින්ද රාජපක්ෂ කියන ඒ ශ්‍රේෂ්ඨ චරිතයයි. නමුත් පුවත්පතක විමල් වීරවංශ මහතා කර ඇති ප්‍රකාශයක් මත ඒ මහතාට පෙන්නලා දෙන්න අපට පක්ෂයක් හැටියට යුතුකමක් හා වගකීමක් තියෙනවා. එතුමා ඉන්නේ කොතැනද, අප ඉන්නේ කොතැනද කියා පෙන්වන්න. විමල් වීරවංශ මහතා ඉරිදා ලංකාදීපයට ප්‍රකාශ කර තියෙනවා, මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නායකත්වයෙන් ඉවත් කර එය ගෝඨාභය ජනාධිපතිතුමා භාර දිය යුතුයි කියා. මේ එතුමාගේ පක්ෂය නෙවේ. එතුමාට තීරණය ගන්නත් බෑ. ඒ වගේ ප්‍රකාශයක් කරන්නත් බෑ. දේශපාලනයේදි වාසි ලබා ගන්න ඒ වගේ කුහක තැනට පත්වෙන්න පක්ෂය සූදානම් නෑ. අපේ පක්ෂය අදටත් පරමාදර්ශ නායකයා හැටියට සලකන් මහින්ද රාජපක්ෂ මහතායි. අදටත් මහින්ද රාජපක්ෂ මහතා මේ පක්ෂයේ නායකයායි. විමල්වීරවංශ මහතාට අපේ පක්ෂයේ නායකත්වය පිළිබඳ කතා කරන්න බෑ. නායකත්වය වෙනස් කරන්න කියන්න එකත් සදාචාරාත්මක නෑ. ඔහු කැබිනට් ඇමැතිවරයෙක් හැටියට කටයුතු කරන කෙනෙක් නිසා ජනතාවගෙන් සමාව ඉල්ලන්න ඕනෑ.

**පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා-**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට තවත් සහෝදර පක්ෂ සමඟ සහයෝගයෙන් දේශපාලනය කරන්නේ. පක්ෂයේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මහතා මැනවින් කළමනාකරණය කරා. අනෙකාට ගරු කරන සදාචාරයක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපේ සහෝදර පක්ෂ සමඟ කටයුතු කරනවා. මැතිවරණයෙන් පසු ආණ්ඩුව ඉදිරිපත් කරන සාධාරණ නොවන අයුක්ති සාගත දේශපාලන කටයුතු ඉදිරිපත් කර විමල් වීරවංශ මහතා වැරදි සහගත දෙයක් ඉදිරිපත් කර තියෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නමැති මේ සුවිසල් දේශපාලන ව්‍යාපාරයේ මහ ලේකම් පිළිබඳ ඔහු ගෝත්‍රික අදහස් ඉදිරිපකත් කර තියෙනවා. සාගර කාරියවසම් මහතා දේශපාලනය තුළ අනාථයෙක් නෙවේ. ඔහු 1996 සිට 1977 දක්වා උත්තරීතර ව්‍යවස්ථා දායකයේ නියෝජනය කර, ලංකාවේ දේශපාලනයේ නිදහසින් පස්සේ දේශපාලනයේ කීර්තිමත් භාවය ඇති කළ ඇල්බට් කාරියවසම් මහතාගේ පුතුයි ගෞරවයෙන් කටයුතු කරන කෙනෙක්.

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාලක ලේකම් රේණුක පෙරේරා මහතා -**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සම්බන්ධව යම් යම් මත අපේ වෙනත් කඳවුරක කෙනෙක් ප්‍රකාශ කිරීම අභ්‍යන්තර ගැටලු, මතභේද මත ඇති වුවා නොවේ. හැබැයි ඒ සියල්ල කළමනාකරණය කරන්න අපේ පක්ෂයේ පරමාදර්ශ නයකයා වූ මහින්ද රාජපක්ෂ මහතාට හැකියි.

අපේ පක්ෂ නායක රැස්වීමේදී පක්ෂ අතර තියෙන අභ්‍යන්තර ප්‍රශ්නයක් තියෙනවානම් සාකච්ඡා කර සදාචාරාත්මක අයිතියක් තියෙනවා. එවැනි වටපිටාවක් තුළ රජය නියෝජනය කරන ඇමැති වරයෙක් ජනාධිපතිතුමා අත්දැකීම් නොමැති පුද්ගලයෙක් ලෙස ප්‍රකාශ කිරීම අපට අනුමත කරන්න බෑ. ඒ වගේම පක්ෂයේ නිර්මෘතු වන බැසිල් රාපක්ෂ මහතා මේ පක්ෂය නිර්මාණය කරේ ඉහළ සිට පහළට නෙවේ. ග්‍රාමිය ජන පදනම පදනම් කරගෙනයි. පස්වන විධායක ජනාධිපති මහින්ද රාපක්ෂ මහතාගේ නායකත්වය මේ පක්ෂයෙන් ඉවත් කිරීමට විමල් වීරවංශ මැතිතුමාට ඇති හැකියාව කුමක්ද? මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය ඉවත් කරන්න කියා කිසිම කෙනෙක් කියා නෑ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කොයිම මොහොතක හෝ පක්ෂයේ තනතුරක් අවශ්‍ය යැයි ඉල්ලා නෑ.

# අපේ රට ඉන්දියාවේ කොලනියක් වන්න ජනතාව ඉඩ දෙන්නේ නෑ

## හිටපු මන්ත්‍රී නලින්ද ජයතිස්ස

**දික්වැල්ලේ තිලකරත්න, ගාල්ල උතුර සමූහ**



අපේ රට ඉන්දියාවේ කොලනියක් බවට පත් කිරීමට මේ රටේ දේශප්‍රේමී ජනතාව ඉඩ දෙන්නේ නැතැයි ජනතා විමුක්ති පෙරමුණේ හිටපු මන්ත්‍රී නලින් ද ජයතිස්ස මහතා පැවසීය.

ගාල්ලේ පැවති මාධ්‍ය හමුවක දී ඉකුත්දා (6)හෙතෙම මෙසේ කීවේය.

වැඩි දුරටත් අසහස් දැක් වූ ඒ මහතා- අප විශේෂයෙන් ඉන්දියාවට කියන්න කැමතියි ඔබ අපගේ ලොකු අයියා නොවේ හාම් පුතා නොවේ කියන එක. අප ස්වාදීන රාජ්‍යයක්. අපේ නායකයන් ඔබ ඉදිරියේ වැඳ වැටුණාට මේ රටේ ජනතාව ඉන්දියාව ඉදිරියේ වැඳ වැටෙන්න සූදානම් නැහැ.

පරිප්පු දාල, ඩෝර්රා යාත්‍රා එවල, ඉන්දු ලංකා ගිවිසුම අස්සන් කරල, ඉන්දියන් හමුදාව එවල, ඔවුන් මේ රට කොලනියක් බවට කරන්න උත්සාහ ගත්ත. හැබැයි අපේ රටේ ජනතාව ජීවිත පරිත්‍යාගයෙන් රට ඉන්දියානු කොලනියක්වීමේ අනතුරෙන් බේරාගත්තා. අදත් ඉන්දියාව උත්සාහ කරනවා අපේ රට කොලනියක් කරන්න ඒකට මේ රටේ දේශ ප්‍රේමී ජනතාව ඉඩදෙන්නේ නැහැ. මේ රටේ නායකයෝ ඉන්දියාවේ න්‍යාය පත්‍රයට යට වුණාට රටේ ජනතාව ඊට සූදානම් නැහැ.

මේ ජනාධිපතිවරයා බලයට පත් කර ගැනීමට පෙර සිටම ඉන්දියානු මැදිහත්වීම පිළිබඳ ඉගිබිගි එමින් තිබුණා. 2018 සැප්තැම්බර් මාසයේ එවකට හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන සහ වර්තමාන ජනාධිපති ගෝටාභය රාජපක්ෂ ඝාතනය කිරීම සඳහා කුමන්ත්‍රණයක් තිබුණාය කියා කිව්වේ, මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමායි. ඒක සිදු කරනවා කියා කිවවේ ඉන්දියාවේ රෝ ඔත්තු සේවයෙන්.

අද එතකොට ඒ ආරක්ෂක ලේකම් ජනාධිපති වෙලා. හිටපු ජනාධිපති ඒ ආණ්ඩුවේම මන්ත්‍රී වෙලා. ඉතින් ඉන්දියාවේ රෝ ඔත්තුසේවය සම්බන්ධ වී කරන්න ගිය කුමන්ත්‍රණය ගැන හොයන එක ඒ නායකයන්ගේ වගකීමක්. නමුත් එහෙම දෙයක් අපට පේන්නේ නෑ.

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ අය අවේ ගියේ ඉන්දියාවට. සෞදි අරාබියට නෙවෙයි. තොරතුර ආවේ ඉන්දියාවෙන් වුණාට ඉනිදියානු මහ කොමසාරිස් කාර්යාලය එක දශමයකින් ආරක්ෂාව වැඩි කරේ නැහැ. ජනාධිපතිතුමාගෙන්, ආරක්ෂක ලේකම්තුමාගෙන් ඇයි ඔබ පුලස්තිනි රාජේන්ද්‍රන් නැත්නම් සාරාව ඉන්දියාවෙන් ඉල්ලන්නේ නැත්තේ කියා අප අහනවා. ඇය මේ පාස්කු බෝම්බ ප්‍රහාරයේ කටුවාපිටියේ බෝම්බකරුගේ බිරියයි. ඒ වගේම ගොඩක් තොරතුරු දන්න කෙනෙක්. කාත්තන්කුඩි බෝම්බ ප්‍රහාරයේදි ඇයව හොර රහසේ ඉන්දියාවට ගෙන්න ගන්න යම් කණ්ඩායමක් සමත් වුණා. අපේ ආණ්ඩුව දැක්කේ නැහැ සාරාව ඉන්දියාවෙන් ඉල්ලනවා. ඉන්දියාව කියන්නෙත් නැහැ සාරාව දෙනවා කියා.

වතුවල වැඩ කරන ජනතාවට දෛනික වැටුප ප්‍රමාණවත් නැහැ. දාහ ඉල්ලත් ගොඩක් කල්. මේ ජීවන වියදම, බඩු මිල වැඩි වන හැටියට, අධ්‍යාපන වියදම්වල හැටියට එළවළු මිල වේගවත්වීම අනුව රුපියල් දාහ ප්‍රමාණවත් නැහැ. ඒකත් වැඩි වෙන්න ඕනෑ. හිටපු සැම පාලකයෙක්ම ඔවුන්ව රැවැට්ටුවා.

# ජනතාවට ජීවන වියදම දරා ගන්න බැරි වෙලා

## මන්ත්‍රී රෝහිණී කවිරත්න

**උකුවෙල සංචාරක ප්‍රියන්ත සුමනසේන**



අද රට මන්ද පෝෂණයට ලක්වෙලා. ජීවන වියදම ජනතාවට දරන්න බැරි තරම් ඉහළ ගිහින්. එදිනෙදා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ජනතාවට දරන්න බැරි තරමට ඉහළ ගොස් ඇතැයි පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිණී කවිරත්න මහත්මිය පැවසුවාය .

මාතලේ රත්තොට කාර්යාලයේදී මෙම අදහස් පළ කළේ මාධ්‍ය හමුවකට එක්වෙමිනි .

එහිදී ඇය මෙසේද පැවසුවාය- සෞභාග්‍යමත් පවුලක් කොහොම හදන්නද? අද පොල් සම්බෝලයි බතුයි කාල ඉන්නට බැරි තරමට ජනතාව අසරණ වෙලා. හාල් කිලෝ එකක මිල රුපියල් 100 සිට 145ටත්, පොල්ගෙඩියත් රුපියල් 100 සිට 120ටත් ඉහළ ගිහින්. අනෙකුත් ද්‍රව්‍යවල මිල කතා කර වැඩක් නැහැ. කහ මිල රත්රන් වලටත් ඉහළයි.

ආණ්ඩුව ආසියාවේ විශාලතම ගවමස් නිෂ්පාදනාගාරය ලංකාවේ ඇති කරන්න යනවා. මෙයින් ජනතාව රජය කරන්නේ කුමක්ද කියන කාරනය තේරුම් අරන් තියෙනවා. රෑ දනියෙල් දවල් මිගෙල් කියන එක පෙන්නලා තියෙනවා .

අද නැගෙනහිර ජැටිය අරන්, බටහිර ජැටිය විකුණන්න මේ වන විටත් පිබුරුපත් සකස් කරමින් ඉන්නවා. මේ ආණ්ඩුව කෙරෙහි ජනතාව දැඩි කලකිරීමකට පත් වෙලා. සෞභාග්‍ය යේ දැක්මේ අප දැකපු විශේෂ දෙයක් නැහැ.

# පෞද්ගලික බස්වලින් කප්පම් ගන්නන්ට නීතිය තදින්

**සුභාෂිණී සේනානායක**

පෞද්ගලික බස් රථවලින් කප්පම් ගන්නා වේලා සටහන් කරුවන්ට සහ ඔවුන්ට කප්පම් දෙන පුද්ගලයන් ට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන බව බස්නාහිර පළාත් මාර්ගස්ත මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති ප්‍රසන්න සංජීව මහතා පැවසීය. ඒ සම්බන්ධයෙන් වැටලීම් ක්‍රියාත්මක කර ඇති බව කී ඒ මහතා පෞද්ගලික බස්රථ වේලාසටහන් කරුවන්ට කප්පම් ගැනීමට අවශ්‍යතාවක් නැති බවත්, ඔවුන් රුපියල් 40,000ට වැඩි වැටුපක් මසකට උපයන බවත් කියා සිටියේය.


දිනමිණ කළ විමසීමකට පිළිතුරු ලබා දෙමින් මේ බව කියා සිටි ඒ මහතා එහිදි මෙසේද කියා සිටියේය.

කප්පම් දීම පුරුදු කරගත් පුද්ගලයන්ම මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටිනවා. රුපියල් දෙකෙන් රුපියල් පහෙන් පටන් ගත්ත මේ මුදල්දීම මේ වනවිට රුපියල් 100ක් දක්වා වැඩිව තිබෙනවා. ලැබුණු පැමිණිලිවලට අනුව පසුගියදා බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් සහ ආණ්ඩුකාරතුමාගේ උපදෙස් අනුව පරීක්ෂණ සිදු කළා.

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk

## පාපන්දුවේ දියුණුවට ක්‍රීඩා ඇමැතිගෙන් නව වැඩපිළිවෙළක්



**ස්වර්ණා විජේකෝන්**
**සන්ධ්‍යා කරුණාරත්න**

මෙරට පාපන්දු ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් කෙටි, මධ්‍ය සහ දිගු කාලින වශයෙන් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (09) ප්‍රකාශ කළේය.

මෙරට පාපන්දු ක්‍රීඩාවේ නිරතවන්නන්ගේ සංඛ්‍යාව මිලියන දෙක දක්වා ඉහළ නැංවීමටද සැලසුම් කර ඇති අතර, ලෝක ශ්‍රේණිගත කිරීම්වල 150 වන ස්ථානය දක්වා ශ්‍රී ලංකාව රැගෙන ඒමට අපේක්ෂා කරන බවද ඇමැතිවරයා පැවසීය. පාපන්දු ක්‍රීඩාවේ ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාව දැනට සිටින්නේ 206 වැනි ස්ථානයේ බැවින් පාපන්දු ක්‍රීඩාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් දිගුකාලීන වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතු බවද ඇමතිවරයා පැවසීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කළේය .

ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන්ද අදහස් දක්වමින් අමාත්‍යවරයා පැවසුවේ පසුගිය වසර 5 තුළ මෙරට ක්‍රිකට් ක්‍රීඩාව විශාල පසු බෑමකට ලක් වී ඇති බවයි. ක්‍රිකට් ආයතනයට කිසිදු දේශපාලන ඇඟිලි ගැසීමක් සිදු නොවන බව පෙන්වා දුන් අමාත්‍යවරයා පැරණි ක්‍රීඩා පනත වෙනුවට නව ක්‍රීඩා පනතක් හඳුන්වා දීමට කටයුතු කරන බවත් ඒ සඳහා මේ වන විටත් කෙටුම්පත් සකස් වෙමින් පවතින බවත් පැහැදිලි කළේය.

'ලංකාවේ ක්‍රිකට් වැටෙන්න පටන් අරන් අවුරුදු 5 ක් වෙනවා. ක්‍රිකට් ක්‍රීඩාවේ කල්ලිවාදය පවතින බවට චෝදනා එල්ල වෙනවා. මෙය ක්‍රිකට් වලට විතරක් නොවෙයි අනික් ක්‍රීඩාවලටත් එල්ල වෙන චෝදනාවක්, කොහොම වුණත් ක්‍රිකට් පරිපාලනයට අත තියන්න දේශපාලනයට අයිතියක් නැහැ.' අමාත්‍යවරයා වැඩි දුරටත් සඳහන් කළේය.

## සල්ලි අරන් ක්‍රීඩකයන් රට පටවන ජාවාරම පිළිබඳ
# සැම්බෝ නිලධාරීන්ට එරෙහි පරීක්ෂණ අද අවසන්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා සැම්බෝ ක්‍රීඩා සම්මේලනය උපයෝගී කොටගෙන එහි හිටපු සභාපතිවරයකු හා නිලධාරීන් කිහිපදෙනකු සිදුකළ මූල්‍ය වංචා හා අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණය අද අවසන් වෙයි. හිටපු සභාපතිවරයකු සම්මේලනයේ ලිපි ශීර්ෂ භාවිත කොට අන්තර්ජාතික සම්මේලනවලින් තරගාවලි සඳහා ආරාධනා පත්‍ර ලබාගෙන ඒ ඔස්සේ ක්‍රීඩකයන් රට පටවන ජාවාරමක් සිදුකළ බවට ලද පැමිණිල්ල පිළිබඳ පසුගිය දින කිහිපයේ පරීක්ෂණ පැවැත්වුණි. ඒ සම්බන්ධ පාර්ශ්ව දෙකක සාක්ෂි සටහන් කොටගෙන තිබූ අතර, අවසන් වාර්තාව අද සකස් කරන බව සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ ශීලා ද සේරම් මහත්මිය 'දිනමිණ' කළ විමසීමකදී පැවැසුවාය.

ක්‍රීඩකයන් රට පටවන ආකාරයෙන් ලක්ෂ ගණන් මුදල් ලබා ඇති අතර, මුදල් ලබාගෙන විදෙස් ගත කිරීමට නොහැකිවූ අය ඒ පිළිබඳ පොලිස් පැමිණිලි ඉදිරිපත් කළ අවස්ථා ද ක්‍රීඩා අමාත්‍යාංශයට වාර්තා වී තිබිණි.

ලිතුවේනියාවේ පැවැති තරගාවලියක් සඳහා ව්‍යාජ තොරතුරු සපයා ලිතුවේනියා සැම්බෝ සම්මේලනයෙන් ආරාධනා පත්‍ර ගෙන්වා ඒවා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පෙන්වා කූට ලෙස මුදල් ලබාගෙන ඇති අතර ප්‍රංශ ග්‍රෑන්ඩ් ස්ලෑම් තරගාවලිය සඳහා කිසි දිනෙවක සැම්බෝ ක්‍රීඩා නොකළ පිරිසකට සැම්බෝ සම්මේලනයේ ඊමේල් ලිපිනය භාවිතා කොට ආරාධනා පත්‍ර ගෙන්වා මුදල් ලබා ගැනීම, රොමේනියාවේ පැවැති තරග සංචාරයකට ද ඒ ආකාරයෙන්ම ආරාධනා පත්‍ර ගෙන්වා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් මුදල් ලබා ගැනීම සම්බන්ධ චෝදනා එල්ලවී ඇත. ඔහු ඇතැම් අවස්ථාවලදී ව්‍යාජ ආකාරයෙන් සැකසූ අන්තර්ජාතික ක්‍රීඩා සම්මේලනවල ආරාධනා පත්‍ර සකසා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ නොමග යැවූ අවස්ථා ද හෙළිවෙමින් පවතී.

ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනයේ හිටපු සභාපතිවරයා වසර 2016 දී කොරියාවේ පැවැති ලෝක සටන් කලා ක්‍රීඩා ශූරතාවලියට ගොස් මුදල් ගෙන කොරියාවේදී මුදාහැර ඇති අතර, ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය උපයෝගී කොට එම තරගාවලියේදී ක්‍රීඩකයන් තිදෙනකු කොරියාවේදී මුදල් ලබාගෙන නිදහස් කොට ඇතැයි පැවැසේ. එමෙන්ම 2017දී ප්‍රංශයේදී ශ්‍රී ලංකා ජු ජිට්සු සම්මේලනය හරහා ජාතික සංචිතයේ ක්‍රීඩකයන් දෙදෙනකු හා ක්‍රීඩා නිලධාරියකු මුදල් ලබාගෙන ප්‍රංශයේදී මුදාහැර ඇතැයි පැමිණිල්ලේ දැක්වේ. මේ එක් අයකුගෙන් රුපියල් ලක්ෂ 10ක් හෝ ඇතැම් අවස්ථාවලදී එම වටිනාකමට දේපල ලබාගෙන ඇතැයිද විදෙස්ගත කිරීමට නොහැකි වූ අය මෙම මුදල් වංචා සම්බන්ධ පොලිසියට පැමිණිලි කොට ඇතැයි ද සඳහන් වේ.

එමෙන්ම සූමෝ, ජූ ජුට්සු හා සැම්බෝ ශ්‍රී ලංකා සංගම් වෙත ජාත්‍යන්තර ක්‍රීඩා සම්මේලන මගින් ලබාදෙන ක්‍රීඩා භාණ්ඩ සම්මේලනයට ලබා නොදී අළෙවි කිරීමේ ජාවාරමක් පිළිබඳවද තොරතුරු සොයා බලා ඇත.

ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනයේ නිලධාරීන් කිහිපදෙනකුගේ අස්සනින් යුතුව දීර්ඝ ලිපියක් ද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාට යොමුකර ඇති අතර, එහි පිටපත් ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට හා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංගම් අංශයට යොමු කොට තිබිණි. එම ලිපි මගින් දැනුම්දී ඇත්තේ ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනයේ හිටපු සභාපතිවරයා හා හිටපු ලේකම්වරිය සම්මේලනයේ ඊ මේල් ලිපිනය, ලිපි ශීර්ෂ, නිල මුද්‍රා භාවිතා කොට රාජ්‍ය දෙපාර්තමේන්තු, අන්තර්ජාතික සම්මේලන, ක්‍රීඩා අමාත්‍යාංශය, පෞද්ගලික බැංකු හා මෙරට ක්‍රීඩා සමාජ වෙත කූඨ ලේඛණ සකසා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ වහාම පරීක්ෂණයක් ආරම්භ කරන ලෙසය. ශ්‍රී ලංකා සැම්බෝ සම්මේලනයේ හිටපු සභාපතිවරයා විසින් ව්‍යාජ නිලධාරී මණ්ඩලයක් සකසා ඇති අතර, එම සියලු දෙනාගේ ලිපින එම හිටපු සභාපතිවරයා පදිංචි නිවසේ ලිපිනය වේ. එම ව්‍යාජ නිලධාරී මණ්ඩලයේ උප තනතුරු සඳහා නම්කොට ඇති කිසිදු පුද්ගලයකුගේ ලිපින හෝ දුරකතන අංක නොමැත. මෙම ව්‍යාජ නිලධාරී මණ්ඩලය පසුගිය වසරේ ව්‍යාජ ලෙස සකස් කරන ලද මහා සභා වාර්තාවකින් බලයට පත්කොට හිටපු සභාපතිවරයා මෙම ජාවාරම කරගෙන යන බව සඳහන් කොට ඇත.

## ශ්‍රී ලංකා පිලේ කොදෙව් සංචාරය කල් යයි

**ෆවුස් මොහොමඩ්**

ප්‍රධාන පුහුණුකරු මිකී ආතර් සහ පිතිකරු ළහිරු තිරිමාන්න කොවිඩ් ආසාදනය වීමෙන් උද්ගත වූ තත්ත්වය මත ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ බටහිර ඉන්දීය කොදෙව් දූපත් සංචාරය නියමිත කාල වකවානුව තුළ සිදුනොවනු ඇතැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ඈෂ්ලි ද සිල්වා මහතා 'දිනමිණ'ට ප්‍රකාශ කළේය. කොදෙව් සංචාරය ඉලක්ක කරමින් පුහුණුවීම් කටයුතු ආරම්භ කිරීම අද (10) ක්‍රීඩකයන්ට තවත් පීසීආර් පරීක්ෂණක් සිදු කිරීමෙන් පසු තීරණය කරන බවත් ඔහු කීවේය.

ප්‍රධාන පුහුණුකරු මිකී ආතර් සහ පිතිකරු ළහිරු තිරිමාන්න කොවිඩ් ආසාදිතයන් බවට තහවුරු වීමෙන් පසු ශ්‍රී ලංකා සංචිතයේ ක්‍රීඩකයන් සහ පුහුණු කාර්ය මණ්ඩලයේ 30කට ආසන්න පිරිසකට ස්වයං නිරෝධානය වීමට උපදෙස් ලබා දී ඇතැයි වාර්තා වන අතර, ඉන් 15 දෙනකු පුහුණුකරුගේ සහ තිරිමාන්නගේ පළමු ආශ්‍රිතයන් බවට හඳුනා ගෙන තිබේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් සංචිතයේ ක්‍රීඩකයන් වැඩි පිරිසක් පසුගිය 2 වැනිදා පැවැති සඩීර සමරවික්‍රමගේ විවාහ මංගලෝත්සවයට සහභාගිවී ඇති බවට වාර්තාවේ. එදින රාත්‍රියේ පැවැති එම විවාහ මංගලෝත්සවයට ක්‍රීඩකයන් සහභාගි වී ඇත්තේ එදින දහවල් කාලයේ පීසීආර් පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසුව බවත් ආරංචි මාර්ග සඳහන් කරයි. කොවිඩ් ආසාදිත බවට පසු දින තහවුරු වූ ළහිරු තිරිමාන්න ද එම විවාහ මංගලෝත්සවයට සහභාගි වී තිබේ. ඒ අනුව පීසීආර් පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් වීමට පෙර ක්‍රීඩකයන් එවැනි එළිමහන් උත්සවයකට සහභාගි වීම සම්බන්ධව බොහෝ පාර්ශ්ව විමතිය පළ කර තිබිණි.

## රග්බි ආයතනය යොවුන් පිලට ක්‍රීඩා ඇමැති සහාය පතයි

**ෆවුස් මොහොමඩ්**

අවුරුදු 19න් පහළ ආසියානු රග්බි ශූරතාවලියට සහභාගිවීමටත්, යොවුන් ක්‍රීඩකයන් පුහුණු කිරීමටත් ශ්‍රී ලංකා රග්බි ආයතනය ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂ මහතාගේ අනුමැතිය සහ සහයෝගය අපේක්ෂා කරයි. ලබන අප්‍රේල් මාසයේ චීන තායිපේ හී දී පැවැත්වීමට නියමිත මේ ශූරතාවලිය ලෝක කුසලාන කනිෂ්ඨ රග්බි තරගාවලියට සුදුසුකම් ලැබෙන වැදගත් තරගාවලියක් බැවින් ඊට සහභාගි වී මෙරට ක්‍රීඩකයන්ගේ දස්කම් උරගා බැලීමට පසුබිම නිර්මාණය කිරීම රග්බි ආයතනයේ බලාපොරොත්තුව වී තිබේ. ඒ අනුව තරගාවලිය ඉලක්ක කරමින් රග්බි ආයතනය වැය කිරීමට අපේක්ෂිත මුදලට යම් කිසි දායකත්වයක් සහ තරගාවලියට සහභාගි වීමට අනුමැතිය ඉල්ලා රග්බි ආයතනයේ සභාපති රිස්ලි ඉල්යාස් මහතාගේ අස්සනින් යුතුව ක්‍රීඩා ඇමතිවරයාට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතැයි ආරංචි මාර්ග සඳහන් කරයි.

කොවිඩ් වසංගතය හේතුවෙන් දැඩි බලපෑමක් එල්ලවී ඇති රග්බි ක්‍රීඩාව දැඩි අවදානම් සහිත ක්‍රීඩාවක් බවට සෞඛ්‍ය අංශ නම් කර ඇති බැවින් සංචිත 3ක් නම් කර එම සංචිත ජෛව බුබුළු ආරක්ෂිත ක්‍රමවේදය ඔස්සේ පුහුණු කිරීමට රග්බි ආයතනය අදහස් කර ඇත. මූලික වශයෙන් ක්‍රීඩකයන් 180ක් පමණ සංචිතගත කිරීමට නියමිතව ඇති අතර, එකිනෙකා අතර සම්බන්ධතාවක් සිදු නොවන පරිදි ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු කිරීමේ අවශ්‍යතාව එම ලිපිය මගින් පෙන්වා දී තිබේ. මූලික සංචිතයෙන් ක්‍රීඩකයන් 40ක් සහ 30ක් වශයෙන් වෙන් වෙන්ව තෝරා ගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ බුබුළු ආරක්ෂිත වළල්ලකට ඇතුළත් කර පුහුණු කරවීම සඳහා වැඩි මුදලක් වැය වන බව ද එම ලිපියෙහි සඳහන් වේ. ඒ සඳහා රුපියල් මිලියන 18ක් පමණ වැය වනු ඇතැයි රග්බි ආයතනය සඳහන් කර ඇත.පුහුණුවීම් සඳහා වැය වන මුදල් ප්‍රමාණය අඩු කරගැනීමටත්, සංචාරය සඳහා වැය වන මුදල සොයා ගැනීමටත් රග්බි ආයතනය මීට පෙර අවස්ථා දෙකකදී මහේල් ජයවර්ධන මහතාගේ සභාපතිධුරයෙන් යුතු ක්‍රීඩා කවුන්සිලය සමග ද සාකච්ඡා කර තිබේ.

ඒ අනුව කොවිඩ් මාර්ගෝපදේශ යටතේ යොවුන් ක්‍රීඩකයන්ගේ පුහුණුවීම් ආරම්භ කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, ක්‍රීඩකයන්ට අවශ්‍ය ආහාරපාන, ක්‍රීඩා පිටි, නේවාසික ආදි පහසුකම් සැපයීමටත් රග්බි ආයතනය ක්‍රීඩා ඇමතිවරයාගේ සහාය අපේක්ෂා කරමින් එම ලිපිය යොමු කර ඇත. පීසීආර් සහ ඇන්ටිජන් පරීක්ෂණ මෙන්ම එම සංචාරයට අවශ්‍ය ගුවන් ප්‍රවේශපත් ලබා ගැනීමටත් මෙන්ම ඒ සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීමට සහාය දක්වන ලෙසත් රග්බි ආයතනය ක්‍රීඩා ඇමතිවරයාගෙන් ඉල්ලා සිටී.

ශ්‍රී ලංකා රග්බි කණ්ඩායමේ නිල අනුග්‍රාහක ඩයලොග් ආසියාටා සමාගම, මේ වනවිට රුපියල් මිලියන 3.5ක මුදලක් ඊට වෙන් කර ඇති බවත්, ඉදිරියේදී මෙරට යොවුන් රග්බි ක්‍රීඩාවට තවදුරටත් අනුග්‍රාහක දායකත්වය ලබාදීමට එකඟවී ඇති බවත් එම ලිපියේ වැඩි දුරටත් සඳහන් වේ.



## රාජකීය - සා.තෝමස් නිල් මහා සටන සූරියවැවට ගෙන යෑමේ තීරණයක්

**ප්‍රින්ස් ගුණසේකර**

කොළඹ රාජකීය - ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල් අතර 142 වැනි නිල් මහා සටන මහා ක්‍රිකට් තරගය මෙවර හම්බන්තොට සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ පැවැත්වීමට තීරණය කර ඇත. ප්‍රේක්ෂකයන්ගෙන් තොරව ජෛව බුබුළක ආකාරයෙන් මෙම මහා ක්‍රිකට් තරගය සංවිධාන කිරීමට මූලික සාකච්ඡා පවත්වා ඇත.

කෙසේ වුවද අද දින පෙරවරුවේ මේ පිළිබඳ අවසන් තීරණයකට එළැඹීමට විදුහල් දෙකේ ප්‍රධානීන් හා ක්‍රිකට් ක්‍රීඩා භාර අංශ ප්‍රධානීන්ගේ හමුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. සෑම වසරකම මාර්තු මාසයේදී මෙම මහා තරගය පැවැත්වුවද පවතින වාතාවරණය හේතුවෙන් මෙවර තරගය අප්‍රේල් 7වැනිදා සිට දින තුනක් පැවැත්වීමට මූලික එකඟතාවක් ඇතිව තිබේ.

පසුගිය වසරේදී කොළඹ රාජකීය - ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල් අතර 141 වැනි නිල්මහා සටන කොළඹ එස්. එස්. සී. පිටියේදී පැවැති අතර, ඒ සමගම කොරෝනා වයිරසය ශ්‍රී ලංකාවට පැමිණෙමින් තිබිණි. කෙසේ වුවද එම තෙදින තරගය සාර්ථකව නිමාකර ගැනීමට විදුහල් දෙකේ සංවිධායකයෝ කටයුතු කළහ. ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් නුවර දී 1878දී ආරම්භ වූ සාන්ත පීතර සහ ප්‍රින්ස් ඇල්ෆර්ඩ් විදුහල අතර මහා ක්‍රිකට් තරගයට පමණක් දෙවැනි කොළඹ රාජකීය - ගල්කිස්ස සාන්ත තෝමස් විදුහල් අතර නිල් මහා සටන මහා ක්‍රිකට් තරගය කොළඹින් පිටත පවත්වන පළමු අවස්ථාව මෙය වේ. ගල්කිස්ස සාන්ත තෝමස් විදුහලේ ආදි සිසු ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක අනුස්මරණ කුසලානය වෙනුවෙන් මෙම මහා තරගය පැවැත්වේ.

## එළියකන්ද තරගාවලියට අයදුම්පත් කැඳවයි

**ගීෂා මුණසිංහ**

නව වසරේ මෝටර් රථ සහ යතුරුපැදි තරග බිමේ පළමු තරගාවලිය වන සදර්න් එළිය කන්ද මෝටර් රථ හා යතුරුපැදි තරගාවලිය සඳහා අයැදුම්පත් කැඳවා තිබේ. මේ මස 27 හා 28 දෙදින මාතර එළිය කන්දේ පැවැත්වෙන මේ තරගාවලිය කොවිඩ් වසංගත තත්ත්වය මත දින දෙකක් පැවැත්වෙන අතර, පළමු දිනය වන 27 වැනිදා යතුරුපැදි තරගාවලියත්, දෙවැනි දිනය වන 28 වැනිදා මෝටර් රථ තරගාවලියත් පැවැත්වෙන බව තරග සංවිධායකයන් වන සදර්න් මෝටර් ස්පෝර්ට්ස් සංගමය දැනුම් දෙයි.

යතුරු පැදි තරග අංශයට ඉසව් 12ක් ඇතුළත් වන අතර, මෝටර් රථ තරග අංශයට ඉසව් 14ක් ඇතුළත් ය.

තරගාවලියට එක්වන ක්‍රීඩකයන් මෙම මස 19 වැනිදාට පෙර www.smsc.lk වෙබ් අඩවිය ඔස්සේ තම අයැදුම්පත සදර්න් ක්‍රීඩා සමාජය වෙත smsc _ srilanka@yahoo.com විද්‍යුත් තැපැලට යොමු කරන ලෙස තරග සංවිධායකයෝ ඉල්ලා සිටිති.



## යොවුන් ක්‍රීඩිකාවන් සොයා අප්සාරි ගමට යයි



ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කැඳවුම්කාරිනිය අප්සාරි තිලකරත්න මහත්මියට කොලොන්න ජාතික පාසලේදී එම විදුහලේ පුහුණුකරුවන්, ආචාර්ය මණ්ඩලය සහ විදුහල්පති සමරු තිළිණයක් පිළිගන්වමින්.

**ෆවුස් මොහොමඩ්**

පළමු වරට පැවැත්වෙන අවුරුදු 19න් පහළ කාන්තා ලෝක කුසලාන තරගාවලිය ඉලක්ක කරමින් ගොඩ නැගීමට නියමිත ශ්‍රී ලංකා යොවුන් ක්‍රීඩිකාවන්ගේ සංචිතයට දස්කම් සපිරි යොවුන් පාසල් ක්‍රීඩිකාවන් සොයා යෑමේ වැඩසටහනේ තවත් අදියරක් මේ වනවිට සබරගමුව පළාත කේන්ද්‍ර කරමින් පැවැත්වෙයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මේ වැඩසටහන් මාලාව ක්‍රිකට් ආයතනයේ කාන්තා ක්‍රිකට් කැඳවුම්කාරිනිය අප්සාරි තිලකරත්න මහත්මියගේ මූලිකත්වයෙන් යුතුව සිදු කෙරේ.

මීට පෙර පළාත් මට්ටමෙන් මෙවැනි වැඩසටහන් ගණනක් පැවැති අතර, මේ වසරේ පළමු වැඩසටහන ලෙස පසුගියදා අප්සාරි තිලකරත්න මහත්මියගේ මූලිකත්වයෙන් ඇරඹුණු මේ වැඩසටහනේ එක් පියවරක් ලෙස පෙරේදා රත්නපුර දිස්ත්‍රික්කයේ අවම පහසුකම් ඇති පාසල් 3ක එම වැඩසටහන් පැවැත්වූ බව 'දිනමිණ' කළ විමසුමකදී ඒ මහත්මිය ප්‍රකාශ කළාය.

'මේ වැඩසටහන්මාලාව අතිශයින්ම සාර්ථකයි. අප සංචාරය කළ සෑම පාසලකම විදුහල්පතිවරු විශිෂ්ට සහයෝගයක් ලබා දුන්නා. ඒ වගේම දක්ෂතා ඇති යොවුන් ක්‍රීඩිකාවන් හඳුනාගැනීමට අපට සහය දුන්නා.' ඇය කීවාය.

ඒ අනුව පළමු දිනය තුළ රත්නපුර ගංකන්ද මධ්‍ය මහ විදුහල, චන්ද්‍රිකාවැව, ජයන්ති මහ විද්‍යාලය සහ කොලොන්න ජාතික පාසල් මුල් කරගනිමින් සබරගමු පළාත් වැඩසටහන ආරම්භ කළ බව තිලකරත්න මහත්මිය සඳහන් කළාය.

මෙම වැඩසටහන් තුළින් හඳුනා ගන්නා ක්‍රීඩිකාවන් එක් එක් පළාත්වල හා දිස්ත්‍රික්කයන් හී පුහුණුකරුවන් යටතේ පුහුණු කිරීමට කටයුතු යොදා ඇති අතර, ඊට පුහුණු කඳවුරු කිහිපයක් ද ඇතුළත් වේ. කෙටි කාලීන වැඩසටහන් ලෙස මෙය ක්‍රියාත්මක වන බවත්, යොවුන් සංචිතයට ක්‍රීඩිකාවන් තෝරා ගැනීම ලබන මාසයේදී සිදු කෙරෙන බවත් අප්සාරි තිලකරත්න මහත්මිය වැඩි දුරටත් සඳහන් කළාය.

අවුරුදු 19න් පහළ කාන්තා ලෝක කුසලාන තරගාවලිය මේ වසරේ අගභාගයේ බංග්ලාදේශයේ දී පැවැත්වීමට නියමිතය.

## රැට්ලා ඉදිරියේ කෝලිලා දණ නමති



හුදෙකලා සටනක නිරතවෙමින් ඉන්දීය පිල පරාජයෙන් බේරා ගැනීමට නායක විරාත් කෝලි ගත් උත්සාහය බිඳ දැමූ සංචාරක එංගලන්ත පිල චෙන්නායි නුවරදී නිමාවට පත්වූ පළමු ටෙස්ට් තරගයෙන් ලකුණු 227ක විශිෂ්ට ජයක් අත්කර ගැනීමට සමත් විය. ඒ අනුව තරග 4කින් සමන්විත දෙපිල අතර ටෙස්ට් තරගමාලාවෙන් 1-0ක් ලෙස පෙරමුණ ගැනීමට ද එංගලන්තයට හැකි විය.

එංගලන්ත පිල ලබා දුන් ලකුණු 420ක දැවැන්ත ඉලක්කය හඹා ගිය ඉන්දීය පිල ඊයේ පස්වරුතේ පානයට පෙර ලකුණු 192කට දැවී ගියේය.

මුළු ලකුණු සංඛ්‍යාව 58 දී චේටස්වර් පුජාරා දැවී යෑමෙන් පසු පිටියට පිවිසි නායක විරාත් කෝලි ආරම්භක පිතිකරු ෂබ්මන් ගිල් සමග එක්ව ඉනිම පිළිසකර කරමින් සිටියදී 27 වැනි ඕවරය යැවූ ජේම්ස් ඇන්ඩර්සන් එම ඕවරයේ දෙවැනි පන්දුවෙන් ෂබ්මන්ගේ ඉනිම ලකුණු 50කට සීමා කළ අතර, පස්වැනි පන්දුවෙන් අජින්ක්‍යා රහානේගේ කඩුල්ල බිඳ දැමුවේ ඔහු ලකුණු ලැබීමටත් පෙරය. මේ අනපේක්ෂිත සිදුවීමෙන් පසු ඉන්දීය ඉනිමේ සෙසු පිතිකරුවන් දැඩි පීඩනයකට හසු විය.

අනතුරුව කෝලි සමග එක් වූ රවිචන්ද්‍රන් අශ්වින් 7 වැනි කඩුල්ලට ලකුණු 54ක සම්බන්ධතාවක් ගොඩ නැගූවත් පරාජයෙන් බේරීමට එය ප්‍රමාණවත් නොවීය.

ඉන්දීය පිල පරාජයෙන් බේරා ගැනීමට දැඩි උත්සාහයක නිරත වූ විරාත් කෝලි මිනිත්තු 153ක් කඩුල්ලේ රැඳී සිටිමින් ලකුණු 72ක් රැස් කිරීමට සමත් විය. ඊට හතරේ පහර 9ක් ඇතුළත් විය.


අංකුට්ටා



බණ්ඩි තිත්තයා


බුලත්හපයා


ලේ තිත්තයා


ගල්පාඩියා


හොරපොලයා


දංකොළ සාලයා


පෝතයා


තල්කොස්සා

# පැලැන් ගඟට ගලා යන්න ඉඩ දෙන්න

ගම කෙළවරෙන් ගලා බසිනා නිල්වන් දොළ පහර සෑම සැන්දෑවකම කුඩා දරුවන්ගේ පාරාදීසයක් විය. එදවස අප දියට බැස දියබුං ගසනවාට වඩා කළේ, දොළ පහරේ රංචු පිටින් පිහිනා යන කුඩා මසුන් අල්ලා ගන්නට තරග කිරීමය. අත්තම්මාගේ චීත්තයක් හෝ තාත්තාගේ සරමක් දෙපසින් අල්ලා එකතු කර ඇළ ඉවුරට නැමී ඇති කුඩා පඳුරු බූටෑව තුළට රිංගවා, යළි එළියට ඇද ගනිද්දී ඒ තුළ වරල් ගසන තල් කොස්සන්, දණ්ඩි, කොරලි පැන යන්නට සටන් කරයි. අප උන් කුඩා බේසමකට හෝ බාල්දියකට දමා බලා සිටිමු. විටෙක බේසම් ගැට්ටෙන් දොළට පැන ගන්නට උන් සමත් වෙති. එසේ නොවුණත් උන් යළිත් ඇළට අතහැර දමා එන්නට අප අමතක නොකළෙමු. ජලයෙන් උඩට මතු වූ ගල්පර මත හිඳ වතුරට දෙපා දැමූ විට ද ඒ වටා රොක් වෙන කුඩා මසුන් දෙපය කිති කැවෙන තුරු උන්ගේ කුඩා මුවෙන් පහර දෙයි.

මේ සියල්ල අයිති අතීතයටය. වර්තමානය වන විට ඇළක, දොළක, වෙල් දෙණියක තවදුරටත් ඒ සොඳුරු දසුන දැක ගන්නට ඉඩක් නැත. මසුන්ගෙන් හිස් වූ කුඩා දිය පහරවල් උසුලන්නේ අතිමහත් පාළුවකි. එදා සිටි ඒ කුඩා මින් රළට සිදු වූයේ කුමක්ද..?

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ 90ක් පමණ ප්‍රමාණයක් වාර්තා වන අතර එයින් විශේෂ 53ක්ම ශ්‍රී ලංකාවට පමණක් ආවේණිකය.

ගෝත්‍ර 10ක්, කුල 22ක් සහ ගන 46ක් යටතට වර්ග කර ඇති මෙම මසුන් අතීතයේ ගංගා ඇළ දොළවල බහුලව ජීවත් වී තිබේ. අද අප කතා බහ කරන්නේ ශ්‍රී ලංකාවේ දැනට බහුල වශයෙන් දුලභ මිරිදිය මසුන් ජීවත් වන නමුත් මිනිසාගේ තර්ජනයට ලක්ව විනාශ වීමේ අභිමුව රැඳෙන පැලැන් ගඟ ගැනයි.

කළුතර දිස්ත්‍රික්කයේ බදුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අත්වැල්තොට ප්‍රදේශයේ පිහිටි පැලැන් ගඟ ඇරැඹෙන්නේ සිංහරාජ අඩවියෙනි. කුකුළේ ගඟෙහි අතු ගංගාවක් ලෙස ගලා බසින, ස්වභාව සෞන්දර්යයෙන් අනූන මේ සොඳුරු ගංගාව මිනිසාගේ ක්‍රියාකාරකම්වලින් දූෂණය නොවූ, නොඉඳුල් ගංගාවකි.

එය ගලා බසින්නේ පීලිතුඩ ඇල්ල නම් මීටර් පහක් පමණ උස දිය ඇල්ලක් ද නිර්මාණය කරමිනි.

පැලැන් ගඟ ඉතා පිරිසුදු දිය දහරක් වන බැවින් බොහෝ දෙනාගේ පැන් පවස නිවන්නට ද ඊට හැකිය. පැලැන් ගඟ තුළ නිර්මාණය වන පීළිතුඩ ඇල්ල ආශ්‍රිතව ඒකදේශික මත්ස්‍ය විශේෂ පහළොවක් සහ ආවේණික මත්ස්‍ය විශේෂ දහ අටක් ද සිය වාසස්ථාන සකස් කරගෙන සිටිති.

දැනට ශ්‍රී ලංකාව තුළ වාර්තා වන මිරිදිය මත්ස්‍ය විශේෂ අතරින් ගෝත්‍ර පහකට, කුල දොළහකට සහ ගන විසි පහකට අයත් මත්ස්‍ය විශේෂ තිස් දෙකක් පමණ අත්වැල්තොට පැලැන් ගඟ සිය වාසස්ථානය බවට පත් කර ගෙන තිබේ. ඒ අතර විශේෂත්වය වන්නේ ආවේණික මත්ස්‍ය විශේෂ දහ අටක්ම පැලැන් ගඟෙහි ජීවත් වීමයි.

ශාක සහ සතුන් දුර්ලභ වන තරමට වඳ වී යෑමේ තර්ජනයට මුහුණ දෙන ප්‍රවණතාවය ශීඝ්‍රයෙන් ඉහළ යයි. ශ්‍රී ලංකාවේ වාර්තා වන මිරිදිය මත්ස්‍ය විශේෂ අතුරින් 36%ක් සහ ආවේණික මත්ස්‍ය විශේෂ අතුරින් 34%ක් ජීවත් වන්නේ අත්වැල්තොට පැලැන් ගඟේ පමණි.

2012 වර්ෂයේ සකස් කරන ලද 'ජාතික රතු දත්ත ලේඛනය'ට අනුව මෙරට මිරිදිය මත්ස්‍ය අතුරින් 50 ක් වඳ වීමේ තර්ජනයට ලක්ව තිබෙන අතර ඉන් හතළිස් දෙකක්ම ශ්‍රී ලංකාවේ පමණක් ජීවත් වන අපට ආවේණික මත්ස්‍ය විශේෂයි. අත්වැල්තොට පැලැන් ගඟෙහි, වඳ වීමේ තර්ජනයට ලක්වී තිබෙන මත්ස්‍ය විශේෂ 18 අතරින් දහසයක්ම ආවේණික මත්ස්‍යයෝය. මසුන් වඳ වී යෑමේ තර්ජනය කොටස් හතරකට වෙන් කර දක්වන්නට හැකිය. දැඩි තර්ජිත, තර්ජිත, අවදානම් සහ ආසන්න තර්ජිත ලෙසින් නම් කර ඇති එම කොටස් හතර අතුරින්, පැලැන් ගඟ දැඩි තර්ජිත විශේෂ දෙකක් දැනට ජීවත් වෙති. තවදුරටත් විමසා බලන විට, තර්ජිත මට්ටමේ විශේෂ දහයක් සහ අවදානම් තත්ත්වයේ සිටින විශේෂ දෙකක් ද ආසන්න තර්ජිත මට්ටමේ විශේෂ හතරක් ද ජීවත් වන බව දක්නට ලැබේ.

එක් ස්ථානයකට පමණක් සීමා වූ, ආවේණික සහ ඒක දේශික සතුන් වඳ වී යෑම ඉතා දුක්ඛදායක කාරණයකි. එසේ වුව හොත් ඔවුන් දිනෙක පුරාවෘත්ත තුළ දී පමණක් මුණ ගැසෙන්නට හැකිය.

පරිසරයේ සමතුලිතතාවය මෙන්ම අලංකාරය ද ආරක්ෂා කරන මෙම සතුන් සුරක්ෂිත කිරීම පරිසරයට ආදරය කරන සෑම පුරවැසියකුගේම වගකීමකි.

1957 වසරේදී නාමකරණය කරන ලද 'කළුවරල් හල් මල් දණ්ඩියා' (Rasboroides nigromaginatus) දැඩි ලෙස වඳ වීමේ තර්ජනයට මුහුණ පා ඇති මත්ස්‍යයෙකි. දැනට මෙම මත්ස්‍ය වර්ගය ජීවත් වන බව වාර්තා වී ඇත්තේ පැලැන් ගඟෙහි පමණකි. එසේම මෙරටට ආවේණික මාර්ටින්ස්ටයින් වැලිගොව්වා (Stiphodon martenstyni)ගේ පළමු නිදර්ශකය හමු වී ඇත්තේ ද, එම මත්ස්‍යයා දැනටත් ජීවත් වන අත්වැල්තොට පැලැන් ගඟෙහිදීය.

මුළු ලෝකයෙන්ම මෙම මත්ස්‍ය විශේෂ දෙක හමුවන එකම ස්ථානය ද පැලැන් ගඟයි. පරිසරයෙහි විවිධත්වය ආරක්ෂා කරමින් සුන්දරත්වය ද රැක ගන්නට නම් දුර්ලභ සත්ව විශේෂ වඳ වී යන්නට ඉඩ නොතබා ආරක්ෂා කර ගත යුතුය.

පැලැන් ගඟෙහි රැකගත යුතු සම්පත් ලෙස දැක්විය හැක්කේ මත්ස්‍යයන් පමණක් නොවේ. ශ්‍රී ලංකාවේ දැනට මිරිදිය කකුළුවන් විශේෂ පනස් එකක් පමණ වාර්තා වන අතර ඉන් විශේෂ පනහක්ම අපට ආවේණිකය. එසේම ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය ඉස්සන් විශේෂ 23 ක් ද, මිරිදිය ගොලු බෙල්ලන් විශේෂ 94ක් ද වාර්තා වේ.

මෙම කකුළුවන්, ඉස්සන් වැනි සතුන් ද අත්වැල්තොට පැලැන් ගඟ තුළ ජීවත් වෙති.

පරිසර පද්ධතිය තවත් අලංකාර කරන ජලජ ශාක අතුරින් වඳ වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇති කෙටල (Leginandra) වර්ග අටක් සහ කෙකටිය (Aponogetone) විශේෂ හතරක් ද අති උඩයන් (Cryptocoryne) විශේෂ 11ක්ද අත්වැල්තොට පැලැන් ගඟෙහි දක්නට ලැබේ.

බොහෝ අවස්ථාවල මිනිස් ක්‍රියාකාරකම් සතුන්ගේ ජීවිත අවදානමට ලක් කරන අතර බොහෝ විට මිනිසුන්ගේ ඇස සහ අත ගැටෙන මානයෙහි සතුන් ගැවසෙන්නේ ද අඩුවෙනි.

ආවේණික සහ දුර්ලභ මසුන්ට ඉතා නිදහසේ නිස්කලංකව කෙළිදෙලෙන් ජීවත්වන්නට ඉඩ දී සිටි පැලැන් ගඟ, නිසංසලේ ගලා ආ ගමනෙහි යම් කඩඉමකට පැමිණ තිබේ. ගඟ හරස් කරමින් කුඩා ජල විදුලි ව්‍යාපෘතියක් ඉදි කිරීම සඳහා සූදානම් වන අතර ඉන් ගඟෙහි ජීවත් වන මේ දුර්ලභ සත්ත්වයන්ගේ ජීවිතවලට යම් කිසි තර්ජනයක් එල්ල වීමට ඉඩ ඇති බව පරිසරවේදීන් සඳහන් කරයි.

රක්ෂිත කලාපයක් ලෙස මෙතෙක් නම් කර නැති බොහෝ තැන්, මිනිසා ඔවුන්ට අවශ්‍ය පරිදි හසුරුවනු දැනටත් දක්නට ලැබෙන කනගාටුදායක තත්ත්වයකි. සංරක්ෂණය කළ යුතු ස්ථාන පිළිබඳව නිසි සොයා බැලීමකින් පසු ඒවා සුරක්ෂිත කිරීමට වැඩි කාලයක් නොගත යුත්තේ ඇතැම් විනාශයන් නැවත සකස් කිරීමට නොහැකි වන බැවිනි.

අප ජීවත් වන්නේ වැසි අධික වූ විට ගංවතුරෙන් පීඩා විඳින, නියඟය අධික වූ විට ජල හිඟයෙන් පීඩා විඳින රටකය. පරිසරයට නිදහසේ තිබෙන්නට ඉඩ නොතබන තාක් කල් මේ තර්ජන වැඩි වෙනවා මිස අඩුවක් වන්නේ නැත. පරිසරවේදීන්ගේ අදහස නම් පැලැන් ගඟෙහි විදුලි බලාගාරයක් ඉදි කිරීම මඟින් එහි සිටින දුර්ලභ සතුන් සහ ශාක විශේෂ මුළුමනින්ම වඳ වී යන්නට ඉඩ ඇති බවය.

සතුන් වඳ වී යන්නට, පරිසරයේ සමතුලිතතාවය බිඳී යන්නට මිනිස් ක්‍රියාකාරකම් හේතු වී ඇති බව අපට අමුතුවෙන් කිව යුතු නොවේ. ගංගා, ඇළ දොළ සඳහා ඒවා දෙපසින් වෙන් කර ඇති බිම් කොටස් මේ වන විට ද බොහෝ දෙනාගේ පෞද්ගලික ප්‍රයෝජන සඳහා වෙන් කර ගෙන තිබෙන බව අපට දක්නට ලැබේ. අතීතයේ ඇළ දොළ ගංගා දෙපස දක්නට ලැබුණු කුඹුක් ආදී වන හේඩෑවන් වෙනුවට; රූස්ස වනගහනය වෙනුවට, අද ගොඩනැඟිලි ද එසේත් නැතිනම් විවිධ භෝග වගාවන් ද දක්නට ලැබේ.

අතීතයේ දුටු ලෙස සෑම ඇළ දොළකම දණ්ඩි කොරලි පිනුම් ගසන ඒ අපූරු දසුන අනාගතයේ යළිත් දකින්නට අපට ඉඩක් නොලැබෙනු ඇත. නමුත් අපට ආවේණික, අපේ පරිසරය සුන්දර කරන සතුන් සහ ශාකවල පැවැත්මට අප ඉඩ දිය යුත්තේ, ඒවා අපට ආඩම්බරයක් ද වන බැවිනි.

තවදුරටත් අවිචාරවත්ව කටයුතු කළ හොත් මෙවැනි සතුන් සහ ශාක මේ බිමෙහි සුජීවත්ව සිටි බව අනාගත දරුවන්ට ඉගෙන ගන්නට ලැබෙනු ඇත්තේ පත පොතින් පමණකි. ඔවුන්ගේ දෑසින්ම ඒ වටිනාකම් දකින්නට ඉඩ ලබා දෙනවා නම් කොතරම් අපූරු ද?


රට සංවර්ධනය කළ යුතුයි. එහෙත් අපේ රටේ ස්වාභාවික සම්පත රැක ගැනීම ද අප සතු වගකීමකි. මෙසේ හිතුමතේ කුඩා බලාගාර ඉදි කිරීම හරහා පැලැන් ගඟ සහ ඒ ආශ්‍රිත පරිසර පද්ධතිය ඉතාමත් ශීඝ්‍රයෙන් විනාශ වනු ඇත. එසේම මෙම විදුලි බලාගාර ඉදි කිරීම හරහා මෙම සුවිශේෂී මත්ස්‍ය ප්‍රජාවගේ අවසන් ඉරණම විසඳෙනු ඇත. එබැවින් පැලැන් ගඟ රැකීමට ප්ලෑන් කිරීමට දැන් කාලය එළැඹ තිබේ.

තොරතුරු සහ ඡායාරූප
පරිසර යුක්ති කේන්ද්‍රය

**දිල්රූ ජයසේකර**

### පැලැන් ගඟේ දක්නට ලැබෙන දේශීය හා ඒක දේශීය මත්ස්‍ය විශේෂ

*Puntius vittatus* (Day,1865) - බණ්ඩි තිත්තයා
*Puntius litteya* (Deraniyagala- 1929) ලේ තිත්තයා
*Systomus pleurotaenia* (Bleeker1863) හීත මත්ස්‍යයා / හීත මැස්සා
*Devario malabaricus* (jerdon,1849) දංකොළ සාලයා
*Rasboroides pallidus* (Deraniyagala,1958)
පඬුවන් හල්මල් දංඩියා
*Rasboroides nigromaginatus* (meinken 1957)
කළු වරල් හල් මල් දංඩියා
*Puntius bimaculatus* (Bleeker,1863) ඉපිලි කඩයා
*Puntius kelumi* (Pethiyagoda et.al., 2008) රතු ඇස් කටු පෙතියා
*Pethia cumingii* (Gunther - 1868) කහ වරල් දෙපුල්ලියා/ පෝතයා
*Pethia nigrofasciata* (Gunther 1868) බුලත්හපයා මනමාලයා
*Rasbora dandia*
(Valenciennes, in Cuvier & Valenciennes, 1844) දංඩියා
*Systomus spllurus* (Gunther,1868) ශ්‍රී ලංකා මස් පෙතියා
*Rasbora microcephalus* (Jerdon,1849) කිරි දංඩියා
*Dawkinsia singhala* (ounker,1912) දංකොල පෙතියා
*Garra ceylonensis* (Bleeker 1863) ගල්පාඩියා
*Belontia signata* (Gunther, 1861) තල්කොස්සා
*Mystus vittatus* (Bloch,1794) ඉරි අංකුට්ටා/ හිරි අංකුට්ටා
*Pseudosphromenus cupanus* (Cuvier,1831) - පුළුට්ටා
*Mystus ankutta* (Pethiyagoda et.al, 2008) ශ්‍රී ලංකා අංකුට්ටා
*Channa gachua* (Bleeker,1877) පරඬැල් කනයා Aweous
*melanocephalus* (bleekes,1849) බලි වැලිගොව්වා
*Schistura notostigma* (Bleeker, 1863)
ගෝමර අභිරාවා/කඳු අභිරාවා
*Acanthocobitis urophthalmus* (Gunther 1886)
වයිරන් අභිරාවා/ පොල් අභිරාවා
*Sicyopus jonklaasi* (klausewitz & Henrich, 1986)
තොල් රතු වැලිගොව්වා
*Channa orientalis* (bloch & Schneider, 1801) කොළ කනයා
*Ompok bimaculatus* (Bloch,1794) වලපොත්තා/ පෙනවලයා
*Clarias brachysoma* (Gunther, 1864) මඟුරා
*Heteropneustes fossilis* (Bloch, 1797) හුංගා /ලේ හුංගා
*Schismatogobius deraniyagalai*
(Kottelat & Pethiyagoda, 1989) කට රතු වැලිගොව්වා
*Mastacembelus armatus* (Lacepede, 1803) ගං තෙලියා
*Rasboroides vateritoris* (Daraniyagala, 1930) හල් මල් දණ්ඩියා
*Xenontodon cancila* (Hamilton, 1822) යොන්නා
*Tor khudree* (Sykes, 1841) හොරපොලයා /ලෙහෙල්ලා


නිදහසේ ගලා බස්නා පැලැන් ගඟ

# වියත් සුළඟ
නොනැවතී හමා යනු පිණිස

නො: 35. ඩී.ආර්. විජයවර්ධන මාවත,
දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
kavi.dinamina@lakehouse.lk

කවියෙන් ලොව

## දාසයාගේ සිහිනය

එක්කාසු නොකරන ලද
ධාන්‍ය ගොඩක් අසල වැතිර සිටින
ඔහුගේ දෑකැත්ත අත දරන්නේය
ඔහුගේ ළමැද නිරාවරණව ඇත්තේය
ඔහුගේ සැඩපළු ගෙතුණු හිසකේ
වැල්ලෙහි කිඳී ඇත්තේ ය
සිහින ලෝකයක මිහිදුම් සෙවනැලි තුළින්
ඔහු යළිත් වතාවක් සිය ජන්ම භූමිය දකින්නේය

ඔහුගේ සිහින ලොව භූමි දර්ශන තුළින්
තෙදැති නයිජර් ගඟ ගලා බසින්නේය
තැනිතලා බිමෙහි තල්ගස් පේළිය යටින්
ඔහු යළිත් අසු අරා ගමන් ගන්නේය
තවද කඳුකර මාර්ගය දිගේ පහළට ඇදෙන
අසුන් බැඳි කරත්තවල කිකිණි නාදය ඔහුට ඇසෙන්නේය

තම දරුවන් අතර සිටගෙන සිටින
සිය දුඹුරුවන් දෑස් ඇති බිසව
ඔහු යළිත් වතාවක් දකින්නේය
ඔවුන් ඔහුගේ ගෙල වැළඳගෙන
කම්මුල් සිපගන්නෝය
නිදන්නාගේ ඇහි පිහාටු අතරින් පිපිරී එන
කඳුළක් වැලි තලාවට මුසු වන්නේය

ඉනික්බිතිව නයිජර් නදී තිරය ඔස්සේ
ඔහු අධි වේගයෙන් අසු මෙහෙයවන්නේය
අසුගේ නාස් ලනුව රන් දමකින් නිමවා ඇත්තේය
අසු පන්නන හැම වාරයක් පාසාම
ඔහුගේ වානේ කඩු කොපුව
අසුගේ ඇලපතෙහි තදින් වදිනු
ඔහුට දැනෙන්නේය

ඔහුට ඉදිරියෙන් ලෝහිත වර්ණ ධජයක් සේ
දීප්තිමත් 'ෆ්ලැමිංගෝ' පක්ෂීන් පියා සලන්නෝය
උදේ සිට රෑවන තුරුම ඔහු සියඹලා තුරු බහුල තැනිතලාව දිගේ
එම විහඟුන්ගේ පියාසැරිය ලුහු බඳින්නේය
කාපිරින්ගේ පැල්පත් සහ මහ සයුර නෙත ගැටෙනා තුරු මෙන්ම
රාත්‍රි කාලයේ සිංහ නාදයත්-හයිනාවන්ගේ හූ හඬත්
ඇසෙන තුරු ඔහු අසු මෙහෙයවන්නේය

එමෙන්ම සැඟවුණු ඇලක් අසළ බට ගාලක් තලා දමන
හිපපොටේමසකුගේ හඬද ඔහුට ඇසෙන්නේය
මේ හඬවල් ඔහුගේ සිහිනයේ ජයග්‍රහණ තුළින්
එකිනෙක සවන්ගත වන්නේය
වනගහනය ලක්ෂ සංඛ්‍යාත දිවගින්
නිදහස උදෙසා යදින්නේය
කාන්තාරය ද වේගවත්ව වියරුවෙන් මෙන්
නිදහසේ පතන්නා සේය
නිදන්නා තම සිහිනය සිනහවකින් පටන් ගත්තේ
ප්‍රචණ්ඩ වූ ප්‍රමෝදයක් මධ්‍යයේය

ඔහුට දැන් දාසයන් මෙහෙයවන්නාගේ කස පහර හෝ
දවසේ ගිනියම් උෟෂ්ණය නොදැනෙන්නේය
ස්වප්නයේ නිදන භූමිය මරණය විසින්
ආලෝකමත් කැර ඇත්තා සේය
ඔහුගේ ප්‍රාණය නිරුද්ධ සිරුර නම් වූ
ගෙවී ගිය ජීවන විලංගුව දැන්
ආත්මය විසින් කඩා බිඳ ඉවත දමා හමාරය!

Henry Wadsworth Longfellow
පරිවර්තනය
**නිමල් විජයතුංග**

## ආදරේ වර්ග දෙකක්

ඔයා ඇවිත් නැවැත්තුවා කාර් එක
ඔෆිස් එකට පාරෙන් අනිත් පැත්තෙ
මම බලා හිටියා තත්පරයක්
ඔයා ඇහුවා "ඇයි" කියලා
"මුකුත් නෑ" කියලා හාද්දක් දීලා
බැහැලා යද්දි
පොඩි හිනාවක් ආව හිතට

අප්පච්චියි වෙනදට බස්සන්නෙ
කාර් එක හරවන් ඇවිත්
නවත්තන්නෙ ඔෆිස් එක ගාවම
මට පාර පනින්න නැති වෙන්න

තරහ ගියෙ, දුක හිතුණෙ නෑ මට
දන්නවා ආදරේ අඩුවක් නැති බව ඔයාගෙ
"කොරෝනා නිසා එපා බස්වල යන්න"
කියලා ඒකයි ආවෙ තකහනියක්
මාව ඇරලවලා යන්න
හවසත් "එනකම් ඉන්න" කිව්වෙ ආදරේට

ඒ අප්පච්චිලගෙ හැටි
මේ මහත්තුරුන්ගෙ හැටි
දෙවිදිහක් වුණත්
ආදරෙමයි දෙගොල්ලන්ගෙම
ඔයා මගෙන් දැක්කෙ කැම්පස් කෙල්ලෙක්,
පස්සෙ හිත හයිය ගෑනියෙක්, අම්මෙක්,
ඒත්,
අප්පච්චිට,
රෝස රෙද්දක ඔතාගෙන
ඉස්පිරිතාලෙන් ගෙනා
පොඩි කෙල්ලමයි මම තවම

මාව අනිත් පැත්තේ බැස්සුවට
කවදහරි
අපේ කෙල්ල පන්ති එක්ක යද්දි
ඔයත් බස්සාවි ඒ පැත්තෙම
පාර පනින්න නැති වෙන්න
රස්තියාදු බඹරුන්ගෙ ඇස්වලට
පේන්නෙ නැති වෙන්න

**පවිත්‍රා අභයවර්ධන**



## වැහිදාට

දොරකඩ අතු නැමී කුඹුකෙන් දිය බේරී
ඉගයි ජනෙල් පියනට හරියට හිත පැරී
හඬනවා නැවතුමක් නැතුව විදුරු සාරී
තාමත් පැනක් නම් ගොනවා අහිමිව බාරී

**නදුෂ මදුරංග**



## ලුහුබැඳීම

මම වදෙන් පොරෙන්
පතොක් ගහක් මත නැඟගෙන
ඔබ එන පෙරමග බැලීමි
ඔබ නෙළුම් පතක් මත පාව
ගඟ දිය දිගේ ගෙට ඇවිත්

මම අතින් ගල් බොරලු
තලා මැඩ
දතින් කටු පඳුරු සැහැ සිඳ
ඔබ යන මාවත සැකසීමි
ඔබ යතුරින් ඇහැරෙන
තුමුල යව ගිජිඳකු තුළ
බැහැපියා
පොළො පස උපුළමින්
ගමෙන් නික්ම ගිහින්

මගෙ කුරවලට
මම ම ලාඩම් ගහගෙන
මහා වාලුකා කතර හරහා
ඔබ ව ලුහුබැඳ ගතිමි
තිබුණ එකම දිය පතහ
වටකරාන
මහා ප්‍රාකාරයක් බැඳගෙන
ඔබ එතුළ නේක සැණකෙළි
කෙළිනා සේ ය

ප්‍රාකර පාදයෙහි හිඳ
මම මාව ම දුන්නෙහි තබා
අහසෙහි විදපීමි
ඔබ ඔබේ සිරි යහනෙහි
උතුරන මී බඳුන් දිවෙන් ගත්
කුවේර අඳුන් දිවියන් සමග
මහා මධු සාදයක ය

ලෙඩ කවුඩකු මෙන් බාගිය මම
හොට බිම ඇනගෙන
කරබාගෙන බඩගාගෙන
ආපසු ගමට එන්නට වීමි

මොනවා!
අර ඈත සිතිජ රත්ත යට
ස්වේත ධජයක් සේ
පය පාවහන් පවා නැතුව
දැවෙන වැල්ලේ
සැලෙමින් සෙමෙන් රහසින්
මා පසුපස එන්නේ
ඒ ඔබ ද?

**උදයංග අමරසේකර**

## නිමිති මැද අතරමංව

සප්ත ස්වර ලෙහි ලෙහී පාවෙන
ගීතයක් මට ඕනෙ කෙරුවා
හුස්ම හිරවෙන ගිතාරුව මත
මගේ හදවත
පී පැ නා
ලි න්
උස්ම කඳුකර නාද අතරේ
සුළඟ මගෙ හිත අරන් දිව්වා
සිහින් දුම් ගුලි අතර පාවී
නැවුම් සුවදක හුස්ම වැටුණා
කේතුධර හිස් හරව හරවා
ක
ඳු යා ය
මා දිහා බැලුවා

සෝවියට් සුරඟන කතාවක
නපුරු මායාකාරියක ලෙස
ඔබ ඇවිත් ඇස් හීනි කෙරුවා

කියාගන්නට දෙයක් නැති තැන
කියාගන්නට බැරිව රිදවන
හැඟුම් මුහුවුණ
වචන ගැලුමක්
සිහින මිටියාවතක
හැ
ලු
ණා

**පවන් අංජන**

## ලේන්බාන් වීදිය

ඒ දවස්වල කන්තෝරු දවසට
ටිකක් කලබල වුණත්
ඉර සමුගන්න හවසට
කොයිතරම් නිසල ද
ඔබ ඇවිද යන
හඬ පවා ඇහෙන තරමට

ලස්සනයි ඔය සෙරෙප්පුව
කිව්වහම දවසක
හැමදාම ඇන්දෙ ඇයි
ඒ දුඹුරු සෙරෙප්පුවම
ආදරය කියන්නේ එහෙම දේකටද?

ඉන්ටලොක් ඇල්ලුවෙ පාර
යටින් තියෙද්දියි තාර
ඉස්සරට වඩා දැන්
ලස්සනයි ලේන්බාන් වීදිය

තාම ඉඳහිට දවසක
බිරිඳ එක්කන්
ඇවිදින්න යන හවසක
පසුකරද්දී ලේන්බාන් වීදිය
ඇයි.... උණුවෙනව දැනෙන්නෙ
යට තියෙන තාර.....

**හර්ෂණී මහත්මා ආරච්චි**

## වැරහැලි



දුඹුටු සුවඳ මවු ලැමැදේ
හුස්ම කළඳ හිර වුණාම
අවාරයයි කොහි යන්නද
විසල් දොරටු හැර තිබුණට

කන මුර කළ දෙහි කටුවට
මල් පරවෙන චීත්තයට
දැලි අංජන තැවරුණාට
හවුහරණක් නැති මැඳුරක

තරු මල්වර අහස යටම
රටා ලිහෙන පන් පැදුරෙම
කුස මේරූ හිරිමල් විය
පැමිණිල්ලක හඬක් නැතිව

රංකැටි පුතා කොතැන ගියේ
කිරි එරවා යන්න ගියේ
කිරි මුට්ටිය කොහේ ගියේ
කඳුළු ගඟේ පාව ගියේ

වැරහැලි වූ තනි සිහිනේ
තාන් අණ්ඩ එළලමිනේ
දුරක් ඉඳන් සෙව්ව උවන
සැඟවුණාම මල් වඩමේ

සනුහරයම මෙහෙසියගේ
පරල වෙත්දි එක පොදියේ
පාමුල ලැග වෙසතුරු කව
මුමුනන්ටත් ඉඩක් නැතේ

අකැප අඩවියකි පිටවෙයන්
මළ බෙරයක් ගුගුරන්නේ
සොහොන් වෙසක් ගත් මැඳුරෙන්
කොහි යන්නද නැත දන්නේ

**සම්මානි වීරකෝන්**

## සයිබර් කවිය

## ඒ හඬ අසා සිටිනෙමි

සිසිරයේ අඳුරට බියව
හී තුඩක හැඩයෙන් පලා යන
පළමු කණකොක් රැලේ වැළපුම
මරණයේ සීතල රැගෙන
පිත තුරු හිස් සිසාරා විත්
කවුළුවේ වැද සන් කරයි

කවුළුව විවර කර
ඇස්දෙක වසාගෙන
සීත සුළඟින් ළය පුරෝගෙන
ඒ හඬ අසා සිටිනෙමි

ජීවිතය සිඳී ගිය ගංතෙරකි
මලානික රෑ අහස යට වැතිරගත්
අතීතය ළසෝ වැලි තලාවකි
සඳ රැයේ මළවුන් ගී ගයන

අහෝ මේ ගංතෙර
නිමල වැලිතල මත
බොහෝ වුන් ඒ මේ අත
ඇවිද ගොස් හැඩිකර
තැබූ පා ලකුණු සහ ලියූ නම් ගම් මිස
කොහේ උන් ගියාදැයි
දිසාවක සලකුණක් වත් නැත

විශ්වයේ කළු කුහර තුළ මැකී ගොස්
කලාතුරකින් දකින සිහිනයකදී වුව
දැන් ඉතින් යමතමින් දිස්වන
ඈත දුර ඈත මන්දාකිණියක
මළ තාරකාවක අවසාන රැස් දහර
මතක දුර දක්නයෙන් නරඹමි

වසා පොත් වනපොත් කළ
සොයා මංපෙත් හද නිනව්වට
සරා වන පෙත් ඇවිද එම් මම
ඈත ඔබ වැළලුණු ඉසව්වට

**අජිත් සී. හේරත්**
farandbeyondlk.wordpress.com

## දිසාපාමොක්

දුනු ශිල්ප කඩු ශිල්ප
හරඹ කරමින්
පන්තියේ

මඟ වැනුම් වන වැනුම්
ගීත ගයමින් විරාමේ
සියල්ලම මතකයට පමණක්
ඉතිරි කරමින් ජීවිතේ

කලිසමද සුදු කමිසයද
මුල්ලට වෙලා
කෙළිදෙළෙන් සිටි කාලයට
තිත් ඉරි තබා

මීටරේ දුර සහස් දුරකට
විහිදමින් සිය පත සලා
දිසාපාමොක් වඩියි අහසින්
ඔන්ලයින්
දඩුමොනරයෙන්

**එම්.ඒ. මලිඳු දෙනෙත්**

## කෙටි කතාව

# කපුටුස්



"ඇයි අපි ඒ අයට බය?" කපුටුස් තාත්තාගේ පැත්තට ඔළුව කරකවලා ඇහුවා.

තාත්තා උත්තර නොදී පිහාටු පිම්බුවා. දෙන්නාම හිටියේ කොස් ගහක පහළ අත්තක.

"කියන්නකෝ තාත්තේ!" කපුටුස් බල කළා. තාත්තා ඔහොමමයි. ලේසියෙන් වචනයක් ගන්න අමාරුයි.

"එහෙම තමයි. ඒගොල්ලෝ නපුරුයි." තාත්තා කීවා.

"නපුරුයි නම් අපට කන්න කෑම ලෑල්ලට එක එක කෑම ජාති දාන්නේ?" අද කපුටුස් කොහොම හරි මේක විසඳා ගන්නයි ලෑස්තිය.

"ඒ දාන්නේ අපට නෙමෙයිනේ. අර මෝඩ මයිනන්ටයි ලේන්නුන්ටයි නේ." තාත්තා ඈත බලාගෙන කීවා. කොස් ගහට එපිටින් තිබුණේ කතුරු මුරුංගා ගහ. ඊට එහා කුණු වළ. දවස තිස්සෙම ඒ දිහා ඇහැ ගහගෙන ඉන්න එක තාත්තාගේ ප්‍රධාන රාජකාරිය.

කපුටුස් ටිකක් වෙලා නිහඬව කල්පනා කළා. මයිනෝ නම් ටිකක් මෝඩයි තමයි. එකෙක් 'දුවපාං!' කීව ගමන් ලවක් දෙවක් නැතිව කට්ටියම ඉගිළිලා යනවා. එහෙම කලබල වුණාට සමහර වෙලාවට අහලක කිසි අනතුරක්වත් නැහැ. ඒත් ලේන්නුන්ගේ නම් මෝඩ බවක් කපුටුස්ට පෙනිලා තිබුණේ නැහැ. ගස් බෙනවල ලොකු කුඩු හදන්න, ඒවාට ඕන කොහු, පුලුන් එහෙම එහෙන් මෙහෙන් උස්සගෙන එන්න සැහෙන්න කල්පනාවක් තියෙන්න වුවමනායි කියලා තමයි කපුටුස්ට හිතුණේ. ලේනෙක් දවසක් මේ ගෙදර පිටිපස්සේ රෙදි වැලේ වේළෙන්න දැම්ම තුවායක මැද පදාසයක නූල් ගලවලා අරගෙන යන හැටි කපුටුස් බලාගෙන හිටියේ හොඳටම හිනා වෙමින්.

කෑම ලෑල්ලට බත්, පලතුරු එහෙම දාන්නේ තමන්ට නෙමෙයි කියලා කපුටුස්ට පොඩි සැකයක් තිබුණත් ඒක මේ වෙනකම් කවුරුවත් ස්ථිරව කියලා තිබ්බේ නැහැ. තමන් දවසක් එතැන තිබුණු බෙරි වුණු කෙසෙල් ගෙඩියක් කමින් ඉන්දැද්දී 'ෂෝ!.. ෂෝ!' සද්දයක් ඇහිලා ඉගිළිලා ගියත් ඒ ගැන ඊට එහා කපුටුස් කල්පනා කරලා තිබුණේ නැහැ.

"කෑම ලෑල්ල තියෙන්නේ ලේන්නුන්ටයි අනෙත් කුරුල්ලන්ටයි. අපි ඒකෙන් කනවට කකුල් දෙකේ අය කැමති නැහැ." කපුටුස්ගෙන් ඊළඟ ප්‍රශ්න මාලාව ඉදිරිපත් වෙන්න කලින් තාත්තා පැහැදිලි කළා. "අපි බඩජාරියි කියලා ඒගොල්ලෝ හිතන්නේ.. අනෙත් සත්තුන්ගේ කොටසත් අපි කනවා කියලනේ අපිව පන්නන්නේ."

"ඉතින් කතාව ඇත්තනේ, අපි ඔක්කොම කනවනේ" කපුටුස් තාත්තාට හරස් ප්‍රශ්නයක් දැම්මා.

තාත්තා උත්තර නොදී රවලා බැලුවා. තාත්තාගේ පිහාටු පිම්බිල්ලෙන් එයා ඉන්නේ කේන්ති ගිහින් කියලා කපුටුස් දැනගත්තා. තමන් මුලින් ඇහුව ප්‍රශ්නේ ආයෙත් අහලා තාත්තගේ මේ කේන්තියම දික් කරගන්නවාද එහෙම නැත්නම් වෙන දවසක අලුතින්ම කේන්තියක් ලෑස්ති කරගන්නවාද කියලා ටිකක් වෙලා කල්පනා කළ කපුටුස් ආයෙත් ඒ ප්‍රශ්නෙම ඇහුවා.

"ඉතින් තාත්තේ අපි ඇයි ඒ අයට බය?"

ගෙයි පිළිකන්න පැත්තේ ඉඳලා ආව ගෑනු කෙනෙක් කුණු වළ පැත්තට වතුර කොරහක් වීසි කරලා ආයෙත් ඇතුළට ගියා. ඔය ඉඳුල් වතුර එක්ක තියෙන්නේ ලූනු පොතුයි, දෙහි බෑයවලුයි කියලා අත්දැකීමෙන් දන්නා නිසා කපුටුස්වත් තාත්තාවත් ඒ ගැන බලන්න යන්න කරදර වුණේ නැහැ.

"ඉස්සර දවසක උඹේ මුත්තෙක් ඔය කකුල් දෙකේ කෙනෙක්ගෙන් වෙඩි කෑවාලු." තවත් ටිකක් වෙලා නිශ්ශබ්දව හිටිය තාත්තා අන්තිමේදී කීවා.

"වෙඩි?" කපුටුස් ඇහුවේ ඔළුව කරකවලා බලමින්. "ඒ රස ජාතියක්ද තාත්තේ?"

"මෝඩයෝ! වෙඩි කෑවාම මැරෙනවා!" තාත්තා කේන්තියෙන් කෑගැහුවා.

කලින් වතාවක තමන් මේ විදිහට තාත්තාගේ කේන්ති දික්කරගත්ත වෙලාවක තාත්තා තමන්ට රිදෙන්න කෙටුවා කියලා කපුටුස්ට මතක තිබුණ නිසා එයා කොස් අත්ත උඩ තාත්තාගෙන් ටිකක් ඈතට වුණා. තාත්තාගේ සද්දේ ඇහිලා ආයෙත් ගෙදර පිළිකන්න පැත්තෙන් එබිකම් කළ ගෑනු කෙනා 'දොරකඩ ඉඳන් කපුටෙක් කරච් කරනවා... නෑයෙක් එන්න වගේ!' කියලා ගේ ඇතුළේ හිටිය කෙනෙකුට හයියෙන් කිව්වා. ඒක අහලා කපුටුස්ට හිනාවකුත් ගියා. 'මෙහෙම මෝඩ උදවියටනේ අපි බය!' එයාට හිතුණා.

එදා රෑ වෙද්දී ගේ ඉස්සරහ අඹ ගහේ සුපුරුදු තැන ඉඳගෙන නිදාගන්න හැදුව කපුටුස්ට සැරෙන් සැරේ එක එක විකාර හීන පෙනිලා ඇහැරුණා. එයාගේ හිත කීවේ කකුල් දෙකේ අයට බය වෙන්න ඕන නැහැ කියලාමයි. ඒ අයට වීසි කරන්නත් මේ තරම් රස කෑම තියෙනවා නම් ඒ ගෙවල් ඇතුළේ කොයිතරම් ජාති ඇතිද? අර තාත්තා කීව 'වෙඩි' කතාව මොකක්ද? තාත්තා කීව විදිහට ඒගොල්ලෝ ඕනෑකමින් මුත්තාව මැරුවා කියලා කපුටුස්ට හිතාගන්නම බැරි වුණා. මරනවා තියා පාරේදී කපුටෙක් දැක්කත් ඒ අය කවදාවත් දෙසැරයක් හැරිලා බලන්නේවත් නැහැ. එහෙනම් මුත්තා කකුල් දෙකේ අයගේ වෙඩි කියන ජාතිය කෑවේ කොහොමද? 'වෙඩි' රසද දන්නෑ! අඩ නින්දේ වැනි වැනි හිටිය කපුටුස්ට හිතුණා.

පස්සෙන්දා වෙනදාට වැඩිය කලින් කපුටුස් ඇහැරුණේ මොකක්දෝ අමුතු සද්දයක් ඇහිලා. රෑ තිස්සේ අනම් මනම් විකාර හිතමින් හිටිය නිසා එයාට නින්ද ගියේ එළිවෙන ජාමේ. පාන්දර, යන්තම් එළිය වැටීගෙන එද්දී මිදුල පුරා පැතිරුණු මීදුම අතරින් කපුටුස්ට ඇතින් 'කාක් කාක්' හඬක් ඇහුණා. හැබැයි ඒ කපුටෙක්ගේ හඬක් නම් නෙමෙයි. කපුටු බාසාව නොදන්නා කෙනෙක් අමාරුවෙන් වචනයක් දෙකක් කියන්න උත්සාහ කරන හඬක්.

ඒ අමුතු සද්දේ ඇහිලා නිදිමත කොහේ ගියාද කියලා නැති වුණ කපුටුස්, සද්දේ එන පැත්තට ඉක්මනින්ම පියෑඹුවා.

ගෙදර මිදුලේ සුදු ඇඳගත්තු කකුල් දෙකේ කෙනෙක් හිටියා. පිනි බාන නිසාද කොහෙද ඒ කෙනා සුදු සාළුවක් ඔළුවේ ඉඳන් පෙරවාගෙනත් හිටියා. එයාගේ අතේ කෙසෙල් කොළයක් එලුව පලංගනාවක සුවඳ හමන කෑමක් තිබුණා. 'කාක් කාක්' කියමින් හිටියේ මේ කෙනා තමයි. එහෙම කියමින් එයා වටපිට ගස්වල මුදුන් දිහා බැලුවේ යමක් හොයනවා වගේ. එහෙම බලමින්, පලංගනාවේ තිබුණු කෑම ගුළියක් අතේ තියාගෙන ඒ කකුල් දෙකේ කෙනා මිදුල වටේ ඇවිද්දා.

කපුටුස් උගුරැස්ස ගහේ අත්තක වාඩි වෙලා මේ සිද්ධිය ගැන විපරමින් බැලුවා. මෙහෙම සිද්ධියක් කලින් කවදාවත් නොදැකපු එයාට, කලින් දවසේ රෑ තිස්සේ කල්පනා කළ මනස්ගාත එක්ක මේ පේන්නේ හීනයක්ද කියලාත් හිතුණා. එහෙම දෙගිඩියාවෙන් ඉන්දැද්දී කකුල් දෙකේ කෙනා උගුරැස්ස ගහ යටට ආවා, කපුටුස් දිහා එක එල්ලේ බැලුවා, ආයෙත් වතාවක් 'කාක්, කාක්' කිව්වා. එහෙම කරලා පලංගනාවේ තිබුණු කෙසෙල් කොළය කෑම ටිකත් එක්කම උගුරැස්ස ගහ යට බැම්ම උඩින් තියලා යන්න ගියා.

හරියටම මේ සිද්ධ වුණේ මොකක්ද කියලා නිනව්වක් නැතිව කපුටුස් ඒ කෑම ටික දිහා තව ටික වෙලාවක් බලාගෙන හිටියා. කකුල් දෙකේ කෙනා මේ කෑම තමන්ට දුන්නා වෙන්න බැහැ. එහෙම කෑම දාන්නේ කෑම ලෑල්ලටනේ. අනික තාත්තා කීව විදිහට ඒ අය කපුටෝ කෑම කනවට කැමතිත් නැහැනේ. හැබැයි ඒ කෙනා තමන්ගේ දිහා බලලා නුහුරට 'කාක්, කාක්' කීව විදිහට කපුටුස්ට නම් තේරුණේ 'කන්න, කන්න' කියනවා වගේ. කොයිකටත් කියලා කපුටුස් කෑම එක තියෙන බැම්මට පියෑඹුවා. අම්මෝ සුවඳේ බැහැ! කපුටුස් ඩිංග ඩිංග කෑම ටිකට ළං වෙලා පැත්තකින් රස බැලුවා. වෙනදාට මේ කෑම ජාතියේ දංකුඩ පිළිකන්නේ කොස් ගහ මුලට හලන නිසා කපුටුස් මේවා අඳුරනවා. ඒත් අද නම් ඒවායෙන් වෙනදා දැනෙන කර රහ නැහැ. අමුතු තෙල් සුවඳකුත් එනවා. මේ දිව්‍ය භෝජනේ රස බලන්න ගත්ත කපුටුස්ට, කෑමක් ලැබුණාම නෑයින්ටත් අඬගහලා මිසක් කන්නේ එහෙම නැහැ කියලා අම්මා පුංචි කාලේ ඉඳන් කට පාඩම් කළ චාරිත්තරේත් අමතක වුණා. එයා ඒ කෑම ටික ඔක්කොම කටට දෙකට ගිල දැම්මා.

කාලා ඉවර වෙලා ආයෙත් අඹ ගහට ඉගිළෙද්දී කපුටුස්ට මත් ගතිය වගෙයි. උදේම හිස් බඩ මෙතරම් කෑමක් කෑවාමයි! අර තාත්තා කීව 'වෙඩි' මේවා වෙන්න බැරිද කියලා කපුටුස්ට හදිසියේ හිතුණේ හොට ගහේ අතුල්ලද්දී. එයා මොහොතක් ගල් ගැහුණා. මුත්තා වගේ එයාත් මැරෙයිද කියලාත් හිතුණා. නෑ වෙන්න බැහැ! තාත්තාට කියන්න ඕන කකුල් දෙකේ අය හරි හොඳයි කියලා. තමන්ට අඬගහලාම රස කෑමක් දුන්නා කියලා. මෙතරම් කල් නිස්කාරණේ අහිංසක කකුල් දෙකේ අයට බය වුණේ. තාත්තලාගේ හණමිටි අදහස්! දවල් වෙද්දී පිළිකන්න පැත්තේ දොරෙන් ඇතුළටත් පියාඹලා බලන්න ඕන කියලාත් කපුටුස්ට හිතුණා. එතකොට ඒගොල්ලෝ තවත් රස කෑම දෙයිනේ. එහෙම හිතමින්, තනියම හිනාවෙමින්, ඉර නගින්න කලින් තව ඩිංගක් නිදාගන්න කපුටුස් ඇස් දෙක පියාගත්තා.

**හෙල්මලී ගුණතිලක**






# අවුන්සාන් සුකී යළි ඉල්ලා මියන්මාර් ජනතාව වීදි බසී

## හමුදා නායකයා පළමුවරට රූපවාහිනියේ පෙනී සිටී



මියන්මාරයේ හිටපු නායක අවුන්සාන් සුකී නැවත පත් කරන ලෙස ඉල්ලමින් ජනතාව ලක්ෂ ගණනින් වීදි බැස සිටින අතරතුර, තමන් සිදු කළ ක්‍රියාව සාධාරණීකරණය කිරීමට හමුදා කුමන්ත්‍රණයේ නායකයා පළමු වතාවට එරට රූපවාහිනියේ පෙනී සිට ඇත.


නොවැම්බරයේ පැවැති, දැනට සිරගත කර සිටින අවුන්සාන් සුකීගේ පක්ෂය දැවැන්ත ජයග්‍රහණයක් අත්කර ගත් මැතිවරණය අසාධාරණ එකක් බව හමුදා කුමන්ත්‍රණයේ මූලිකයා වූ මින් අවුන්ග් හ්ලේයින්ග් මෙහිදී පවසා ඇත. හමුදා නායකයෝ ඇතැම් ප්‍රදේශවලට හදිසි නීතිය පනවා ඇති අතර ඒකරාශි වීමේ සීමා පනවා ඇත.හමුදා කුමන්ත්‍රණයට එරෙහිව තුන්වන දිනටත් දැවැන්ත උද්ඝෝෂණ සහ මහා වැඩවර්ජන සිදුවෙමින් පවතියි. මේ විරෝධතා වැඩවලට වෛද්‍යවරු, ඉංජිනේරුවන් සහ ගුරුවරුන් ඇතුළු සිවිල් සේවකයින් පිරිසක් ද එකතු වී සිටින බව නම සඳහන් කිරීමට අකැමැති වූ පුද්ගලයෙක් ප්‍රකාශ කොට තිබේ. රැස්වී සිටින දහස් ගණනක් වූ විරෝධතාකරුවන් විසුරුවා හැරීමට පොලීසිය ජල ප්‍රහාර සහ රබර් උණ්ඩ භාවිත කර ඇත.

# කැපිටල් සිද්ධිය ට්‍රම්ප්ගේ උසිගැන්වීමක් නොවේ

### නීතිඥයෝ කියති




ජනවාරි 6 වැනිදා අමෙරිකාවේ වොෂිංටන් නුවර කැපිටල් ගොඩනැගිල්ලට ට්‍රම්ප් ආධාරකරුවන් කඩා වැදුණේ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ උසිගැන්වීමට නොව, ඒ අයගේ ස්ව කැමැත්ත මත යැයි ට්‍රම්ප්ගේ නීතිඥයෝ කියති.



දෙවැනි වතාවටත් දෝෂාභියෝගයට ලක් වූ ඔහු ගැන සෙනෙට් විභාගය අඟහරුවාදා පැවැත්වීමට නියමිතව පැවැතිණි. තම අනුගාමිකයින් කැරැල්ලට පෙළඹවීම ගැන ඔහුට චෝදනා එල්ල වී තිබේ. ඩිමොක්‍රටික් පාර්ශ්වය පෙන්වා දෙන්නේ කැරැලිකරුවන් ස්වාධීනව කටයුතු නොකළ බවත්, ට්‍රම්ප්ගේ උසිගැන්වීම් මත ඔවුන් ක්‍රියා කළ බව ඔප්පු කිරීමට තමන්ට ප්‍රමාණවත් තරම් සාක්ෂි තිබෙන බවයි. තම පාලන කාලය ඇතුළත දෙවරක් දෝෂාභියෝගයට ලක් වූ එකම අමෙරිකානු ජනාධිපතිවරයා ට්‍රම්ප් වන අතර දෝෂාභියෝගයට ලක්වූ ජනාධිපතිවරුන් තිදෙනාගෙන් එක් අයෙකි.

# ෆ්ලොරිඩාවේ පරිගණක පද්ධතියට රිංගූ හැකර් අල්ලයි

ෆ්ලොරිඩාවේ නගරයක ජල සම්පාදන ක්‍රමයේ පරිගණක පද්ධතියට රිංගූ හැකර්වරයකු එම ජලයට එකතු කරන භයානක රසායනිකයක් වැඩියෙන් එකතු කිරීමට දැරූ උත්සාහයක් ව්‍යර්ථ කර ඇත.

ඕල්ඩ්ස්මාර් ජල පිරිපහදු පද්ධතියට මෙසේ ඇතුළු වී ලයි වශයෙන් හඳුන්වන සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් නම් රසායනික ද්‍රව්‍යය එකතු කරන ප්‍රමාණය ඉහළ දැමීමට උත්සාහ දරා ඇත. එහි සේවකයකු මෙය දැක එම රසායනික මට්ටම යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු යොදා තිබේ. ලයි නම් එම රසායනිකය ජලයේ ආම්ලිකතාව වර්ධනය කිරීමට යොදා ගන්නා අතර වැඩි වශයෙන් යෙදීම හානිකරය. මේ සම්බන්ධව තවමත් කිසිවකු අත්අඩංගුවට ගෙන නොමැති අතර මේ හැක් කිරීම එක්සත් ජනපදය ඇතුළත සිදු කළේද විදේශයක සිට සිදු කළේද යන්න තවමත් නිශ්චිත ව හඳුනාගෙන නැත. ඕල්ඩ්ස්මාර් ජල පිරිපහදු පද්ධතිය සම්පූර්ණයෙන්ම පරිගණක ආශ්‍රිතව පාලනය වන්නකි.

# ලෝකප්‍රකට රොබින්හුඩ් මෘදුකාංගයට එරෙහිව නඩු



පසුගිය වසරේ සියදිවි නසාගත් 20 හැවිරිදි තරුණයකුගේ මවු-පියන් ඒ මරණය වෙනුවෙන් රොබින්හුඩ් මෘදුකාංගයට එරෙහිව නඩු පවරා ඇත. ඇලෙක්ස් කැරන් මෙසේ සිය දිවිනසා ගැනීමට හේතු වී ඇත්තේ තමන් එම සමාගමට ඩොලර් 730,000ක් ණය බව දැනුම් දීම නිසාය.

සමාගමේ පාරිභෝගික සේවා අංශය තම දරුවාගේ ප්‍රශ්නයට සහාය දැක්වීමට අපොහොසත් වී යැයි ඔහුගේ මවුපියන් වන ඩෑන් සහ ඩොරති කියර්න්ස් කියති. ඇලෙක්ස්ගේ මරණයෙන් තමන් විමතියට පත් වූ බවත් මේ ප්‍රශ්නය විසැඳීමට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදුකරන බවත් රොබින්හුඩ් සමාගම කියයි. කොටස් වෙළෙඳපොළේ කොටස් මිල දී ගැනීම් සඳහා පහසුකම් සපයන මේ මෘදුකාංගය මූල්‍ය කටයුතු ප්‍රජාතන්ත්‍රවාදීකරණය කිරීම සඳහා ඉදිරිපත් කළ එකක් බව රොබින්හුඩ් සමාගම කියයි.

# ඉන්දියාවේ උත්තුරු ප්‍රාන්තයේ වේල්ලක් කැඩී 28ක් මරුට

### 150කට වැඩිපිරිසක් අතුරුදන්



උතුරු ඉන්දියාවේ උත්තුරු ප්‍රාන්තයේ බිඳී ගිය වේල්ල නිසා මේ වන විට 28 දෙනෙක් මියගොස් ඇති අතර 150කට වැඩිපිරිසක් අතුරුදන් වී ඇතැයි වාර්තා වේ. දැන් කිලෝ මීටර් 8.3ක් දිග උමඟක් ඇතුළත සිර වී සිටින පුද්ගලයන් මුදා ගැනීමට මෙහෙයුමක් දියත් කර ඇත. මෙය තපෝවාන් විෂ්ණුගාද් ජල විදුලි බලාගාරයට ජලය ගෙන යන උමං මාර්ග දෙකෙන් එකක් වේ. කිලෝ මීටර් 3.8ක් දිගැති අනිත් උමං මාර්ගය ජලාශයේ රැස්වෙන අපද්‍රව්‍ය සහ රොන්මඩ ඉවත් කිරීමට භාවිත කරන්නෙකි. අයිස් වතුර නිම්නය දිගේ ගලාගෙන යන විට ඒ සමඟ ඇදී ආ ගල්මුල්වලින් ප්‍රධාන උමං දොරටුව වැසී ගොස් තිබිණි. උත්තර්ඛාන්ද් ප්‍රධාන ඇමැති ත්‍රිවේන්ද්‍ර සිං රාවත් පවසන පරිදි 35කට වැඩි පිරිසක් තවමත් උමං මාර්ගයේ සිර වී සිටිති. ප්‍රධාන ප්‍රවේශය මතුකර ගැනීමට කල් ගතවන බැවින් උමං මාර්ගය දෙසට විදීමක් සිදුකර මුදාගැනීම් සිදු කරන බව ද ඔහු වැඩිදුරටත් කියයි. ජල විදුලි ව්‍යාපෘතිය පිළිසකර කිරීම් අරඹා ඇති අතර 2023 දී නැවත ක්‍රියාත්මක කිරීමට හැකි වෙතැයි විශ්වාස කෙරේ.

# පරිසර අමාත්‍යාංශය මේ වන විට පැළ ලක්ෂයක් සිටුවා අවසන්

### ඇමැති මහින්ද අමරවීර

පරිසර අමාත්‍යාංශය මඟින් සෑම සති අන්තයකම විවිධ පැළ වර්ග 5000කට අධික ප්‍රමාණයක් රෝපණය කරන බවත්, ගත වු මාස තුන තුළ පැළ ලක්ෂයක් පමණ රෝපණය කිරීමට පියවර ගත් බවත් පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසීය.

පරිසරය රැක ගැනීම පමණක් නොව රජය මේ වන විට විශාල සංවර්ධන වැඩ සටහන් රැසක් ආරම්භ කර ඇති අතර ග්‍රාමීය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීම, අධිවේගී මාර්ග ව්‍යාපෘති මෙන්ම නාගරික නිවාස ව්‍යාපෘති වැනි සංවර්ධන වැඩ සටහන් රැසක් ඒ අතර වන බවද ඇමැතිවරයා කීවේය.

නැකතට පැළයක් යන තේමාව යටතේ අප්‍රේල් මස 16 දින පෙරවරු 6.40ට යෙදෙන රුක්රෝපණ ජාතික රුක්රෝපණ නැකතේ දී රෝපණය කිරීමට අවශ්‍ය පැළ ලබා ගැනීමට බීජ සිටුවීමේ වැඩ සටහනක් රූමස්සල දී පැවැත්වුණු අවස්ථාවේ ඊට සහභාගී වෙමින් ඇමැතිවරයා මෙම අදහස් පළ කළේය. මෙම අවස්ථාවට ගාල්ල නියෝජ්‍ය පොලිස් අධිකාරි ඩී.වී. ගිනිගේ මහතා සහ දකුණු පළාත් පරිසර අධ්‍යක්ෂවරයා ඇතුළු පිරිසක් සහභාගී වුහ.

එහිදී ඇමැතිවරයා මෙසේද කීය.

ග්‍රාමීය මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කෙරෙන්නේ කිසිදු රජයක් යටතේ අවධානයට යොමු නොවු මාර්ගයි. ඒවා සංවර්ධනය කිරීමේ දී වැලි, කළුගල්, හා පස් අවශ්‍යයි. ඒ වගේම ඇතැම් පාරවල් අසල ඇති ගස් පවා ඇතැම් අවස්ථාවල ඉවත් කිරීමට සිදු වනවා. අප උපදෙස් දී තිබෙන්නේ හැකි තරම් එවැනි අවස්ථාවල ගස් නොකපා එම සංවර්ධන කටයුතු කරන ලෙසයි. සංවර්ධන ව්‍යාපෘතිවලදී වැලි , කළුගල්, හා පස් අපට පිට රටින් ආනයනය කරන්න බැහැ. ඒවා අප රටෙන්ම ලබා ගත යුතුයි. නමුත් අද සමහරු විශාල පරිසර හානියක් සිදු වනවා යැයි චෝදනා කළත් එහි සත්‍යතාවක් නෑ. දේශපාලනය හා මුදල් බලය යොදාගෙන පරිසර හානි හානි කළ පුද්ගලයන් සම්බන්ධව අප නීතියට අනුව පියවර ගෙන තිබෙනවා. ඒ අතර සමහර දේශපාලනඥයන්ගේ හිතවතුනුත් ඉන්නවා. පරිසරය විනාශ කරනවා නම් ඊට එරෙහිව කටයුතු කරන්න අපි සූදානම්. අපේ




පරිසර නිලධාරීන් පරිසරය රැක ගැනීම සඳහා විශාල වැඩ කොටසක් කරනවා. සමහර නිලධාරීන් ජාවාරම්කරුවන්ගේ ප්‍රහාරවලට පවා ලක් වී තිබෙනවා.

ඒ වගේම තවත් සමහරු ඉන්නවා ජාවාරම්කරුවන්ගේ මුදල්වලට යට වී සේවය පැහැර හරින. ඒ අය නිසා තමයි අද මෙවැනි පාරිසරික ගැටලු ඉස්මතු වෙලා තිබෙන්නේ. දාරළුව දුම්රිය ස්ථානය ඉදිරිපිට තිබෙන දුර්ලභ ශාඛයක් ඉවත් කිරීමට තැත් කිරීමක් සම්බන්ධව මාධ්‍ය වාරතා කළා. ඒ අවස්ථාවේම මා මාර්ග සංවර්ධන අධිකාරියටත්, වනසංරක්ෂණ ලේකම්ටත් කතා කළා. ඒ දුර්ලභ ශාඛය විනාශ කරන්න එපා කියා මා උපදෙස් දුන්නා.

පරිසරය හා සංවර්ධනය යන දෙක සමතුලිතව පවත්වාගෙන යාම අසීරුයි. සංවර්ධන වැඩ සටහන්වල දී කිසියම් පාරිසරික හානියක් සිදු වනවා. විශේෂයෙන් ශාඛවලට. නමුත් අප හැකි තරම් ශාක රෝපණය කිරීමේ වැඩ කටයුතු අරඹා තිබෙනවා. සෑම සති අන්තයකම අප පරිසර අමාත්‍යංශය විදියට පැළ 5000ක් රෝපණය කරනවා.

# සියෝල්හි සුනඛයන් - බළලුන් කොවිඩ් පරීක්ෂාවට



දකුණු කොරියාවේ සියෝල් නාගරික ප්‍රදේශයේ ජීවත් වන බල්ලන් සහ පූසන් අතරින් කොවිඩ් රෝග ලක්ෂණ පෙන්නුම් කරන සතුන්ව කොවිඩ් පරීක්ෂණයට ලක් කරන බව එහි නගර සභාව කියයි. ප්‍රථම වතාවට එරට පූසකුට කොවිඩ් 19 රෝගය තිබී හමුවීමෙන් අනතුරුව මේ නිවේදනය නිකුත් කර ඇත. ස්වසන අපහසුතා වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරන සතුන්ව පමණක් මෙසේ පරීක්ෂණවලට ලක් කිරීමට බලධාරීහු තීරණය කර ඇත. වයිරසය පවතින බව සොයා ගනු ලැබුවහොත් එම පූසන් සහ බල්ලන් නිවසේ නිරෝධායනය කිරීමට කටයුතු කළ යුතුය. මිනිසුන්ට සුරතල් සතුන්ගෙන් කොවිඩ් රෝගය වැලැඳී ඇති බවට මෙතෙක් කිසිදු සාක්ෂියක් හමු වී නොමැත. එබැවින් උන් නිරෝධායන මධ්‍යස්ථාන වෙත රැගෙන යාම අවශ්‍ය නොවන බව ද වැඩි දුරටත් පැවැසේ.



බුද්ධි කරුණාරත්න

# පෙත්සම් කාරක සභාවේ සාමාජිකයන් කැඳවා සාකච්ඡා කරනවා

### ඇමැති ගාමිණී ලොකුගේ

**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**



මහජන පෙත්සම් කාරක සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් පෙත්සම් කාරක සභාවේ සාමාජිකයන් කැඳවා ඉදිරි දින කිහිපය තුළ සාකච්ඡා කරන බව එහි සභාපති අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (9) පැවසීය.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පිටස්තර පුද්ගලයින් පාර්ලිමේන්තුවට කැඳවීම නොහැකි බැවින් මෙම කාරක සභා රැස්වීම් පැවැත්වීම ප්‍රමාද වූ බවද ඇමැතිවරයා පැවසීය.

මහජන පෙත්සම් කාරක සභාවට , පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මඟින් මහජනතාව යොමුකරන පෙත්සම් කඩිනමින් විභාග කිරීම සඳහා අනු කමිටු පත්කර එම පෙත්සම් විභාග කිරීමට පියවර ගන්නා ලෙස රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා කථානායකවරයාගෙන් ඉල්ලීමක් කළේය.

මෙම යෝජනාව මහජන පෙත්සම් කාරක සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේය.

# වැලන්ටයින් දිනයට සාද-ප්‍රියසම්භාෂණ බෑ

**රක්ෂණ ශ්‍රියන්ත**

ආදරවන්තයන්ගේ දිනය හෙවත් වැලන්ටයින් දිනය නිමිත්තෙන් සමාජ මාධ්‍ය හරහා නීති විරෝධී සාද සහ ප්‍රිය සම්භාෂණ සංවිධාන කර ඇති බවට පොලිසියට තොරතුරු ලැබී තිබෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මෙසේ ද කීය.

'පසුගිය දිනවල වාර්තා වු කොවිඩ් ආසාදිතයන් ගැන සලකා බැලීමේදී ප්‍රිය සම්භාෂණ, සාද සහ විවාහ උත්සව ප්‍රධාන වශයෙන් කොවිඩ් රෝගය ව්‍යාප්ත වීමට හේතුවක් වූ බව පෙනී යනවා.

කොවිඩ් පොකුරු සහ අනුපොකුරු නිර්මාණය වීමේ වැඩි ඉඩකඩක් ඇති නිසා අන්තර්ජාලය හරහා නීති විරෝධී සාද සංවිධාන කරන පුද්ගලයන්ට එරෙහිව දැඩිව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂ පොලිස් බුද්ධි අංශද යොදවා තිබෙනවා.

එවැනි සම්භාෂණ සඳහා ඉඩ පහසුකම් දීමට හෝටල් හිමියන් කටයුතු නොකර සිටින ලෙස ඉල්ලා සිටිනවා. සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුවම සෑම විටම හෝටල් සහ පරිශ්‍රයන් ප්‍රිය සම්භාෂණ සහ උත්සව සඳහා දීමට කටයුතු කරන්න. එසේ කටයුතු නොකරන හෝටල් හිමියන්ට එරෙහිව නිරෝධායන රීතීන් යටතේ දැඩිව කටයුතු කරනවා.'

### වන විනාශයට එරෙහිව

# වන සංරක්ෂණයට වන ජීවියට ඉඩම් කොමසාරිස්ට ඇල්ලේ ගුණවංශ හිමි එන්තරවාසි යවති

**රුවන්ත නිතුල්ගස්පිටිය**

රට පුරා වනාන්තර සහ වන ජීවී පද්ධති විනාශ කිරීම්වලට එරෙහිව රටේ සම්මත නීතියට අනුකූලව නිසි නෛතික ක්‍රියාමාර්ග නොගැනීමට අදාළව වන සංරක්ෂක ජනරාල්වරයාට, වන සංරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයාට, වනජීවී දෙපාර්තමේන්තුවට සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව එන්තරවාසි යැවීමට ඇල්ලේ ගුණවංශ හිමියෝ කටයුතු කර තිබේ.

සිය නීතිඥයින් මාර්ගයෙන් එන්තරවාසි යවමින් හිමියෝ දන්වා ඇත්තේ වන විනාශයන්ට එරෙහිව 1907 අංක 16 දරණ කැලෑ ආඥාපනතට අනුව කඩිනමින් කටයුතු නොකරන්නේ නම් අදාළ නිලධාරින්ට සහ දෙපාර්තමේන්තුවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දක්වා නඩු පැවරීමට පියවර ගන්නා බවයි.

මෙලෙස සිය රාජකාරි පැහැර හැර සිටීමට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 112, 289 යන වගන්ති සහ අල්ලස් පනතේ 70 වැනි වගන්තිය ඔස්සේ නීතිමය පියවර ගැනීමට නෛතික ප්‍රතිපාදන පවතින බවත් උන්වහන්සේ සිය නීතිඥයින් මාර්ගයෙන් යොමුකළ එන්තරවාසි මඟින් තව දුරටත් දන්වා තිබේ.

# ගම්පහ-දාරළුව දුම්රිය ස්ථානය ඉදිරිපිට ඇති ‘කෲඩියා සෙලනිකා’ වෘක්ෂය රැකගැනීමට පියවර

## ඇමැති මහින්ද අමරවීර

**බුද්ධිකා ඉඹුලාන**

ගම්පහ - දාරළුව දුම්රිය ස්ථානය ඉදිරිපිට තිබෙන මෙරට වඳවී යෑමේ තර්ජනයට ලක්ව තිබෙන ශාකයක් වන 'කෲඩියා සෙලනිකා' වෘක්ෂය ආරක්ෂා කර ගැනීමට පියවර ගන්නා බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා කියයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ ගස ඉවත් කිරීම පිළිබඳව මේ දිනවල පළවී ඇති පුවත් සම්බන්ධයෙන් මගේ අවධානය යොමුවී තිබෙනවා. කිසිදු පුද්ගලයකුට එම ගස කපා ඉවත් කිරීමට ඉඩ දෙන්නේ නෑ.

මේ දුර්ලභ ශාකය වගේ තවත් දුර්ලභ ශාක විශේෂ රැසක් අපේ රටේ තිබෙනවා. එම ශාක මෙන්ම දාරළුව පිහිටි මේ ශාකය ආරක්ෂා කර ගැනීමට මා අදාළ අංශ සමඟ සාකච්ඡා කළා. මාර්ග සංවර්ධන අධිකාරියටත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් මා මේ සම්බන්ධව කතා කළා. කිසිසේත්ම මේ ශාකය කපා දැමීමට කටයුතු නොකරන ලෙසට මා එම නිලධාරීන්ට උපදෙස් දුන්නා. එයට විකල්ප වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබෙනවා. ඒ අනුව අධිවේගී මාර්ගය එම ශාකය අසලින් වෙනස් කර ඉදිකිරීම හෝ ඒ සම්බන්ධව ගැටලු පැන නගින්නේ නම් නව තාක්ෂණය යොදා ගෙන මේ ගස ආරක්ෂිතව ගලවා සුදුසු පරිසරයක නැවත රෝපණය කිරීමට පියවර ගන්නවා.

මේ සතියේ මධ්‍යම පරිසර අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු සියලුම පාර්ශ්ව සමඟ දාරළුවට ගොස් සාකච්ඡා කර එම ශාකය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලුම පියවර ගැනීමට මා සූදානම්.'

# මත් ගුළි 3000ක් සමඟ වෙළෙඳසල් හිමියා අත්අඩංගුවට

**මැදිරිගිරිය සමූහ - ඩබ්. ඒ. පියතිලක**

කලක පටන් නීති විරෝධී ලෙස රුපියල් 600 සහ 150 මිල ගණන්වලට පාසල් සහ උපකාරක පන්ති සඳහා යන දරුවන්ට මනම්පිටිය නගරයේ වෙළෙඳසල් හිමියකු මදනමෝදක (මත් ගුලි) අලෙවි කරන බවට ලද තොරතුරක් අනුව පෙරේදා (08) එම වෙළෙඳසලට පාසල් දරුවකු ලෙස උපාය දූතයකු යොදවා මත්ගුලි ලබාගෙන ඇත. පසුව එම වෙළෙඳසල පරීක්ෂා කිරීමේදී එහි තිබී මත් ගුලි 3000ක් (කිලෝ 27ක්) සොයා ගත් බව පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය පවසයි.

මේ වෙළෙඳසල් හිමියා කලක පටන් පාසල් සහ උපකාරක පන්ති යන සිසුන්ටත්, විවිධ තරාතිරම්වල තරුණයන්ටත් මත්ගුලි අලෙවි කරන බවට පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වෙත ප්‍රදේශවාසීන්ගෙන් ලද තොරතුරක් මත මේ වැටලීම සිදු කර තිබේ.

උතුරු මැද පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතාගේ සහ පොළොන්නරුව ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති වසන්ත කිත්සිරි ජයලත් මහතාගේ නියෝග මත, පොළොන්නරුව කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඔෂාන් හේවාවිතාරණ මහතාගේ උපදෙස් පරිදි, සහකාර පොලිස් අධිකාරි නිශාන්ත රත්නපාල මහතාගේ මෙහෙයවීමෙන්, පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රශන්න ජාගොඩ, උප පොලිස් පරීක්ෂක හේමරත්න, උප පොලිස් පරීක්ෂක රත්නසිරි, පොලිස් සැරයන් 16614 මානවඩු නිලධාරීන් මේ වැටලීම සිදු කර තිබේ.

# සතියකදී රිය අනතුරුවලින් මරණ 45ක්

**රක්ෂණා ශ්‍රියන්ත**

ජනවාරි මස 31 සිට පෙබරවාරි මස 06 දක්වා සතියක කාලයකදී මෙරට පුද්ගලයන් 45ක් රිය අනතුරුවලින් මියගොස් 94 දෙනකු බරපතළ තුවාල ලබා ඇති අතර රිය අනතුරු 403ක් සිදුව ඇති බව පොලිසිය පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා මෙසේ පැවැසීය.

'රිය අනතුරුවල නැවතත් ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙනවා. රිය අනතුරුවලින් දිනකට පුද්ගලයන් 06 දෙනකු පමණ මිය යනවා. සතියක කාලයේ රිය අනතුරුවලින් පුද්ගලයන් 266ක් තුවාල ලබා තිබෙනවා. ඒ අනුව දිනකට පුද්ගලයන් 38 දෙනකු පමණ රිය අනතුරුවලින් තුවාල ලබනවා. සතියක කාලයේ රිය අනතුරු 403ක් සිදුව තිබෙනවා.

පොලිසියට වාර්තාවී ඇති රිය අනතුරු සංඛ්‍යාව 403ක් වුවත් සත්‍ය වශයෙන්ම මෙයට වඩා රිය අනතුරු සිදු වීමට ඉඩ තිබෙනවා. වැඩි වශයෙන්ම රිය අනතුරු සිදුව ඇත්තේ ගම්පහ, මහනුවර, කුරුණෑගල දිස්ත්‍රික්ක ආශ්‍රිතව.

මේ සම්බන්ධයෙන් පොලිසිය විශේෂ මෙහෙයුමක් ආරම්භ කර තිබෙනවා. පදිකයන්, පාපැදිකරුවන්, යතුරු පැදිකරුවන්, ත්‍රිරෝද රථවල ගමන් කරන්නන් බොහෝ විට අනතුරුවලට ලක් වීමේ ප්‍රවනතාවයක් තිබෙනවා. ඔවුන් හැම විටම අවධානයෙන්, ප්‍රවේසම් සහගතව මාර්ග නීතිවලට ගරු කරමින් කටයුතු කරන්න.'

# බස් රථයකට යට වීමෙන් පවුල් සෞඛ්‍ය සේවිකාව මරුට

**අනුරාධපුර මධ්‍යම විශේෂ - බී. එම්. විජේසූරිය**

දරුවන් දෙදෙනා පාසල් ඇරලවා රාජකාරි ස්ථානයට යමින් සිටි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක මිහින්තලය රජරට විශ්වවිද්‍යාලයට අයත් බස් රථයකට යට වීමෙන් ජීවිතක්ෂයට පත්වී ඇති බව අනුරාධපුර මූලස්ථාන පොලිසියේ රථවාහන අංශය පවසයි. පෙරේදා (08) පුලියංකුලම හංදියේ සිදු වූ මේ මාරක රිය අනතුරෙන් බරපතළ තුවාල ලැබූ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව ජීවිතක්ෂයට පත්වී තිබේ.

මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇත්තේ රඹෑව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව සේවය කළ අංක 170, ඇලපාර, තන්නායම්කුලම ලිපිනයේ පදිංචි 51 හැවිරිදි දෙදරු මවක් වන ගනේවත්තේගෙදර සෝමාවතී මැණිකේය.

මේ මාරක රිය අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියැදුරා පොලිසිය අත්අඩංගුවට ගෙන තිබෙන අතර ඔහු ඊයේ (09) අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. අනුරාධපුර මූලස්ථාන පොලිසියේ රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සේනක ප්‍රසන්න මකුන්දෑගම මහතාගේ උපදෙස් මත පොලිස් සැරයන් දේශප්‍රිය 51146, පොලිස් කොස්තාපල් ප්‍රියන්ත 69548 නිලධාරීහු අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරති.

# කළුතර බන්ධනාගාර තාප්පයට ඉහළින් විසි කළ පාර්සල් 08ක් අත්අඩංගුවට

**බුද්ධිකා ඉඹුලාන**


කළුතර බන්ධනාගාර තාප්පයට ඉහළින් විසි කළ තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සල් 08ක් ඉකුත් වසරේ දෙසැම්බර් සහ මේ වසරේ ජනවාරි මාසයේදී අත්අඩංගුවට ගැනීමට බන්ධනාගාර නිලධාරීන් සමත්වී ඇත.

එම පාර්සල්වල තිබී ජංගම දුරකථන 12ක්, සිම්පත් 11ක්, දුම්කොළ 90ක්, හෙරොයින් පැකට් 281ක්, මත් ද්‍රව්‍ය ඇතුළත් කරල් 180ක්, අයිස් මත්ද්‍රව්‍ය පැකට් 6ක් සහ ගංජා පැකට් 2ක් සොයාගෙන තිබේ.

ජංගම දුරකථන බැටරි, චාජර්, හැන්ඩ් ෆ්‍රී සහ ලයිටර් වැනි තහනම් ද්‍රව්‍ය රැසක් ද එහි තිබූ බව බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

කළුතර බන්ධනාගාර තාප්පයට ඉහළින් මෙසේ එක් අවස්ථාවකදී පාර්සල් විසි කිරීමට පිටතින් පැමිණි පුද්ගලයකු සහ ඔහු පැමිණි යතුරු පැදියද අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට පත් තහනම් ද්‍රව්‍ය, පුද්ගලයා සහ යතුරු පැදිය ඉදිරි විමර්ශන කටයුතු සඳහා කළුතර පොලිස් ස්ථානයට භාරදී තිබේ.

# පුනොච්චිමුනේ මිහිදන් කළ බිලිඳු මළ සිරුරක් ගොඩ ගැනේ



**මඩකලපුව සමූහ - එල්. ජව්ෆර්කාන්**

සැක සහිත ලෙස භූමිදානය කළ බිලිඳු මළ සිරුරක් අධිකරණය නියෝග මත ගොඩගෙන ඇත.

පසුගිය 02 වැනිදා මහ නගර සභා බල ප්‍රදේශයේ කාත්තාන්කුඩි පොලිස් වසමේ පුනොච්චිමුනේ සුසාන භූමියේ මේ බිලිඳු මළ සිරුර මිහිදන් කර ඇත. පසුව එම බිලිඳාගේ මව වෛද්‍ය පරීක්ෂණයට ගිය අතර ඇයගේ හැසිරීමේ සැක සහිත බවක් දුටු මඩකලපුව සෞඛ්‍ය වෛද්‍ය අධිකාරීවරයා ඇය වැඩිදුර පරීක්ෂණ සඳහා මඩකලපුව ශික්ෂණ රෝහලට ඇතුළත් කර පොලිස් විමර්ශන කටයුතු ආරම්භ කරන ලදි.

ඒ අනුව මඩකලපුව මහේස්ත්‍රාත් මහාධිකරණ විනිසුරු ඒ. සී. රිස්වාන් මහතා මේ සිරුර ගොඩ ගෙන පරීක්ෂණ පවත්වන ලෙස නියෝග කරන ලදි.

**ඡායාරූපය - මඩකලපුව සමූහ**

# පොල් වත්ත බලා ගත් අයගේ මරණය ඝාතනයක් බව හෙළි වේ

**පුත්තලම සමූහ - ඩබ්ලිව්. සී. බී. ප්‍රනාන්දු**

පොල් වත්තක් රැක බලාගැනීමේ නිරතව සිටි අයකුගේ සිරුර එම වත්තේම තිබී හමුවී ඇති අතර මෙය මුගුරක් වැනි මොට ආයුධයකින් හිසට සහ උගුරුදණ්ඩට පහරවැදීමෙන් සිදුවී ඇති මරණයක් බව පශ්චාත් මරණ පරීක්ෂණයේදී හෙළිවී ඇත. එනිසා මිනිස් ඝාතනයක් වන මේ මරණය පිළිබඳව මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන ක්‍රියාත්මක කර ඇත.

බත්තුළුඔය, තාරවිල්ලුවේ පදිංචිව සිටි ආර්. ඒ. දොන් අනුරුද්ධ රන්දෙනිය (අවු.63) යන අයකුගේ මරණය සම්බන්ධයෙන් පොලිසිය මෙසේ විමර්ශන ක්‍රියාත්මක කර ඇත.

තම නිවෙසට ආසන්නයේ තිබෙන පොල් වත්තක් රැක බලාගැනීම වෘත්තිය වශයෙන් කරගෙන ගොස් ඇති මිය ගිය පුද්ගලයා දිනපතාම අලුයම 5.00ට පමණ එම වත්තට ගොස් එතැන් සිට වත්ත බලාගැනීමේ කටයුතු කරගෙන යෑම පුරුද්දක් කරගෙන ඇති බවත්, සුපුරුදු පරිදි ඉකුත් 02 වැනිදා අලුයම 5.00ට පමණ වත්තට ගිය ඔහු ආපසු නොපැමිණීම නිසා සොයා බලන විට වත්තේ නිවෙස පිටුපස තිබී ඔහුගේ සිරුර හමුවී ඇති බවත් මුන්දලම පොලිසිය සිද්ධිය පිළිබඳව පවත්වන ලද මූලික පරීක්ෂණවලදී හෙළිවී ඇත.

පුත්තලම හදිසි මරණ පරීක්ෂක නන්දන විමලවීර මහතා මේ මරණය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා, පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා සිරුර පුත්තලම රෝහලට යවන ලදී.

එහිදී පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ පුත්තලම රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විශේෂඥ වෛද්‍ය ජේ. පී. එස්. බණ්ඩාර මහතා මුගුරක් වැනි මොට ආයුධයකින් හිසට හා උගුරුදණ්ඩ කොටසට පහරවැදීමෙන් මේ මරණය සිදුවී ඇති බව තීරණය කර ඇත.

ලංකා සතොස
LANKA SATHOSA

වෙළඳ අමාත්‍යාංශය

# අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 27 ක මිල පහත හෙළීම.

ඉදිරි මාස 03 ක් සඳහා, ස්ථාවර අඩුම මිලට, ගුණත්වයෙන් ඉහළ අත්‍යවශ්‍ය පාරිභෝජන භාණ්ඩ 27 ක් ලංකා සතොස, සමූපකාර සහ Q-Shop වෙතින් දැන් මිලදී ගත හැක.

| | භාණ්ඩය | විවෘත වෙළෙඳපොළ පැවති මිල (රු.) | සතොස සහ සමුපකාර අලෙවි ජාලය හරහා අලෙවි කෙරෙන මිල (රු.) | පාරිභෝගික සහනය (රු.) |
|---|---|---|---|---|
| 01 | රතු කැකුළු (1 kg) | 106 | 93 | 13 |
| 02 | සුදු කැකුළු (1 kg) | 105 | 93 | 12 |
| 03 | සුදු නාඩු (1 kg) | 109 | 96 | 13 |
| 04 | සම්බා (1 kg) | 120 | 98 | 22 |
| 05 | කීරි සම්බා (1 kg) | 140 | 125 | 15 |
| 06 | තිරිඟු පිටි (1 kg) | 105 | 84 | 21 |
| 07 | සුදු සීනි (1 kg) | 110 | 99 | 11 |
| 08 | දුඹුරු සීනි (1 kg) | 140 | 125 | 15 |
| 09 | තේ (නො. 01 - පැකට් 100 g) | 130 | 95 | 35 |
| 10 | රතු පරිප්පු - ඕස්ට්‍රේලියන් (1 kg) | 188 | 165 | 23 |
| 11 | ලොකු ළූණු - පකිස්තාන් / ඉන්දියන් (1 kg) | 140 | 120 | 20 |
| 12 | අර්තාපල් - දේශීය (1 kg) | 215 | 180 | 35 |
| 13 | අර්තාපල් - පකිස්තාන් (1 kg) | 190 | 140 | 50 |
| 14 | කඩල (1 kg) | 225 | 175 | 50 |
| 15 | වියළි මිරිස් (1 kg) | 550 | 495 | 55 |
| 16 | ටින් මාළු - දේශීය (425 g) | 240 | 220 | 20 |
| 17 | ටින් මාළු - ආනයනික (425 g) | 280 | 265 | 15 |
| 18 | හාල්මැස්සන් - තායිලන්ත (1 kg) | 700 | 575 | 125 |
| 19 | කුකුළු මස් - සම සහිත (1 kg) | 430 | 400 | 30 |
| 20 | ලුණු (ක්‍රිස්ටල් අයඩයිඩ්) (1 kg) | 55 | 43 | 12 |
| 21 | කිරි පිටි (400 g) | 380 | 355 | 25 |
| 22 | සෝයා තෙල් (500 ml) | 470 | 310 | 160 |
| 23 | රෙදි සෝදන සබන් - STC (115 g) | 53 | 48 | 5 |
| 24 | රෙදි සෝදන / බාර් සබන් - BCC (650 g) | 325 | 260 | 65 |
| 25 | සුවඳ සබන් - STC (100 g) | 63 | 56 | 7 |
| 26 | දත් සෝදන දියර (100 ml) - ITI | 350 | 250 | 100 |
| 27 | මුව ආවරණ (SLS සහතික ලත්) | 25 | 14 | 11 |

# පඩිපාලක සභා ආඥා පනත

## නිවේදනයයි

### රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වෙනි වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩි පාලක සභාව අදහස් කරන බව එකී ආඥා පනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2021 පෙබරවාරි මස 15 දින මධ්‍යහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති**
**සභාපති**
**රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය**
**පිළිබඳ පඩිපාලක සභාව**

**2021-02-09 දින**
**කොළඹ 05. කම්කරු දෙපාර්තමේන්තුවේදීය**

**උපලේඛනය**

රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දවූ ද අවසන් වරට 2014 සැප්තැම්බර් 26 දින අංක 1881/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දවූද තීරණ එම උපලේඛනයේ 11 වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය

| | |
|---|---|
| කම්කරු | රු. 900.00 |
| අයවැය සහන දීමනාව | රු. 100.00 |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු කැඳවීමයි (IFB)

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත විස්තර කර ඇති **බස්නාහිර පළාතේ** ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටියි.

| කොන්ත්‍රාත් අංක | කොන්ත්‍රාත්තුවේ නම | සම්භාව්‍යතාව නොමැති ඉංජිනේරු ඇස්තමේන්තුව (රු. මිලි.) | ලංසු ආරක්ෂණය (රු. මිලි.) | CIDA ශ්‍රේණිය | කාලය (දින) | වැඩ විෂය පථය |
|---|---|---|---|---|---|---|
| RDA/DC/WP/IR - GOSL/2021/05 | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 3/1 පාලම පුළුල් කිරීම - B435 | 106.5 | 1.5 | C3 හෝ C4 | 273 | පාලම පුළුල් කිරීම (including bored pile foundation), පිවිසුම් ඉදිකිරීම් සහ අනෙකුත් වැඩ |
| RDA/DC/WP/IR - GOSL/2021/06 | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 3/2 පාලම නැවත ඉදි කිරීම - B435 | 157.1 | 2 | C3 හෝ C2 | 273 | පාලම නැවත ඉදිකිරීම (including bored pile foundation), පිවිසුම් ඉදිකිරීම් සහ අනෙකුත් වැඩ |

2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.
3. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) **පාලම් ක්ෂේත්‍රයට අදාළව** ඉහත වගුවේ සඳහන් කර ඇති පරිදි අදාළ ශ්‍රේණියන් හි ලියාපදිංචි වී සිටිය යුතුය.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත කාර්යාලවලින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර **2021.02.11** සිට **www.rda.gov.lk** හරහා ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.

   අ. අධ්‍යක්ෂ (ඉදිකිරීම්),
   මාර්ග සංවර්ධන අධිකාරිය,
   3 වන මහල, "මගනැගුම මහමැදුර",
   ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
   බත්තරමුල්ල.

   දුරකථන: 011 - 2864388, ෆැක්ස් අංකය.: 011 - 2861821

   ආ. ව්‍යාපෘති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත),
   මාර්ග සංවර්ධන අධිකාරිය,
   1 මහල, "සෙත්සිරිපාය",
   බත්තරමුල්ල

   දුරකථන: 011 - 2876600 සහ ෆැක්ස් අංකය.: 011 - 2877226

5. පූර්ව ලංසු රැස්වීම, **2021.02.19** දින **පැය 10:00** ට ව්‍යාපෘති අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල හි දී (දුරකථන 011-2876600 ෆැක්ස් 011-2877226) පැවැත්වෙනු ඇති අතර අවශ්‍ය වන්නේ නම්, ඉන් පසු වැඩබිම් සංචාරයක් සැලසුම් කළ හැකිය.
6. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021.02.11** සිට **2021.03.03** දක්වා **පැය 09:00** සිට **පැය 15:00** තෙක් කාලය තුළ, එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා "අධ්‍යක්ෂ ජනරාල් - මාර්ග සංවර්ධන අධිකාරිය" නමට ලබාගත් **රු. 21,600.00 (වැට් සහිත) නැවත නොගෙවනු ලබන** ගෙවීම් නියෝගයක් **(දින 90 ක් වලංගු)** සහිතව ලිඛිත අයදුම්පත්‍රයක් අධ්‍යක්ෂ (ඉදිකිරීම්), මාර්ග සංවර්ධන අධිකාරිය, 3 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත එවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩරය ලබාගැනීමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.
7. සෑම ලංසුවක්ම ඉහත වගුවේ දක්වා ඇති වටිනාකමට සරිලන ලංසු ආරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ලංසු ආරක්ෂණ **2021.06.30** දක්වා වලංගු විය යුතු ය.
8. ලංසු **2021.06.02** දක්වා වලංගු විය යුතු ය.
9. ලංසු, පිටපත් දෙකකින් යුතුව, **2021.03.04** දින **පැය 14:00** හෝ එදිනට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ ජනරාල් බාරේ, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.

**සභාපති**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව**
**මාර්ග සංවර්ධන අධිකාරිය**
**1 වන මහල, "මගනැඟුම මහමැදුර"**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල**

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

## කුලී රථ (Cab Service) සඳහා මිල ගණන් කැඳවීම

අප ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍යතාවය පරිදි ලබා ගැනීමට හැකි අයුරින් කුලී රථ සේවා (Cab Service) ආයතනවලින් මිල ගණන් කැඳවනු ලැබේ.

01. **වෑන් රථ - වායු සමීකරණ සහිත (ද්විත්ව)**
02. **මෝටර් රථ - වායු සමීකරණ සහිත (ඇල්ටෝ, වැගන් ආර් වැනි)**
03. **මෝටර් රථ - වායු සමීකරණ සහිත (හයිබ්‍රිඩ් වැනි)**

එම වාහන රියදුරන් සමග සැපයිය යුතු අතර, කෙටි ධාවන ගාස්තු සහ දුර ගමන් ගාස්තු, රඳවා ගැනීමේ ගාස්තු ද ඇතුළත්ව මුද්‍රා තබන ලද සියලුම මිල ගණන් 2021.02.19 වන දින ප.ව. 3.00 ට පෙර ආයතනයේ පරිපාලන අංශය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, එදිනම ප.ව. 3.00 ට මිල ගණන් විවෘත කරනු ලැබේ. මිල ගණන් පිළිබඳ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය**
**කඳවල වත්ත, අංක 02, සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන.**
**දු. අංකය - 0112632406**




# බේරා නොගත් රන් භාණ්ඩ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකුවේ සියලුම ශාඛාවල රන් ණය සහ උකස් ණය ලබා ගැනීම සඳහා උකස් කරන ලදුව 2020.09.30 දින හෝ ඊට පෙර බේරා ගැනීමට නියමිතව තිබූ එහෙත් 2021.02.19 වෙනිදා තෙක් බේරා නොගත් භාණ්ඩ 2021.02.20 වන දින සිට දිනපතා (භාණ්ඩ අවසාන වන තෙක්) පෙ.ව. 9.00 සිට

**කුරුණෑගල ශාඛාවේදී**
(නො. 22, සූරතිස්ස මාවත, කුරුණෑගල.)
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් නිවේදනය කර සිටිමු. වෙන්දේසිය අවලංගු කිරීම හෝ කල් දැමීමේ බලය බැංකුව රඳවා ගනු ඇත.

**පෑන් ඒෂියා බැංකුව**
**සැබවින්ම ශ්‍රී ලාංකීයයි**
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා පරිපාලන)
නො. 450, ගාලුපාර, කොළඹ 03.

# afc රන් ණය සේවාව

## රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පීඑල්සී පහත සඳහන් ස්ථානවල උකස් තබන ලද 2019-11-30 දිනට කල්පිරුණු, මෙතෙක් බේරා නොගත් රන් භාන්ඩ 2021-02-24 වන දින පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**රන් ණය මධ්‍යස්ථාන**


**අළුත්ගම, අම්බලන්ගොඩ, අම්පාර, අනුරාධපුර, අතුරුගිරිය, අවිස්සාවේල්ල, බදුල්ල, බලංගොඩ, මඩකලපුව, චන්කනෛයි, චාවකච්චේරි, හලාවත, චුන්නක්කම්, දඹුල්ල, ගලේවෙල, මොණරාගල, හැටන්, හෝමාගම, හොරණ, ජා-ඇල, යාපනය, කඩවත, කදුරුවෙල, කඩුවෙල, කලවංචිකුඩි, කල්පිටිය, කිලිනොච්චි, කිරිබත්ගොඩ, කිරිඳිවැල, මාලබේ, මාතර, මීගමුව, නිට්ටඹුව, පානදුර, පිළියන්දල, පේදුරු තුඩුව, පූගොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ, තිරුනවේලි, ත්‍රිකුණාමළය, වව්නියාව, වැලිමඩ, දෙහිඅත්තකණ්ඩිය, ගල්ගමුව, කළුතර, කෑගල්ල, කැලණිය, කුරුණෑගල, නාවලපිටිය, රාගල, රාජගිරිය, වැලල්ලවාය, කොහුවල, නුවර එළිය, නිකවැරටිය, මාතලේ, හිඟුරක්ගොඩ, මැදවච්චිය**

**වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය සහ දිනය**
**නො 722, කෝට්ටේ පාර, රාජගිරිය**
**2021-02-24**

වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ, කල් දැමීමේ හා ඒකාබද්ධ කිරීමේ බලය එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී සතුය.

ආරම්භය 1956
එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී
සෞභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

ප්‍රධානී - රන් ණය
**එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී**
නො.722, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන - 0115 573600



**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29D වන වගන්තිය යටතේ විකිණීම**

# මහජන බැංකුව

## ආයතනික ශාඛාව

# වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම
# ගාල්ල

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර අක්මීමන ප්‍රාදේශීය සභා සීමා තුළ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 113/සී අනන්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගාල්ලේ අකුරැස්ස පාරේ පිහිටි 2018.05.18 දින බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සකස් කළ අංක 15320 දරන නේවාසික සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත ලකුණු කර බෙදා වෙන් කරන ලද දේපළ පිළිබඳ විස්තර.

| | කොටස් අංකය | වරිපනම් අංක | | කුලුන | මහල | ගෙබිම් ප්‍රදේශය (වර්ග මීටර) | ලියාපදිංචි අංකය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ |
|---|---|---|---|---|---|---|---|
| 1 | A/NT/F2/P5 | 171/60 | 2/5 | උතුරු කුලුන | දෙවැනි මහල | 73 | CON/J 01/13 |
| 2 | A/NT/F2/P6 | 171/60 | 2/6 | උතුරු කුලුන | දෙවැනි මහල | 73 | CON/J 01/15 |
| 3 | A/NT/F2/P8 | 171/60 | 2/8 | උතුරු කුලුන | දෙවැනි මහල | 106.25 | CON/J 01/19 |
| 4 | A/NT/F2/P10 | 171/60 | 2/10 | උතුරු කුලුන | දෙවැනි මහල | 103.75 | CON/J 01/23 |
| 5 | A/NT/F3/P1 | 171/60 | 3/1 | උතුරු කුලුන | තුන්වන මහල | 103.75 | CON/J 01/25 |
| 6 | A/NT/F3/P2 | 171/60 | 3/2 | උතුරු කුලුන | තුන්වන මහල | 106.25 | CON/J 01/27 |
| 7 | A/NT/F3/P3 | 171/60 | 3/3 | උතුරු කුලුන | තුන්වන මහල | 106.25 | CON/J 01/29 |
| 8 | A/NT/F3/P5 | 171/60 | 3/5 | උතුරු කුලුන | තුන්වන මහල | 73 | CON/J 01/33 |
| 09 | A/NT/F3/P7 | 171/60 | 3/7 | උතුරු කුලුන | තුන්වන මහල | 71.75 | CON/J 01/37 |
| 10 | A/NT/F3/P8 | 171/60 | 3/8 | උතුරු කුලුන | තුන්වන මහල | 106.25 | CON/J 01/39 |
| 11 | A/NT/F3/P9 | 171/60 | 3/9 | උතුරු කුලුන | තුන්වන මහල | 106.25 | CON/J 01/41 |
| 12 | A/NT/F4/P4 | 171/60 | 4/4 | උතුරු කුලුන | හතරවන මහල | 72.25 | CON/J 01/51 |
| 13 | A/NT/F4/P10 | 171/60 | 4/10 | උතුරු කුලුන | හතරවන මහල | 103.75 | CON/J 01/63 |
| 14 | A/NT/F5/P4 | 171/60 | 5/4 | උතුරු කුලුන | පස්වන මහල | 72.25 | CON/J 01/71 |
| 15 | A/NT/F5/P5 | 171/60 | 5/5 | උතුරු කුලුන | පස්වන මහල | 73 | CON/J 01/73 |
| 16 | A/NT/F5/P6 | 171/60 | 5/6 | උතුරු කුලුන | පස්වන මහල | 73 | CON/J 01/75 |
| 17 | A/NT/F5/P7 | 171/60 | 5/7 | උතුරු කුලුන | පස්වන මහල | 71.75 | CON/J 01/77 |
| 18 | A/NT/F6/P4 | 171/60 | 6/4 | උතුරු කුලුන | හයවන මහල | 72.25 | CON/J 01/91 |
| 19 | A/NT/F6/P5 | 171/60 | 6/5 | උතුරු කුලුන | හයවන මහල | 73 | CON/J 01/93 |
| 20 | A/NT/F6/P6 | 171/60 | 6/6 | උතුරු කුලුන | හයවන මහල | 73 | CON/J 01/95 |
| 21 | A/NT/F7/P5 | 171/60 | 7/6 | උතුරු කුලුන | හත්වන මහල | 73 | CON/J 01/113 |
| 22 | A/NT/F8/P5 | 171/60 | 8/5 | උතුරු කුලුන | අටවන මහල | 73 | CON/J 01/131 |
| 23 | A/NT/F10/P4 | 171/60 | 10/4 | උතුරු කුලුන | දසවන මහල | 145.25 | CON/J 02/33 |
| 24 | A/NT/F11/P1 | 171/60 | 11/1 | උතුරු කුලුන | එකොළොස්වන මහල | 103.75 | CON/J 02/45 |
| 25 | A/NT/F11/P5 | 171/60 | 11/5 | උතුරු කුලුන | එකොළොස්වන මහල | 73 | CON/J 02/53 |
| 26 | A/NT/F12A/P8 | 171/60 | 14/8 | උතුරු කුලුන | දොළහ A මහල | 104 | CON/J 02/107 |
| 27 | A/NT/F12A/P7 | 171/60 | 14/7 | උතුරු කුලුන | දොළහ A මහල | 106.25 | CON/J 02/103 |
| 28 | A/NT/F14/P4 | 171/60 | 14/7 | උතුරු කුලුන | දහතරවන මහල | 105.5 | CON/J 02/105 |
| 29 | A/ST/F4/P4 | 171/50 | 4/4 | දකුණු කුලුන | හතරවන මහල | 73 | CON/J 03/23 |
| 30 | A/ST/F5/P5 | 171/50 | 5/5 | දකුණු කුලුන | හතරවන මහල | 73 | CON/J 03/43 |
| 31 | A/ST/F5/P10 | 171/50 | 5/10 | දකුණු කුලුන | හතරවන මහල | 103.75 | CON/J 03/53 |
| 32 | A/ST/F12A/P2 | 171/50 | 14/2 | දකුණු කුලුන | දොළහ A මහල | 106.25 | CON/J 04/63 |
| 33 | A/ST/F14/P1 | 171/50 | 14/2 | දකුණු කුලුන | දහතරවන මහල | 105.5 | CON/J 04/65 |
| 34 | A/ST/F12A/P7 | 171/50 | 14/7 | දකුණු කුලුන | දොළහ A මහල | 106.25 | CON/J 04/79 |
| 35 | A/ST/F14/P4 | 171/50 | 14/7 | දකුණු කුලුන | දහතරවන මහල | 105.5 | CON/J 04/81 |

අදාළ දේපළ ෆෙයාවේ ගෝල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි.තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2020 දෙසැම්බර් මස 24 වන දින රජයේ ගැසට් පත්‍රය, 2020 දෙසැම්බර් මස 25 වන දින ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් බලන්න.

**මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ**

## 2021 මාර්තු මස 10 වන බදාදා දින පෙ.ව. 11.00 ට

**මහජන බැංකුව - ගාල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

*මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.*

### ගෙවීමේ ක්‍රමය

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

01. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
03. වෙන් දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක (සියයට දෙකහමාරක්)
04. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 1,500.00
05. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ප්‍රධාන කළමනාකාර - අයකරගැනීම්, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් A ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ. දුරකථන අංක 011-2481443, 011-2481546.

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

*"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"*

# ශොක්මන් සහ සමරවික්‍රම

**එකම රටක්. එකම වෙන්දේසිකරුවෙක්. වසර 129 ක සේවා විශිෂ්ටත්වය සමගින්**

**ප්‍රධාන කාර්යාලය**
24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන : 081-2227593
දුරකථන / ෆැක්ස් : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

**නගර කාර්යාලය**
6A, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකථන : 011 2671467, 011 2671468
දුරකථන / ෆැක්ස් : 011-2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

like us on facebook

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු කැඳවීමයි (IFB)

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත විස්තර කර ඇති ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටියි.

| අනු අංක | කොන්ත්‍රාත් අංක | ව්‍යාපෘතියේ නම | පළාත | සම්භාව්‍යතාව නොමැති ඉංජිනේරු ඇස්තමේන්තුව (රු. මිලි.) | මහාමාර්ග පිළිබඳ විශේෂඥතාව | ලංසු ආරක්ෂණය රු. | කොන්ත්‍රාත් කාලය (දින) |
|---|---|---|---|---|---|---|---|
| 01. | RDA/MM/EP (Akk)/RMTF/ 2021/07 | කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම. කි.මී. (295+200 සිට 297+700) | EP (Akk) | 36.11 | C5 හා C4 පමණි | 590,000.00 | 90 |
| 02. | RDA/MM/EP (Akk)/RMTF/ 2021/08 | කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම. කි.මී. (297+700 සිට 300+200) | EP (Akk) | 36.05 | C5 හා C4 පමණි | 590,000.00 | 90 |
| 03. | RDA/MM/EP (Akk)/RMTF/ 2021/09 | කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම. කි.මී. (300+200 සිට 302+700) | EP (Akk) | 35.75 | C5 හා C4 පමණි | 580,000.00 | 90 |
| 04. | RDA/MM/EP (Akk)/RMTF/ 2021/10 | කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම. කි.මී. (302+700 සිට 305+200) | EP (Akk) | 36.78 | C5 හා C4 පමණි | 600,000.00 | 90 |
| 05. | RDA/MM/CP GOSL(EM)/ 2021/11 | අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදි කිරීම. (A007) කි.මී. 86+400 - 86+500 | CP | 46.41 | මහාමාර්ග හෝ පාලම් සම්බන්ධ C4 හා C3 පමණි | 790,000.00 | 180 |

1. වැඩ කටයුතුවලට අයිතම අංක 1 - 4 දක්වා ඇස්ෆෝල්ට් ඇතිරීම සහ අයිතම අංක 5 හි සඳහන් රැදැවුම් බැම්ම ඉදිකිරීම ඇතුළත් වේ.
2. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත. අයිතම අංක 01,02,03, 04 සඳහා වන මුළු ප්‍රසම්පාදන පිරිවැය තක්සේරුව රු.මි. 50 ට අඩු බැවින්, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016 (ii) හි දක්වා ඇති CIDA ශ්‍රේණිය සහ ප්‍රාදේශීය වරණයන් අදාළ වෙනු ඇති අතර රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2020 (i) අනුව සියලුම අයිතම සඳහා මූල්‍ය ඇගයීමේදී රජයට අයත් ව්‍යාපාර සඳහා 5% ක වරණයක් ලබාදෙනු ඇත.
3. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා යෝග්‍ය වීමට සාර්ථක ලංසුකරුවා ඉහත වගුවේ දක්වා ඇති ශ්‍රේණිවලට අදාළව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී සිටිය යුතු ය.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන් (http://www.rda.gov.lk/source/bids-ads.htm) **2021.02.10** සිට **2021.03.02** දින **පැය 15.00** දක්වා ලංසු ලේඛන භාගත හැකි ය.
5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත කාර්යාලවලින් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය.

(අ) අධ්‍යක්ෂ (නඩත්තු කළමනාකරණ),
මාර්ග සංවර්ධන අධිකාරිය,
6 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන : 011-2882196 ෆැක්ස්: 011-2882195

(ආ) අයිතම අංක 01, 02, 03, 04 සඳහා පළාත් අධ්‍යක්ෂ (අක්කරෙයිපත්තු), මාර්ග සංවර්ධන අධිකාරිය, අක්කරෙයිපත්තු.
දුර: 067-2277428 ෆැක්ස්: 067-2278971.

(ආ) අයිතම අංක 05 සඳහා පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර.
දුර: 081-2226150 ෆැක්ස්: 081-2237931.

6. **2021.02.18** දින **පෙ.ව 10.00** ට පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, අක්කරෙයිපත්තු හි දී අයිතම අංක 01, 02, 03, 04 සඳහාත් පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය (මධ්‍යම පළාත), මහනුවර හි දී අයිතම අංක 05 සඳහාත් පූර්ව ලංසු රැස්වීම් පැවැත්වෙනු ඇත. ඉන් පසු අදාළ ස්ථාන පරීක්ෂාවක් සැලසුම් කරනු ඇත. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ලංසුකරුවන් සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.
7. ලංසු ලේඛනයේ දක්වා ඇති **ආකෘති පත්‍රය අනුව** ඉහත වගුවේ දක්වා ඇති වටිනාකමට සරිලන **ලංසු ආරක්ෂණයක්** සමග ලංසු ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණ **2021.06.30** දක්වා වලංගු විය යුතු ය.
8. උනන්දුවක් දක්වන ලංසුකරුවන් **නැවත නොගෙවනු ලබන** ටෙන්ඩර් ගාස්තුවක් සඳහා "අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය" නමින් අයිතම අංක 01, 02, 03, 04 සඳහා **රු.6,750.00** ක ගෙවීම් නියෝගයක් සහ අයිතම අංක 05 සඳහා **රු. 12,500.00** ක ගෙවීම් නියෝගයකුත් ලබාගෙන ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය.
9. **පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත් ලියාපදිංචියේ පිටපතක්** සහ ගෙවීම් නියෝගයේ මුල් පිටපත සමග ලංසුව බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත් නම සඳහන් කරමින් පිටපත් දෙකකින් යුතුව **2021.03.03** දින **පැය 13:00** ට පෙර පහත දක්වා ඇති ලිපිනයට ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා මාර්ගගත (Online) ක්‍රමය අනුගමනය කරනු ලැබේ. Zoom meeting සබැඳිය පසුව දැනුම් දෙනු ලැබේ. ගෙවීම් නියෝගය රහිත සහ **www.eroc.gov.lk** හරහා පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත් ලියාපදිංචියේ පිටපත රහිත ලංසු පිළි නොගන්නා අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතිකෙෂ්ප කරනු ලැබේ.

**සභාපති**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව**
**අධ්‍යක්ෂ ජනරාල්**
**මාර්ග සංවර්ධන අධිකාරිය**
**1 වන මහල, "මගනැගුම මහමැදුර"**
**අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**




BE BETTER INFORMED!
දිනමිණ Dinamina
Daily News
தினகரன் Thinakaran
News you can trust now free on your mobile phone.
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE
AVAILABLE AT


## ලංසු කැඳවීමේ ආරාධනයයි
## ජාතික මෝස්තර මධ්‍යස්ථානය - කටුබැද්ද

01. පහත විස්තර කර ඇති කාර්යයන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.
02. තරගකාරී ලංසු කැඳවීම මගින් කොන්ත්‍රාත්කරු තෝරාගනු ලැබේ.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී හෝ පවරන ලද කොන්ත්‍රාත් හැරගොස් හෝ අවසන් නොකර නොතිබිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබීම හා වලංගු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ලියාපදිංචිය තිබිය යුතුය.

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | අවශ්‍ය අවම ICDA ලියාපදිංචිය | ආපසු ගෙවනු ලබන තැන්පතුව / ලංසු සුරක්ෂණය රු. | ලංසු ලිපි ලේඛණ නිකුත් කරන / ලංසු තැන්පත් කළ යුතු / බහාලිය යුතු ස්ථානය හා දුරකථන අංක |
|---|---|---|---|---|
| NDC/Adm/AD /22-1 | අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් ශාලාව ප්‍රතිසංස්කරණය | C 6 | ලංසු වටිනාකමින් 1% | ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නො. 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. 0112607814 |
| NDC/Adm/AD /22 - II | ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය | | ලංසු වටිනාකමින් 1% | |
| NDC/Adm/AD /22 - III | අධ්‍යාපන අංශය වෙනත් ස්ථානයකට ස්ථාපනය කිරීම | | ලංසු වටිනාකමින් 1% | |

04. ලංසු ලියවිලිවල සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
05. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ඇති ලංසුකරුවන් වැඩි විස්තර ඇතුළත් ප්‍රසම්පාදන ලිපිලේඛන කට්ටලය 2021.02.11 දින සිට 2021.02.25 දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම වැඩකරන දිනයකදී ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිත හට ලබාගත හැක. අදාළ කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය හා සුදුසුකම් අනුව ඉහත කොන්ත්‍රාත් එකකට හෝ කිහිපයකට ලංසු ඉදිරිපත් කළ හැකිය.
06. ඔබගේ මුද්‍ර, තබන ලද කවරයේ ඉහළ කෙළවර ව්‍යාපෘති නාමය සඳහන් කළ ලංසු ලියවිල්ල ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් 2021.03.04 දින පෙ. ව. 10.30 ට පෙර පහත ලිපිනයට ගෙනැවිත් බාරදිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.
07. සියලුම ලංසු සමග ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුව මුදලින් ගෙවූ බවට ලද රිසිට් පත / ලංසු සුරක්ෂණය අමුණා එවිය යුතුයි.
08. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති, ජාතික මෝස්තර මධ්‍යස්ථානය.**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

### පේෂ කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා සායම් වර්ග මිලදී ගැනීම

දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වර්ණාගාරයන්හි නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා සායම් වර්ග මිලදී ගැනීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | රසායන ද්‍රව්‍ය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
|---|---|---|
| 01. | Wetting Agent | 650 |
| 02. | Sodium Sulfate (Globasalt) | 30,000 |
| 03. | Soda Ash | 10,000 |
| 04. | Uvitex | 85 |
| 05. | Sequestering Agent | 650 |
| 06. | Fixing Agent | 600 |
| 07. | Core Neutralizer | 450 |
| 08. | Soaping Agent | 850 |
| 09. | Decolourent | 900 |
| 10. | Leveling Agent | 400 |
| 11. | Softner | 200 |
| 12. | Caustic Soda | 1,400 |
| 13. | Hydrogen Peroxide | 2,250 |
| 14. | Ferrous Sulfate | 5,000 |
| 15. | Polymer | 350 |
| 16. | Hydrochloric Acid | 200 |
| 17. | Hydro Sulfide Acid | 300 |
| 18. | තිල් | 50 |
| 19. | Beva Soft | 200 |

| අනු අංකය | සායම් වර්ණය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
|---|---|---|
| 01. | Black | 800 |
| 02. | Yellow | 500 |
| 03. | Red | 390 |
| 04. | Scarlet | 150 |
| 05. | Turk Blue | 490 |
| 06. | Blue | 445 |
| 07. | Violet | 185 |
| 08. | Orange | 185 |
| 09. | Green | 165 |
| 10. | Rubine | 100 |
| 11. | Pink | 10 |
| 12. | Brown | 10 |

- **බතික් අංශය සඳහා රසායන හා සායම් මිලදී ගැනීම**

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
|---|---|---|
| 01. | ඉටි | 1000 |
| 02. | ASSW | 10 |
| 03. | ASSG | 10 |
| 04. | CSR | 50 |
| 05. | ASBS | 5 |
| 06. | Blue B | 25 |
| 07. | Red B | 25 |
| 08. | Blue RSN | 5 |
| 09. | Roshin | 25 |
| 10. | Wetting Agent | 5 |
| 11. | Scarlet | 25 |
| 12. | Vat Apple Green | 5 |

ආපසු නොගෙවන රු. 5,000.00 ක ගාස්තුවක් ගාල්ල, ලබුදූව, දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණයෙහි, හත්වන මහලෙහි පිහිටි දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ගිණුම් අංශය වෙත ගෙවා ලංසු ලියවිලි 2021.03.02 දින ප.ව. 2.30 දක්වා සතියේ වැඩකරන දිනවල ලබාගත හැක.

එමෙන්ම ලංසු ඉදිරිපත් කිරීමේදී, ඉදිරිපත් කරන ලංසුවේ වටිනාකම 1% ක වටිනාකම සහිත දින 45 ක කාලයක් සඳහා වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කර ලද ලංසුපත් 2021.03.03 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන ලෙස, සභාපති, **අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, දකුණු පළාත් ධීවර හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, දෙවන මහල, දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය, ලබුදූව, ගාල්ල** යන ලිපිනයට නිසි ලෙස මුද්‍ර, තබා ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අමාත්‍යාංශ කාර්යාල පරිශ්‍රයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. ලංසු පත්‍රය සහිත කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**රසායන ද්‍රව්‍ය හා සායම් වර්ග සඳහා මිල ගණන්**" යනුවෙන් සඳහන් කළ යුතුය.

ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැක.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**දකුණු පළාත් ධීවර හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,**
**දෙවන මහල, දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය,**
**ලබුදූව, ගාල්ල.**

**දුරකථන අංක : 091-2234479, 091-2244041**

# කොවිඩ් මරණවලින් වාසි ගන්න හදන පහත් විපක්ෂයක් මේ රටට අවශ්‍ය නෑ

## ● ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**'සිව් දෙස සුරැකි සිව් වසර' කටුගම්පළ රැස්වීම**



**රත්නසිරි පතිරණ**

කොවිඩ් මරණවලින් පවා දේශපාලන වාසි ගැනීමට බලා සිටින විපක්ෂයක් අපේ රටේ සිටී ඉතාම කනගාටුදායක තත්ත්වයක් බවත් එවැනි විපක්ෂයක් මේ රටට අවශ්‍ය නොවන බවත් මහා මාර්ග ඇමැති, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා කීය. ඇමැතිවරයා මෙසේ පැවැසුවේ 'සිව් දෙස සුරකි සිව් වසර' මැයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ 4 වැනි සංවත්සරයට සමගාමීව කටුගම්පළ ආසන මධ්‍ය සංවිධාන රැස්වීම අමතමිනි. පන්නල ප්‍රාදේශීය සභාවේ සභාපති කටුගම්පළ ආසන කැඳවුම්කරු සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කුරුණෑගල දිස්ත්‍රික් පළාත් පාලන ප්‍රධානීන්ගේ සංසදයේ සභාපති රංජිත් ලංසකාර මහතාගේ නිකපොත පිහිටි නිවසේදී මෙම රැස්වීම පැවැත්විණි.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා:

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරවන්න කටුගම්පළ ආසනයේ ප්‍රගතිශීලී ජනතාව ලබා දුන්නෙ පුදුමාකාර ශක්තියක්. එවැනි හයියක් ශක්තියක් ලබාදුන්න කටුගම්පළ ජනතාවට අපේ පක්ෂයේත්, මගේත් ගෞරවනීය ප්‍රණාමය මේ මොහොතේ පුදකරන්න කැමතියි.

විශේෂයෙන්ම ලංසකාර මහතා විවිධ තර්ජන ගර්ජන මැද්දෙ කටුගම්පළ ජනතාව මහින්ද මහත්තයව ජයග්‍රහණය කරවන්න පෙළ ගැස්සුව. ඒ වගේම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ විජයග්‍රහණයටත් ඔබ සියලු දෙනාම කැපවී කටයුතු කළ බව මම හොඳින් දන්නව. ලක්ෂ 69ක බහුතර ජනතා කැමැත්තෙන් 3/2 බලයක් සහිතව ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත් වුණා. එතුමාට කොවිඩ් - 19 වසංගත රෝගය යම් අභියෝගයක් . අද ඒ අභියෝගයටත් රජය නොබියව මුහුණ දෙනවා. කොවිඩ් - 19 කියන්නෙ කොටි ත්‍රස්තවාදයටත් වඩා දරුණු ව්‍යසනයක්.

කොවිඩ්වලට එරෙහි එන්නත සාර්ථකව රට පුරා සෞඛ්‍ය අංශවලට හා ආරක්ෂක අංශ වෙත ලබා දෙනව. රටට වගකියන ආණ්ඩුවක් විදිහට මේ රෝගයට එරෙහිව අතිවිශාල වැඩ කොටසක් කරගෙන යද්දි. අපේ රටේ විපක්ෂය හැසිරෙන හැටි ඉතාම කනගාටුදායකයි. රජය මෙතරම් වැඩ කොටසක් රටේ ජනතාව ආරක්ෂා කරගන්න ක්‍රියාත්මක කරද්දි අපේ විපක්ෂය රජයේ වැඩපිළිවෙළ විවේචනය කරනවා. දැන් එන්නත ගෙනල්ල සාර්ථකව ජනතාවට දෙන විටත් ඒකත් මේ විපක්ෂය විවේචනය කරනවා. ජනතා විමුක්ති පෙරමුණත් එජාපයේ මෙන්ම සමගි ජනබලවේගයේ පදයට නටන අඳබාල විපක්ෂයක් වෙලා. මේ අය බලාගෙන හිටියෙ කොවිඩ් වසංගතයෙන් රටේ මිනිස්සු ලක්ෂ ගණනින් මිය යාවි කියලා. මළ මිනියෙනුත් දේශපාලන වාසි ගන්න බලාගෙන ඉන්න තුට්ටු දෙකේ බංකොළොත් මේ වගේ විපක්ෂ රටට වැඩක් නෑ

කොවිඩ් මරණ හරහා මුස්ලිම් ජනතාව අවුස්සන්න බැලුව. ඊට පස්සෙ වරායෙ නැගෙනහිර ජැටිය හරහා එල්ලෙන්න වැල් හෙව්වා. එදා හම්බන්තොට වරාය විකුණන කොට, මත්තල ගුවන් තොටුපළේ වී ගබඩා කරද්දී සජිත්ල, අනුර කුමාර සහෝදරය කොහෙද හිටියෙ. ගොළුවො, බිහිරො වගේ උඩ බලාගෙන හිටිය. එයාලා කවදාවත් රනිල්ට එරෙහිව කතා කරන්නෙ නෑ. රනිල්ගෙ පිහිටෙන් තමයි ජවිපෙ සහෝදරවරු අද ජීවත් වෙන්නෙ.

අද ඉන්න අයියල විජේවීර සහෝදරයටත් අවමන් කරනවා. රාජපක්ෂවරු කවදාවත් මහජන දේපොළ විකුණගෙන කන මිනිස්සු නොවෙයි. රාජපක්ෂවරු මේ රට බේරාගත්තෙ නැත්නම් අද අපිට කියල බිම් අඟලක් ඉතිරිවෙන්නෙ නෑ. මහ බැංකුව මහ දවල් කොල්ලකාපු මිනිස්සු ඒ මහා හොරකමෙන් තමයි රටේ ආර්ථිකය සහමුලින්ම විනාශ වුණේ. අද ඒ පව්වලට කරගහන්න වුණේ අපේ ආණ්ඩුවට.

කොරෝනා වසංගතය මැද්දේ වුවත් රටේ සංවර්ධනය නතර කරන්නෙ නෑ. මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ඉතා කඩිනමින් සාදා නිමකිරීම රජයේ ප්‍රධාන ඉලක්කයක්. මේ වසරේ දෙසැම්බර් 25ට පෙර කිලෝමීටර් විසිපන්දහසක වැඩ අවසන් කරන බව සඳහන් කළ ඇමැතිවරයා ගිරිඋල්ල නගරය නවීකරණය කර අංගසම්පූර්ණ නගරයක් බවට කරන බවත් කටුගම්පළ ජනතාවගේ යහපත වෙනුවෙන් ඉදිරියටත් කටයුතු කරන බවත් වැඩිදුරටත් සඳහන් කළේය.

**වනජීවී සහ වන සංරක්ෂණ ඇමැති සී. බී. රත්නායක මහතා,**

අද රටට වගකියන ආණ්ඩුවක් තියෙන්නෙ. ඒකයි කොවිඩ් වසංගතය සාර්ථකව මර්දනය කළ රටවල් දහය අතරට අපිත් ඇවිත් ඉන්නෙ. ජනතාව දන්නව රාජපක්ෂවරු කවදාවත් අභියෝග ඉදිරියේ විජාතික බලවේගවලට රට පාවා නොදෙන බව. ඒකයි මහින්ද මහත්තය 2015 මැතිවරණ පරාජයෙන් ගෙදර ගිය වෙලාවෙ මේ රටට ආදරය කරන මිනිස්සු ලක්ෂ ගණනින් තංගල්ලෙ කාල්ටන් නිවසට ගිහිල්ල ඔබතුමා නැවතත් අපේ රට බේරගන්න නැවත දේශපාලනයට එන්න කීවෙ. රනිල්, රාජිත, පාඨලී, අනුර කුමාර රාජපක්ෂවරුන්ට තියන බය නිසා එක දිගට පහර පිට පහර ගැහැව්ව. හොරා කීව. මිනීමරුවො කීව. කරන්න පුළුවන් දරුණුම අපහාස කළා. එදා රනිල්ල, මෛත්‍රිල කරපු ඒ මහා පාවාදීමට ශ්‍රීලනිපයේ කට්ටියකුත් දායක වුණා. මහින්ද මහත්තයව අතහැරල 56 දරුවන්ගෙ දරුවො කීපදෙනෙකුත් පක්ෂය පාවාදීල යමපාලනයට හේත්තු වුණා. ඇමැති තනතුරුවලට, වරප්‍රසාදවලට කවදාවත් රට පාවා දෙන්න එපා. එදා ඒ පාවාදීමට හවුල්වුණු කාට කාටත් පසුගිය මැතිවරණවලදී මේ රටේ බත් බුලත් කන මිනිස්සු හොඳ පාඩමක් ඉගැන්නුව. කෙසේ වුණත් විනාශ වුණ රට ගොඩනගන්න පුළුවන් නිවැරදි නායකයො දෙන්නෙක් අද අපට ඉන්නව. දුෂ්කරතා මැද්දෙ වුණත් රටේ විශාල සංවර්ධනයක් දැන් ආරම්භ වෙලා තියෙනව.

**පන්නල ප්‍රාදේශීය සභාවේ සභාපති රංජිත් ලංසකාර මහතා,**

පොදුජන පෙරමුණ කියන්නෙ කෙටි කාලයක් තුළ ඉතා ඉක්මනින් ජනතාව වැළඳ ගත්ත ලංකාවෙ ජනප්‍රියම දේශපාලන පක්ෂය. කටුගම්පළ ආසනය තුළ මම ශාඛා සමිති 146ක් පිහිටවල ඉතා අමාරුවෙන් ජනතාව ඒකරාශී කළා. විශේෂයෙන්ම මේ මොහොතේ අප පක්ෂයේ නිර්මාතෘ බැසිල් රෝහණ රාජපක්ෂ මහතාට අපේ ප්‍රණාමය හිමිවෙනව. ශ්‍රීලනිපය අප පාවා දෙද්දි අපි කටුගම්පළ ආසනයේ අන්ත අසරණ වුණා. ඒ අසරණ අපට රැකවරණය දුන්නෙ බැසිල් මහත්තය. එතුමා පක්ෂය හදල ජනතාවට බාරදුන්න. එතැන සිට බොහෝ දුෂ්කරතා මැද අපි පක්ෂය ඉදිරියට ගෙන ගියා. පොදුජන පෙරමුණේ කටුගම්පළ ආසන බල මණ්ඩල රැස්වීම අමතා අගමැතිතුමාගේ කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ ලේකම් ප්‍රියන්ත රත්නායක, පන්නල ප්‍රාදේශීය සභාවේ උප සභාපති නීතිඥ ඉන්දික බණ්ඩාර මහත්වරුද අදහස් දැක්වූහ. කටුගම්පළ ආසනයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශාඛා සමිතිවල සභාපතිවරු, ලේකම්වරු සහ පන්නල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ද මෙම අවස්ථාවට එක්වූහ.

# රේගු මාධ්‍ය ප්‍රකාශක ඉවත් වෙයි

**සුභාෂිණී සේනානායක**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස කටයුතු කළ අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් සුනිල් ජයරත්න මහතා එම තනතුරෙන් ඉල්ලා අස්වී තිබේ.

රේගු අධ්‍යක්ෂ ජෙනරාල් විශ්‍රාමික මේජර් ජෙනරාල් විජිත රවිප්‍රිය මහතා වෙත මේ බව ලිඛිතව දැනුම් දුන් බවද අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් සුනිල් ජයරත්න මහතා කීය.

කරුණු කිහිපයක් හේතුවෙන් එම තනතුරෙන් ඉල්ලා අස්වූ බවද හෙතෙම නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර ඇත.

ඒ මහතා රේගු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශක ලෙස 2017 වසරේ ජූලි මස 01 වනදා සිට කටයුතු කළ අතර ශ්‍රී ලංකා රේගුව සහ මාධ්‍ය අතර විධිමත් සම්බන්ධතාවයක් ගොඩනැගීම සඳහා කැපවී කටයුතු කළේය.

එමෙන්ම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ධුරයේ තවදුරටත් කටයුතු කරන බව ද සුනිල් ජයරත්න මහතා සිය නිවේදනය මගින් වැඩිදුරටත් කියා තිබේ.



ජීවිතයේ කිසිම දිනක අකුරක් ලියා නැති ඇය පේරාදෙණියේ සරසවියෙන් පළමු උපාධිය ලබන්නේ විභාගයට වාචිකව පිළිතුරු සපයමිනි. වාචිකව විභාගයට පිළිතුරු සපයමින් උපාධියක් ලබාගත් ලෝකයේ පළමු වැන්නා ලෙසත් ඇගේ නම ඉතිහාසයේ සටහන් වනු ඇත. ඇගේ දක්ෂතා ඉස්මතු කරමින් උපාධියක් ලබා ගැනීම සඳහා ඇයට අවශ්‍ය මූලික පදනම ලබා දෙන්නේ විශේෂ අවශ්‍යතා දරුවන් සඳහා වන අඹන්පිටිය මහා විද්‍යාලයේ අධ්‍යාපන ඒකකයයි. ඇය තිළිණි නිමේෂා ජයතිලක මෙනවියයි ඇයට දිනමිණේ සුබ පැතුම් පිරිනමමු.

# තෝලංගමුව මධ්‍ය විද්‍යාලයේ සිසු දරුවන්ගේ ජනසන්නිවේදන විෂය දැනුම නංවන්න වැඩමුළුවක්

**ජයසිරි මුණසිංහ**

ජනසන්නිවේදනය විෂය පිළිබඳව කුඩා කල සිටම දූ දරුවන්ගේ සිත්වලට කා වැද්දවීමෙන් වඩාත් ඵලදායි ජනමාධ්‍ය කලාවක් බිහිකර ගත හැකි බව තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයේ විදුහල්පති ජේ.ඒ.අයි.යූ. ජයකොඩි මහතා කියයි.ජනසන්නිවේදන විෂය ලෝක ප්‍රගමනය සඳහා නූතනයේ අත්‍යවශ්‍ය විෂයක් බවට පත් වී තිබෙන බවද හෙතෙම කීය.

පුවත්පත් වාර්තාකරණය, ඡායාරූපකරණය, නිවේදනය සහ සමාජ මාධ්‍ය ජාල හැසිරවීම පිළිබඳව නව ආරක දැනුම් සම්භාරයක් විදුහලේ ජනමාධ්‍ය ඒකකයේ දූදරුවන්ට ලබාදීම සඳහා ඉකුත්දා විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ පැවැති විශේෂ වැඩමුළුවට එක්වෙමින් විදුහල්පතිවරයා මෙසේ කීය.

තෝලංගමුව මධ්‍ය විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍ය කඳුරට ගුවන්විදුලි සේවයේ අධ්‍යක්ෂ සමන් ජයරත්න, ප්‍රවීණ කැමරා ශිල්පී චාමර ජයරත්න, විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් චින්තක ජයවිලාල්, සහශ්‍ර කණ්ඩායමේ (2000) සභාපති සහ වරකාපොල රූ ඇඩ්ස් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ රුචිර මාලින්ද රණසිංහ යන මහත්වරු මෙහිදි කතා කළහ. විදුහල්පතිවරයා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය, විද්‍යාලයේ මාධ්‍ය ඒකකය භාර ආචාර්ය මණ්ඩලය සහ විද්‍යාලයේ දියුණුවට සුබ පතන සහශ්‍ර කණ්ඩායමේ සහ දූදරුවන්ගේ එකමුතුවෙන් සහ සංවිධාන ශක්තියෙන් මෙම වැඩමුළුව සංවිධානය කොට තිබුණි. වැඩමුළුවට එක් වූ දරු දැරියන්ට සහතිකපත්‍ර පිරිනැමීම සම්පත් දායකයන් ප්‍රධාන ආරාධිත අමුත්තන් අතින් සිදුවිය.





කඳුරට ගුවන්විදුලි සේවයේ අධ්‍යක්ෂ සමන් ජයරත්න, විදුහල්පති ජේ.ඒ.අයි.යූ. ජයකොඩි යන මහත්වරුන් විසින් දූ දරුවන්ට සහතික පත්‍ර පිරිනැමූ අවස්ථාවක් . වැඩමුළුවට එක්වූ දූ දරුවන්ගෙන් කොටසක් පසෙක වෙති.

ඡායාරූපය - ඒ. ආර්. පුෂ්පකුමාර

# ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනයට අන්තර්ජාලය ඔස්සේ ආයෝජක සංසදයක්

**සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර**

ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව සහ ලංකා වාණිජ මණ්ඩලය එක්ව විදේශ ආයෝජකයන් ආකර්ශනය කර ගැනීමට ප්‍රථම වරට අන්තර්ජාලය ඔස්සේ ආයෝජක සංසදයක් සංවිධාන කර ඇත.

ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව සහ ලංකා වාණිජ මණ්ඩලය එක්ව සංවිධානය කරනු ලබන ආයෝජක සංසදය අන්තර්ජාලය ඔස්සේ ලබන අප්‍රේල් 6, 7 සහ 8 යන දිනයන්හි දී රැස්කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), කොළඹ කොටස් හුවමාරුව (CSE) සහ ලංකා වාණිජ මණ්ඩලය (CCC) එක්ව, ශ්‍රී ලංකාවේ ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රථම වරට අන්තර්ජාලය හරහා පැවැත්වෙන ආයෝජක සංසදය (virtual investment forum) සංවිධාන කිරීමට සූදානම් වේ. ඉහළ වටිනාකමක් ඇති තනි ආයෝජකයන් මෙන්ම ආයතනික ආයෝජකයන් ද ඇතුළුව ලොව පුරා සිටින ආයෝජකයන් රැසක් මෙම අවස්ථාවට සහභාගී කරගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සංසදයේදී ශ්‍රී ලංකාවේ සර්ව ආර්ථික තත්ත්වය පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර සෘජු ආයෝජන සඳහා අවස්ථාව පවතින සියලුම ප්‍රධාන ව්‍යාපෘතීන් සහ ව්‍යාපාරයන් පිළිබඳව වන විස්තර ද මෙහිදී ඉස්මතු කරනු ඇත. එමෙන්ම කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් සඳහා පවතින ආයෝජන අවස්ථාවන් පිළිබඳවද මෙහිදී ආවරණය කෙරෙනු ඇත.

මෙම අන්තර්ජාල ආයෝජන සංසදය ලොව පුරා විවිධ කාල කලාපයන් හි සිටින ආයෝජකයන්ගේ පහසුව සැලකිල්ලට ගනිමින් සංවිධාන කෙරෙනු ඇති අතර ශ්‍රී ලංකාවේ ආයෝජන සඳහා සාමූහිකව අවස්ථාව සළසා දීමට අපේක්ෂා කරන ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ව්‍යාපාරික නායකයන් ඇතුළු කථිකයන්, ඉදිරිපත් කරන්නන් සහ සාකච්ඡාවට සහභාගී වන්නන්ගෙන් සමන්විත වූ විශිෂ්ට පෙළගැස්මක් එයට ඇතුළත් වේ. ප්‍රධාන ව්‍යාපෘති හිමිකරුවන් සහ ප්‍රමුඛ ලැයිස්තුගත සමාගම් සමග අන්තර්ජාලය හරහා මුහුණට මුහුණ සම්බන්ධ වීම සඳහා ද ආයෝජකයන්ට පහසුකම් සැලසෙනු ඇත.

ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති දුමිත් ප්‍රනාන්දු සහ ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති ආචාර්ය හාන්ස් විජයසූරිය යන මහත්වරුන් විසින් මෙම සංසදය සංවිධාන කරනු ලබන අතර, ආයතන තුනේ සාමාජිකයන්ගෙන් සමන්විත සංවිධායක කමිටුවට ඔවුන් විසින් නායකත්වය හා මග පෙන්වීම ලබා දෙනු ඇත. ආයෝජන මණ්ඩලයේ සහ වාණිජ මණ්ඩලයේ සාමාජිකයින්, ව්‍යාපෘති ප්‍රවර්ධකයන්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්, කොටස් තැරැව්කාර සමාගම්, වාණිජ බැංකු සහ වෙනත් හවුල්කරුවන් ඇතුළු ශ්‍රී ලංකාවේ සෘජු ආයෝජන සහ ප්‍රාග්ධන වෙළඳපොළ අවකාශය තුළ විසිරී සිටින පුළුල් පාර්ශ්වකරුවන් පිරිසකගේ සහයෝගය ලබා ගැනීමට මෙහිදී අපේක්ෂා කෙරේ.

සංසදය සංවිධානය කිරීම පිළිබඳව අදහස් දක්වමින්, ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල මහතා මෙසේ පැවසීය. ශ්‍රී ලංකා ආර්ථික නියාමනයේ ප්‍රමුඛ දායකත්වයක් දරන රාජ්‍ය අංශය, ප්‍රාග්ධන වෙළඳපල සහ පුද්ගලික අංශය නියෝජනය කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කොටස් වෙළඳපල සහ වාණිජ මණ්ඩලය ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස මෙසේ එක්ව කටයුතු කිරීම ඓතිහාසික අවස්ථාවකි. එමගින් ශ්‍රී ලංකාව වඩාත් ආකර්ශණීය ආයෝජන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට හැකිවනු ඇත. ගෝලීය වසංගතය නිසා ඇතිවූ අභියෝගයන් හමුවේ වුවද, පසුගිය වසර තුළ බොහෝ ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදුකරමින් අප විසින් නිර්මාණය කර ඇති ශක්තිමත් ආයෝජන පදනම සහ එමගින් ශ්‍රී ලංකාවේ වර්ධනාත්මක දශකයට මග පෙන්වන ආයෝජන පරිසරය පිළිබඳව ගෝලීය ආයෝජන ප්‍රජාව දැනුවත් කිරීමට මෙම සංසදය කදිම වේදිකාවක් වනු ඇත.

# පළාත් සභා ක්‍රියාත්මක නොවීමෙන් සමුපකාර සේවා අඩපණ වෙළා

## ● හිටු එජාප මන්ත්‍රී සිඩ්නි ජයරත්න

**ඇම්. පී. සරත් - පොලොන්නරුව දිස්ත්‍රික් සමූහ**

පළාත් සභා ක්‍රියාත්මක නොවීමෙන් මේ වනවිට සමුපකාර සේවා විනාශ මුඛයට පත්වෙමින් පවතින බව එක්සත් ජාතික පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු පළාත් සභා මන්ත්‍රී සිඩ්නි ජයරත්න මහතා පවසයි. ඒ මහතා මේ බව පැවසුවේ මැදිරිගිරිය ඒ මහතාගේ නිවසේ පසුගියදා ( 08 වැනිදා) පැවැති මාධ්‍ය හමුවකදීය.

සිඩ්නි ජයරත්න මහතා මෙසේද කීය.

අනිවාර්යයෙන්ම කඩිනමින් පළාත් සභාව පැවැත්විය යුතුයි. මොකද පළාත් සභාව නොමැතිකම නිසා අද උතුරු මැද පළාතේ සමුපකාර අඩපණ වෙලා. සමහර සමුපකාර විනාශ වෙලා. සමුපකාරය දියුණු කළේ පළාත් සභාවයි. අද සමුපකාරවල දූෂණ, වංචා පිරිලා. ගන්න දෙයක් නැහැ. පළාත් සභා මගින් පාලනය වන ආයතන අතරට සමුපකාර පමණක් නොව, පාසල්, රෝහල් ඇතුළු තවත් ආයතන කිහිපයක්ම ඇතුළුවී තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවෙන් පළාත් සභාවට සම්පත් බෙදීමක් සිදු වුණේ නැහැ. හරිනම් මධ්‍යම ආණ්ඩුවටත් පළාත් සභාවටත් සමානව සම්පත් බෙදී යා යුතුයි. නීතියක් හැටියට පළාත් සභාව අවශ්‍යයි. වසර 32ක ජනතා අවශ්‍යතා ඉටුකළ ආයතනයක් හැටියට පළාත් සභාව අවශ්‍යයයි .

# විදේශ සංචාරකයන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙළක්

**ජයසිරි මුණසිංහ සහ මහින්ද අලුත්ගෙදර**

විදේශීය සංචාරකයන් සඳහා නැවත වතාවක් ශ්‍රී ලංකාව විවෘත කිරීමත් සමගින් ඔවුන් හට ආරක්ෂිතව මෙරටට පැමිණීමටත් ආරක්ෂිතව පිටව යෑමටත් සහතික කිරීමේ අරමුණින් සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ගිවිසුම්ගත වෙයි.

ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය සේවා සැපයුම් සමූහයේ සාමාජිකයකු සහ ප්‍රමුඛතම රක්ෂණ සේවා සැපයුම්කරුවකු වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම සමග ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අත්වැල් බැඳගනිමින් නව රක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සංචාරක ක්ෂේත්‍රයේ පිබිදීමක මුලපිරීමක් වනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නියම කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම අනිවාර්ය රක්ෂණ ක්‍රමය අන්තර්ජාලය හරහා සංචාරක වීසා සඳහා ඉල්ලුම් කරන ජාත්‍යන්තර සංචාරකයන්, ශ්‍රී ලාංකික නොවන විදේශ ගමන් බලපත්‍ර දරන්නන්, ද්විත්ව පුරවැසි විදේශ ගමන් බලපත්‍ර දරන්නන්, විදේශීය හෝ ද්විත්ව විදේශීය ගමන් බලපත්‍ර දරන්නන් සහ ව්‍යාපාරික වීසා දරන්නන් වෙත මෙහි ප්‍රතිලාභ හිමිවන අයුරින් රක්ෂණ යෝජනා ක්‍රමය සැලසුම් කොට ඇත.

සංචාරකයකු ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය තුළ කොවිඩ් 19 ආසාදිතයකු බවට පත්වුවහොත් හෝ ආසාදිත රෝගියකුගේ ආශ්‍රිත බවට පත්වුවහොත් කොවිඩ් 19 පැතිරීම වළක්වාලීම සඳහා වන සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ඇත. එහිදි රෝහල්ගත කිරීම, නිරෝධායන හෝටල් ගාස්තු සහ ඒ හා සම්බන්ධ ක්‍රියාපටිපාටි සඳහා වන වියදම් මෙම රක්ෂණයෙන් ආවරණය කෙරේ. මෙම කාර්යයේදී අමතර ආරක්ෂණය ආවරණයක් ලෙස පීපල්ස් ඉන්ෂුවරන්ස් ආයතනය අන්තර්ජාතික ප්‍රති රක්ෂණ වෙළෙඳ පොළේ ශක්තිමත් සමාගම්වල සහාය ලබාගෙන ක්‍රියාවට නංවනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනි කිමාලි ප්‍රනාන්දු මහත්මිය අදහස් දක්වමින් කියා සිටියේ පසුගිය මාස කිහිපය තුළසිදුකළ සංචාරක නියමු ව්‍යාපෘතියෙන් පසුව රක්ෂණ අවස්ථා සපුරාලීම සඳහා රාජ්‍ය අනුග්‍රහයෙන් යුතු ශක්තිමත් රක්ෂණ සමාගමක අවශ්‍යතාවය තදින් අවබෝධ වූ බවයි. මෙම වැඩසටහන සඳහා පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම තෝරාගැනීමට හැකිවීම පිළිබඳව තම අධිකාරිය බෙහෙවින් සතුටට පත්වන බව ද ඇය ප්‍රකාශ කළාය.

# අබලන් මාර්ගයක් ගැන ජනපතිට පැමිණිලි කළ ආබාධිත සෙබළාට පහර දී කෘත්‍රිම පාදය කඩා දමලා

**අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක**

පසුගියදා මොරගහකන්ද හරහා උතුරුමැද මහ ඇළ උමං මාර්ගය ආරම්භ කිරිම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අනුරාධපුර ,පළුගස්වැව ප්‍රදේශයට පැමිණි අවස්ථාවේ අබලන් මාර්ගයක් සම්බන්ධයෙන් ලිපියක් භාර දිමට කටයුතු කළ යුද හමුදා ආබාධිත රණවිරුවකුට කිසියම් කණ්ඩායමකින් පෙරේදා (06) රාත්‍රි ප්‍රහාරයක් එල්ලවි තිබේ.

මෙම මැර ප්‍රහාරයෙන් තුවාල ලබා ඇත්තේ අනුරාධපුර, ගලෙන්බිඳුණු වැව, යකල්ල ප්‍රදේශයේ පදිංචි තරංග ජයවර්ධන නම් යුද හමුදාවේ හිටපු ආබාධිත සෙබළෙකි.

එම ප්‍රහාරයෙන් තුවාල ලැබු ආබාධිත රණවිරුවා ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ.පසුව ඔහුගේ සුවදුක් විමසිම සඳහා මුදල් හා සමෘද්ධි කටයුතු පිළිබද රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා ඊයේ (07) සවස අනුරාධපුර ශික්ෂණ රෝහලට ගියේය.

අනුරාධපුර ගනේවල්පොල සිට දාච් හල්මිල්ලෑව මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් මෙම ආබාධිත රණවිරුවා විසින් ජනාධිපතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

පහර කෑමට ලක්වු මෙම ආබාධිත රණවිරුවා මාධ්‍ය වෙත පවසා සිටියේ අබලන් මාර්ගය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා දැනුවත් කිරිම පිළිබදව උරණ වු කණ්ඩායමක් විසින් පෙරේදා (06) රාත්‍රි තමන්ට පහරදි එක් පාදයක සවිකර තිබු කෘතිම පාදය ද සම්පුර්ණයෙන් කඩා දැමු බවයි.

**මොහුගේ සුවදුක් විමසිමෙන් පසුව රාජ්‍ය ඇමති ශෙහාන් සේමසිංහ මහතා මාධ්‍ය වෙත මෙලෙස අදහස් දැක්විය:** මෙම රණවිරුවා විසින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින මෙම මාර්ගය මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස සිටින සමයේ එහි සංවර්ධන කටයුතු සිදු කළද පසුගිය යහපාලන සමයේ එහි කටයුතු නවතා දමා තිබෙනවා.මෙම මාර්ගය වත්මන් රජය යටතේ සංවර්ධනය කිරිම සම්බන්ධයෙන් උරණවු කණ්ඩායම් මෙම ආබාධිත රණවිරුවාට පහරදි තිබෙන අතර එම පහරදිම පිළිකුළෙන් හෙළා දකින බවද හෙතෙම පැවැසිය.

එමෙන්ම මෙම පහරදිම සම්බන්ධයෙන් කඩිනම් පරික්ෂණයක් සිදුකරන ලෙස පොලිසියට දැනුම් දුන් බවත් නව කෘතිම පාදයක් රණවිරුවා වෙත ලබා දිමටද තමන් කටයුතු කරන බවත් ඇමති ශෙහාන් සේමසිංහ මහතා වැඩිදුරටත් පැවැසිය.

# පාලන මිලට වඩා වැඩි මිලට බඩු විකුණන ව්‍යාපාරික පිරිසකට වෙළෙඳ ඇමැතිවරයාගේ ආරක්ෂාව ලැබිලා

## පාරිභෝගික අයිතීන් සුරැකීමේ සංවිධානය චෝදනා කරයි

**සුභාෂිණී සේනානායක**

පාරිභෝගික කටයුතු අධිකාරිය මගින් නිකුත් කොට ඇති පාලන මිලට වැඩි මිලකට භාණ්ඩ අලෙවි කිරීම සඳහා ඉඩ සැලසෙන එකගතාවයකට වෙළෙඳ ඇමැතිවරයා හා ව්‍යාපාරික පිරිසක් රහසේ ගිවිස ගෙන ඇති බවද මෙය සම්පූර්ණ නීති විරෝධි ක්‍රියාවක් බවද පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරයේ සභාපති රන්ජිත් විතානගේ මහතා නිවේදනයක් නිකුත් කරමින් චෝදනා නගයි.

පාරිභෝගික කටයුතු අධිකාරියේ නියෝග අංක 71 අනුව සීනි අලෙවි කළ හැකි උපරිම සිල්ලර මිල රුපියල් 85.00කි. අමාත්‍යවරයා හා ව්‍යාපාරිකයන් අතර ඇතිව තිබෙන රහස් එකගතාවයට අනුව සීනි අලෙවි කරනු ලබන මිල රුපියල් 99.00 කි මේ අනුව මෙම මිලට සීනි අලෙවි කිරීම ශ්‍රී ලංකාවේ වලංගු නීතිය උල්ලංඝනය කිරීමක් බව පෙන්වා දෙන එම අධිකාරිය සහල් සඳහා ද පාලන මිලක් නියම කර ඇති බවත් ඒ අනුව පාලන මිලක් පනවා ඇති භාණ්ඩ නීති විරෝධී ලෙස වැඩි මිලට අලෙවි කරනු ලබන ව්‍යාපාරිකයන්ට ආරක්ෂාවක් ලබා දීම වෙළෙද ඇමැතිවරයා විසින් සිදු කිරීම දූෂණයක් බවද පෙන්වා දෙයි.

මෙම දූෂණයට එරෙහිව එම සංවිධානය විසින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටින බවත් විතානගේ මහතා කීය. භාණ්ඩ මිල පාලනය කිරීමට ගත හැකි නීතිමය ක්‍රියා මාර්ග අනුගමනය නොකර නීති විරෝධි ක්‍රම මගින් පාරිභෝගිකයන් ගසා කෑමට ව්‍යාපාරිකයන්ට ඉඩ සැලැස්වීම තම සංවිධානය දැඩිව හෙළා දකින බවද කීය. භාණ්ඩ 27ක් මෙසේ පාලන මිලට වැඩි මිලට අලෙවි කිරීම සඳහා ව්‍යාපාරිකයට ඉඩ සැලැසී ඇති අතර භාණ්ඩ මිල පාලනය කිරීම සඳහා වෙළෙද අමාත්‍ය වරයාට ඇති නොහැකියාව මින් මනාව පෙන්නුම් කරන බවද පාරිභෝගික අයිතීන් සුරැකීමේ සංවිධානය පවසයි.

කෙසේ වෙතත් පාරිභෝගික අයිතීන් සුරකින්නන් ලෙස අපි රජයෙන් ඉල්ලා සිටින්නේ මෙරට පාරිභෝගිකයන්ට සෑම වෙළෙඳ සැලකින්ම සාධාරණ මිලකට භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඇති අයිතිය තහවුරු කරන ලෙස බවත් එම සංවිධානය කියයි.

# ප්‍රවීණ මාධ්‍යවේදී වදාකඩ නවරත්න අභාවප්‍රාප්ත වෙයි



ප්‍රවීණ මාධ්‍යවේදියකු, කවියකු සහ ගත්කතුවරයකු වූ වදාකඩ නවරත්න (73) මහතා අභාවප්‍රාප්ත විය. නවරත්න මහතා දිනකර, සත්දින, ලංකාදීප සහ මැදපෙරදිග පුවත්පත්වල මාධ්‍යවේදියකු ලෙස කටයුතු කළ අතර 'සත්දින' පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා ලෙස කලක් සේවය කර ඇත.

වවුල්කැලේ තීන්දුව, වැල්ලේ ලේ මල්, භීෂණයේ දිනපොත, වෙඩි උණ්ඩය සහ තෙවන නැගිටීම වැනි කෘති රචනා කළ නවරත්න මහතා 'සඳ' නමින් වූ කාව්‍ය සඟරාවේ කතුවරයා ලෙස ද කටයුතු කර ඇත.

ජනමාධ්‍යවේදියකු ලෙස විවිධ මාතෘකා ඔස්සේ පාඨකයන් දැනුම්වත් කළ ඒ මහතා කලා භූෂණ සම්මානය ඇතුළු මාධ්‍ය ක්ෂේත්‍රයේ සම්මාන රැසක් හිමිකරගත් මාධ්‍යවේදියෙකි. එක්සත් ජාතීන්ගේ සහජීවන කවි සංවිධානයේ සභාපතිවරයා ලෙස හා තම්මැන්නා කවි සංවිධානයේ අනුශාසකවරයා ලෙස ද කටයුතු කර ඇත.

නවරත්න මහතාගේ දේහය මීරිගම, විජයරජදහන, 156 දරන නිවෙසේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු අද (10) සවස 6.30ට විල්වත්ත ආදාහනාගාරයේදී සිදුකෙරේ.

## හිතවත් වදාකඩ ......

**අප ඉස්සර වෙලාම මිතුරන් බවට පත්වුයේ කවියෙනි. මට මතකයි කවි සම්මේලනයේ රැස්වීමකදී අප එක තැන වාඩි වී හිටියා. ඒ 1969 විතර. අප පත්තරවලට තරගයට වගේ කවි ලිව්වා.**

**ඒත් සමගම දේශපාලනයටත් සම්බන්ධ වුණා. ආණමඩුව ආසනයට ශ්‍රීලනිපයෙන් දේවබණ්ඩාර ඉදිරිපත් කරවන්න මූලිකව ක්‍රියා කළ අය අතර, මුලින්ම සිටි කෙනෙක් ඔබ. ගමක් ගානේ දේව බණ්ඩාරත් එක්ක ගියේ වදාකඩයි. ඒ දවස්වල දේවාට වැඩියෙන් මිනිස්සු වදාකඩව දැන ගෙන හිටියා. හිටිවන කවි මඩුවලදි වදාකඩ ජන සිත් වසීකර ගන්න සමත් වුණා. ටික කාලයකින්ම කවි මඩුවල මූලාසනය වදාට පිරිනැමෙන්න වුණා.**

**මට මතකයි! දවසක් කවි සම්මේලනයේ ලේකම් කමට තරගයක් තිබුණා. රැස්වීම තිබුණේ කොළඹ ආනන්ද විද්‍යාලයයේයි. එක්කෙනෙක් කවි සම්මේලනය වෙනුවෙන් දර දිය නොඇද්ද කෙනෙක්. අනික් කෙනා හිටපු උප ලේකම්වරයෙක් වුණු රණේපුර. වදාකඩත් මමත් දුම්රියෙන් ගිහින් රැස්වීම් ශාලාවට ඇතුළු වෙද්දි ඡන්දෙ ගන්නවා. අප දෙන්නා රණේපුර වෙනුවෙන් අත් උස්සාගෙනයි ඇතුළු වුණේ .අපේ ඡන්ද දෙක නිසා රණෝපුර එදා ලේකම් වුණේ වැඩි ඡන්දයකින්.**

**දිනකර පුවත්පතේත් අප එකට සේවය කළා. කරුණාසේන ජයලත්, මියුලන් පෙරේරා, නිව්ටන් සෙනෙවිරත්න, වදාකඩ, මම, රංජිත් නිමල්සිරි, ගාමිණී ජයලත්, රම්‍යතිලක, සුසිල් ජිනප්‍රිය දිනකර තුළින් මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයට මහත් මෙහෙයක් කළා .**

**විජය කුමාරතුංගයන්ගේ මහජන පක්ෂයේ ප්‍රචාරක මාධ්‍ය වුණේ දිනකරයි. ඊට පස්සෙ තවත් මාධ්‍ය ආයතන කිහිපයකට වදාකඩ මාධ්‍යවේදියෙක් ලෙස දායකත්වය දුන්නා. අවසානයේ ඔහු සේවය කළේ ලංකාදීපයේයි.**

**ඔහු පොත් කිහිපයක්ද සමාජයට ප්‍රදානය කළා. ගැදි පැදි දෙකටම දක්ෂයෙක් වූ වදාකඩ කාලයක් අපේ ගෙදරට කිට්ටු නිවසක බිරිය සහ දරුවන් සමඟ වාසය කළා. ඒ නිසා අපේ පවුල් අතරත් කිට්ටු සම්බන්ධතාවක් ඇති වුණා.**

**වදා හොඳ හිතවතෙක්. අහිංසක හදවතක් තිබුණු ගුණ යහපත් මිනිසෙක්. මේ ඉරණම අප කාටත් පොදු දෙයක්. ඒ නිසා ඉවසා දරාගෙන ඔහුට සමුදීම කළ යුතුමයි වදා, ඔබට සුබ ගමන්!**

**සෝකයි දුකයි කනගාටුයි සංවේගයි**
**ඉවසුම්, තැවෙමි, වැළපෙමි නියදම මේකයි**
**සැනසුම ලැබෙන්නේ මරණය මැරූ දාකයි**
**පතනෙමි නිවන් සුව ඔබහට අත්වේවායි**

**දයා සෝමසිරි**

# ජීවිත සුවපත් කළ මහ වෙදැදුරු



**මාලබේ නෙවිල් ප්‍රනාන්දු රෝහලේ නිර්මාතෘ අභාවප්‍රාප්ත හිටපු පාණදුර පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතාගේ සත් දින පින්කම වෙනුවෙන් සැකසුණු ලිපියකි.**

1970 දශකයේ පාණදුර බස් නැවතුම්පොළ අසල බෙහෙත් ශාලාවකට අම්මා තාත්තා සමග ප්‍රතිකාර ගැනීම සඳහා ගිය මට ඉතාම කඩවසම් ප්‍රියමනාප වෛද්‍යවරයකු මුණ ගැසිණි.

රෝගාතුර වන මව්-පියන් සමග මම ද එම සෑම අවස්ථාවකදීම එම කාරුණික වෛද්‍යවරයාගේ මුහුණ දැක ගැනීම සඳහා යාමට පෙලඹී සිටියෙමි.

කාලයක් යන විට යන විට ඒ කාරුණික වෛද්‍යවරයා එම ස්ථානයේ නොමැති බව දැනගන්නට ලැබිණි.

පසුව දැනගන්නට ලැබුණේ ඔහු දේශපාලනයට ගොස් ඇති බවක්ය. ඒ අන් කවුරුත් නොව වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතාය.

1931 මාර්තු මස 3 වනදා ආතර් ප්‍රනාන්දු සහ රොස්ලින් මෙරායා සොයිසා දෙපළට දාව මෙලොව එළිය දුටු නෙවිල්ගේ පවුලේ සාමාජිකයන් 8 දෙනෙකි.

කොන්ස්ටන්, බැසිල්, ඩෑෆ්නි, ෂෙල්ටන්, නොයෙල්, රියෙන්සි සහ බාලයා සුජිත්ය.

නෙවිල් පවුලේ තුන්වැනියාය. නෙවිල්ගේ පියා වන ආතර් ප්‍රනාන්දු මහතා රජයේ සේවකයෙක් නිසා ඔහුට සේවා ස්ථානයෙන් සේවා ස්ථානයට මාරු වීමට සිදුවිය.

ඒ හේතුව නිසා කුඩා නෙවිල්ටත් පාසලින් පාසලට මාරු වීමට සිදුවිය. පානදුර ශ්‍රී සුමංගල, කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ ඇතුළු පාසල් 12ක නෙවිල් අධ්‍යාපනය හැදෑරීය.

1957 දී වෛද්‍ය වෘත්තියට එක් වෙමින් නෙවිල් ප්‍රනාන්දු මහතා රෝගීන් සුවපත් කිරීමේ කටයුතුවලට එක්විය.

හෙතෙම වසර 20ක් පාණදුර ප්‍රධාන බස් නැවතුම්පොළ අසල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන ගියේය.

ඒ වනවිටත් වෛද්‍ය නෙවිල් පානදුරේ කා අතරත් ජනප්‍රිය චරිතයක් බවට පත්වෙමින් සිටියේය.

වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු යනු මුහුණුවර ගොඩක චරිත ගොඩක එකතුවක් යැයි හඳුනා දුන ද වරදක් නැත. ඔහු මාලබේ සයිටම් වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළේය.

සයිටම් පටන් ගත්තේ ආශා සෙන්ට්‍රල් රෝහල විකුණූ මුදලිනි. එහෙත් සයිටම් වසා දැමීම නිසා උපන් කළ කිරීම ද ක්ෂණයකින් මතුවිය.

මට කියන්න වැඩි වැඩියෙන් වෛද්‍යවරු බිහිවෙන එකේ තියෙන වරද මොකක්ද කියලා. වෛද්‍ය වෘත්තිය කියන්නේ මුළු ලෝකයම පිළිගත්ත රස්සාවක්. ලංකාවේ නැති උනත් පිටරට ගිහිල්ලා හරි ඔවුන්ට වැඩ කරලා රටට විදේශ විනිමය ගේන්න පුළුවන් රැකියාවක්.

සයිටම් ආයෝජනය නිසා නෙවිල් ප්‍රනාන්දු රෝහල නිසාත් ඔහුට සිදුවූයේ දරුණු මූල්‍ය අර්බුදයකට දෙන්නටය.

සයිටම් ගොඩනැගිල්ල මම කාගිලිස් එකට රු. මිලියන 1000ට විකුණුවා. හැබැයි ඒ සම්පූර්ණ මුදලම ඒක වසා දැමීමෙන් රස්සා අහිමි වෙච්ච අයට පාරිතෝෂිත ගෙවන්න වියදම් කළේය.

ඉස්පිරිතාලෙ හදන්න කෝටි 350ක ණයක් ගත්තා. කෝටි 100 ළමයින්ගේ පාඨමාලා සල්ලිවලින් ගෙව්වා. ඉතිරි 250 ආණ්ඩුවට ගෙවනවා. හැබැයි ඉස්පිරිතාලෙ ආණ්ඩුවට ගත්ත එකට මට කෝටි 100 ලැබෙන්න නියමිතයි.

ඒ කෝටි 100 යෙන් මං ආයිත් ඉස්පිරිතාලයක් පටන් ගන්නවා. කවදහරි මම මැරෙන්නෙ වෛද්‍ය විද්‍යාලයක් පටන් අරගෙන.

දස දහස් සංඛ්‍යාත රෝගීන් වෙනුවෙන් කැපවුණු මුදල් පවා ඔවුන්ගෙන් නොගෙන ප්‍රතිකාර කරනු ලැබූ අයුක්තිය අසාධාරණය වෙනුවෙන් කැපවුණු පෞද්ගලික වාසි නොතකා කෙළින් නැගී සිටි මිනිසුන්ගේ දුක වටහාගත් මානව දයාවෙන් පිරුණු දේශපාලනඥයින් අතර වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු සුවිශේෂී චරිතයකි.

පාණදුරේ දසදහස් ගණනක් රෝගීන් සුවපත් කළ නෙවිල් විශාල පිරිසකගේ පවුලේ වෛද්‍යවරයා බවට පත්විය.

බෙහෙත් ශාලාවට ආයුබෝවන් කියූ වෛද්‍ය නෙවිල් එක්සත් ජාතික පක්ෂය හා එක්ව සිය දේශපාලනය ඇරඹීය.

වෛද්‍ය නෙවිල් දේශපාලනයට එන විට පාණදුර සමසමාජ රතු බළකොටුවකි.

එම බළකොටුවේ අධිපතිවරයා වූයේ එවකට සමසමාජ නායකයකු වූ හිටපු ප්‍රවාහන අමාත්‍ය ලෙස්ලි ගුණවර්ධන මහතායි.

ලෙස්ලිව පරාජය කිරීම සුළු පටු කරුණක් නොවීය. සමසමාජ පක්ෂය පානදුරේ රතු බලය පතුරුවා හරිනු ලැබීය.

කාගේත් සිත් දිනාගෙන සිටි වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු වැඩි ඡන්ද 10,000 කින් ලෙස්ලිව පරාදකොට පානදුර මහජන මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත්විය.

පාණදුර මෝදරවිල කර්මාන්ත පුරවරය, කේතුමතී කාන්තා රෝහල, පානදුර අගමැති බාලිකා විද්‍යාලය, පානදුර රාජකීය විද්‍යාලය වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ගොඩනැගූ ඒවායි.

එවකට ජනාධිපති දිවංගත ජේ. ආර්. ජයවර්ධන මහතා සහ දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතා අතර ඇතිවූ ගැටලුකාරී තත්ත්වයක් මත නෙවිල් ප්‍රනාන්දු මහතාගේ මන්ත්‍රී ධුරය 1981 වර්ෂයේදී අහිමි වී ගියේය.

එවකට හිටපු ජනාධිපති දිවංගත ජේ. ආර්. ජයවර්ධන මහතාව දැඩි ලෙස දෝෂදර්ශනයට ලක්කළ නෙවිල් හොරුන්ට එරෙහිව සිය හඬ අවදි කළේය. උතුරේ හමුදා සොල්දාදුවන් මිය යාම සම්බන්ධයෙන් දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතා ජේ. ආර්. ජයවර්ධන මහතා සහ එක්සත් ජාතික පක්ෂය දැඩි ලෙස විවේචනයට ලක් කළේය.

ඉල්ලා අස්වන්න, නෙවිල් ජේ. ආර්. ජයවර්ධනට එක්තරා ප්‍රසිද්ධ රැස්වීමකදී අභියෝග කළේය.

එක්සත් ජාතික පක්ෂය නෙවිල්ගේ මහජන මන්ත්‍රී ධුරය උදුරා ගත්තේය. එපමණක් නොව ලංකාවේ සෑම ප්‍රදේශයකටම අතුරු මැතිවරණ පැවැත්වුවද පානදුර ආසනේට අතුරු මැතිවරණයක් ද නොමැති විය.

අතුරු මැතිවරණයක් තිබ්බොත් නෙවිල් උඩින්ම දිනනවා. ජනතාව කීහ.

හිටපු ජනාධිපති දිවංගත ජේ. ආර්. ජයවර්ධන මහතා එක්සත් ජාතික පක්ෂයත් නෙවිල්ගේ ජයග්‍රහණය පිළිබඳව හොඳින් අවබෝධ කරගෙන සිටියේය.

ජේ. ආර්. ජයවර්ධන හොඳ ගැටයක් ගැසුවේය. හිස්වූ පාණදුර මහජන මන්ත්‍රී ධුරයට නීතිඥ පද්මින් ෆොන්සේකා මහතා ලැයිස්තුවෙන් පත් කෙරිණි.

දොස්තර මහත්තයා සැලුනේ නැත. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආරාධනයෙන් ඔහු එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්විය.

ඔහු පාණදුර ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ද විය.

පක්ෂයේ ශාඛා සංවිධානය ගොඩනගමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගීම සඳහා නෙවිල් සිය ධනය, ශ්‍රමය, කාලය කැප කළේය.

කල් යත්ම ආසන ක්‍රමය අහෝසි වී වූ මනාප ක්‍රමය දේශපාලන කරළියට පැමිණියේය. නෙවිල් ප්‍රනාන්දු සිය ඡන්ද ව්‍යාපාරය කළුතර දිස්ත්‍රික්කය ඉලක්ක කරගනිමින් ආරම්භ කළේය.

ගමින් ගමට දොරින් දොරට ගිය නෙවිල් ප්‍රනාන්දු මහතාගේ නිවස අතුරු සිදුරු නැතිව පාක්ෂිකයින්ගෙන් පිරී ඉතිරී ගියේය.

නෙවිල්ගේ ජනප්‍රියත්වය විරුද්ධවාදීන්ට ඉවසාගත නොහැකි විය. භීෂණය රජ විණි. තැන් තැන්වල මිනී කඳු ගොඩ ගැසිණි.

1988 දෙසැම්බර් මස 18 වැනි දින උදෑසන නෙවිල් ප්‍රනාන්දු මහතා ඉලක්ක කරගනිමින් ඔහුගේ වෑකඩ නිවසට ප්‍රහාරයක් එල්ල විය.

එහිදී තම ක්‍රියාකාරී පාක්ෂිකයින් අටදෙනකු ජීවිතක්ෂයට පත් වූ අතර දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතා තම ජීවිතය බේරාගත්තේ අනූ නමයෙනි.

1994 දී ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පතාක යෝධයින් පිරිසක් සමඟ නැවත එක්සත් ජාතික පක්ෂයට එක්විය.

පාණදුර -
**සමන් කාරියවසම්**

# බුද්ධි තොරතුරු හුවමාරුව වැඩි දියුණු කළ යුතුයි

## ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න

**චන්ද්‍රිකා පෙරේරා**

ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ සෙවීමේ සහ මුදා ගැනීමේ මෙහෙයුම් සඳහා සම්පත් බෙදා ගැනීම, ප්‍රවර්ධනය කිරීම, කලාප හරහා ඒකාබද්ධ මෙහෙයුම් සිදු කිරීමේ දී පහසුකම් සැලසීම, බුද්ධි හා තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය බව ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතා පැවසීය.

ඉන්දීය සාගර කලාපීය වෙරළාරක්ෂක සම්මන්ත්‍රණය සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඒ මහතා දිනමිණට පැවසීය.

මේ අනුව ඉන්දීය සාගරයේ සන්නිවේදන හා වෙළඳ මුහුදු මාර්ගවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාවට වැදගත් කාර්යභාරයක් පැවරී ඇති බව කමල් ගුණරත්න මහතා අවධාරණය කළේය.

ශ්‍රී ලංකාවට සමීපව දකුණු මුහුදු ප්‍රදේශයේ දිවෙන වෙළෙඳ මාර්ග ඇතුළු වැදගත් සන්නිවේදන මාර්ග ගණනාවක් තිබීම හේතුවෙන් භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවට ඉන්දියන් සාගරයේ සුවිශේෂී වැදගත් ස්ථානයක් හිමිව ඇත.

භූමි ප්‍රමාණයට වඩා 27 ගුණයක් විශාල නාවික සැතපුම් 200ක පමණ සාගර ප්‍රදේශයක් වූ මේ සුවිශේෂී ආර්ථික කලාපයේ සෙවීමේ, මුදා ගැනීමේ මෙහෙයුම් සහ සැපයීමේ වගකීම මේ අනුව ශ්‍රී ලංකාවට හිමිව තිබේ. එහි සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දෙයි.

මුහුද මාර්ග ඔස්සේ සිදුවන මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම සහ තවත් බොහෝ සංවිධානාත්මක අන්තර්ජාතික අපරාධවලට එරෙහිව කටයුතු කිරීමේ වගකීම මෙරට ආරක්ෂක අමාත්‍යාංශය හරහා සිදු වෙයි. මීට අමරතව ධීවර කටයුතු, සමුද්‍ර දූෂණය, සෙවීමේ හා මුදාගැනීමේ ක්‍රියාන්විත, තෙල් හා රසායනික කාන්දුවීම්වලට ප්‍රතිචාර දැක්වීම, අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම, නීති විරෝධී සහ විධිමත් නොවන මසුන් ඇල්ලීම වැළැක්වීම, සමුද්‍ර පුරාවිද්‍යාත්මක ස්ථාන සහ සමුද්‍ර ජීවී විශේෂ ආරක්ෂා කිරීම ආදී සියලු කටයුතුවලට ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිචාර දැක්විය යුතු හා අධීක්ෂණය කළ යුතු වැදගත් කාරණා බව ගුණරත්න මහතා අවධාරණය කළේය. එවැනි කටයුතු සිදු කිරීමේදී ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට ඉන්දීය රජයෙන් සහ ඉන්දීය වෙරළාරක්ෂක බළකායෙන් ද සහයෝගය ලබා දෙයි. මේ අනුව දෙරට අතර වෙරළාරක්ෂක ආයතන අතර සම්බන්ධතාවය ඉහළ නැංවීම පිළිබඳව අවධානය යොමු කර ඇති බව ඒ මහතා කීවේය. සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා සම්පත් බෙදා ගැනීම, ප්‍රවර්ධනය කිරීම, කලාප හරහා ඒකාබද්ධ මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම, බුද්ධි හා තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම මේ අනුව වැදගත් කරුණු ලෙස සැලකෙන බව අවධාරණය කළේය.


රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

DMC SRI LANKA

## අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීම

**ආපදා කළමනාකරණය සඳහා බහුවිධ - උවදුරු අනතුරු ඇඟවීමේ සන්නිවේදන පද්ධතියක් සංවර්ධනය කිරීම** සඳහා විසඳුම් සපයන්නන් වෙත අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලා සිටීම පිළිබඳව **2021-01-24** දින සිළුමිණ පුවත්පතේ පළකරන ලද දැන්වීම හා බැඳේ.

උක්ත කරුණට අදාලව **2021-02-05** දින **පස්වරු 02.00** ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී පැවති පූර්ව - විසඳුම් සපයන්නන්ගේ රැස්වීමේදී ඔවුන් විසින් සිදුකරන ලද ඉල්ලීමට අනුව අභිලාෂය ප්‍රකාශ කිරීමේ අවසන් දිනය **2021 මාර්තු මස 01** දින දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව අභිලාෂය ප්‍රකාශ කිරීම **2021 මාර්තු මස 01 සඳුදා** දින **පෙරවරු 10.00ට** හෝ ඊට ප්‍රථම **"අභිලාෂය ප්‍රකාශ කිරීම"** යනුවෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑල මඟින් හෝ ප්‍රසම්පාදන ඒකකයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනවිත් බහාලීමට හැකියාව ඇති අතර එය විවෘත කිරීම එදින **පෙරවරු 10.30ට** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

**සභාපති**
**උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**
**අංක. 120/2 , විද්‍යා මාවත, කොළඹ 07.**



## පඩිපාලක සභා ආඥා පනත

### නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වෙනි වගන්තිය යටතේ රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයත් එම උපලේඛයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩි පාලක සභාව අදහස් කරන බව එකී ආඥා පනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2021 පෙබරවාරි මස 15 දින මධ්‍යහ්න 12.00 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති**
**සභාපති**
**රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය**
**පිළිබඳ පඩිපාලක සභාව**

**2021-02-09 දින**
**කොළඹ 05. කම්කරු දෙපාර්තමේන්තුවේදීය**

**උපලේඛනය**

රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2014 සැප්තැම්බර් 26 දින අංක 1881/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූද තීරණ එම උපලේඛනයේ 11 වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය

| | |
|---|---|
| කම්කරු | රු. 900.00 |
| අයවැය සහන දීමනාව | රු. 100.00 |



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

## ලංසු ආරාධනයයි

**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට**
**මිලි 500 හෑන්ඩ් සැනිටයිසර් කෑන් සැපයීම**

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන්, එහි ප්‍රධාන කාර්යාලයට මිලි 500 හෑන්ඩ් සැනිටයිසර් කෑන් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.
2. ක්‍රියාත්මක කරන නියෝජිතායතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය යි.
3. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021.02.10** සිට **2021.02.23** දක්වා පැය **09.00** සිට **15.00** අතර කාලය තුළ ලිඛිත අයදුම්පතක් සහ **රු. 2,500** ක (වැට් සහිත) නැවත ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුවක් සඳහා "අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය" වෙත ලබාගත් ගෙවීම් නියෝගයක් (දින 90 ක් වලංගු) අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 වන මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලේඛන මිලදී ගත හැකිය.
5. ලංසුකරුවා කාර්මික තාක්ෂණ ආයතනයෙන් (ITI) ලබාගත් පරීක්ෂණ සහතිකය සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය සමග මිලි 500 හෑන්ඩ් සැනිටයිසර් බෝතලයක නියැදියක් ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කළ යුතු ය.

| කොන්ත්‍රාත් අංකය | විස්තරය | ඒකකය | එකතුව ප්‍රමාණය | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත්තුව RDA/DPR/SHS/2021/29 | හෑන්ඩ් සැනිටයිසර් බෝතල් සැපයීම (මිලි 500) | සංඛ්‍යාව | 5000 | 25,000 |

6. ලංසු කැඳවීම අවසන් වන දිනයේ සිට ලිත් දින 90ක් ලංසු වලංගු විය යුතු ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට සමාන ලංසු ආරක්ෂණයක් (**2021.05.25** දක්වා වලංගු) ලංසුපත සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ආරක්ෂණයක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. සම්පූර්ණ කරන ලද ලංසුපත අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, මාර්ග සංවර්ධන අධිකාරිය, 4 මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල වෙත **2021.02.24 පැය 14.00 ට** පෙර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. වැඩි දුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 011-2046481/ 011-2884790 ඔස්සේ අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

ඊමේල් : **dirprorda@gmail.com**

**සභාපති,**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**1 මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල**


# වයඹ ඇළ ව්‍යාපෘතියෙන් පැළ 60,000ක් සිටුවීමට සැලසුම්

**ක්‍රිසන්ති විතාරණ**

වයඹ ඇළ ව්‍යාපෘතියට සමගාමීව පැළ 60,000ක් සිටුවන බව මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

වසර ගණනාවන් සිට කෘෂි කර්මාන්තයට සහ පානීය ජල අවශ්‍යතාව ප්‍රධාන ගැටලුවක් වූ වයඹ පළාතේ ජනතාවටම ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දීම සඳහා මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් සකස් කෙරුණ බවත්, එමගින් පවුල් 40,000ක් ප්‍රතිලාභ ලබන බවත් අමාත්‍යවරයා වැඩි දුරටත් සඳහන් කළේය.

මූලික මහවැලි මහ සැලැස්මෙහි වයඹ පළාතට ජලය ලබා දීම සඳහා සැලසුම් නොතිබුණත් එම ප්‍රදේශවල ජනතාවගේ දැඩි ඉල්ලීම සලකා වයඹ පළාතට මෙම ජල ව්‍යාපෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නියෝගයෙන්, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ මැදිහත්වීමෙන්, චමල් රාජපක්ෂ මහතාගේ උපදෙස් මත ලබා දුන් බව ඇමැතිවරයා කීවේය.

මෙම වයඹ ඇළෙහි ඉදිකිරීම් ආරම්භ කරන ස්ථානයේ ස්ථානීය පරීක්ෂාවක් පසුගියදා මහා සංඝරත්නය සමඟ මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා සිදු කළහ. මෙම නිරීක්ෂණයේ දී වල් බිහි වී තිබූ සොරොව්ව, මහකිතුල, මහකිරුල සහ මහදඹේ යන පුරාණ වැව් සහිත භූමිය ඇමැතිතුමාගේ පරීක්ෂාවට ලක්විය.

වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ කි.මී. 88.96ක් දිග ඇළ මාර්ගයක් මීටර් 25ක් පමණ උසැති වැව් බැම් සහිත මහකිරුල සහ මහකිතුල ජලාශ දෙකක් සහ කෙටි දිගින් යුත් උමං ජල මාර්ග දෙකක් මඟින් ගලේවෙල, පොල්පිතිගම, මහව සහ ඇහැටුවැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව පවතින මහා වාරිමාර්ග 7කට සහ ග්‍රාමීය වැව් 326කට දෙකන්නයේම වගා කිරීම සඳහා ජලය 2024 වර්ෂය වන විට ලබා දීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 51,729ක් වැය වේ.

අධ්‍යයන වර්ෂය
2021/ 2022

Apply Online

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පාඨමාලාවන් සඳහා
| වෘත්තීය සුදුසුකම් | මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිමනු ලබන ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>හෝ<br>ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු (සිවිල් ඉංජිනේරු) ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

01. **බඳවා ගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු බඳවා ගනු ලැබේ.

02. **සේවා කොන්දේසි** : මෙම තනතුර එක් අවුරුදු කොන්ත්‍රාත් කාල සීමාවකට යටත්වේ.

03. **වැටුප** : සම්පූර්ණ මාසික දීමනාව රු. 38,840.00

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු පිළිබඳව සියලු විස්තර සහ තමන් පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ ඇමතිය හැකි දුරකථන අංක සඳහන් කරන ලද අයදුම්පත්‍ර, අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කොට 2021.03.05 දින හෝ ඊට පෙර **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. සහතිකපත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.**
**2021.02.05**

## නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

# ඇබෑර්තු

## (ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින්)

නගාරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි (SHIFT ව්‍යාපෘතිය) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්, පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුවේ.

### ව්‍යාපෘති ගණකාධිකාරී තනතුර (තනතුරු 01)

**වැටුප් කේතය** : PS4 වර්ගීකරණය 'A'

**ව්‍යාපෘති වර්ගීකරණය :** ඇමරිකන් ඩොලර් මිලියන 100 ට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

සමග

සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

හෝ

(2) රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II හෝ ඉහළ පංතිය නිලධාරියකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,

සමග

III / II පංතිය තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.

### ජ්‍යෙෂ්ඨ සමාජ නිලධාරී තනතුර (තනතුරු 01)

**වැටුප් කේතය** : PS5

**ව්‍යාපෘති වර්ගීකරණය :** ඇමරිකන් ඩොලර් මිලියන 100 කට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

ජලය හා සනීපාරක්ෂක අංශයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද, යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ප්‍රජා ඒකරාශි කිරීමේ ක්‍රියාකාරකම්වල පළපුරුද්ද සහිත අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**පොදු කොන්දේසි :**

**වයස් සීමාව :**

අයදුම්පත් භාර ගැනීම අවසන් කරනු ලබන දිනයේදී අවුරුදු 64 ට අඩුවිය යුතුය.

**සේවා නියමයන් හා කොන්දේසි :**

මෙම පත්වීම්, කොන්ත්‍රාත් පදනමින්, මූලිකව වසර එකක් සඳහා වන අතර, සතුටුදායක කාර්යසාධනය මත වාර්ෂිකව අලුත් කළ හැක. අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි අන්තර්ගත කොන්දේසි මෙම පත්වීම් සඳහා අදාළ වේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කාර්යසාධනය මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සියලුම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපැලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, 2021-02-24 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රජයේ හා ආයතනික අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**(SHIFT ව්‍යාපෘතිය),**
**අංක 38, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.**

**දිනය : 2021-02-02**

2021 පෙබරවාරි 10 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.


දිනමිණ
සාර භූමියේ හරිතානන්දය
පැලැස්ස
2021 පෙබරවාරි 10 බදාදා
ආදරය
ඡායාරූපය - කෞෂ් දිසානායක







# යන එන මං නැති වූ පුත්තලම් බූරුවෝ



බූරුවා යන වචනය ඇසෙන විටම අප තුළ ඇති වෙන සංජානනය (perception) එතරම් සාධනීය එකක් නොවේ. වසර සිය ගණනක් බූරුවන් සමඟ ජීවත් වී ඇති නිසා බූරුවා සම්බන්ධ අපූරු කතා සිංහල භාෂාවේ අඩුවක් නැත. "බූරුවාගේ පිටේ හකුරු පැටෙව්වා වගේ", "බල්ලාගේ වැඩේ බූරුවා කරන්න ගියා වගේ" "බූරුවෙක් වගේ මෝඩ වැඩ කරන්න එපා" යැයි ප්‍රස්තාවපිරුළු ද සමහරුන්ගේ වයස අනුමාන කරන විට පුත්තලම් බූරුවෝ දෙන්නෙකුගේ වයස යැයි කියන්නේ පුත්තලම් බූරුවන්ගේ වයස පෙනුමෙන් කියන්නට අපහසු නිසා විය හැකියි. 1948 අපට ලැබුණේ වල්බූරු නිදහසක් යැයි මෑතක් වන තුරුම වමේ දේශපාලකයන් පුන පුනා කී කතාවකි. අපේ භාෂා ව්‍යවහාරේ බූරු කතා කොපමණ තිබුණත් වර්තමානයේ පුත්තලමෙන් පවා බූරුවෙක් සොයා ගැනීම කළුනික සොයනවා වැනි කටයුත්තක් වී ඇත. ශ්‍රී ලංකාවේ බූරුවන් බහුලව දක්නට ලැබුණේ පුත්තලම, කල්පිටිය, මන්නාරම නගර මුල් කර ගත් වයඹ මුහුදු තීරයේය.

බටහිර යටත්විජිත යුගයේ පුත්තලම ලුණු කර්මාන්තයේ නියැළුණු විදේශිකයන් විසින් ලුණු ප්‍රවාහන කටයුතු සඳහා බූරුවන් ලංකාවට ගෙනැවිත් තිබේ. ලන්දේසි යුගයේදී හැමිල්ටන් ඇළ ප්‍රවාහන කටයුතු සඳහා සංවර්ධනය කිරීමත් සමඟ ප්‍රවාහන කටයුතුවලදී බූරුවන්ගේ තිබූ වැදගත්කම හීන වෙන්නට පටන්ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ස්වාමියෙක් අහිමි වීම නිසා බූරුවන් අයාලේ යන්නට විය. කොටසක් වල්වැදුණ අතර සමහරක් ගම් වැදුණෝය. වර්තමානය වන විට බූරුවන්ට අයිතිකාරයෙක් නැත. පුත්තලම බූරුවෝ දැන් කල්පිටිය අර්ධද්වීපයේ තැනින් තැන සුදුසු වාසස්ථානයක් නොමැතිව ආහාර හිඟයකට මුහුණ දෙමින් යන්තම් දිවි ගැට ගසා ගනිමින් ජීවත් වෙති.

අප්‍රිකානු සම්භවයක් ඇති අශ්ව පවුලට අයත් බූරුවා (Equleus Africanus) වාසය කරන ප්‍රදේශ අනුව වර්ග තුනකට වෙන් කර ඇත. එනම් ඊජිප්තු වැසියන් විසින් ක්‍රි:පූ : හතර වෙනි සියවසේ දෛනික කටයුතු සඳහා යොදා ගත් "ඇට්ලස්" බූරුවා, අප්‍රිකානු වනාන්තරවල රංචු වශයෙන් ජීවත්වෙන "සෝමාලියානු වර්ගයේ බූරුවා" සහ මැදපෙරදිග ප්‍රදේශවල මෙන්ම ශ්‍රී ලංකාවේද දක්නට ඇති "සිරියානු වර්ගයේ බූරුවා" යනුවෙනි. බූරුවකු සාමාන්‍යයෙන් කි.ග්‍රෑ. 135 සිට 180 දක්වා බරින් යුක්තය. උස අඩි 4-5ක් පමණ වේ. බූරුවකුගේ උපරිම ආයු කාලය අවුරුදු 30ක් පමණ වේ.

බූරුවෝ වියළි කලාපයේ වැවෙන තෘණ හා කුඩා පඳුරු ආහාරයට ගනිති. බොහෝ විට ජලාශවල ඇති ජලජ පැළෑටි ද ආහාරයට ගනිති.

ජලය නොමැතිව දිගු කලක් සිටීමට හැකි වීම ඌට පරිසරයෙන්ම උරුම වූවක් බව පෙනේ. බූරුවන්ට බොහෝ වේලාවක් නිශ්චලව එකම ඉරියව්වෙන් සිටීමට හැකි වීම විශේෂ ලක්ෂණයකි. සාමාන්‍යයෙන් බූරු දෙනක් වරකට එක් පැටියෙක් ප්‍රසූත කරන අතර පැටවුන් දෙන්නෙකු ප්‍රසූත කරන අවස්ථා නැත්තේ නොවේ. බූරුවා වගේ වැඩ කරනවා යැයි කියමනක් අප අතර ඇත. එම කියමන වහරට එන්න ඇත්තේ බූරුවාට හොඳට බර ඉසිලීමේ සහ දුක් විඳීමේ ශක්තිය ඇති නිසා විය යුතුය. සත්ව

විද්‍යාඥයන් විසින් බූරුවාගේ බර ඉසිලීමේ ශක්තියත් අශ්වයාගේ ජවයත් දෙමුහුන් කර කොටළුවා නමැති සත්ව විශේෂය නිර්මාණය කළ බව කියවේ. එහෙත් බලාපොරොත්තු වූ ශක්තිය සහ ජවය කොටළුවා තුළින් මතු වූයේ නැත.

මිනිසා විසින් බොහෝ සතුන් හීලෑ කර ගනු ලැබුවේ තමාගේ ප්‍රයෝජනය සඳහාය. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ ප්‍රධාන වශයෙන් ලුණු ප්‍රවාහනය කළත් පසුව විවිධ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගෙන ඇත. කියුබාව වැනි රටවල කුඹුරු සී සෑම සඳහා ද බූරුවන් යොදාගෙන ඇත. අභිකුණ්ඨික ජනයා තම භාණ්ඩ තැනින් තැන ගෙන යෑම සඳහා බහුලවම යොදා ගැනුණේ බූරුවන්ය. නවීන ප්‍රවාහන ක්‍රම දියුණු වීමත් සමඟ ප්‍රවාහනය සඳහා බූරුවාට තිබූ වැදගත්කම ක්‍රමයෙන් අඩු වන්නට විය. අද වන විට පුත්තලම් බූරුවෝ ප්‍රවාහන සේවයෙන් විශ්‍රාම ගොස් සිටිති. එහෙත් සමහර සතුන් අලුත් රැකියාවක් සොයාගෙන ඇත. ඒ පොල් වතුවල කුරුම්ණියන් පලවා හැරීමේ රැකියාවයි. බූරුවන් කෑගහන සද්දෙට පොල් කුරුම්ණියන් පැනලා යනවා යැයි විශ්වාසයක් වතු හිමියන් තුළ පවතී. ඒ නිසා දැන් පොල්වතුවල බූරුවෝ දෙතුන් දෙනෙක් සිටිති. බොහෝ බූරුවෝ රැකියාවක් නොමැති නිසා අයාලේ යමින් සිටිති. දැනට වසර විස්සකට පමණ පෙර පුත්තලම, කල්පිටිය ප්‍රදේශවල බූරුවන් දෙතුන් දාහක් පමණ සිටි නමුත් අද වන විට දෙතුන් සීයයක්වත් සොයා ගැනීමට නැති තරම්ය.

ශ්‍රී ලංකාවේ බූරුවන් වඳ වී යෑමට පරිසර නවීකරණය ඇතුළු හේතු රාශියක් බලපා ඇති බව පෙනේ. මුල් යුගයේ බූරුවන්ගේ වාස දේශය වූයේ පුත්තලම කලපු තීරයයි. එහෙත් නගරය ජනාකීර්ණ වීමත් අවට මුඩු බිම්වල උතුරු නැඟෙනහිර යුද්ධයෙන් අවතැන් වූවන් සඳහා සරණාගත කඳවුරු පිහිටුවීමත් සමඟ බූරුවන්ට නගරයෙන් සහ නගරය අවටින් ඉවත් වන්නට සිදු විය. එමෙන්ම විශාල වශයෙන් ලුණු නිස්සාරණය සඳහා කලපු තීරය ව්‍යාපාරිකයන් විසින් අල්ලා ගැනීමත් මහා පරිමාණ ඉස්සන් පොකුණු නිසාත් ජීවත් වීමට තිබූ ඉතිරි ඉඩකඩත් ඇහිරී ගියේය. මේ නිසා ඔවුන්ට ආහාර නොමැති වීම මෙන්ම මිනිස්සුන්ගේ අඩම්තේට්ටම්වලට මුහුණ පෑමට සිදුවිය. මිනිසුන් විසින් ඔවුන්ගේ වාසභූමි ආක්‍රමණය කළ හෙයින් බූරුවෝ අසරණ වූහ. ඔවුහු සරණක් සොයා කල්පිටිය දෙසට ඇදෙන්නට වුහ. ඉන්පසු ඔවුන්ගේ ප්‍රධාන වාසභූමිය වූයේ කල්පිටිය කලපු තීරය, මුහුඳු වෙරළ සහ කන්දකුලිය මුහුදු තිරයේ ඇති හමුදා වෙඩි පුහුණු පිටියයි. අක්කර 1500 ක් පමණ වූ වෙඩි පිටියත් කන්දකුලිය වැව් පිටියත් බූරුවන්ට ක්ෂේම භූමියක් විය. එහෙත් ඒ ඉතා

කෙටි කාලයකට පමණි. උතුරේ යුද්ධය උත්සන්න වීමත් සමඟ ත්‍රිවිධ හමුදා භටයින් සඳහා වෙඩි තැබීම් පුහුණු කිරීම් වැඩි විය. භූමියේ සටන් මෙන්ම ගුවනින් බෝම්බ දැමීම් පිළිබඳ පුහුණුව දිනපතා දිවා රාත්‍රී දෙකෙදිම සිදුවිය. මේ නිසා වෙඩි පිටියෙන් ඉවත් වීමට සිදු වුවා පමණක් නොව ගුවනින් හෙළන ලද බෝම්බ නිසා සත්තු බොහෝ දෙනෙක් මිය ගියහ.

එපමණක් නොව යුද්ධය උත්සන්න විම හේතුවෙන් කල්පිටිය කලපු තීරයේ මුඩු බිම්වල යුද අනාථයෝ පදිංචි කරන ලැබුවහ.

ඉස්සන් පොකුණු ද එන්න එන්නම කලපු ආශ්‍රිතව ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. මේ සියලු කරුණු හේතුවෙන් බූරුවෝ ද අනාථ වූහ. ආහාර සපයා ගත් භූමියේ සරණාගතයන් පදිංචි කරන ලදී. ඒ නිසා ඔවුන්ගේ ආහාරය වූ කලපු අන්දර මෙන්ම තරණ නමැති තෘණ වර්ග ද හිඟ විය. යන එන මං නැති වූ බූරුවන් කොටසක් ගම්මානවලට ඇතුළු වූ අතර තවත් කොටසක් කල්පිටිය නගරයට සේන්දු වූහ. මේ නිසා බූරුවන්ට ආහාර හිඟ වීම පමණක් නොව මිනිස්සුන්ගේ පහර දීම්වලට ද ගොදුරු වීමට සිදු විය. නගරයේ වාහන අනතුරුවලින් මෙන්ම පොලිතින් ආදි කෘත්‍රිම ද්‍රව්‍ය ආහාරයට ගැනීමෙන් බූරුවෝ මිය ගියහ.

මීට අමතරව ඔවුන්ගේ ජීවිත හානියට බලපෑ තවත් හේතුවක් වූයේ බූරුවන් මරා මස් කර ගවමස් සමඟ මිශ්‍ර කර කොළඹට ප්‍රවාහනය කිරීමය. මේ පිළිබඳව පුත්තලම සහ කල්පිටිය පොලිස්වලට වාර්තා වීම නිසා එය වැළැක්වීමට නීතිය ක්‍රියාත්මක කෙරිණි. කෙසේ නමුත් මස් ජාවාරම නිසා බූරුවෝ විශාල වශයෙන් වඳ වූහ. හරකුන් බල්ලන් සහ එළුවන්ට මෙන් බූරුවාට අයිතිකරුවකු නොවීමත් ඔවුන්ගේ වඳ වී යෑමට බලපැවේය. අයිතිකරුවකු නොමැති වුවත් බූරුවන් හිතුමතේ ප්‍රවාහනය කළ නොහැකිය. බූරුවා ලංකාවට හඳුන්වා දුන් සත්වයකු වුවත් බූරුවන්ට ද වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ 30 වැනි වගන්තිය යටතේ ආරක්ෂාව හිමි වේ. එබැවින් බූරුවන් ඇල්ලීම, විකිණීම, සන්තකයේ තබා ගැනීම දඩුවම්ලැබිය හැකි වරදකි. එමෙන්ම මරණයට පත් කිරීම් සහ මස් අලෙවියද දඬුවම් ලැබිය හැකි වරදකි. බූරුවන් සංරක්ෂණයට කිසිවකුත් ඉදිරිපත් නොවීම බූරුවන්ගේ අවාසනාවකි. කයිට්ස් දූපතේ අශ්වයින් මෙන් බූරුවන් කල්පිටියේ සංචාරක ආකර්ෂණය සඳහා යොදා ගැනීම සංචාරක ව්‍යාපාරයේ උන්නතියට ද හේතු විය හැකිය.

කෙසේ නමුත් කවුරුන් හෝ බූරුවන් සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කාලය පැමිණ ඇති බව නම් කිව යුතුමය. එය බූරුවන්ට මෙන්ම සත්ව විද්‍යාඥයන්ට ද කරන ඉමහත් සේවයකි. බූරුවා සම්බන්ධ කරමින් මිනිසාට අපහාස උපහාස කළ ද බූරුවා මිනිසාට ඉතා සමීප අහිංසක සතෙකි.

කෝනාර එම්. ගුණපාල
ඡායාරූප - කේ. ප්‍රියංකර කළුපහන



# මානා ඇල්ල පානා හසරැලි

රාම සීතා පුරා වෘත්තයට අනුව ලෝකයේ බිහි වූ අති විශිෂ්ටම රජු ලෙස සැලකෙන රාවණා රජතුමා සුළං බලයෙන් ක්‍රියාකරන අහස් යානයකින් ඉන්දියාවට ගොස් රාම කුමරුගේ බිරිය වන සීතා දේවිය පැහැර ගෙන විත් සඟවා ගෙන සිටි එක් ස්ථානයක් හැටියට ඌවපරණගම ස්ත්‍රීපුර කන්දේ පිහිටි උමඟ හැඳින්විය හැකිය. මෙම උමඟ නුවරඑළිය සීතාඑළිය අසලින් අවසන් වෙයි. සීතාඑළිය සීතා කෝවිල අසලින් ජලය ගලා බසින ගල් පර්වතයේ හනුමාගේ පාද සලකුණුවලට සමාන ලකුණු අදටත් දක්නට ඇත. සීතාඑළිය හා ස්ත්‍රීපුර කන්ද අතර, අශෝක උයන තිබු බවට සාධක ඇතැයි ද පරිසරවේදීහු පවසති.

ඉන්දියාවේදී ලක්ෂ්මන් කුමරු විසින් තම සහෝදරියගේ නාසය කපා දැමීමේ වරදට දඬුවම් ලෙසින් රාමගේ බිරිය වන සීතා දේවිය පැහැර ගෙන විත් ඌවපරණගම ස්ත්‍රීපුර කන්දේ උමඟ ආශ්‍රිතව සිරකර තැබුව ද රාවණා රජු ඇයට පූර්ණ ආරක්ෂාව සලසා දී ඇති බව පෙනේ. සීතා දේවිය රාම කුමරු ඇතුළු පිරිස ඉදිරියේදී වැලිමඩ දිවුරුම්වෙල වර්තමාන රජමහා විහාරභූමියේදී ගිනිමැලයට පැන සති පූජාව පැවැත්වීමෙන් රාවණා රජු ඇය මනාව ආරක්ෂා කළ බවට හොඳම සාධකයකි.


ලෝකයේ පළමු ගුවන් යානයේ නිර්මාණකරු බවට සැලකෙන රාවණා රජු ඉන්දියාවේ සිට පැහැර ගෙන විත් වසර 06 ක පමණ කාලයක් ඌවපරණගම ස්ත්‍රීපුර කන්දේ උමඟ ආශ්‍රිතව සඟවා ගෙන සිටි සීතා දේවිය ජලස්නානය කර ඇත්තේ අලංකාර මානා දිය ඇල්ලෙන් බවට ජනප්‍රවාදයන්ට අනුව විශ්වාස කරන බව පුරාවිද්‍යාපති කොටවෙහෙර කාශ්‍යප හිමියෝ පවසති.

මෙම අලංකාර දිය ඇල්ලේ උස අඩි 100ක් පමණ වන අතර, ජල පොකුණුවලින් යුක්තය. එසේම මෙහි වෙන කිසිදු තැනක දක්නට නොමැති ගල් ජල පිහිල්ලක් දක්නට ඇත. මෙම දිය පිහිල්ලේ විශේෂත්වය නම් අධික වර්ෂා සමයේ හා ජල ප්‍රමාණය අඩු වන විට ද දක්නට නොලැබීමයි. එහෙත් මධ්‍යම මට්ටමෙන් ජලය ඇද හැලෙන සමයේ මෙම ජල පිහිල්ල දකින්නට ලැබේ.

දිය ඇල්ලේ උස අඩි 100ක් පමණ වන අතර මොනර පිහාටු මෙන් ද්විත්ව අන්දමට පහතට ජලය ඇද හැලෙන අතර ස්වාභාවික ජල කටාරම් 07ක් (ජලපොකුණු) හරහා ජලය ගලා බසී.

මෙම ප්‍රදේශය ආශ්‍රිතව මානාභරණ ප්‍රාන්ත රජකෙනකු ද වාසය කළ බවට ද මතයක් පවතී. මානාභරණ රජතුමා හා බිසෝවරුන් මෙම දිය ඇල්ලේ ජල ක්‍රීඩා කර ඇතැයි ද එනිසාම එම රජතුමාගේ නම යොදා මෙම දිය ඇල්ලට මානා ඇල්ල ලෙසට නම් කර ඇතැයි ද පැවසේ. දිය ඇල්ලේ පාමුල ස්වාභාවික ගල් ගෙයක් නිර්මාණය වී තිබේ. එමෙන්ම දිය ඇල්ලේ දකුණු පස සුදු තේ වතු පාලකයන් එංගලන්තයෙන් රැගෙන විත් මල් වගාවක් සිදු කර ඇති බවත් තවත් මතයකි.

මෙය අලංකාර දිය ඇල්ලකි. එහෙත් මෙම දිය ඇල්ල අවට නිධන් වස්තු ඇතැයි යන විශ්වාසයෙන් නිධන් හොරුන් සිදු කරනු ලබන විනාශයන් ද විශාලය. ඌවපරණගම පොලිසියේ අවධානයට ලක්වීමත් සමඟ නිධන් හොරුන් සිදු කරන හානිය යම් දුරකට පාලනය වී තිබේ. මෙයට අමතර හාල්ගංඔයේ දෙපස එළවළු වගාකරුවන් කෘමිනාශක හිස් බෝතල් ඔයට බැහැර කිරීම බරපතළ පරිසර ගැටලුවක් බවට පත් වී තිබේ. මෙම ගැටලුවලට විසඳුම් සපයා දෙමින් සංචාරකයන් අතර ජනප්‍රිය කළ හොත් ඌවපරණගමට විශාල ආදායමක් ද උපයා ගැනිමට ද හැකි වනු ඇත.



ස්වාභාවික ජල පොකුණු

නුවරඑළිය හාවාඑළිය දැඩි රක්ෂිතයෙන් ආරම්භ වන උමා ඔයේ අතු ශාඛාවක් වන හාල්ගංඔයේ ලුණුවත්ත හා බෙරලියපොළ ගම් දෙක අතර මානා දිය ඇල්ල නිර්මාණය වී තිබේ. වැලිමඩ සානුවේ ප්‍රධාන දිය ඇල්ල වන බෝඹුරු ඇල්ල හා මෙම මානා දිය ඇල්ල ද ඌවපරණගම පිහිටා ඇත. වර්ෂ 1800 මුල් යුගයේ රචනා කර ඇති මංසලකුණු කෘතියේ මෙම දිය ඇල්ල ගැන සඳහන් කර තිබේ.

මානා දිය ඇල්ල දෙකට බෙදී අලංකාරව කඩා හැලෙන අතරම ලංකාවේ එකම දිය උයනක් ලෙසින් ද මෙය හැඳින්විය හැකියි. එසේම වෙනත් කිසිදු දිය ඇල්ලක දක්නට නැති ඓතිහාසික වටිනාකමකින් යුත් ලක්ෂණ මෙම මානා දිය ඇල්ලේ පවතී. දිය ඇල්ලේ ජලය බේසමෙන් බේසමට වැටෙමින් ගලා බසින ආකාරයක් දක්නට ලැබේ.

"මෙම මානා දිය ඇල්ලට ඉහළින් ස්ත්‍රීපුර කන්ද සහිත උමං මඟක් තිබෙනවා. දැනට වසර 6000ක පමණ ඈතට දිව යන රාවණ රජතුමා බදුල්ල මුල් කරගෙන පාලනය කළ බවට සාධක තිබෙනවා. රාවණ රජතුමා සීතා දේවිය පැහැර ගෙනැවිත් මෙම ස්ත්‍රීපුර කන්දේ උමං මගේ රඳවා තබා සිටි බවත් එම උමඟ නුවරඑළියේ හග්ගල මල්වත්ත අසල සීතාඑළිය දක්වා වැටී තිබුණ බවට මතයක් පවතී.


මෙම සිතාඑළිය හා ස්ත්‍රීපුර කන්ද අතර අශෝක මල් උයන තිබුණ බවට මතයක් තිබෙනවා. ඒ අනුව රාවණ රජු ඇතුළු බිසෝවරුන් මෙන්ම ස්ත්‍රීපුර උමං මඟ ආසන්නයේ පිහිටීම නිසා සීතා දේවිය ද මෙම දිය ඇල්ලෙන් ජලස්නානය කළ බවට ජනප්‍රවාද කථා තිබෙනවා.

මෙම දිය ඇල්ලට මානා ඇල්ල ලෙස නම් කර ඇත්තේ මානාභරණ ප්‍රාන්ත රජු සිහිවීමට යන මතයක් ඇතත් එම රජතුමා පිළිබඳව වෙනත් මූලාශ්‍ර ඇතුළත් තොරතුරු අසන්නට නෑ. නමුත් සෙංකඩගල සිට ඌව හරහා දකුණට වැටී තිබුණ මාර්ගය වැටී තිබුණු ඌවපරණගම තුප්පිටිය ගමට ඉතා ආසන්නව මෙම දිය ඇල්ල පිහිටා තිබෙනවා. එසේම ඌව පාලනය කළ කුමාරසිංහ රජතුමා පදිංචිව සිටි තුප්පිටිය මාලිගය ඇතුළු උයන තිබුණ බවට සලකුණු දක්නට ලැබෙනවා. මෙම කුමාරසිංහ රජතුමා ඇතුළු බිසෝවරුන් මෙම දිය ඇල්ලේ ජල පොකුණු ආශ්‍රිතව ජල ක්‍රීඩා කර තිබෙනවා. ඉහළ ජල පොකුණක ඖෂධ සහිත ජලය සකසා එම ජලය ගල් පිහිලක් ඔස්සේ ගලා එද්දි රාජකීයයන් ස්නානය කරන්නට ඇතැයි විශ්වාස කරනවා.

එසේම සීගිරියේ ගල් සිංහාසනය ලෙසින් මෙම දිය ඇල්ලේ ද ගලින් අව්ව හා වැස්සෙන් ආවරණය වන ලෙසට නිම කළ සිංහාසනයක් හා සිංහයකුගේ ලක්ෂණ සහිත ඔටුන්නක් ගල් පර්වතයේ ඉහළින් දක්නට ලැබෙන අතර එමඟින් රජතුමා රාජකීය බිසෝවරුන්ගේ ජල ක්‍රීඩා මෙම සිංහාසනයේ සිට නැරඹූ බවටත් ඔටුන්නෙන් මෙය රාජකීයන්ගේ ජලස්නාන ස්ථානයක් බවට බාහිර පාර්ශ්ව දැනුම්වත් කිරීම සිදු කරන්නට ඇතැයි විශ්වාස කිරීමට හැකියි. එසේම මෙම දිය ඇල්ල ආශ්‍රිත ජල පොකුණු අවට යම් වහලක් සහිත ගොඩනැඟිල්ලක් ඉදි කර තිබුණු බවට සලකුණු අදටත් පැහැදිලිව දක්නට තිබෙනවා. අධික හිරුරැස්වලින් මිදීමට රාජකීයයන් මෙම දැවමය ආවරණය ඉදි කරන්කට ඇතැයි විශ්වාස කිරීමට හැකියි.

ඌවේ නිවැරදි ජලකළමනාකරණයක් පැවති බවට ප්‍රබල සාධක තිබෙනවා. මහියංගන සොර බොර වැව් ජලය බැස යැමට විශාල ගලක් දෙබෑ කර වාරි ඇළක් සකසා ඇති අන්දමට මානා දිය ඇල්ල පාමුල සිට කළු ගලක් අඩි 03ක් පමණ ගැඹුරට කඩා වාරි ඇළක් නිර්මාණය කර ඇති අතර මෙම ශිලාමය වාරි ඇළෙන් ගන්නා ජලයෙන් උණපාන, බෙරලියපොළ, පන්නලවෙල යන කුඹුරු අක්කර සිය ගණනක වගාවන්ට අදටත් වාරි ජලය ලබා ගන්නා අයුරු දැක ගත හැකියි" යනුවෙන් පුරාවිද්‍යා චක්‍රවර්ති කොටවෙහෙර කාශ්‍යප හිමියෝ පැවසුහ.

**ආර්.රාජමන්ත්‍රී**






ඔබගේ අදහස් හා යෝජනා පමණක් නොව,
ලිපි හා ඡායාරූප ද පහත ලිපිනයට අප වෙත එවිය හැකියි.
'පැලැස්ස' දිනමිණ, අංක 35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10
pelessa@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
චතුමි
පිටිපන







# වන මං මැද්දෙන් මහ ගල් ලෙනටම

පළාත - **ඌව**
දිස්ත්‍රික්කය - **බදුල්ල**
ප්‍රා.ලේ. කොට්ඨාසය - **හල්දුම්මුල්ල**

ඌවේ ජනප්‍රවාදයේ එන ඓතිහාසික තැන් ගණන අති විශාලය. තවමත් මහා ඝන කැලෑවෙන් වැසී ඇති තැන් විශාල ප්‍රමාණයක් තවමත් සැඟවී ඇත්තේ ඒ පිළිබඳව තවමත් හරිහැටි විපරමක් සෝදිසියක් වගකිව යුතු අංශවලින් සිදු නොවන නිසාය.

සෙල් ලිපි සහිත කටාරම් කෙටූ ලෙන් රැසක් සහිත අපූරු තැනක් පිළිබඳව තොරතුරු කියන්නේ අලුත්වෙල පදිංචි නිශාන්තය.

ඒ ස්ථානය පිහිටා ඇත්තේ ඌව පළාතේ මොනරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක අතර සීමාවේ වුවත් හරියටම කිව්වොත් බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේය. තවත් ආකාරයකට කිව හොත් මොනරාගල දිස්ත්‍රික් මායිමේ කෙළවරකය.

වැල්ලවාය තණමල්විල මාර්ගයේ වෙහෙරයාය ආරියසිරි හන්දියෙන් දකුණට ඇති අලුතවෙල මාර්ගයේ කිලෝමීටර් අටක් පමණ ගැන ගිය විට හමු වන්නේ අලුත්වෙල ගම්මානයයි. එතැනින් තවත් කිලෝමීටර් හතක පමණ දුරක් අපගේ මේ අලුත් සොයා යෑමේ ගමනාන්තය කරා යායුතුය.

කලින් කතා කර ගත් පරිදි මා එන විටත් නිශාන්ත සූදානම් වී සිටි අතර අප යතුරුපැදිවලින් ගමන් ගත්තේ යතුරුපැදිය මෙවැනි ගමන්වලදී පහසුවෙන්ම යොදා ගත හැකි වාහනය වූ නිසාය.

ඒ යන අතර ගමනේ මඟපෙන්වන්නා ලෙස ඒ ආසන්නයේ පදිංචි නිශාන්තගේ මිතුරකු වන විපුල ක්‍රිෂ්ණසිරි ජයමාන්න නම් මිතුරා එකතු කර ගත්තේ යායුතු මග ගැන තොරතුරු මනාව දැන කියා ගැනීම සඳහාය.

විපුලගේ බිරිය විසින් අප වෙත නැවුම් කජු වගාවෙන් ගලවා තැම්බූ රට කජු පිඟානක් පිළිගැන්වූයේ ගමන පිටත් වන්නටත් පෙරය. අමු රට කජු තැම්බූ පසු එන සුවඳත් රසත් එකවගේය. කොතෙක් කෑවත් ඇතිවන්නේ නැති තරම්ය. අනතුරුව ඇයගෙන් ලැබුණු කහට කෝප්පයක් බී අපි ගමන පිටත් වූයේ දහවල් වුව හොත් අව්රශ්මියෙන් ගමනට බාධාවක් ඇති වේ දෝ'යි සිතමිනි.

ඒ යන පාර දෙපස පුරාම ඇත්තේ පීදුණු වගාවන්ය. සමහර වගාවන්වල අස්වනු නෙළමින් තිබේ. කුරහං හේන් මැදින් යන විට ඇත්තේ අපූරු ආශ්වාදයකි. කෙසෙල් වගාවන්, රට කජු වගාවන් එක යායටය. ඒ අතර අතරින් පතර නිවහනක් දෙකක් දකින්නට තිබේ. කුඹුරු පීදෙන්නට ආසන්නය. තවමත් පැළ ගොයම දකින්නට ඇති කුඹුරු ද ඒ අතර නැතුවා නොවේ. වගාකර අතහැර දමා ඇති බිම් කැබලි ලඳු කැලෑවලින් වැසී තිබේ.

පාරවල් තරමක් මවවලවල්වලින් ගහණය. පසුගිය දිනවල ඇදහැළුණු වර්ෂාවත් සමඟ යන එන වාහනවලින් හැරුණු කුඩා වළවල් මහ වළවල් වී ඇති හැඩක්ය.

පරිස්මෙන් ඒවා මඟහැර ගිය විට ඊළඟට හමු වන්නේ අබකොළ ආරය. බොර පැහැති වතුර ගලා එන්නේ මහ වැස්ස නිසාය. වගාබිම්වලින් සේදී එන පස් කළවම් වූ වතුර ඊට සාක්ෂි සපයයි.

"අන්න අර ඈතින් පේන්නේ නැව් ආර ආරණ්‍යය. සමහරු ඒකට තපෝවනය කියලත් කියනවා" යැයි නිශාන්ත කිවේ අපයන තැන ගැන ඉඟියක් දෙමිනි.

එය හුදෙකලාව පිහිටි කඳු ගැටයකි. පාරට කුඩාවට පෙනුණ ද අඩි දෙතුන් සියයක් තරම් උස් කඳු ගැටයක් බව පෙනෙන්නේ ළඟට ගිය විටය.

කලකට පෙර ප්‍රදේශවාසීන් එක්ව මෙම ස්ථානයේ ආරාණ්‍යවාසි ස්වාමින් වහන්සේ වෙනුවෙන් කුටි ඉදිකරන්නට කටයුතු සූදානම් කර තිබුණ ද කුමන හෝ හේතුවකට එය අතරමඟ නැවතී ඇත්තේ කොතැනකින් හෝ සිදුවූ අඩුපාඩුවක් නිසාය.

ඒ වෙනුවෙන් සකස් කළ මාර්ගයක් ඔස්සේ අපි ඇවිද ගිය අතර ප්‍රදේශවාසීන්ගේ දායකත්වයෙන් ඉදි වූ අඩක් අවසන් වූ ගොඩනැඟිලි දෙක තුනක් දකින්නට ලැබුණේ කටාරම් කෙටූ ගල් ලෙන් ආශ්‍රිතවය.

එතැනින් උඩට නැඟ ගිය විට හමු වන්නේ තවත් කටාරම් කෙටූ ගල් ලෙනකි. එය කරමක් විශාලත්වයෙන් වැඩි අතර කලකට පෙර එම ස්ථානයේ පිරිසක් නිදන් සොයා හාරා විනාශ කර ඇති බවට සාධක ද දකින්නට හැකි වූයේ කැබලි කරන ලද ගල් විශාල ප්‍රමාණයක් අවට විසිරී පැතිරී ඇති නිසාය.

ඒ හේතුව නිසා දෝ එම ගල් ලෙන ආසන්නයේ තිබූ මහා ගල් පර්වතයක් පහළට පෙරළී ඇති අතර එයින් එම ලෙනේ ස්වාභාවික පෙනුම වෙනස් වී තිබේ.

මෙම ලෙන් ත්‍රිත්වයට ඉදිරියෙන් වැටී ඇති මාර්ගය දිගේ ගිය විට ගරා වැටුණු නිදන් සොරුන්ගේ ග්‍රහණයට හසු වී ඇති චෛත්‍යය දැක ගත හැකිය. එය බලන්නට යන ගමන තරමක් දුෂ්කරය. ගස් ගල් පර්වත අතරින් රිංගා කන්ද උඩට හෙමින් හෙමින් යා යුතුය. අතරමඟ දුර්ලභ ශාක විශේෂ රැසක් හමු වේ. විශේෂයෙන්ම ගල් දෙබොක්කාවන් අතර කෙනකුට පහසුවෙන් ළඟා විය නොහැකි සීමාවේ වැඩෙන බිං කොහොඹ ශාකය සුලබව දකින්නට හැකිය. දේශීය ඔසු පැළෑටි රැසක්ම දැක ගැනීමට හැකි වනයක් බව කිව යුතුමය.

ඉඳ හිට ඇසෙන කුරුලු නාදයන් මිස කනට ඇහෙන වෙනත් කිසිදු හඬක් නැත. පරිසරය ඒ තරම්ම නිහඬය.. නිස්කලංකය..වේලාව දහවල් එකොළහ පසු වුවත් ගමනේ විඩාවක් තෙහෙට්ටුවක් දැනුණත් ගස් අතරින් ඉර එළියක් එක එල්ලේ නොවැටෙන බැවින් ඇත්තේ සිසිල් පරිසරයකි. ගතට මෙන්ම සිතට ද සුවයකි.

අප දැන් කෙමෙන් කෙමෙන් ළඟා වන්නේ පර්වතය උඩ පිහිටි ගරා වැටුණු චෛත්‍යය බැලීම සඳහාය.

ඒ සඳහා ගල් තලාවක් මතින් ඇවිද යා යුතුය.

ඒ මතට ආවිට අවට වටපිටාවේ බොහෝ සුන්දර තැන් රැසක්ම අපූරුවට දැක ගැනීමට හැකිය. එක් පසෙකින් පෙනෙන්නේ අප මිට කලින් ගිය ලෙන් ගුහා පිහිටි ප්‍රදේශයයි. තවත් පසෙකින් වගා බිම් අක්කර සිය ගණනකි. ඒ මැදින් වැටී ඇති මාර්ගය අඩි පාරක් මෙන් පෙනේ. කඳු වළල්ලකින් වට වී ඇති ඈත ප්‍රදේශය චමත්කාරජනකය.

"අන්න අතන තමයි චෛත්‍යය තියෙන්නේ. දැන් නම් වළවල්වලින් වැහිලා අපි පෝය දවසට ඇවිල්ලා සුද්ධ කරලා අතුපතු ගාලා පහන් පත්තු කරනවා." ඒ විපුලගේ කටහඬයි..

ඔහු සැබෑ භක්තිවන්තයෙකි. මේ භූමියේ අසපුවක් ලෙස සකස් කර ගැනීමටත් ස්වාමින් වහන්සේ නමක් වැඩමවා ගැනීමටත් ඔහු තුළ ඇත්තේ දැඩි මහන්සියකි. ඕනෑකමකි.

ඒ මේ ඓතිහාසික ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමටත් මෙහි ඇති ලෙන් හා පරිසරයට වන හානිය වළක්වා ගැනීමට නම් එවැනි ආරණ්‍ය සේනාසනයකින් හැකි වේ යැයි සිතන නිසාය. ගම්වාසීන් ඒ සඳහා ඔහුට හැකි හැම අයුරින්ම සහාය දෙන්නේ ඒ නිසාය.

ඒ චෛත්‍යයට නුදුරින් ඇත්තේ අඩි සියයකට වැඩි දිගකින් යුත් ප්‍රපාතාකාර ගල් තලාවකි. පහළ බැලූ විට පෙනෙන්නේත් නැති තරම්ය. හදිසියේ හෝ පය ලිස්සා ඇද වැටුණොත් ඉතිරි වන්නේ කෑලි පමණි. එබැවින් පහළ බැලීමේ අදහස අතහැර ගත්ත ද නිශාන්ත ගල් තලාවේ දිගාවී පහළ බැලුවේ බලන්නටම ඇති වූ වුවමනාව නිසාය.

අඩි දෙතුන් සියයක් යටින් වූ ප්‍රපාතය ආසන්නයේ ඇත්තේ රුස්ස ගස් කොළන්ය. තරමක් ආසන්නයට වන්නට ගල් සියඹලා ගස් ගොන්නක් දකින්නට හැකි වුවත් ඒවායේ ගෙඩි නොමැති වූයේ මේ අවාරය නිසාය.

ගල් තලාව ඒ තරම් පළල් නොවුවත් දිගින් විශාලය. වාඩි වී අවට සිරි නැරඹිය හැකිය. හමා එන සුළඟ සැරය.

ඒ ගල් තලාවට පෙනෙන ඉසව්ව අතිවිශාලය. කුඹුරු, කෙසෙල් වතු, කුරක්කන් යායවල්, වෙනත් වගාවන් මෙන්ම අතහැර දැමූ ලඳු කැලෑ ද, දිය අගල් මෙන්ම පාරවල් රැසක් ද ඒ යායේ තැනින් තැන දකින්නට හැකිය. කලකට පෙර වර්තමානයේ පෙනෙන සියලු වගාබිම් වෙනුවට තිබී ඇත්තේ මහා වැවකි. වර්තමානයේ ඇත්තේ ඒවායේ නටබුන් පමණි.

"අන්න අර කන්දයි අනිත් කන්දයි යාකරමින් තමයි බැම්ම තිබිලා තියෙන්නේ" යැයි විපුල මාහට පැවසුවේ තවමත් අප සිටිනා ඉසව්වට වැවේ බැම්මේ කැඩුම් කඩක් මනාව පෙනෙන ඉසව්ව දෙස අත දිගුකර පෙන්වමිනි.

ඈත අතීතයේ ඒ සියලු බිම් කෙත් වතුවලින් සරුසාර වී තිබුණු බවට අමුතුවෙන් සාක්ෂි අවැසි නැත. මන්ද කඳු දෙකක් යා කරමින් ඉදි කළ වැවක එකතු වන ජල කඳ කොයි තරම් දැයි සිතා ගත නොහැකි වන තරමට ඒ තුළ එක්රැස් වූ ජලයෙන් අස්වැද්දූ කුඹුරු ප්‍රමාණය ද ඒ හා සමානව අති විශාල බැවිනි.

වැවයි දාගැබයි ගමයි පංසලයි ඉපැරණි හෙළ සංස්කෘතියේ ලක්ෂණ මනාව විදහා දක්වන තවත් එක් ඉසව්වක් බවට අටුවා ටීකා අවැසි නොවන්නේ අදටත් එවායේ නටබුන් විද්‍යාමානව පවතින නිසා යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවේ.

"එන්නකෝ තව දෙයක් පෙන්වන්න"යැයි කී විපුල මාව රැගෙන ගියේ තවදුරටත් කන්ද උඩට වන්නට කැලේ ඇතුළටය.

"ඔන්න තැනට ආවා මෙතනින් බලන්න" යැයි මාහට පැවසුයේ එක්තරා කවුළුවක් පෙන්වමිනි.

මෙතනින් මෙනවද පේන්නේ.. මම විමසුවෙමි...

ඇතුළෙන් රිංගලා බලන්න යැයි ඔහු පැවසූ හෙයින් මම බඩ ගා ගල් දෙබොක්කාවක් ඇතුළෙන් රිංගා එළියට පැමිණියෙමි.

එතැනින් ද අප පෙර දුටු දසුනම අපූරුවට දැක ගැනීමට හැකි වූ අතර ඒ ස්ථානයට කඩාගෙන ගිය වැව් බැම්ම මනාව දැක බලා ගැනිමට හැකි විය.

"පොකුණු දෙක තුනක් තියෙනවා ඒවත් බලන්න යමු"දැයි යෝජනාවක් කළේ අප තුළ තවදුරටත් මේ ගමනේ ඇති අත්දැකීම් වැඩි කිරීමට දැයි මට සිතුණේ එය ඇත්තේ පහළ බෑවුමේ යැයි කියූ නිසාය.

"අම්මෝ මේක පහළට ද යන්න තියෙන්නේ" ..යැයි මම විමසුවේ ගල් තලාව පහළට කිසිදු ආධාරකයක් නොමැතිව යන්නට සිදු වූ නිසාය. පය ලිස්සා ගිය හොත් වැටෙන්නේ එරබදු හෝ අන්දර ගාලක් උඩටය. නැතිනම් ගල් සියඹලා ගහක් උඩටය.

කෙසේ හෝ පළමුව ගියේ විපුලය. දෙවනුව මමත්, පිටුපසින් නිශාන්තත් පැමිණියේ අතිශය අවදානම් ගමනකි. ඊට හේතුව අංශක හැත්තෑපහකටත් වඩා ආනත වූ ගල් තලාවක ඇවිද යෑමට සිදු වූ නිසාය. පරිස්සමින් හෙමින් හෙමින් ඇවිදි ගිය අපි එක් විශාල පොකුණක් ළඟ නතර වූයේ ඇගේ විඩාබර ගතිය නිසාමය.

ඒ පොකුණට ජලය ලැබෙන්නේ අප සිටි ඉහළ ගල් තලාවෙනි. ගල් තලාව අතරින් සිදුරක් ඇති බව අප සොයා ගත්තේ වටපිටාවේ සිදු කළ නිරීක්ෂණයන් සමඟය. තවත් පොකුණක් පහළින් පෙනෙන්නට තිබූ හෙයින් පරිස්සමෙන් ගල් තලාව මතින් පහළට ඇවිදගෙන ආවෙමු. පොකුණ යට කොළ රොඩු පෙරී කානුවක් මඟින් පොකුණට වතුර ගලා යයි. එම කානුව ගල් තලාව දිගේ අඟල් දෙක තුනක් ගැඹුරට හා පළලින් කපා ඇති අඩි දහයක් දොළහක් පමණ දිගින් යුතු එකකි.

හෙළයා හැබෑවටම විශ්වකර්මයකු යැයි සිතෙන්නේ මෙවැනි විස්කම් දකින විටය. පොකුණට එන ජලය පෙරී යන්නත් පිරිසුදු වතුර පමණක් පොකුණට ගන්නත් එතැනින් වැඩි වතුර තවත් පොකුණකට ගලා යන්නටත් යොදා ගෙන ඇති සියුම් තාක්ෂණික ක්‍රමෝපායන් සැබවින්ම පුදුමාකාරය. ඒවා අද දක්වාත් සුරැකිව තිබීම ද ජාතියේ වාසනාවකි. මෙවැනි ජලය පිරි පොකුණු කුමන කටයුත්තකට යොදා ගත්තේ දැයි නිශ්චිතවම පැවසිය නොහැක්කේ ඒවායේ පිහිටීමත් සමඟ ඇති අවදානම නිසාය.


කෙසේ නමුත් පිරිසුදු ජලය ඒවා තුළ එක්රැස් වී ඇති බවත් විශාල ජල ප්‍රමාණයක් කිසියම් වූ කාර්යයන් සඳහා එකල යොදා ගන්නට ඇති බවත් පමණක් අද දකින්නට ඇති සාධකවලින් කිව හැකිය.

අප එතැනින් පහළට බැස මඳ දුරක් යන විට හමුවන්නේ තවත් ගල් කටාරම් කෙටූ ලෙනකි. එහි ඉහළ ශිලා ලේඛනයක් දකින්නට ඇති අතර මෙම ලෙන් සමූහය භික්ෂූන් වහන්සේ වෙත පූජා කළ බව ඒවායේ සඳහන් වන බවයි පැවසෙන්නේ.


එතැනින් එළියට පැමිණි අප නැවතත් එන්නට පිටත් වූයේ කෙටි මාර්ගයක් ඔස්සේය. වැස්සක පෙරනිමිති ගල උඩදී අප දුටු බැවින් ද ගම්මානයට වැස්ස ඇද වැටෙමින් තිබූ හෙයින් ද අප අඩිය ඉක්මන් කළේ වැස්සට කොටු වුණොත් මළ ආරවල් පවා පණ ලබන බැවින් ඊට කලින් නිවෙස්වලට යෑමේ බලාපොරොත්තු ඇතිවය.

ජී.අයි.ආර්. ගරුසිංහ







දිනමිණ සශ්‍රීක
ශූර ගොවියන්ගේ රාජධානිය



මතුගම අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරුන්, ගුරුවරුන් දේශීය වී වගාවට කුඹුරට බැස ඇති අයුරු



# දේශීය වී ගොවිතැනට හුරු විදුහල්පතිවරු මුල් තැන ගනිති

කොරෝනාවට ස්ථිර ප්‍රතිකාරය ශරීරය තුළ ප්‍රතිශක්තිය ඇති කර ගැනීමය. ඒ සඳහා වස විසෙන් තොර ප්‍රතිශක්තිජනක ආහාර ගැනීම වෙනුවෙන් මතුගම අධ්‍යාපන කලාපයේ ගුරුවරුන්, විදුහල්පතිවරුන් කොරෝනාවට එරෙහි හෙළ ගොවිතැනට කුඹුරට බැස සරුසාර වි ගොවිතැනක් ආරම්භ කර තිබේ. කොරෝනා ඇතුළු වසංගත රැසකින් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය ප්‍රතිශක්තිය පාරම්පරික දේශීය ආහාර තුළ තිබෙන බව විද්‍යාත්මකව තහවුරු වුවත් වස විසෙන් තොර පාරම්පරික ගොවිතැන පසෙක දමා වෙළෙඳපොළ වෙනුවෙන් තම වගාවන් බිලි දී හමාරය.

මේ පිළිබඳ අවධානය යොමු කළ මතුගම අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරුන් පිරිසක් සහ ගුරුවරුන් පිරිසක් මතුගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ ද සහාය ඇතිව “හෙළ සුවය“ මතුගම ගුරු විදුහල්පති එකමුතුව පිහිටුවා ගෙන තිබේ. දරුවන් තුළ ප්‍රතිශක්තිකරණය ඇති කිරීම නිවෙසින්ම කළ යුතු නිසා එවැනි ආහාර භෝග වගා කර දරුවන් සඳහා ලබා දීම වෙනුවෙන් ආදර්ශයක් දීමට කොරෝනා නිවාඩුවෙන් උපරිම ප්‍රයෝජන ගත් මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් හෙළ ගොවිතැනට කුඹුරට බැස අවවාදයට වඩා ආදර්ශය උතුම් බව ප්‍රායෝගිකව පෙන්වා දි තිබේ.

මතුගම ගුරු-විදුහල්පති සංගමය පාරම්පරික හෙළ ගොවිතැනේ ඇති වැදගත්කම පෙන්වා දීමෙන් අනතුරුව ප්‍රදේශයේ පාසල් දරුවන්ගේ ගොවිතැන් කරන මව්පියන් දෙසීය දෙනකුට එක් අයකුට “බටපලැල්“ බිත්තර වී කිලෝ පහ බැගින් සහ කෘෂි ප්‍රතිකාර සමග ලබා දී නියමු ව්‍යාපෘතියක් දියත් කර තිබේ. වස විස නැති ප්‍රතිශක්තියෙන් ඉහළ සාම්ප්‍රදායික දේශීය වි වර්ග හෙළ සුවය කෘෂි ප්‍රතිකාර ක්‍රමය මඟින් වගා කිරීමේදී මඩ සකස් කළ කුඹුරු අක්කරයක් වගා කිරිමට වැය වන්නේ රුපියල් 3700 තරම් සුළු මුදලක් යැයි ගොවීහු කියති.

“පළමු බිම් සැකසීමෙන් පසු මඩට යෙදීමට දියර වර්ග දෙකක් දුන්නා. ඒක ජලය සමග මිශ්‍ර කර යෙදීමෙන් පසු පසේ ගැඩවිල් පණුවන් විශාල ලෙස වැඩිවෙලා තණ කොළ දිරාපත් වෙලා ඉතාම හොඳින් කුඹුර මඩ වුණා.“ යැයි ගුරු ගොවි මහතකු කීවේය. නැවත දින දහයකින් තවත් දේශිය ශාක සාර දියරයක් යොදා කුඹුර වැපුරුවා. බිත්තර වී ගොම දියරෙන් සෝදා වපුරා දින දහයෙන් - දාහතරෙන් නැවත නැවත එම ශාක සාර දියර වතුරට මිශ්‍ර කර කුඹුරට යෙදුවා. කිසිම රසායනික පොහොරක් හෝ වෙනත් කාබනික පොහොරක් යෙදීමට අවශ්‍ය වුනේ නැතැ'යි ගොවීහු කියති. සාමාන්‍ය ක්‍රමයට වැපුරුවා නම් පළමු බිම් සැකසීමට පසු රසායනික බෙහෙත් ගහනවා. ඊට පසු රසායනික පෝර අවස්ථා දෙකකදී යොදනවා. වල් මර්දනයට තෙල් ගහන්න වෙනවා. කෘමිනාශක ආදි වශයෙන් අවස්ථා ගණනකදී විස සහිත රසායනික ද්‍රව්‍ය යොදන්න වෙනවා. එහෙත් මේ ක්‍රමයේදී තවම එවැනි කිසිවක් යොදා නැතැයි, ගොවිතැනට එක්වූ ගොවීහු කියති.

නියාමක ව්‍යාපෘතියක් ලෙස මතුගම, අගලවත්ත, වලල්ලාවිට, බදුරලිය ප්‍රදේශවල මේ වන විට සාර්ථකව මෙවර කුඹුරු අක්කර පනහක් වගා කර තිබේ. ගුරුවරුන්, විදුහල්පතිවරුන් වගේම වස විසෙන් තොර දේශිය ගොවිතැනට කැමති ගොවින් විශාල පිරිසක් මේ පිළිබද උනන්දුවෙන් විමසීම් කිරීමෙන් පෙනී යනුයේ වස විසෙන් තොර ගොවිතැනට මෙන්ම එවැනි ආහාර රටාවකට ජනතාව තුළ විශාල උනන්දුවක් තිබෙන බවය. පළමු අදියරේදී මතුගම ප්‍රදේශයේ පාසල් සතු ගොවි බිම්වල වස විසෙන් තොර දේශීය හෙළ ගොවිතැන සිදු කර ඇති අතර ඉදිරියේදි කලාපයේ වගා කළ හැකි සියලු කුඹුරු මේ ආකාරයට අස්වැද්දීම මඟින් දරුවන්ට ආකල්පයක්, දැනුමක් ලැබෙන බව ගුරුවරු හා විදුහල්පතිවරු කියති.

මතුගම අධ්‍යාපන කලාපයෙන් ලබා දුන් මෙම ආදර්ශයට අමතරව ගොවින් දෙසිය දෙනකු සම්බන්ධ කර ගනිමින් වගා කර තිබෙන වගාවන් නිසි අධීක්ෂණය කරමින් දිස්ත්‍රික්කයේ වස විසෙන් තොර ගොවිතැනට කැමති ගොවීන් හඳුනා ගෙන දිස්ත්‍රික්කය පුරාම ව්‍යාප්ත කර රටපුරා ප්‍රචලිත කිරිම අරමුණ යැයි,“ මතුගම ගුරු විදුහල්පති සංගමය කියයි. විශේෂයෙන්ම දරුවන් වස විසෙන් තොර ආහාර රටාවකට හුරු කිරීමේ කාර්යභාරය ගුරුවරුන් වශයෙන් වගකිමක් තිබෙන බව ද එම සංගමය කියයි.

කාර්මික තාක්ෂණ ආයතනය මඟින් සිදු කරන ලද පර්යේෂණ අනුව පාරම්පරික දේශිය වී වර්ග මඟින් ශරීරයේ ශක්තිකරණයට අමතර සෘජු ලෙසම රෝග රැසකට ඖෂධ බව ද තහවුරු කරගෙන තිබේ. ශරීරයේ ප්‍රතිශක්තිකරණය යහපත් නම් වයිරස් මර්දනය වන හෙයින් එවැනි ගුණ සහිත පාරම්පරික දේශීය වී ප්‍රභේද සිය ගණනකින් දැනට ඉතිරිව ඇත්තේ කිහිපයකි. කුරුලු තුඩ, කළු හීනටි, මඩතවාලු, සුවදැල්, මා වී, පච්ච පෙරුමාල්, ඇටකාරි, රත් ඇල්, දික් හීනටි, වෙද හීනටි, බෙහෙත් හීනටි, මුට්ට කරුප්පන්, කහවණු, මසුරන්, කුකුළු බිජු (හිච්චි නංගි), රත් දැල්, පුෂ්පරාග, අසූදා වී සහ මුරුන්ගන් ඇතුළු වි වර්ග රැසක් නැවතත් මේ රටේ ගොවීන් අතට පත් කර රටේ ජනතාවගේ බත් පතට ගෙන එන්නට මහත් වෑයමක් දරනු ලබයි.

විශේෂයෙන්ම සාම්ප්‍රදායික මෙම වී ප්‍රභේද වැඩි දියුණු කළ දෙමුහුන් වී වර්ගවලට වඩා රෝගවලට, කෘමි හානිවලට සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීම නිසා ලැබෙන ආර්ථික වාසිය ඉහළය.

ආහාරයක් ලෙස වස, විස සහිත බත ලබා ගන්නවා වෙනුවට ඖෂධයක් ලෙස බත සපයා ගැනීමට පාරම්පරික වී වගාවෙන් අවස්ථාව උදා වේ. සාරාර්ථ සංග්‍රහය වැනි පැරැණි පොත පතේ සඳහන් ආකාරයටත්, පර්යේෂණ මඟින් තහවුරු කරන ලද ආකාරයටත් පෝෂණ ගුණයෙන් ඉහළ, දියවැඩියාව, රක්ත හීනතාව, වකුගඩු රෝග, මල බද්ධය, පිළිකා, පීනස මෙන්ම ශරීරගත විස නැසීම ආදි රෝග රැසකට දේශීය ආයුර්වේදයේ සාම්ප්‍රදායික දේශීය සහලින් සැකසූ බත්, කැඳ ආදිය නිර්දේශ කිරීමෙන් දේශීය සහල් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම හා මිල ඉතා ඉහළය.

ගොවිතැන යනු හොඳින් දැන හඳුනා ගෙන කළ යුතු කාර්යයක් බව මතුගම ගුරු විදුහල්පති සංගමය නැවත අවධාරණය කරමින් සිටියි. බොහෝ දෙනකු මහා පරිමාණ වෙළෙඳපළක් අපේක්ෂාවෙන් විශාල ලෙස රසායනික පොහොර , කෘෂි රසායනික යොදමින් වස විස සහිත ආහාර භෝග වගාවෙන් ප්‍රතිශක්තිකරණයෙන් දුර්වල පරපුරක් බිහිවීම නිසා කොරෝනා පමණක් නොව වෙනත් රෝගයන්ට ද නිරන්තර ගොදුරු වෙති. එහෙත් රෝග රැසකට විසඳුම් දෙන සාම්ප්‍රදායික වී ප්‍රභේද රැසක් අප සතුය. දේශීය වෙදකමේදී ඖෂධයක් ලෙස භාවිත කරන වී ප්‍රභේද රැසක් හෙළ සුවය ක්‍රමවේදයට වගාකිරීමට දැන උගත් ගොවි පරපුරක් ඇති කිරීමටත් මුල පුරමින් තිබේ. මතුගම ගුරු-විදුහල්පති එකතුවේ මෙම උත්සාහය පිළිබඳ දැනටමත් ජාතික මට්ටම අබිබවා අවධානය යොමුව තිබීම සතුටට කරුණකි.

**පී. සෝමරත්න**





සරු සාරව වගාකළ ගොවිතැනක්



# වට්ටක්කාවලට අමතර අගයක්

වට්ටක්කා කියූ විට අපේ ඇතැම් ගොවීන්ට ඇත්තේ අමිහිරි අත්දැකීමකි. ලොරියක් කඩන්න වට්ටක්කා එල දැරුවත් කුණු කොල්ලයටවත් විකුණා ගැනීමට නොහැකිව ලත වුණු හැටි මතකයට එන විට වට්ටක්කා වැවීමට උනන්දු නොවීම පුදුම නැත. එමෙන්ම ඇතැම් අය වට්ටක්කා ආහාරයට ගැනීමට ද මැළිකමක් දක්වති. මේ සියලු ගැටලුවලට විසඳුමක් ගැන මෙවර පැලැස්ස මඟින් අපි ඔබට කියන්නට යන්නේ වට්ටක්කා වගාවෙන් අතමිට සරු කරගන්නා අතරම ආහාරයට ගැනීමෙන් එහි ගුණය සිරුරට එක් කර ගත හැකි අලුත් ක්‍රමයක් ගැනය. ඒ වට්ටක්කා පිටි නිෂ්පාදනයයි.

ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ ඉතාමත් හොඳින් වට්ටක්කා වගා කළ හැකි අතර වර්තමානය වන විට ඉතා විශාල ලෙස වගා කිරීම නිසා මිල පහළ යෑමත් විශාල අතිරික්තයක් ඇති වීමෙන් අපතේ යෑමත් වැනි ප්‍රශ්නවලට වට්ටක්කා වගාකරුවෝ මුහුණ දෙති. මෙයට පිළියමක් ලෙස ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය මඟින් වට්ටක්කා පිටි ආශ්‍රිත විවිධ ආහාර වර්ග නිෂ්පාදනය කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇති අතර එමඟින් වට්ටක්කාවලට අගය එකතු කිරීම තුළින් ගොවියාට මෙන්ම ආහාර කර්මාන්තයේ නියැළෙන්නන්හට ද හොඳ මිලක් ලබා ගත හැකි මාර්ගයක් විවර කර දී ඇත. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය මඟින් මීට අදාළව පුහුණු වැඩසටහන් පවත්වන අතර එහිදී වට්ටක්කා පිටි නිෂ්පාදනයට අදාළ තාක්ෂණය, යන්ත්‍රෝපකරණ, ඇසුරුම් කිරීම හා පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා පුළුල් දැනුමක් ලබා ගත හැකිය.

සාමාන්‍ය ක්‍රමයට ගොවින් නෙළා ගෙන වට්ටක්කා ගෙඩි ලෙස වෙළෙඳපොළට ඉදිරිපත් කරනවාට වඩා වට්ටක්කා පිටි නිෂ්පාදනයට කැමැති කෙනකුට මේ සඳහා ප්‍රවේශයක් ලබා දීමට අපි කැමත්තෙමු.

වට්ටක්කා පිටි නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස කරන්නේ නම් විජලන යන්ත්‍රයක් වුවමනා වෙයි. මෙහිදී පළමුවෙන්ම කළ යුත්තේ වට්ටක්කා මිලිමීටර් 2-5ත් අතර ප්‍රමාණයේ කැබලිවලට කපා ගැනීමයි. ඉන් පසු විජලන යන්ත්‍රයෙන් වියළා කුඩු කර ගත යුතුය. නිවෙසේ ආහාරයට වට්ටක්කා පිටි සාදා ගන්නේ නම් ඉහත ආකරයටම කුඩා කැබලි කපා අව්වේ වියළා ග්‍රයින්ඩරයකින් කුඩු කර ගත හැකිය. මෙසේ සකසා ගත් වට්ටක්කා පිටි සාමාන්‍ය උෂ්ණත්වය යටතේ මාස හයක් පමණ කල් තබා ගත හැකිය. ස්වයං රැකියාවක් හෝ කර්මාන්තයක් ලෙස කරන්නේ නම් වට්ටක්කා පිටි ඇසුරුම්කරණය සහ ඒ සඳහා පහසුකාරකයන් සපයන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව දැනුමක් අවශ්‍යය. මේ සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයයෙන් සේවා දායකත්වය සපයා ගැනීමට පුළුවන.

දැනට විදේශීය වෙළෙඳපොළේ මෙන්ම දේශීය වශයෙන් සුපිරි වෙළෙඳසල් හා තරු පන්තියේ හෝටල්වල වට්ටක්කා පිටිවලට විශාල ඉල්ලුමක් ඇත. ආහාර කර්මාන්තයේදී නොයෙකුත් භෝගවලින් පිටි නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබයි. වට්ටක්කාවලින් පිටි නිපදවීම මඟින් අතිරික්ත වට්ටක්කා නිෂ්පාදනය කල් තබා ගැනීම කළ හැකි අතර එම පිටිවලින් නොයෙකුත් ආහාර වර්ග නිෂ්පාදනය කළ හැකිය. එම නිසා ආහාර නිෂ්පාදනයට අමුද්‍රව්‍යයක් ලෙස වට්ටක්කා පිටි සඳහා වෙළෙඳපොළේ හොඳ මිලක් හා ඉල්ලුමක් ලබා ගත හැකි වනු ඇත. මෙම වට්ටක්කා පිටි බේකරි නිෂ්පාදන ලෙස පාන්, බනිස්, කේක්, බිස්කට්, මෆින් වැනි දේ නිපදවීමට යොදාගත හැකි අතර රොටී, ඉදිආප්ප, පිට්ටු වැනි කෑම වර්ග සකසා ගැනීමට ද භාවිත කළ හැකිය. තවද වට්ටක්ක සුප්, වට්ටක්කා පල්පය, වට්ටක්කා අයිස්ක්‍රීම් හා වට්ටක්කා ඇට වලින් ස්නැක් නිෂ්පාදන ද කළ හැකිය.

වට්ටක්කා පිටිවලට අමතරව වට්ටක්කා ඇට ද රසවත්ය. රටකජු, ආමන්ඩ් මෙන් වට්ටක්කා ඇට බැද ආහාරයට ගැනීම විනෝදාත්මක මෙන්ම ගුණදායි ද වෙයි. වට්ටක්කා ඇටවල සින්ක් සහ මැග්නීසියම් බහුලය. ඇට බැද ගැනීමේදී පොත්ත ඉවත් නොකරන්නේ නම් පොත්තේ අඩංගු තන්තුමය ස්වභාවය නිසා අමතර ගුණයක් ද එක්වෙයි. අවන් එකක හෝ තෙලේ බැද ආහාරයට ගත හැකිය. එමෙන්ම වෙළෙඳපොළට ද ඉදිරිපත් කළ හැකිය.

වට්ටක්කා විටමින් ඒ ඉතා බහුල ලෙස ඇති අතර එය ඇස් පෙනීම සඳහා වැදගත් වේ. තවද විටමින් බී සහ සී බහුල නිසා සම නීරෝගී හා පැහැපත් කරයි. මීට අමතරව මැග්නීසියම්, පොටැසියම්, කැල්සියම් හා සින්ක් යන ඛනිජ ලවණවලින් ද පොහොසත් වේ.

මේ වන විට දාර වට්ටක්කා, හේන් වට්ටක්කා, මිනි මිනි වට්ටක්කා ආදි විවිධ නම්වලින් විවිධ හැඩයෙන් වට්ටක්කා ප්‍රභේද ඇති මුත් මේ සෑම වර්ගයකම ඊට අනන්‍ය වූ රසයක් පවතී. පුංචි දරුවන්ගේ කෑම වේලකට අනවාර්යයෙන්ම වට්ටක්කා එක් කර ගන්නා ලෙස මව්වරුන්ට උපදෙස් ලැබෙන්නේ එහි තරමක් වූ පැණි රසයට කෑම රුචියක් වඩවන අතරම මල බද්ධය වැනි ගැටලුවලට විසඳුමක් ලැබෙන බැවිනි. මේ නිසා වට්ටක්කා අතිරික්තයක් නිසා පැන නඟින ගැටලු මිස ඊට පාරිභෝගික ඉල්ලුම අඩු නොවේ. වට්ටක්කා වාෂ්පයෙන් තම්බා පොල් සහ කට්ට සම්බලය සමඟ රස බලා ඇත්තෙකු මීට සාක්කි දරනු ඇත.

සාම්ප්‍රදායික ආහාර කර්මාන්තයෙන් ඔබ්බට ගොස් වෙළෙඳපොළට අලුත් නිෂ්පාදනයක් කිරීමට උනන්දුවක් දක්වන අයට මේ අත්හදා බැලීම කළ හැකිය. එය ගමේ නගරයේ ආකර්ෂණීය වෙළෙඳපොළ නිෂ්පාදනයක් වනු නොඅනුමානය.

**සකුන්තලා ජයසිංහ**



වට්ටක්කා පිටි




බැදපු වට්ටක්කා ඇට










පර්යේෂණ නිලධාරී
**කසුන් හෙට්ටිගේ**
ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය, අනුරාධපුර





පිටි බවට පත් කරන ලද පලා වර්ග





කැබලි කරන ලද පලා



වියළන ලද කොස්

# පලාවලින් රටම මවන මාතලේ බණ්ඩාර



එල්.සී.කේ.එස්. බණ්ඩාර

ඔහු මේ රට තුළ තිස් වසරක් තිස්සේ පැවති යුද්ධය දිනන්නට උර දුන්නේය. යුද හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටින ඔහු දැන් රටේ ආර්ථිකයට ශක්තියක් වෙමින් සිටියි. අප රට තුළ වැවෙන පලා වර්ග, ඖෂධ ශාක, කරපිංචා වැනි රසකාරක ද නව ක්‍රමයකට සකස් කොට විදෙස් වෙළෙඳපොළට යවයි. එමෙන්ම දඹුල්ල පොදු වෙළෙඳපොළේ එළවළු දැන් අපතේ යන්නේ නැත. මාතලේ පදිංචි ඔහු එච්. එල්.සී.කේ.එස්. බණ්ඩාර. මේ නව ව්‍යාපෘතිය නිසා ඔහු දැන් සම්මානලාභියකු වීමට ද නියමිතයි.

**● යුද හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටින ඔබ මෙවැනි වැඩපිළිවෙළක් ආරම්භ කරන්න හිතුවේ ඇයි?**

මම 1993දි හමුදාවට බැඳුණා. 1994 ඉඳන් මම යාපනේ සිදු කළ සෑම ක්‍රියාන්විතයකටම සහභාගි වුණා. එහිදී මට සේවා ඇගයීම් පවා ලැබුණා. මම 2015දී යුද හමුදාවෙන් විශ්‍රාම ගියා. ඊට පස්සේ මට ඕනෑ වුණේ රටේ ආර්ථිකයට කුමන හෝ අයුරින් දායක වෙන්න. මම මුලදී කළේ වාහනයක් අරගෙන මේ පැත්තේ ගොවියන්ගේ එළවළු දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ප්‍රවාහනය කරන එක. ඒ අතරේ අහඹු ලෙස මට පත්තර පිටුවක විජලනය ගැන විස්තරයක් තිබෙනවා දැක්කා. මම මේ ගැන විස්තර හොයලා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ඉගෙන ගන්න ගන්නෝරුව ආහාර පර්යේෂණ තාක්ෂණ ආයතනයටත්, අයි.ටී. ආයතනයටත් ගියා. එස්.එල්. ෆුඩ් ටෙක් ආයතනය ආහාර කල් තබා ගැනීමේ තාක්ෂණය පිළිබඳ හැදෑරුවා. මාතලේ විදාතා මධ්‍යස්ථානයෙනුත් මෙයට අදාළ පාඨමාලාවක් කළා. දඹුල්ල ආර්ථක මධ්‍යස්ථානයේ එළවළු, පලතුරු අපතේ යනවා මම දැක්කා. මට ඕනෑ වුණා මෙයට පිළියමක් සොයන්න. ඒ නිසා මම ඒ ගැන මුලින්ම දැනුම්වත් වෙලා මේ වැඩේ කරන්න පටන් ගත්තා.

**● ඔබ මේ සඳහා භාවිත කරන පලා වර්ග සහ ඖෂධ ශාකයන් මොනවා ද? ඒවා කුමන අයුරින් ද සකස් කරන්නේ ?**

කරපිංචා, ගොටුකොළ, වැල්පෙනෙල, කටුපිල, හාතාවාරිය, ඉරමුසු, මුරුංගා, පොල්පලා, රම්පේ, සේර, කෝවක්කා, හීන් බෝවිටියා ආදි කොළ වර්ග මේ සඳහා යොදා ගන්නවා. ඒවා ශාකසාර පාන ලෙසත්, පලා කොළ මැල්ලුම් සහ කැඳ ලෙසත් භාවිත කළ හැකි අයුරින් සකස් කරනවා.

**● කොහොම ද ඒවා කෙරෙන්නේ?**

පලා වර්ග සහ අනෙකුත් සියලුම දේ හොඳින් සෝදා විජලනය කරනවා. ඊට පසුව ඒවා අඹරන මැෂින් ආධාරයෙන් පවුඩර් කරනවා. මම ගොටුකොළ, ඉරමුසු, වැල් පෙනෙල වගේ ඖෂධ ශාක පත්‍ර ටී බෑග්ස් විදියට සකස් කරන්නේ නෑ. ඒවා පවුඩර් එකම තොග ලෙස විකුණන්නේ. මගෙන් මේ පවුඩර් එක ගන්න අය ටී බෑග්ස් විදියට සකස් කරනවා

**● ඇයි ඔබ ටී බෑග්ස් හදන්නෙ නැත්තේ?**

ඒවට ලොකු මැෂින් ඕනෑ, මම ඖෂධවල ගුණාත්මක බව සහ ඒවායේ නිවැරදි පාට ආරක්ෂා වෙන විදියට වේළලා කුඩු කරලා දෙනවා. ඒ අය ටී බෑග්ස් හදනවා.

**● කොළ වර්ගවලට අමතරව ඔම මොනවද කරන්නේ?**

මම ජීවත් වෙන්නේ මඩවල උල්පත. මේ ප්‍රදේශයේ ජනතාව පරිභෝජනයට ගන්නේ උල්පත්වල වතුර. රැකියාව විදියට කරන්නේ ගොවිතැන. මේ අය වගා කරන එළවළු දෙන්නේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට. සමහර කාලවලදී මේ අයගේ එළවළු දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේදී විකුණාගන්න බැරි වෙන අවස්ථා තිබෙනවා. විශේෂයෙන් කරිවිල, දඹල, වම්බටු වගේ එළවළු. මේ අයගේ මේ අතිරික්තය විනාශ වෙන නිසා මම ඒවා අරගෙන විජලනය කරනවා. ඒ වගේම මේ ස්වභා දහමෙන් අපට ලබා දී තිබෙන කොස්, දෙල් මේ පැත්තේ තිබෙනවා. ඒවා හැදෙන කාලෙට ගස් යට වැටිලා විනාශ වෙලා යන නිසා මම ඒවත් විජලනය කරනවා.

ඒ වගේම පලතුරු සහ එළවළු ලුණු සාන්ද්‍රණයේ දාලා බෝතල් කිරීමත් කරනවා.

**● ඔබ මේවා යවන්නේ විදෙස් වෙළෙඳපොළට ද?**



සුනේත්‍රා දමයන්ති

අපේ රටේ මාර්කට් එකටත් දානවා. පිටරටවලටත් යවනවා. දැනට කරපිංචා කොළ විතරක් කිලෝග්‍රෑම් 250-350ත් අතර ප්‍රමාණයක් හැම මාසෙම ජපානයට යවනවා. රම්පේ , දෙල් සහ කොස් කොරියාවට යවනවා.

**● ඔබ මේ අමුද්‍රව්‍ය සපයා ගන්නේ කොහොම ද?**

මගේ ප්‍රදේශයේ ගොවි ජනතාවගෙන් තමයි බොහෝ දේවල් ගන්නේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එන ගොවියන්ගෙනුත් ගන්නවා.

**● ඔබ මේවා තනියම ද කරන්නේ?**

නැහැ. මගේ බිරිඳ සුනේත්‍රා දමයන්ති මට ගොඩක් උදවු කරනවා. මගේ මේ වැඩපොළේ වැඩ බලන්නේ ඇයයි. ඇය එතන සුපවයිසර්. මා යටතේ සේවිකාවන් දහ දෙනෙක් වැඩ කරනවා. මට ඕනෑ වුණේ නිවෙස්වල සිටින කාන්තාවන්ට රැකියා අවස්ථා ලබා දීලා ඒ අයටත් ආදායමක් ලැබෙන විදියට වැඩපිළිවෙළක් සකස් කරන්න. එම කාන්තාවන්ගේ දරුවන් පාසල්වලට යැවීම සහ ඔවුන්ගේ නිවෙස්වල රාජකාරි කරන ගමන් මේ වැඩපළේ රැකියාව කිරීමට මම ඉඩකඩ සලසා තිබෙනවා.

සෑම වසරකම මධ්‍යම පළාතේ තරුණ ව්‍යවසායකයන්ට තරු සම්මාන දෙනවා. මේ වසරේ මටත් තරු සම්මානයක් හිමි වෙලා තිබෙනවා.

**● ඔබගේ මේ නව නිෂ්පාදනවලට තිබෙන ඉල්ලුම කොහොම ද?**

මට කර ගන්න බැරි තරම් ඉල්ලුමක් තිබෙනවා. අමෙරිකාව, මැලේසියාව සහ ඊශ්‍රායලයේ විදෙස්ගතව ඉන්න ශ්‍රී ලාංකිකයින්ගෙන් විශාල ඉල්ලුමක් තිබෙනවා. වැඩිම ඉල්ලුමක් තිබෙන්නේ මුරුංගා, කරපිංචා, ගොටුකොළ සහ වැල්පෙනෙලවලට. මේ දවස්වල ගොඩක් අය සෞඛ්‍ය තත්ත්වය ගැන හිතනවා. වස විසෙන් තොරව ස්වාභාවික ලෙස නිෂ්පාදනය කරන කුරක්කන් කැඳවලටත් හොඳ ඉල්ලුමක් තිබෙනවා.

**● විජලනය කළ පළා වර්ගවලින් මොනවද කරන්න පුළුවන් වන්නේ?**

කැඳ වර්ග හදන්නත් තේ වගේ බොන්නත් පුළුවන්. මුකුණුවැන්න, ගොටුකොළවලට වතුර දැම්මාම ස්වාභාවික තත්ත්වයට නැවත එනවා. ඒවා සම්බෝල විදියටත් මැල්ලුම් විදියටත් සකස් කර ගන්න පුළුවනි.

**● සමහර කොළ වර්ග තිබෙනවා කපලා සුළු වෙලාවකින් අවපැහැ ගැන්වෙනවා. ඔබ මේ සඳහා යොදන්නේ මොනවා ද?**

වතුරට දෙහි ගෙඩි 10ක් 15ක් මිරිකලා දාලා ඒවායින් සුළු ප්‍රමාණයක් කොළවලට කලවම් කරනවා. සිට්‍රික් ඇසිඩ් ටිකක් දාන්නත් පුළුවනි. ඒත් මම ගොඩක් දුරට කොළවල ස්වාභාවික පෙනුම ඒ විදියටම තියන්නයි කැමති.

**● ඔබ මේ කරන දේවල් පිළිබඳව තෘප්තිමත් ද?**

ඇත්තටම ඔව්. මට රටේ ආර්ථිකයට කිසියම් දෙයක් කරන්න පුළුවන් වීම ගැන සතුටුයි.

බණ්ඩාර මහතාගෙන් මෙම නව නිෂ්පාදන පිළිබඳව කිසියම් උපදෙසක් ගැනීමට හෝ ගොවි මහත්වරුන්ට තමන්ගේ අමුද්‍රව්‍ය ඔහුට ලබා දීමට අවශ්‍ය නම් dinuklanka@gmail.com ඊ මේල් ලිපිනයෙන් ඔහු සමඟ සම්බන්ධ විය හැකිය.

**චතුමී පිටිපන**







2021 පෙබරවාරි 10 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.